# 01 සමාජ විද්‍යාව හැඳින්වීම

## 1.1 සමාජ විද්‍යාව නිර්වචනය කිරීම

සමාජ විද්‍යාව විෂයයක් ලෙස ස්ථාපිත වී වසර එකසිය පනහක් පමණ ගත වී ඇත. බටහිර සමාජය පදනම් ව බිහිවූ මෙම විෂය විවිධ දිශානතීන් ඔස්සේ වර්ධනය වී තිබේ. ඒ සඳහා බලපා ඇත්තේ සමාජ විද්‍යාවේ ප්‍රායෝගික පදනමයි. න්‍යාය හා සංකල්ප වලින් ඔබ්බට ගොස් සමාජයේ අවශ්‍යතා ඉටුකරන ප්‍රායෝගික විෂයයක් බවට සමාජ විද්‍යාව පත්ව ඇතැයි කිව යුතු ය. ඒ අනුව සමාජ විද්‍යාව යනු කුමක් ද යි සමාජ විද්‍යාඥයන්ගේ නිර්වචන ආශ්‍රයෙන් විමසා බැලීම වැදගත් වේ.

"සමාජ විද්‍යාව යනු මානව සමාජය පිළිබඳ ව අධ්‍යයනය කිරීමයි." යනුවෙන් එලිසබත් ජේ.විල්කින්ස් (Elizabeth J.Wilkins) නිර්වචනය කරයි. මානව සමාජය විද්‍යාත්මකව අධ්‍යයනය කිරීම මෙම විෂය තුළින් කරන ලද බව එම නිර්වචනය තුළින් ඉතා සරල ව පෙනී යයි. නමුත් මෙහි දී මානව සමාජයේ කුමන අංශයන් අධ්‍යයනය කරන්නේ ද යන ගැටලුව මතුවේ. සමාජ විද්‍යාව මානව සමාජයේ සෑම අංශයක් ම අධ්‍යයනය කරනු ලබයි. එල්. ටී. හොබ්හවුස් (L.T. Hobhouse) නැමැති සමාජ විද්‍යාඥයා ට අනුව "සමාජ විද්‍යාව මිනිසාගේ සකල සමාජ ජීවිතය විද්‍යාත්මකව අධ්‍යයනය කරන්නකි." එමෙන් ම ඔගස්ට් කොම්ට් (Auguste Comte) නැමැති සමාජ විද්‍යාඥයා ''සමාජ ශාස්ත්‍රවල රැජින සමාජ විද්‍යාව'' ලෙස නම් කරයි. මෙම නිර්වචනවලින් සමාජ විද්‍යාව මිනිසාගේ සමාජ ජීවිතයේ සෑම අංශයක් ම අධ්‍යයනය කරන බව පෙනීයයි.

දහනවවන සියවසේ ජීවත් වූ ජෝන් ස්ටුවට් මිල් (John Stuart Mill) නම් දාර්ශනිකයා සමාජ විද්‍යාව "මානව වංශ විද්‍යාව" (Ethnology) ලෙස නම් කර ඇත. එමගින් අදහස් වන්නේ සමාජ විද්‍යාව මානව චර්යාවන් පිළිබඳ ව අධ්‍යයනය කරන බවයි. මිනිසාගේ සමාජ චර්යා සඳහා බලපානු ලබන විවිධ විචල්‍යයන් පවතී. සාමාන්‍ය සමාජ පරිසරයේ දී මිනිසාගේ සමාජ

චර්යාව සඳහා බලපානු ලබන විවිධ සාධකයන්ගේ බලපෑම කෙතරම් ද යන්න නිර්ණය කිරීම සමාජ විද්‍යාඥයන් විසින් කරනු ලැබේ. උදාහරණයක් ලෙස ළමා සමාජානුයෝජනය සඳහා පවුල නැමැති සාධකය කෙසේ බලපාන්නේ ද සම වයස් කණ්ඩායම් නැමැති සාධකය කුමන බලපෑමක් කරයි ද යන්න අධ්‍යයනය කිරීම දැක්විය හැකිය.

එමිල් ඩුර්කයිම් (Emile Durkheim) නම් සමාජ විද්‍යාඥයා විසින් "සමාජ විද්‍යාව සමාජ ආයතන හෙවත් සමාජ සංස්ථා පිළිබඳ ව අධ්‍යයනය කරන විද්‍යාව" යනුවෙන් නිර්වචනය කරයි. එමගින් පැහැදිලි වන්නේ සමාජ පරිසරය පවත්වාගෙන යාමට හා සමාජ අවශ්‍යතා ඉටුකිරීමට කෘත්‍යමය බලපෑමක් කරනු ලබන සමාජ සංස්ථා සමාජ විද්‍යාව මගින් අධ්‍යයනය කරන බවයි.

විද්‍යාත්මක අධ්‍යයනයවල ප්‍රධාන ලක්ෂණයක් වන්නේ කිසියම් ගැටලුවක් විද්‍යාත්මක ක්‍රමය උපයෝගි කර ගෙන අධ්‍යයනය කිරීමයි. ඒ ඒ විෂයයන්ට අදාළ ව ඒ ඒ ගැටලු අධ්‍යයනය කරන අතර එමගින් ගැටලුවේ ස්වභාවය හා ඊට බලපානු ලබන හේතු සාධක තේරුම් ගනී. සමාජ විද්‍යාව මගින් අධ්‍යයනය කරනු ලබන්නේ සමාජ ගැටලු ය. උදාහරණයක් ලෙස සමාජ විරෝධී චර්යා ඇතිවන්නේ ඇයි ද යන සමාජ ගැටලුව සමාජ විද්‍යාඥයින් විසින් අධ්‍යයනය කරනු ලබයි. එමගින් සමාජ විරෝධී චර්යා ඇතිවීම කෙරෙහි බැඳී පවතින සාමාජීය සාධක අවබෝධ කරගත හැකි වේ.

## 1.2 සමාජ විද්‍යාව විෂය බිහිකළ තත්කාලීන බටහිර සමාජය

සමාජ විද්‍යාව විෂයයක් වශයෙන් ආරම්භ වූයේ ක්‍රි.ව. 1838 ප්‍රංශයේ දී ය. ඒ සඳහා දායක වූයේ ප්‍රංශ ජාතික ඔගස්ට් කොම්ට් (Auguste Comte) නැමැති සමාජ දාර්ශනිකයා ය. මොහුගේ මතය වූයේ සමාජය විපර්යාසයන්ට භාජනය වන බවයි. එසේ විපර්යාසයන්ට භාජනය වන සමාජය අධ්‍යයනය කිරීමේ විෂයයක් ලෙස ඔහු විසින් සමාජ විද්‍යාව හඳුන්වා දෙනු ලැබී ය.

දහනමවන සියවස පමණ වන විට බටහිර සමාජය විවිධ හේතූන් නිසා විපර්යාසයන්ට පත් වෙමින් පැවතුණි. ඒ සඳහා බලපෑම් කළ හේතු සාධක රාශියක් ජෝර්ජ් රිට්සර් (George Ritzer) නම් සමාජ විද්‍යාඥයා විසින් ඉදිරිපත්

කර ඇත. ඒවා අතර,

* ප්‍රංශ විප්ලවය තුළින් ගොඩනගන ලද දේශපාලන ප්‍රතිසංස්කරණ
* කාර්මික විප්ලවය සහ ධනවාදයේ නැඟී සිටීම
* නාගරීකරණය
* ආගමික ප්‍රතිසංස්කරණ
* විද්‍යාවේ වර්ධනය මුල්තැනක් ගනී.

වසර ගණනාවක් තිස්සේ යුරෝපා සමාජය තුළ ඉහත සඳහන් සමාජ සාධක බලවත් විපර්යාසයක් ඇති කරනු ලැබී ය. ඒ තුළින් සාම්ප්‍රදයික සමාජ ක්‍රමය දෙදරා ගොස් නවීන සමාජ ක්‍රමයක් බිහි විය. යුරෝපා සමාජය මහත් විපර්යාසයකට ලක් කිරීමට බලපෑ විශේෂ සාධකයක් ලෙස කාර්මික විප්ලවය දැක්විය හැකි ය. ජේම්ස් වොට් (Jemes Watt) විසින් වාෂ්ප බලයෙන් ක්‍රියා කරන හුමාල එන්ජිම නිපදවීම කර්මාන්ත ක්ෂේත්‍රයෙහි විපර්යාසයක් ඇති කිරීමට හේතු විය. මුලින් ම එංගලන්තය කාර්මීකරණයට ලක් වූ අතර පසුව එය යුරෝපය පුරා පැතිර ගියේ ය. කර්මාන්ත ශාලා බිහිවීමත් සමග ම ඒ අවට විශාල ජනගහනයක් පදිංචි වීම කරණකොට ගෙන නගර නිර්මාණය වන්නට විය. ඒ තුළින්,

* නාගරික සමාජය තුළ විවිධ සමාජ ස්ථර බිහිවීම.
* වැටුප් ලබන ශ්‍රමික පිරිසක් නිර්මාණය වීම.
* කම්කරුවන්ට ධනපති පංතියෙන් සිදුවන පීඩනයන්ගෙන් මිදීම සඳහා කම්කරු නීති ස්ථාපිත වීම.
* නිල සංවිධාන හා ආයතන පිහිටුවීම.

සිදුවිය.

ගෘහස්ථ නිෂ්පාදන ක්‍රමය බිඳවැටී කාර්මික නිෂ්පාදන සමාජයේ ඉල්ලුම බවට පත් වූ අතර, එහි ප්‍රතිඵලය වූයේ ග්‍රාමීය ජනයා රැකියා අපේක්ෂාවෙන් නගරයට පැමිණීම ය. ඒ ඇසුරින් සමාජ සම්බන්ධතාවල ද වෙනසක් ඇති විය. එම වෙනස පවුල, විවාහය ආගම වැනි සමාජ සංස්ථාවන්ගේ කාර්යන්හි වෙනසක් ඇති කළේ ය. කාර්මීකරණය නිසා බටහිර සමාජ ව්‍යුහය මෙසේ විපර්යාසයට ලක් විය.

බටහිර සමාජ පර්යාය වෙනස් වීමට බලපෑ තවත් සුවිශේෂී සාධකයක් වූයේ 1789 දී සිදු වූ ප්‍රංශ විප්ලවය යි. දහසයවන සියවස වනවිට එතෙක් ප්‍රංශය පාලනය කල රාජාණ්ඩු ක්‍රමයට ජනතාව කලකිරී සිටියහ. දහසයවන ලුවී රජුගේ පාලනයට එරෙහිව ජනතාව කැරලිගැසීමෙන් ප්‍රංශ විප්ලවය ආරම්භ විය.රජුගේ හා කතෝලික පල්ලියේ ආධිපත්‍යයෙන් ප්‍රංශය මුදවාගෙන ප්‍රජාතාන්ත්‍රිය පාලනයකට අවශ්‍ය මූල බීජ සකසනු ලැබූවේ මෙම විප්ලවය මගිනි. එය පුද්ගල නිදහස පදනම් කරගත් දේශපාලන දර්ශනයකට මග පෑදී ය.

පහළොස්වන සියවසේ සිට යුරෝපීය සමාජයේ ඇති වූ ආගමික ප්‍රතිසංස්කරණ බටහිර සමාජය විපර්යාසයකට ලක් කළේ ය. පෞරාණික කතෝලික ආගමේ ඇතැම් පූජක කොටස් විසින් එම ආගම අභියෝගයකට ලක් කරන ලදි. මාටින් ලූතර් (Martin Luther) හා ජෝන් කැල්වින් (John Calvin) යන පූජකයන් විසින් ආගමික ප්‍රතිසංස්කරණයක් ඇති කරන ලදි. එය ප්‍රොතෙස්තන්ත්‍ර ආගමික ව්‍යාපාරය යනුවෙන් හඳුන්වනු ලැබේ. මෙම ආගමික ව්‍යාපාරය මගින් යුරෝපා සමාජයට නව ආචාර ධර්ම පද්ධතියක් හඳුන්වා දෙන ලදි. පෞද්ගලිකත්වය හා ධනවාදය ඉස්මතු වන පරිදි එම ආචාර ධර්ම ගොඩනගා ඇත. එමගින් යුරෝපා සමාජය ධනවාදී සමාජයක් කරා යොමුකරන ලදි.

මැක්ස් වේබර් (Max Weber) නැමැති ජර්මන් ජාතික සමාජ විද්‍යාඥයා ඔහුගේ ප්‍රොතෙස්තන්ත්‍ර ආචාර ධර්ම හා ධනවාදයේ හරය (The Protestant Ethic and The Spirit of Capitalism) යන කෘතියෙන් ධනවාදී ආකල්ප ප්‍රොතෙස්තන්ත්‍ර ආගම මගින් බටහිර සමාජය තුළ ගොඩ නැගුණු ආකාරය සාකච්ඡා කරයි. මෙම ආගමික ප්‍රතිසංස්කරණය බටහිර සමාජය ද වෙනසකට ලක් කළේ ය. පවුල් ජීවිතයේ බිඳවැටීම නිසා,

* සමාජානුයෝජන ක්‍රියාවලිය බිඳ වැටීම.
* ආගමික සාරධර්මවල බලපෑම අඩුවීම.
* ආගමික සංස්ථා බිඳවැටීම.

ආදි සමාජ ආර්ථික ගැටලු රාශියක් උද්ගත විය.

නාගරීකරණය ද බටහිර සමාජය උඩුයටිකුරු කළ තවත් සාධකයකි.

කර්මාන්තශාලා බිහිවීමත් ඒ අනුව ජන ඝනත්වය වැඩිවීමත් නිසා ඒ අවට නගර බිහිවිය. නගර බිහිවීමත් සමග ම සාම්ප්‍රදායික අන්තර් පුද්ගල සම්බන්ධතා, සංකීර්ණ වූ සමාජ සම්බන්ධතා දක්වා වෙනස් විය. නාගරීකරණය විසින් සමාජ ගැටලු රාශියක් ද ඇති කරන ලදි. සෞඛ්‍ය ගැටලු, මානසික අසහනය, සියදිවි හානිකර ගැනීම, ගණිකා වෘත්තිය ආදී සමාජ ප්‍රශ්න ඒ අතර වේ.

පහළොස්වන සහ දහසයවන සියවස්වල සිට බටහිර යුරෝපීය සමාජය තුළ වර්ධනය වූ විද්‍යාත්මක පුනරුදය ද යුරෝපා සමාජය වෙනස් කිරීමට හේතු විය. විද්‍යාත්මක අදහස් යුරෝපා සමාජයේ ගතානුගතික සාම්ප්‍රදායික මිථ්‍යා මතවාද ඛණ්ඩනය කළේ ය. එම නිසා මිනිසා යථාර්ථවාදී, බුද්ධිවාදී මානසිකත්වයකට අවතීර්ණ විය. එහි ප්‍රතිඵලය වූයේ නිදහස් සමාජ පරිසරයක් නිර්මාණය වීමයි. නව සොයාගැනීම් මගින් යන්ත්‍ර සූත්‍ර ආදිය නිෂ්පාදනය කිරීමත් එමගින් සිදු වූ නිසා මිනිසා සමාජයෙන් වෙන්කර කර්මාන්තශාලාවක සේවකයකු බවට පත්විය.

ඉහත සාකච්ඡා කරන ලද සියලු ම සමාජ විපර්යාසයන් බටහිර සමාජය තුළ නොයෙකුත් ගැටලු ඇති කළේ ය. ඒවා නම්

* මානසික අසහනය
* මදිරාබාධය
* ගණිකා වෘත්තිය
* සියදිවි හානි කරගැනීම
* දික්කසාද
* අපරාධ
* අපචාර ආදී සමාජ ප්‍රශ්නයි.

එකල පැවති වෙනත් විෂයයන්ට එම ගැටලු විසඳිය නොහැකි වූ නිසාත් සංකීර්ණ සමාජ පර්යාය තේරුම් ගැනීම සඳහාත් සමාජ විද්‍යාව විෂය ස්ථාපනය විය.

## 1.3 ස්වාභාවික විද්‍යා හා සමාජීය විද්‍යා අතර සමාජ විද්‍යාවට හිමිතැන

විද්‍යාව (Science) යන විෂය ක්ෂේත්‍රය ඉතා පුළුල් පරාසයක් තුළ විසිර පවතී. ඒ අනුව විද්‍යාත්මක විධික්‍රමය පදනම් කරගත් විවිධ විෂයයන් දැකිය හැකි ය. ඒවා විවිධ වර්ගීකරණයන්ට ලක් කර ඇත. එයින් එක් ප්‍රභේදයක් ලෙස පහත සඳහන් වර්ගීකරණය දැක්විය හැකි ය.

(1) ස්වාභාවික විද්‍යා (Natural Sciences)
(2) සමාජීය විද්‍යා (Social Sciences)

ස්වාභාවික විද්‍යා යනු ස්වාභාවික ලෝකය පිළිබඳ ව හදුරන විෂයයන් ය. එනම් **වස්තු, ද්‍රව්‍ය, ජීවීන්, ආලෝකය, විදුලිය** ආදිය අධ්‍යයනය කරන විෂයයන් වේ. මේ ගණයට **භෞතික විද්‍යාව, රසායන විද්‍යාව, ජීව විද්‍යාව, පරිසර විද්‍යාව, භූගර්භ විද්‍යාව, ගණිතය** ආදි විෂයයන් අයත් වේ.

මිනිසා හා ඔහුගේ සමාජය පිළිබඳ ව අධ්‍යයනය කරන විද්‍යාවන් සමාජීය විද්‍යාවන් ලෙස හැඳින්වේ. **සමාජ විද්‍යාව, මානව විද්‍යාව, මනෝ විද්‍යාව, ආර්ථික විද්‍යාව, දේශපාලන විද්‍යාව, ඉතිහාසය** ආදි විෂයයන් සාමාජීය විද්‍යාවන් ගණයට අයත් වේ.

මෙම විද්‍යා ක්ෂේත්‍රයන් දෙක ම දැනුම නිර්මාණය කිරීමේ දී විද්‍යාත්මක ක්‍රමවේදය භාවිතයට ගනී. නමුත් ස්වාභාවික විද්‍යාඥයාට අත්හද බැලීමේ පරීක්ෂණ (Experiments) මත කරුණු තහවුරු කිරීමේ හැකියාව ඇත. ඒ තුළින් න්‍යායන් හා මූලධර්ම ගොඩනැංවීමට ඉතා ම ඉහළ හැකියාවක් පවතී. සමාජ විද්‍යාඥයාට අත්හද බැලීමේ පරීක්ෂණ භාවිත කිරීමේ හැකියාව අඩු ය. සමාජය අධ්‍යයනය කිරීමේ දී ස්වාභාවික විද්‍යාවන්ට මෙන් සාධක පාලනය කිරීමේ හැකියාව සමාජ විද්‍යාවට අඩු ය. එසේ ම මිනිසුන් සම්පරීක්ෂණාත්මක අධ්‍යයනවලට යොදා ගැනීම ආචාර ධර්ම පිළිබඳ ප්‍රශ්නයක් ද වේ.

ස්වාභාවික විද්‍යාව හා සමාජ විද්‍යාව අතර සමානකම් හා අසමානකම් ද පවතී. විද්‍යාත්මක විෂය ක්ෂේත්‍රයක් ලෙස මෙම විෂය ක්ෂේත්‍රයන් දෙක ම තම දැනුම නිර්මාණය කිරීම සඳහා විද්‍යාත්මක ක්‍රම වේදය අනුගමනය කරනු ලැබේ. නමුත් ස්වාභාවික ලෝකය පිළිබඳ කරනු ලබන විද්‍යාත්මක අධ්‍යයනවල දී ලැබෙන නිගමන වලට සියයට සියයක් ම එකඟවීමේ හැකියාව ඇත. එයට හේතු වන්නේ ස්වාභාවික විද්‍යාඥයන්ට සාධක පාලනය කිරීමේ වැඩි හැකියාවක් තිබීම ය. සමාජ විද්‍යාව සමාජ ලෝකයේ අධ්‍යයනය කිරීමේ දී සාධක පාලනය කිරීමේ හැකියාව අඩු නිසා සමාජ විද්‍යාත්මක නිගමනවල වලංගුතාව සාපේක්ෂව අඩු අගයක් ගනී.

ස්වාභාවික විද්‍යාත්මක නිගමන හා නිපැයුම් අවසානයේ දී සමාජය හා සම්බන්ධ වේ. එම නිසා ස්වාභාවික විද්‍යාඥයන්ට සමාජ විද්‍යාත්මක දැනුම ද අවශ්‍ය වේ. ඉංජිනේරු විද්‍යාව අවශ්‍ය නිපැයුම් නිර්මාණයන් කරනු ලබන්නේ සමාජ අවශ්‍යතා සඳහා ය. එම නිසා සමාජයට ගැලපෙන පරිදි ඒවා නිර්මාණය කිරීමටත් ඉංජිනේරුවන්ගේ මානසික පසුබිම පවත්වාගෙන යාම සහ සමාජ සබඳතා ගොඩනැගීම ආදි අවශ්‍යතා යන කරුණු සලකා බලමින් සමාජ ඉංජිනේරු විද්‍යාව බිහිවී තිබේ. වෛද්‍ය විද්‍යාව ද සමාජය හා අතිශයින් ම සම්බන්ධතා පවත්වන විෂයයකි. රෝගීන් හා වෛද්‍ය සම්බන්ධතා පවත්වාගෙන යාම, නව පර්යේෂණ සිදු කිරීම, ප්‍රතිකාර කිරීම, ඖෂධ නිෂ්පාදනය, බෙදාහැරීම, විකිණීම හා ඖෂධ භාවිතය යන මේවා අතිශයින් ම සමාජය හා සම්බන්ධ ඒවා ය. එමනිසා වෛද්‍ය විද්‍යාවට සමාජ විද්‍යා දැනුම අත්‍යවශ්‍ය වේ. ඒ හේතුවෙන් වෛද්‍ය සමාජ විද්‍යාව නිර්මාණය වී තිබේ.

නූතන සමාජය කාර්මීකරණයට පත්වීමත් සමග මිනිසා කර්මාන්ත-ශාලාවල ශ්‍රමිකයන් බවට පත් වූ බව මුලින් ද සඳහන් කළෙමු. කාර්මීකරණය නිසා උද්ගත වන ගැටලු තේරුම් ගැනීම, සමාජ පරිසරයට ගැලපෙන පරිදි කර්මාන්තශාලා නිර්මාණය කරගැනීම ආදි සෑම තත්ත්වයක් ම සමාජය හා බැඳී පවතී. මෙම තත්ත්වයන් තේරුම් ගැනීමට කාර්මික සමාජ විද්‍යාව නමින් විෂය ක්ෂේත්‍රයක් බිහිවී ඇත. මෙම කරුණු මගින් පැහැදිලි වන්නේ ස්වාභාවික විද්‍යා ඥානයට ද සමාජ විද්‍යාත්මක දැනුම අවශ්‍ය බවයි.

සමාජීය විද්‍යා හා සමාජ විද්‍යාව අතර පවතින්නේ වෙන්කළ නොහැකි සබඳතාවකි. එක් අතකින් සමාජ විද්‍යා දැනුම පෝෂණය සඳහා සමාජීය විද්‍යා දැනුම යොදගනී. ආර්ථික විද්‍යාව, දේශපාලන විද්‍යාව, ඉතිහාසය, මනෝ විද්‍යාව ආදී විෂයයන්ගේ දැනුම නොමැතිව සමාජ විද්‍යාවට හුදකලාව පැවතිය නොහැකි ය. තවත් පැත්තකින් සමාජීය විද්‍යා හා සමාජ විද්‍යාව තම අනන්‍යතාවයන් වෙන වෙන ම පවත්වාගෙන යයි. එල්.ටී.හොබ්හවුස් සමාජ විද්‍යාව සමාජීය විද්‍යාවන්ගේ පදනම ලෙස හඳුන්වයි. සමාජීය විද්‍යා සමාජ විද්‍යාවේ උප ශාඛාවන් (Sub Divisions) වන බව ද ඔහු පවසයි. ඇන්තනී ගිඩ්න්ස් ( Anthony Giddens) සමාජ විද්‍යාව සියලුම සමාජීය විද්‍යාවන්ගේ මව බව පෙන්වා දී ඇත.

එල්.ටී. හොබ්හවුස්ට අනුව සමාජ විද්‍යාව මිනිසාගේ සමස්ත සමාජ ජීවිතය විෂය කොටගත් විද්‍යාවකි. නමුත් සමාජීය විද්‍යාවන් මගින් අධ්‍යයනය කරනු ලබන්නේ වෙන වෙන විෂය පථයන්ය. සමාජීය විද්‍යාවන් මගින් ඒකීය දෘෂ්ටි කෝණයක් මත පිහිටා සමාජය අධ්‍යයනය කරනු ලබයි. එමෙන් ම සමාජ විද්‍යාව ද බහුවිධමාන එළඹුමක් මත පිහිටා සමාජය අධ්‍යයනය කරනු ලබයි.

සමාජීය විද්‍යාවන් එක් විෂය පථයක් කෙරෙහි අවධානය යොමුකර සමාජය අධ්‍යයනය කරන අයුරු විමසා බැලීම වැදගත් වේ.

පහත දක්වා ඇති පරිදි සමාජ විද්‍යාව සමාජීය විද්‍යාවන් හා සම්බන්ධ ව වෙන ම විෂය ක්ෂේත්‍ර පවත්වා ගෙන යනු ලබයි. ඒ අනුව සමාජ විද්‍යාව හා සමාජීය විද්‍යා අතර සම්බන්ධතාවක් පවතී.

| සමාජීය විද්‍යා | සමාජීය විද්‍යා හා සම්බන්ධ උප විෂය ක්ෂේත්‍ර |
|---|---|
| **ඉතිහාසය**<br>ඓතිහාසික සංසිද්ධි තුළින් සමාජ හැසිරීම් අධ්‍යයනය කරයි. | ඓතිහාසික සමාජ විද්‍යාව (Historical Sociology) මිනිසාගේ ඓතිහාසික සමාජ පසුබිම ඇසුරින් සමාජ ජීවිතය ගැන කථා කරයි. |
| **මනෝ විද්‍යාව**<br>මිනිසාගේ මානසික ජීවිතය හදාරයි. | සමාජ මනෝ විද්‍යාව (Social Phychology) මිනිසාගේ සමාජ හැසිරීම, මානසිකත්වය කෙරෙහි බලපාන අයුරු අධ්‍යයනය කරයි. |
| **ආර්ථික විද්‍යාව**<br>ආර්ථික සාධකය ඇසුරින් සමාජය අධ්‍යයනය කරයි. | සමාජ ආර්ථික විද්‍යාව (Economic Sociology) මිනිසාගේ සමාජ හැසිරීම කෙරෙහි ආර්ථික සාධකයේ බලපෑම අධ්‍යයනය කරයි. |
| **මානව විද්‍යාව**<br>ප්‍රාථමික සමාජ අධ්‍යයනය කරයි. මිනිසා පදනම් කරගෙන එය අධ්‍යයනය කරනු ලබයි. | සමාජ මානව විද්‍යාව (Social Anthropology) ප්‍රාථමික සමාජයේ මිනිසාගේ සමාජ සම්බන්ධතා ගැන කතා කරයි. |
| **දේශපාලන විද්‍යාව**<br>බලය, රාජ්‍යය, ආණ්ඩුව යන සාධක මත මිනිසාගේ දේශපාලන චර්යාව අධ්‍යයනය කරනු ලබයි. | දේශපාලන සමාජ විද්‍යාව ( Political Sociology) මිනිසාගේ දේශපාලන චර්යාව සමාජය කෙරෙහි බලපාන ආකාරය අධ්‍යයනය කරයි. |

## 1.4 බෞද්ධ සමාජ විද්‍යාත්මක චින්තනය

ක්‍රි.පූ. හයවන සියවසේ භාරතයේ ආරම්භ වූ බුදු දහම ලෝකයේ ප්‍රධාන ආගම් අතරට එක්ව ඇත. ගෞතම බුදුරදුන් විසින් දේශිත ධර්මය, සංගීති කාරක භික්ෂූන් වහන්සේලා විසින් සූත්‍ර, විනය සහ අභිධර්මය වශයෙන් නම් කොට එය ත්‍රිපිටකය තුළට අන්තර්ගත කරන ලදී. එසේ සංගෘහිත වූ බුද්ධ ධර්මය නූතනය දක්වා පැවත එයි. මෙම දහමේ පරමාර්ථය පුද්ගලයා සසර දුකින් මුදවා විමුක්තිය ලබා දීමයි. සමාජ ජීවිතය සැපවත් කර ගැනීමට හේතුවන

ලෞකිකවාදී ධර්ම කරුණු ද මෙහි අඩංගු ය.

බුදු දහම මූලික වශයෙන් දාර්ශනික ස්වාභාවයක් පෙන්නුම් කළ ද එහි සමාජ විද්‍යාත්මක පසුබිමක් ද හඳුනා ගත හැකි වේ. මහාචාර්ය නන්දසේන රත්නපාල මහතා ඇතුළු ශ්‍රී ලාංකික සමාජ විද්‍යාඥයන් ද බුදු දහමේ සමාජ විද්‍යාත්මක චින්තනය විග්‍රහ කර තිබේ. සූත්‍ර පිටකය තුළින් සමාජ සම්බන්ධතා, සමාජ සංස්ථා, සමාජානුයෝජනය, සමාජ ස්ථර, සමාජ සමූහ, සමාජ ගැටලු සහ සමාජ අධ්‍යයන ක්‍රම ආදි සංකල්පීය සමාජ විද්‍යාත්මක මූලධර්ම හැඳිනගත හැකි ය. විනය පිටකයට අනුව ද නෛතික පාලනය, අපරාධ, දඬුවම්, සාමූහික ජීවිතය හා සම්බන්ධ චර්යා ධර්ම ආදී සමාජ විද්‍යාත්මක මූලධර්ම එහි අඩංගු ය. සූත්‍ර පිටකයේ දක්නට ලැබෙන මංගල, පරාභව, සිඟාලෝවාද, වසල, ධම්මික, චක්කවත්ති සීහනාද, අග්ගඤ්ඤ, කූටදන්ත, ආදී සූත්‍ර දේශනා තුළ සමාජ විද්‍යාත්මක මූලධර්ම ඇතුළත් වේ. විනය පිටකයේ සංග්‍රහ කොට ඇති පාරාජිකා, සංඝාදිසේස, අනියත ආදි විනය නීති තුළ ද නෛතික පාලනය, අපරාධ, දඬුවම් ආදි සමාජ විද්‍යා මූලධර්ම අන්තර්ගත වේ.

බුදු දහම සමාජ සම්බන්ධතා පිළිබඳ ව දක්වන ආකල්පය කෙබඳු ද යන්න තේරුම් ගැනීමට සිඟාලෝවාද සූත්‍රය වැදගත් වේ. මෙහි අන්තර් පුද්ගල සම්බන්ධතා සමස්ත සමාජ ජීවිතය සමග සම්බන්ධ කොට ඇත. යුතුකම්, වගකීම්, හා අයිතිවාසිකම් පදනම් කොටගත් සදිසා නමස්කාරය නමින් මෙම සමාජ අන්තර් සබඳතා දක්වා තිබේ.

1. දෙමාපිය - දූදරු සම්බන්ධය - නැගෙනහිර
2. ගුරු - ශිෂ්‍ය සම්බන්ධය - දකුණ
3. අඹු - සැමි සම්බන්ධය - බටහිර
4. මිත්‍ර - මිත්‍ර සම්බන්ධය - උතුර
5. ගිහි - පැවිදි සම්බන්ධය - උඩ
6. ස්වාමි - සේවක සම්බන්ධය- යට

මෙම සමාජ සම්බන්ධතා සම්බන්ධ ව සිඟාලෝවාද සූත්‍රය මෙවන්

උපමාවක් දක්වයි. කරත්ත රෝදයේ කඩ ඇණ තිබෙනා තාක් කරත්තය ගමන් කළ හැක්කේ යම් සේ ද මෙම සමාජ සම්බන්ධතා යහපත්ව පවතින තුරු සමාජය මැනවින් පවත්වාගෙන යා හැකි බව එහි දක්වයි. ඒ ඒ සමාජ කොටස්වලට අයත් යුතුකම් හා වගකීම් ඉටු කිරීමෙන් සමාජ යහපැවැත්ම තහවුරු වන බව එහි පැහැදිලිව දක්වා ඇත.

සමාජ පැවැත්ම උදෙසා සමාජ සාරධර්මවල වැදගත්කම බුදුදහම දකියි. එය **වසල, පරාභව, මංගල,** ආදී සූත්‍ර වලින් ඉස්මතුකර ඇත. **සමානාත්මතාවය, දෙමාපිය, වැඩිහිටි, ගුරු දෙගුරුන්ට සැලකීම, අපරාධ හා අපචාර කටයුතු වලින් ඉවත්වීම, නිවැරදි රැකියා කිරීම** ආදි සමාජ සාරධර්ම රැසක් පෙන්වා දෙයි. විශේෂයෙන් ම පරාභව සූත්‍රයෙන් ප්‍රතිමාන විරහිත වීම නිසා සමාජය බිඳවැටීමකට හේතුවන බව දක්වයි.

බුදු දහමේ වැදගත් සමාජ විද්‍යාත්මක සංකල්පයක් ලෙස **සමාජානුයෝජනය** (Socialization) දැක්විය හැකි ය. බෞද්ධ සාහිත්‍යයේ එන ජාතක කථා ද මේ බව මැනවින් විග්‍රහ කරයි. සත්ති කුම්භ ජාතකය තුළින් විවිධ ආශ්‍රයන් පිළිබඳ සමාජ විද්‍යාත්මක සංකල්පය ඉස්මතු කරයි. තාපසයන්ගේ ආශ්‍රය නිසා ගිරා පැටවා සංවර වීම ද සොරුන්ගේ ආශ්‍රය නිසා ගිරා පැටවා ආක්‍රමණශීලී වීම ද තුළින් ප්‍රකට වන්නේ සමාජානුයෝජන ක්‍රියාවලිය විවිධ පෞරුෂ හැඩගැස්වීමට හේතුවන බවයි.

**කෘත්‍ය වාදය** (Action Theory) ද බෞද්ධ සමාජ විද්‍යාත්මක මූලධර්මයක් ලෙස හැඳින්විය හැකි ය. ක්‍රියාවට ලබාදෙන අර්ථ කථනය අනුව බුදු දහම ක්‍රියාවේ ස්වරූපය විග්‍රහ කරයි. "චේතනාහං භික්ඛවේ කම්මං වදාමි " යන සංකල්පය තුළින් ඒ බැව් පැහැදිලි වේ. සමාජ විද්‍යාඥයන් ද සමාජ ක්‍රියාව (Social Action) අර්ථ කථනය කරනු ලබන්නේ ද ක්‍රියාකාරිකයා ක්‍රියාවට දෙන අර්ථය අනුව ය. ක්‍රියාකාරිකයා නිරතුරුව ම තම ක්‍රියාවට අර්ථය දිය යුත්තේ තමන් හා අනුන් යන (සමාජය ) සාධකය මුල්කරගෙන බව රාහුලෝවාද සූත්‍රයේ සඳහන් වේ. එයින් පැහැදිලි වන්නේ පුද්ගලයා තමා හා සමාජය සම්බන්ධ ව තීරණ ගැනීමේ දී ප්‍රතිජානාත්මක තීරණ ගත යුතු බවයි.

බෞද්ධ පංචශීල ප්‍රතිපත්තිය ද සමාජ විද්‍යාත්මක අගයකින් යුක්ත ය. එමගින් පැහැදිලි වන්නේ සමාජය විසින් වැළකිය යුතු යැයි නිර්දේශ කර ඇති නීති පහකි.

| | |
|---|---|
| 1. ප්‍රාණඝාතයෙන් වැළකීම. | - මිනිසා ඇතුළු සත්ත්ව ප්‍රජාවගේ ජීවත්වීමේ අයිතිය |
| 2. නොදුන් දෙය ගැනීමෙන් වැළකීම. | - සියල්ලන්ගේ වස්තුව, දේපළ පිළිබඳ පුද්ගල අයිතිය තහවුරු කිරීම |
| 3. කාමයෙහි වරදවා හැසිරීමෙන් වැළකීම. | - පුද්ගලයාගේ විවාහ ජීවිතය හා සමාජ සදාචාරය රැකීමේ අයිතිය |
| 4. මුසාවාදයෙන් වැළකීම. | - සත්‍යවාදී සන්නිවේදන අයිතිය |
| 5. සුරාපානයෙන් වැළකීම. | - පුද්ගල හා සමාජ සෞඛ්‍යය රැකීමේ අයිතිය |

ඉහත සඳහන් පංචශීල ප්‍රතිපත්තිය ද සමාජ පාලනය පිළිබඳ මූලධර්මයක් ලෙස ද සැලකිය හැකි ය. සමාජ පාලනය උදෙසා සමාජ සාරධර්ම පද්ධතියක් ලෙස බෞද්ධ සීලමය ප්‍රතිපත්ති ක්‍රියාත්මක වෙයි.

අනිත්‍යය සංකල්පය ද බුදුදහමේ වැදගත් සමාජ විද්‍යාත්මක මූලධර්මයකි. ''ලොව සියල්ල වෙනස් වේ '' යන අදහස එමගින් ඉස්මතු කරයි. සමාජ විද්‍යාඥයන්ට අනුව ද වෙනස්වීම පිළිගනී. බුදු දහම තමා ඇතුළු ලොව සියල්ල වෙනස් වීම සම්බන්ධ ව පෙන්වා දෙනු ලබන්නේ වෙනස්වන ලෝකය තුළ උපේක්ෂාවෙන් යුක්තව ජීවත්විය යුතු බවයි. එමෙන් ම සමාජ සදාචාරය ද රැකිය යුතු බවයි.

සමාජ ස්ථරායනය සම්බන්ධ ව බුදු දහම වැදගත් අදහසක් දක්වා ඇත. ආරෝපිත තත්ත්වය (Ascribed Status) මත පුද්ගල තත්ත්ව ගරුත්ව මිනුම් නොකළ යුතු බවයි. එනම් කුලය, ජාතිය, ස්ත්‍රී, පුරුෂ ආදි ආරෝපිත තත්ත්වයන් තුළ සමාජ ස්ථර ගත නොකළ යුතු බවයි. සාධිත තත්ත්වය (Achieved Status) මත සමාජ තත්ත්වය හා ගරුත්වය මිනුම් කළ යුතු වේ. එනම් ගුණධර්ම හා බාහිර කුසලතා වර්ධනයෙන් ලබාගන්නා දේවල් වේ.

## ක්‍රියාකාරකම් 1.1.1

01. පහත සඳහන් කෙටි ප්‍රශ්න සඳහා පිළිතුරු සපයන්න.

I. සමාජ විද්‍යාවේ පියා නම් කරන්න.

II. සමාජ විද්‍යාව හැඳින්වීමට ජෝන් ස්ටුවට් මිල් සහ එමිල් ඩර්කයිම් යන සමාජ මානව විද්‍යාඥයින් ඉදිරිපත් කොට ඇති නිර්වචන දෙක සඳහන් කරන්න.

III. ජෝර්ජ් රිට්සර් නම් සමාජ විද්‍යාඥයා දක්වන පරිදි බටහිර සමාජය වෙනස් වීමට බල පෑ සාධක තුනක් සඳහන් කරන්න.

IV. පෞරාණික කතෝලික ආගම අභියෝගයට ලක් කළ දර්ශනිකයන් දෙදෙනා කවුරුන්ද?

V " ප්‍රොතෙස්තන්ත්‍ර ආචාර ධර්ම හා ධනවාදයේ හරය " යන කෘතිය රචනා කළේ කවුරුන් විසින්ද?

VI ස්වාභාවික විද්‍යා දෙකක් සහ සමාජීය විද්‍යා (සමාජ ශාස්ත්‍ර) දෙකක් නම් කරන්න.

VII සමාජීය විද්‍යා හා සම්බන්ධ උප විෂය ක්ෂේත්‍ර තුනක් සඳහන් කරන්න.

02. බුදු දහම සමාජ සම්බන්ධතා පිළිබඳ ව දක්වන ආකල්පය සිඟාලෝවාද සූත්‍රය ඇසුරින් පැහැදිලි කරන්න.

03. සමාජ විද්‍යාව පිළිබඳ ව ප්‍රමාණවත් හැඳින්වීමක් කරන්න.

# 02 සමාජ පරිණාමය

## 2.1 සමාජ පරිණාමය වන අයුරු (සමාජ විද්‍යාඥයන්ගේ නිර්වචන ඇසුරෙන්)

සමාජ පරිණාමය නැතහොත් සමාජ වෙනස්වීම සමාජ විද්‍යා විෂය ක්ෂේත්‍රයෙහි ඉතා වැදගත් සංකල්පයක් ලෙස සැලකිය හැකි ය. සමාජය පිළිබඳව අධ්‍යයනයක් කිරීමට සිදුවන්නේ සමාජය තුළ ඇතිවන සුවිශේෂ හැසිරීම් නිසා ය. එම සුවිශේෂිත්වය ගොඩනැගෙනුයේ සමාජය වෙනස්වීමට බඳුන් වීම නැතහොත් පරිණාමයට පත්වන නිසා ය. සමාජයක් පරිණාමය වීම අත්‍යවශ්‍ය කරුණකි. සමාජයෙහි ගොඩනැගෙන අලුත් තත්ත්වයන්ට ශක්තිමත් ව මුහුණදීමට වෙනස අත්‍යවශ්‍ය වේ. පරිණාමය ඕනෑම සමාජයක නියත වශයෙන් ම සිදුවන්නකි. සමාජ විද්‍යා විෂය ආරම්භ වන්නේ මෙසේ ක්‍රම ක්‍රමයෙන් පරිණාමය වන, සංකීර්ණත්වයට පත්වන, සමාජය අධ්‍යයනය කිරීමට උත්සුක වීමේ ප්‍රතිඵලයක් වශයෙනි.

පහත දැක්වෙන්නේ සමාජ පරිණාමය පිළිබඳ ව අවධානය යොමු කළ මුල් කාලීන සමාජ විද්‍යාඥයින් කිහිප දෙනෙකි.

| | | | |
|---|---|---|---|
| 1. | ඔගස්ට් කොම්ට් | (Auguste Comte) | (1798-1857) |
| 2. | හර්බට් ස්පෙන්සර් | (Herbert Spencer) | (1820-1903) |
| 3. | එමිල් ඩුර්කයිම් | (Emile Durkheim) | (1858-1917) |
| 4. | මැක්ස් වේබර් | (Max Weber) | (1864-1920) |
| 5. | කාල් මාක්ස් | (Karl Marx) | (1818-1883) |

ප්‍රංශ ජාතික ඔගස්ට් කොම්ට් සමාජ පරිණාමය අවධි තුනක් ඔස්සේ සිදු වූ බව පෙන්වා දී ඇත. එහි ආරම්භක යුගය දේවවාදී අවධිය (Theological Stage) ලෙසත් දෙවැන්න පාරභෞතික අවධිය (Metaphysical Stage) ලෙසත් තුන්වැන්න යථානුභූත අවධිය (Positive Stage) ලෙසත් හඳුන්වයි.



1 රූපය
ඔගස්ට් කොම්ට් (Auguste Comte)
(1798-1857)

## කොම්ටගේ සමාජ පරිණාමය පිළිබඳ අදහස

**01. දේවවාදී අවධිය**

- ප්‍රාථමික ලක්ෂණ ඇති සමාජයක් තිබීම
- " සියල්ල දේව නිර්මාණයක් ය " යන අදහස හා මැවුම්කරුවකු පිළිබඳ සංකල්පයක් තිබීම
- බියමුසු ගෞරවයක් තිබීම
- විමර්ශනශීලි නොවීම

**02. පාර භෞතික අවධිය**

- ලෝකය දෙස විමර්ශනාත්මක ව බැලීමට හුරු වූ අවධිය
- දේව නිර්මාණයක්ය යන අදහසින් මිදීම
- නෛතික සම්බන්ධතා දක්නට ලැබීම
- නිෂ්පාදන අතිරික්තයක් පැවතීම
- ප්‍රශ්න කිරීමට පෙළඹීම

03. යථානුභූත අවධිය

- ලෝකය විද්‍යාත්මක ව පසක් කළ යුගය
- විශ්වාසය මත නොව දැනුම මත ක්‍රියා කිරීම
- නිර්මාණාත්මක ව අලුත් තත්ත්වයන්ට මුහුණ දෙන අවධියක් වීම

මෙය සමාජ සංවර්ධනයේ අවධි තුනක් ලෙස ද හැඳින්විය හැකි ය. දේවවාදී යුගයේ තිබුණු ප්‍රාථමික සමාජ තත්ත්වය පාරභෞතික යුගයේ දී වෙනස් වන්නට විය. විශේෂයෙන් දේව ධර්මය පිළිබඳ ඉගැන්වීම මත ඒකාකාරී ස්වරූපයෙන් පැවතුණු සමාජය මේ යුගයේ දී ආකල්පමය වෙනසකට ලක්වේ. මේ වෙනස්වීම මත නව කාර්මික නැතහොත් විද්‍යාත්මක යුගයක් කරා සමාජය පරිණාමය විය. එලෙස නිර්මාණය වූ විද්‍යාත්මක යුගය යථානුභූත යුගය ලෙස කොම්ට් විසින් හැඳින්වීය. මෙලෙස සමාජ සංවර්ධනයේ ගමන් මග පැහැදිලි කළ සංකල්පයක් ලෙස කොම්ට්ගේ ඉහත සමාජ පරිණාමීය අවධි තුන පිළිබඳ අදහස අගය කළ හැකි ය.

සමාජ පරිණාමය පිළිබඳ ව අදහස් දක්වන ප්‍රංශ ජාතික සමාජ විද්‍යාඥයෙකු වූ එමිල් ඩුර්කයිම් ප්‍රධාන යුග දෙකක් ඔස්සේ සමාජ පරිණාමය සිදු වූ බව කියයි. ඒ අනුව යාන්ත්‍රික ඒකාබද්ධතාව (Mechanical Solidarity) හා ඓන්ද්‍රිය ඒකාබද්ධතාව (Organic Solidarity) නැමැති සංකල්ප දෙකක් ඔහු හඳුන්වා දෙයි. පැරණි සමාජයේ ලක්ෂණ යාන්ත්‍රික ඒකාබද්ධතාව නමින් පැහැදිලි කළ ඔහු නූතන සමාජයේ ලක්ෂණ පැහැදිලි කළේ ඓන්ද්‍රිය ඒකාබද්ධතාව නැමැති සංකල්පයෙනි.



2 රූපය
එමිල් ඩුර්කයිම් ( Emile Durkheim )
(1858- 1917 )

## එමිල් ඩුර්කයිම් ගේ අදහස අනුව සමාජ පරිණාමය සිදු වූ ආකාරය

01. යාන්ත්‍රික ඒකාබද්ධතාව සහිත සමාජය
Mechanical Solidarity

- **නිරායාසයෙන් ගොඩනැගෙන සමාජ සම්බන්ධතා**
- සරල බව හා ඒකාකාරී බව
- පොදු අරමුණු ඇති බව
- සම්ප්‍රදයන් ඉක්මවා යාමට ඇති අකමැත්ත
- ආරෝපිත තත්ත්වයක් තිබීම
- පැහැදිලි ශ්‍රම විභජනයක් නොතිබීම
- අපි යන හැඟීමෙන් ක්‍රියා කිරීම
- සමාජ සම්බන්ධතා මගින් සමාජ පාලනයක් තිබීම

02. ඓන්ද්‍රීය ඒකාබද්ධතාව සහිත සමාජය
Organic Solidarity

- **ආයාසයෙන් ගොඩනැගෙන සමාජ සම්බන්ධතා**
- පෞද්ගලික අරමුණු ඇති බව
- සාරධර්ම පිළිබඳ සැලකිල්ල අඩුවීම
- සංකීර්ණ සමාජයක් තිබීම
- සාධිත තත්ත්වයක් තිබීම
- නෛතික සමාජ පාලනයක් තිබීම
- ශ්‍රම විභජනයක් පැවතීම


පැරණි සමාජය එකිනෙකා කෙරෙහි කෘත්‍යාත්මක ව බැඳී තිබුණි. ඒ නිසා පොදු අරමුණු තිබුණි. එම ලක්ෂණ සහිත සමාජය යාන්ත්‍රික ඒකාබද්ධතාව සහිත සමාජය ලෙස ඩුර්කයිම් විසින් හඳුන්වා දෙන ලදි. එවැනි තත්ත්වයක සිට පෞද්ගලික අරමුණු මත ක්‍රියාත්මකවන තියුණු ශ්‍රම විභජනයක් සහිත කාර්මික සමාජයක් දක්වා පරිණාමය වූ බව දක්වන ඔහු එම අලුත් සමාජය ඓන්ද්‍රීය ඒකාබද්ධතාව සහිත සමාජය ලෙස නම්කර ඇත. පැරණි යුගයේ සිට වත්මන් යුගය දක්වා සමාජය සංවර්ධනය වූ ආකාරය එමගින් ඉදිරිපත් කෙරේ.

හර්බට් ස්පෙන්සර් අවධි දෙකක් ඔස්සේ සමාජ පරිණාමය සිදු වී ඇති බව දක්වා ඇත.




3 රූපය
හර්බට් ස්පෙන්සර් ( Herbert Spencer)
( 1820 -1903 )

## ස්පෙන්සර් දක් වූ පරිණාමයේ අවධි දෙක පිළිබඳ අදහස



ස්පෙන්සර් විසින් පෙන්වාදෙන සමාජ පරිණාම සංකල්පය ඔස්සේ ද තහවුරු කරනු ලබන්නේ, සමාජය පරිණාමය තුළින් ප්‍රාථමික අවධියක සිට නූතන දියුණු සමාජ පරිසරයක් කරා වෙනස් වූ ආකාරයයි.

මැක්ස් වේබර් නම් සමාජ විද්‍යාඥයා සමාජ පරිණාමය පිළිබඳ අදහස් ඉදිරිපත් කර තිබේ. ඔහු පෙන්වා දෙන්නේ සාම්ප්‍රදායික තත්ත්වයක සිට කාර්මික තත්ත්වයක් කරා සමාජය පරිණාමය වූ බවයි. එය සිදු වූ ආකාරය ඔහු පැහැදිලි කරන්නේ ආධිපත්‍ය සංකල්පය තුළිනි. මෙම සංකල්පය ඒ ඒ යුගයේ ගොඩනැගෙන පාලන බලවේගයන් මත නිර්මාණය වන ඒවා ලෙස දැක්විය හැකි ය. ඒ අනුව ආධිපත්‍ය සංකල්ප තුනක් ඔස්සේ එම කරුණු ඔහු ඉදිරිපත් කොට ඇත.



4 රූපය
මැක්ස් වේබර් ( Max Weber )
( 1864 -1920)

01. සාම්ප්‍රදායික ආධිපත්‍ය
Traditional Authority

- ප්‍රාථමික සමාජයක් තිබේ
- පරම්පරාවෙන් බලයට පත්වන නායකයෙකු සිටී
- ආධිපත්‍යය පරම්පරාවෙන් පරම්පරාවට ගමන් කරයි

02. අනුහාසාත්මක ආධිපත්‍ය
Charismatic Authority


- ජනප්‍රිය පාලකයෙක් සිටී
- සාම්ප්‍රදායිකව පැවති සිරිත් විරිත්, සාරධර්ම බිඳ වැටේ
- අයෝමය පෞරුෂයකින් බැබළෙන නායකයෙකු සිටී

03. නෛතික ආධිපත්‍යය
Legal Authority

- නිල බල රාමුවක් මගින් පාලන කටයුතු සිදු කෙරේ
- නිශ්චිත වූත්, අපෞද්ගලික වූත් නීතිරීති පද්ධතියක් ඇත
- පිරමීඩාකාර ධූරාවලි ක්‍රමයක් දක්නට ලැබේ

සමාජය සාම්ප්‍රදායික තත්ත්වයක සිට දියුණු ධනවාදී ක්‍රමයක් කරා වර්ධනය වන ආකාරය මොහු සිය ආධිපත්‍ය සංකල්පය උපයෝගී කරගෙන පෙන්වා දෙයි. පැරණි සාම්ප්‍රදායික සමාජයේ බලය ජනප්‍රිය, ශක්තිමත්, පෞරුෂයකින් යුත් නායකයෙකු විසින් උදුරාගැනීමත් එම පාලකයාගේ බලය බිඳ වැටී නීත්‍යානුකූල ක්‍රමවත් පාලකයෙකු බිහිවීම තුළින් නිදහස් සමාජයක් නිර්මාණය වන බවත් ඔහුගේ අදහසයි.

සමාජ පරිණාමය පිළිබඳ ව අදහස් දක් වූ සමාජ විද්‍යාඥයින් අතුරින් වඩා ආර්ථිකමය සංකල්පයක් ඉදිරිපත්කර ඇත්තේ කාල් මාක්ස් බව පොදු පිළිගැනීමයි. සමාජ පරිණාමය ආර්ථික සාධක මුල්කරගෙන සිදුවන බව ඔහුගේ අදහසයි. කාල් මාක්ස් විසින් තම සමාජ පරිණාම සංකල්පය සමාජයේ පැවති යුග කිහිපයක් ඔස්සේ දක්වන ලදි.



5 රූපය
කාල් මාක්ස් ( Karl Marx )
( 1818 - 1883 )

# සමාජ පරිණාමය පිළිබඳ කාල් මාක්ස්ගේ අදහස

### 01. පූර්ව කොමියුනිස්ට් සමාජය

- දේපල පිළිබඳ පොදු අයිතියක් තිබීම.
- සාධාරණ ශ්‍රම විභජනයක් තිබීම.
- පන්ති ස්ථරායනයක් නොමැති වීම.

### 02. වහල් යුගය

- වහලා හා වහල් හිමියා වශයෙන් පන්ති දෙකක් තිබීම.
- වහලා සූරාකෑමට ලක්වීම.
- සමාජය තුළ ගැටුම් නිර්මාණය වීම.

### 03. වැඩවසම් සමාජය

- රදළයා සහ ප්‍රවේණි දසයන් වශයෙන් පන්ති දෙකක් තිබීම.
- රදලයාට සියලු දේපළවල අයිතිය ලැබීම.
- කෘෂිකර්මයට අමතරව කාර්මික නිෂ්පාදනවලට උනන්දු වීම.

### 04. ධනවාදී අවධිය

- ධනපති හා නිර්ධන වශයෙන් පන්ති දෙකක් සිටීම.
- නිෂ්පාදන සාධකවල වැඩි අයිතිය ධනපතියා සතු වීම.
- ලාභය පදනම් කරගෙන නිෂ්පාදනයන් සිදු වීම.

### 05. සමාජවාදී අවධිය

- පන්ති විරහිත වීම.
- දේපල පිළිබඳ පොදු අයිතියක් තහවුරු වීම.
- පීඩනයට පත්වීම හෝ සූරාකෑමක් නොවීම.

කාල් මාක්ස්ගේ අදහස අනුව සමාජය ආර්ථික කරුණු මුල් කරගෙන පන්ති දෙකක් අතර සිදු වූ ගැටුමක ප්‍රතිඵලයක් ලෙස විකාශනය වේ. පීඩාකාරි තත්ත්වයන්ගෙන් මිදෙමින් සමාජය යහපත් තත්ත්වයක් කරා පරිණාමය වීම ඔහුගේ අදහස් තුළින් තහවුරු වන බව පෙනේ.

සමාජයක් එහි පැවැත්මට බාධාකාරී වන තත්ත්වයන් දුරුකර ගනිමින් වඩා යහපත් තත්ත්වයක් කරා පැමිණීම සමාජ පරිණාමය තුළින් සිදුවන බව සමාජ විද්‍යාඥයන්ගේ අදහස්වලින් තහවුරු වේ. සමාජ සංවර්ධනය සඳහා පරිණාමය හෙවත් වෙනස්වීම අනිවාර්ය සාධකයක් වේ. කාල් මාක්ස් දැක් වූ පරිදි සමාජයේ යහපැවැත්ම සඳහා අත්‍යවශ්‍ය සාධකයක් ලෙස සමාජ පරිණාමය හඳුන්වා දිය හැකි ය.

## ක්‍රියාකාරකම් 2.1.1

1. සමාජ පරිණාමය සමාජයට අවශ්‍යවන්නේ කුමක් නිසා ද?
2. ප්‍රාථමික සමාජයක ලක්ෂණ හතරක් හා නූතන සමාජයක ලක්ෂණ හතරක් දක්වන්න.
3. පාර භෞතික යුගයේ සමාජයේ ස්වරූපය පිළිබඳ කෙටියෙන් විස්තර කරන්න.
4. වැඩවසම් යුගයේ ලක්ෂණ මොනවා ද?

5. පහත සඳහන් සංකල්ප පිළිබඳ කෙටි සටහන් ලියන්න.

I යථානුභූත අවධිය

II ඓන්ද්‍රීය ඒකාබද්ධතාවය සහිත සමාජය

III සමාජවාදී සමාජය

IV නෛතික ආධිපත්‍යය

## 2.2 පැරණි සමාජය නූතන සමාජය දක්වා පරිණාමය වූ ආකාරය

සමාජ පරිණාමය පිළිබඳ අදහස් දැක්වූ සෑම සමාජ විද්‍යාඥයකු විසින් ම ඉදිරිපත් කළ පොදු අදහස වූයේ පරිණාමය වීම නිසා සමාජය සරල ස්වභාවයේ සිට සංකීර්ණ තත්ත්වයකට පත්ව ඇති බව ය. පැරණි සමාජයේ පැවතුණේ නොදියුණු සරල නිෂ්පාදන ක්‍රමයකි. පුද්ගල චර්යාවන් ද සාම්ප්‍රදායික ස්වභාවයක් ගත් ඒකාකාරී ලක්ෂණවලින් යුතු ඒවා විය. එම සාම්ප්‍රදායික සමාජය තුළ පහළවන නව වෙනස්වීම්වලට හැඩගැසීමේ ක්‍රියාවලිය හේතුකොටගෙන පැරණි සමාජය ක්‍රමයෙන් පරිණාමයට ලක් වූ බව දැක්විය හැකි ය.

පැරණි සමාජය නූතන නාගරික සමාජය දක්වා පරිණාමය වූ ආකාරය සමාජයානුබද්ධ සාධක කිහිපයක් ඔස්සේ සාකච්ඡා කළ හැකි ය. ආර්ථික සාධකය ඉන් එකකි. පැරණි සමාජය සාම්ප්‍රදායික කෘෂි ආර්ථිකයකට හිමිකම් කියයි. කෘෂිකර්මය මුල්කරගත් පැරණි ආර්ථිකය ස්වයංපෝෂිත ව පැවතුණි. ගම තුළින් ම බොහෝ අවශ්‍යතා ඉටුකර ගැනීම එම ක්‍රමයේ ස්වරූපයයි. තාක්ෂණයේ නොදියුණු බව නිසා අවම යැපුම් මට්ටමක් සඳහා නිෂ්පාදනය ප්‍රමාණවත් විය. පසුකාලීනව සිදු වූ විද්‍යාවේ දියුණුවත් තාක්ෂණයේ වර්ධනයත් නිසා අතිරික්ත නිෂ්පාදනයක් ඇති වූ බව පෙන්වා දිය හැකි ය. එම ආර්ථික වර්ධනය හා සමගාමීව පුද්ගල ආකල්පවල ඇති වූ වෙනස නිසා යැපුම් ආර්ථිකය, ව්‍යාපාරික ආර්ථිකයක් බවට පරිවර්තනය විය. මහා පරිමාණ ව්‍යාපාරික කෘෂිකර්මයක් සමාජය තුළ වර්ධනය විය. මහා පරිමාණ කෘෂිකර්මය සඳහා ඉඩම් කොටුකර ගැනීමෙන් ග්‍රාමීය ප්‍රදේශවල ඉඩම් හිඟයක් ඇති විය. කෘෂිකර්මයෙන් ජීවනෝපාය සලසා ගත් විශාල පිරිසක් ඉඩම් හිඟය නිසා කෘෂිකර්මයෙන් ඈත් ව වෙනත් ජීවනෝපාය මාර්ග සොයා යාමෙන් ග්‍රාමීය ප්‍රදේශවල ශ්‍රම සංචලතාවක් සිදු විය. කෘෂි අංශයට අමතර ව භාණ්ඩ නිෂ්පාදනය කිරීමේ කර්මාන්ත අංශයක් හා බැංකු, රක්ෂණ, වෛද්‍ය, හෙද, ගුරු ආදී විශාල සේවා අංශයන් ආර්ථිකය තුළ ස්ථාපනය වන්නේ මේ ශ්‍රම සංචලතාව නිසා ය. සාම්ප්‍රදායික ගැමි ආර්ථිකය වෙනුවට කාර්මීකරණය ( Industrialization ) හේතු කොට ගෙන නාගරික ආර්ථිකයක් ගොඩනැගිණි. ඒ අනුව ආර්ථිකයේ වර්ධනයක් මෙන් ම ආර්ථිකය හැසිරෙන ස්වභාවයේ ද වෙනසක් දක්නට ලැබුණි. මින් පැහැදිලි වන්නේ ආර්ථික සාධකය ද පරිණාමය කෙරෙහි බලපා ඇති බවයි.

සමාජ පරිණාමයේ දී දේශපාලන සාධකවල බලපෑම ද වැදගත් වේ. පැරණි සමාජය තුළ වූයේ සරල පාලන ක්‍රමයකි. රජු පාලකයා වූ අතර ඔහුට විකල්පයක් නොතිබීම ද විශේෂ ලක්ෂණයක් විය. දේව නීතිය වැනි ආගමික ඉගැන්වීම් මූලික නීතියක් ලෙස සලකන ලදි. සිරිත් විරිත් වැනි සාම්ප්‍රදායික සංකල්ප සමාජ පාලනය සඳහා උපයෝගි කර ගැනිණි. රාජ්‍ය පාලනය සඳහා ජනතා සහභාගිත්වයක් නොවූ අතර ජනතාව සමග පාලකයාගේ සමීප සම්බන්ධතාවක් ද නොවී ය. නූතන දේශපාලන තත්ත්වයක් ගොඩනැගෙන්නේ ආර්ථික සංවර්ධනයේ ප්‍රතිඵලයක් වශයෙනි. පාලකයා සතු වී තිබුණු අසීමිත බලතල ප්‍රමාණයත් ඔහුගේ ක්‍රියාකලාපයත් නැගී එන නිදහස් ආර්ථිකයේ හැසිරීමට බාධාකාරී විය. පාලකයාගේ අසීමිත බලය සීමා කිරීමෙන් නව ආර්ථිකයට ගැළපෙන පාලනයක් පවත්වා ගැනීමේ අවශ්‍යතාව මත නව පාලන ප්‍රතිපත්ති හා න්‍යායන් ගොඩනැගිණි. මානව අයිතීන්ට මුල්තැන දී ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමය නිර්මාණය වන්නේ මේ අවශ්‍යතා මත ය. මහජන පරමාධිපත්‍යය, නීතියේ ආධිපත්‍යය වැනි සංකල්ප තුළින් නව පාලන ක්‍රමය ක්‍රියාත්මක විය. ඒ අනුව පැරණි සාම්ප්‍රදායික පාලන ක්‍රම වෙනුවට ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමයන් බිහි වුණි. එම නව පාලන ක්‍රමය තුළ ව්‍යවස්ථානුකූලව බලතල බෙදීම වැනි ලක්ෂණ ද විය. මෙම තත්ත්වය ධනවාදී නාගරික සමාජයට ද ගැලපුනි. එමගින් පැරණි සමාජයේ සාම්ප්‍රදායික දේශපාලන සන්දර්භය වෙනස් වී නව දේශපාලන සන්දර්භයක් ගොඩනැගිණි.

සමාජ පරිණාමය හඳුනා ගැනීමට ඇති තවත් එක් සාධකයක් වන්නේ සංස්කෘතියේ වෙනස් වීමයි. ආගම, කුලය, සිරිත් විරිත්, සම්ප්‍රදයන් ආදී කරුණු පුද්ගලයාගේ සමාජ සම්බන්ධතා තීරණය කිරීමෙහි ලා පැරණි සමාජ තුළ වැදගත් විය. පැරණි සමාජයේ පැවතියේ ආරෝපිත තත්ත්වයක් (Ascribed Status) වූ බැවින් එම තත්ත්වයෙන් ඉවත්වීම අපහසු විය. මේ නිසා සිරිත් විරිත් වැනි සම්ප්‍රදයන් ආරක්ෂා කිරීමේ ප්‍රවණතාවක් පැරණි සමාජයෙහි දක්නට ලැබිණි. අධ්‍යාපනයේ හා තාක්ෂණික දනුමේ වර්ධනයත් සමග පුද්ගලයා තුළ ඇතිවෙන විචාරාත්මක බව හේතු කොටගෙන ඇතැම් සාම්ප්‍රදයන් බිඳ වැටිණි. නව වාණිජවාදී තරඟකාරී නාගරික සමාජයට ගැලපෙන පරිදි සිරිත් විරිත් හා සම්ප්‍රදයන් වෙනස්වීමකට ලක් විය. ශ්‍රීමත් හෙන්රි මේන් (Sir Henri Maine)විසින් පෙන්වා දෙනු ලබන ආකාරයට පැරණි සමාජය පැවතියේ පුද්ගලයන්ට හිමි තත්ත්වයන් (Status) මත ය. පුද්ගලයෙකුට තම තත්ත්වය සමාජ සාම්ප්‍රදයන් මගින් පවරා දී තිබිණි. එබැවින් ඔවුහු සාම්ප්‍රදායානුකූල

ජීවිතයක් ගත කළහ. එහෙත් නූතන සමාජය පදනම් වී ඇත්තේ ගිවිසුම් මත බව ඔහු කියයි. එනම් එය ලිඛිත නීතියක් මත පවතින බවයි. පැරණි සමාජය මෙහෙය වූ සාම්ප්‍රදාය, සිරිත් විරිත් හෝ සාරධර්ම පද්ධතිය වැනි සංස්කෘතික සාධක වෙනස් වී නූතන සමාජය තුළ නීතිමය සම්බන්ධතා ඇති වූ බව පෙන්වා දිය හැකි ය. කුලය වැනි සාම්ප්‍රදායික තත්ත්වයන් මෙහි දී සැලකිල්ලක් නොලබයි. ධනය වඩා උසස් ලෙස පිළිගැනේ. මෙවැනි වෙනස්කම් මත අලුත් චර්යාධර්ම පද්ධතියක් මෙන් ම වටිනාකම් පද්ධතියක් ද නාගරික සංස්කෘතිය තුළ නිර්මාණය වේ.

සමාජ පරිණාමය පිළිබඳ විමසීමේ දී සමාජ සම්බන්ධතා ද ඉතා වැදගත් සාධකයකි. පැරණි සමාජයේ සමාජ සම්බන්ධතා ගොඩනැගී තිබුණේ ඉතා සරල ආකාරයකිනි. සාමූහිකත්වය පැරණි සමාජය තුළ දක්නට ලැබුණු වැදගත් ලක්ෂණයක් විය. සමාජ සම්බන්ධතා ද සාමූහික ලක්ෂණවලින් යුතු විය. පැරණි සමාජය තුළ '' මම '' යන සංකල්පයට වඩා '' අපි '' යන සංකල්පය මත ගොඩනැගුණු සම්බන්ධතා දක්නට ලැබුණි. මේ නිසා ම අන්‍යයන් පිළිබඳ හැඟීම, පරිත්‍යාගශීලි බව මෙන් ම පරෝපකාරය වැනි පොදු ආකල්ප ද මුල් කරගත් අන්‍යෝන්‍ය සම්බන්ධතා දක්නට ලැබිණි. පැරණි සමාජය සම ජාතීය කණ්ඩායමක් වීම නිසා ඔවුන් අතර හෘදයංගම සම්බන්ධතා දක්නට හැකි විය. පැරණි ශ්‍රී ලාංකික ගොවි සමාජයේ දක්නට ලැබුණු නැකත, කයිය, පංගුව වැනි සංකල්ප එම සමාජ සම්බන්ධතාවලට උදහරණ වශයෙන් ඉදිරිපත් කළ හැකි ය.

| | | |
|---|---|---|
| නැකත | - | සියලු දෙනා එක විට එකට වැඩ කිරීමයි. |
| කයිය | - | අත්තම් ක්‍රමය මත සාමූහික ව අන්‍යෝන්‍ය උපකාරය පෙරටු කරගෙන වැඩ කිරීමයි. |
| පංගුව | - | උත්සාහයේ ඵලය සියලු දෙනා අතර යුක්ති සහගත ලෙස බෙදා ගැනීමයි. |

කාර්මික සංවර්ධනය නිසා ඇති වූ යාන්ත්‍රිකරණයත් ලාභාපේක්ෂිත නිෂ්පාදන ක්‍රමයත් නිසා සිදු වූ සමාජ පරිණාමය ඔස්සේ නූතන කාර්මික සමාජය බිහි විය. එහි දී ආධ්‍යාත්මික සම්බන්ධතා බොහෝ සෙයින් වෙනස් වී ඇත. ඒ වෙනුවට නූතන සමාජය තුළ මූල්‍යමය හා නෛතික සම්බන්ධතා වර්ධනය වේ. සෑම නිෂ්පාදනයක් ම ලාභාපේක්ෂාවෙන් සිදු කරයි.

සෑම සේවයක් ම වැටුපක් අපේක්ෂාවෙන් සිදු කරයි. මේ නිසා පැරණි සමාජ සම්බන්ධතා තුළ වූ ආධ්‍යාත්මික ලක්ෂණ ඉවත් වී මූල්‍යමය සම්බන්ධතා ඇතිවේ. සිරිත- විරිත මෙන් ම සාරධර්ම තුළින් පාලනය වූ පැරණි සමාජයේ සම්බන්ධතා වෙනස් වී සංකීර්ණ වූ නෛතික සම්බන්ධතා රටාවක් නූතන සමාජයෙහි නිර්මාණය විය. මාපිය - දූදරු, ස්වාමි - භාර්යා, අසල්වැසි ආදි බොහෝ සම්බන්ධතා දුරස් වී ඇත්තේ මෙලෙස නීතිය මගින් පාලනය වන සමාජ සම්බන්ධතා ඇතිවීමේ ප්‍රතිඵලයක් වශයෙනි.

අධ්‍යාපනයේ වෙනස්වීම ද සමාජ පරිණාමය පෙන්වනු ලබන සාධකයකි. පැරණි සමාජයේ අධ්‍යාපනය ආර්ථික ඉලක්කයන් සහිත එකක් නොවී ය. තම පරිසරයෙන් ලබාගත් ව්‍යවහාරික දැනුමට මුල්තැන දුන් අධ්‍යාපනයක් ඉන් ලැබිණි. විශේෂයෙන් ම සමාජානුයෝජනය තුළින් තම පරිසරයට අනුගත ව ජීවත්වීමේ කුසලතාව ලැබීම අධ්‍යාපනයේ මූලික අරමුණ වූ බව සැලකිය හැකි ය.

පැරණි ලාංකික සමාජයේ කෘෂිකර්මය සහ ඉදිකිරීම් ක්ෂේත්‍රය තුළ විශේෂ වර්ධනයක් දක්නට ලැබුණේ එකල පැවති අධ්‍යාපනයෙහි ගුණාත්මක බව නිසා ය. නූතන නාගරික සමාජයෙහි අධ්‍යාපනයට සුවිශේෂී වටිනාකමක් ලැබී ඇත. එහි දී විෂයානුබද්ධ ශාස්ත්‍රීය අධ්‍යාපනයක් මෙන් ම ප්‍රායෝගික වෘත්තීය අධ්‍යාපනයක් ද අපේක්ෂා කෙරේ. පැරණි සමාජය අධ්‍යාපනයෙන් ආධ්‍යාත්මය තරණය කිරීමට වෙහෙස වූ අතර නූතන අධ්‍යාපනයෙන් විශ්වය තරණය කිරීමට වෙහෙසෙයි. නූතන සමාජය තුළ අධ්‍යාපනය මූල්‍යමය වටිනාකමක් සහිත එකකි. ඒ අනුව නූතන අධ්‍යාපනය ආර්ථික ඉලක්ක කරා ගමන් කරන උපකරණයක් ලෙස හැඳින්විය හැකි ය. අධ්‍යාපනයට නූතන සමාජයේ මූල්‍ය වටිනාකමක් ලැබීම නිසා සාරධර්මවල පරිහානියක් සිදු වී ඇත. අධ්‍යාපනයේ ඇති වූ වෙනස්කම්වල ස්වභාවය මත පැරණි සමාජය හා නූතන සමාජය වෙන්කර හඳුනාගත හැකි ය. ඒ තුළින් ද ප්‍රකට වන්නේ සමාජය ප්‍රාථමික අවස්ථාවේ සිට නූතන සමාජය දක්වා පරිණාමය වූ ආකාරයයි.

ප්‍රවාහනයේ ස්වරූපය ද සමාජ පරිණාමය පෙන්වනු ලබන තවත්

සාධකයකි. පැරණි සමාජය සීමාසහිත සම්බන්ධතා ඇති එකකි. පැරණි සමාජයේ පැවතියේ ස්වයංපෝෂිත ආර්ථිකයකි. ගමනාගමනය හෝ ප්‍රවාහනයේ දැඩි අවශ්‍යතාවයක් ද එම සමාජයට නොවී ය. නූතන සමාජයේ දැඩි ශ්‍රම විභජනයක් (Division of Labour) දක්නට ලැබේ. සමාජයෙහි අන්තර්පරායත්ත (Interdependence) බවක් දක්නට ලැබේ. වෙළෙඳපොළ අර්ථක්‍රමය මත ප්‍රවාහනය හා වෙළෙඳාම නූතන සමාජයෙහි අත්‍යාවශ්‍ය සාධකයක් විය. ප්‍රවාහනය හා ගමනාගමනය තුළින් ගම හා නගරය අතර පැවති පරතරය අඩු වී නාගරික ලක්ෂණ ගම තුළට පැමිණියේ ය. ප්‍රවාහන ක්ෂේත්‍රයේ දියුණුව නිසා සමාජය ශීඝ්‍රයෙන් වෙනස්වීමට ලක්වන ආකාරය නූතනයේ දක්නට ලැබේ.

## ක්‍රියාකාරකම් 2.2.1

1. පැරණි සමාජය නූතන සමාජය දක්වා පරිණාමය වූ ආකාරය පැහැදිලි කළ හැකි සාධක හතරක් දක්වන්න.
2. පැරණි යුගයේ අධ්‍යාපනයේ ස්වරූපය පිළිබඳ විස්තරයක් කරන්න.
3. නූතන සමාජයේ දේශපාලනය පැරණි දේශපාලන ක්‍රමයෙන් වෙනස්වන ආකාරය පිළිබඳ කරුණු පරීක්ෂා කරන්න.
4. පහත සඳහන් සංකල්ප පිළිබඳ කෙටි හැඳින්වීම් කරන්න.

   I කාර්මීකරණය

   II ශ්‍රම සංචලතාව

   III අත්තම් ක්‍රමය

5. පැරණි සමාජයේ හා නූතන සමාජවල සමාජ සම්බන්ධතා වෙනස් වී ඇති ආකාරය ගුරුතුමා සමග සාකච්ඡා කරන්න.

## 2.3 සමාජ පරිණාමය කෙරෙහි බලපාන සාධක

සමාජය පරිණාමය වීම සමාජ සංවර්ධනයත් සමග සිදුවන්නකි. ඒ සඳහා සමාජ, ආර්ථික, දේශපාලනික, මෙන් ම තාක්ෂණික සංවර්ධනය ද හේතුවේ.

සමාජ වෙනස්වීම පිළිබඳ ව අධ්‍යයනය කරනු ලැබූ සමාජ විද්‍යාඥයන්ගේ විවිධ මතවාද අනුව සමාජ සංවර්ධනය ප්‍රධාන අවධි දෙකකට ගොනුකර දැක්විය හැකි ය.

* පූර්ව කාර්මික යුගය
* කාර්මික යුගය

නූතන කාර්මික සංවර්ධනය පහළ වීමට පෙර යුගය පූර්ව කාර්මික යුගය ලෙස හඳුන්වා දිය හැකි ය. ප්‍රාථමික සරල සමාජය අයත් වූයේ මේ යුගයටයි. සිය අවශ්‍යතා ඉටුකර ගැනීම සඳහා අත් පා වැනි ශරීරාංග හෝ ප්‍රාථමික මට්ටමේ මෙවලම් භාවිතය මේ සමාජයේ දක්නට ලැබුණි. කාර්මීකරණය සමග වර්ධනය වන වත්මන් යුගය කාර්මික යුගය වේ. යාන්ත්‍රිකරණය මේ යුගයේ විශේෂ ලක්ෂණය වූ බව පෙන්වා දිය හැකි ය. පූර්ව කාර්මික යුගයේ සිට කාර්මික යුගය දක්වා සමාජය පරිණාමය වීම කෙරෙහි බලපාන මූලික සාධක තුනක් සමාජ විද්‍යාඥයන් ඉදිරිපත් කර ඇත.

1. නවීකරණය (Modernization)
2. කාර්මීකරණය (Industrialization)
3. නාගරීකරණය (Urbaniztion)

මේවා සාධක වශයෙන් වෙන් වෙන් ව දක්වා ඇති නමුත් ක්‍රියාත්මක වීමේ දී එකිනෙකට අන්‍යෝන්‍ය සහසම්බන්ධතාවක් පවතින බව අවබෝධ කරගත යුතු ය.

## නවීකරණය

පවතින සමාජය තුළ අලුත් තත්ත්වයක් ගොඩනැගීම නවීකරණ යයි. පරිණාමයට ලක්වීම නිසා සමාජයෙහි නිරන්තරයෙන් ම අලුත් තත්ත්වයන් ගොඩනැගේ. මෙලෙස නිර්මාණය වන අලුත් තත්ත්වයන්ට අනුව සමාජය හැඩගැසීමේ ක්‍රියාවලිය පැහැදිලි කෙරෙන්නේ නවීකරණය යන සංකල්පයෙනි. නවීකරණය මුලින් ම දක්නට ලැබෙන්නේ බටහිර යුරෝපීය සමාජය තුළ ය. යුරෝපීය සමාජය මුහුණ දුන් වැදගත් සාධක තුනක් නිසා එම සමාජයේ නවීකරණයක් සිදු වූ ආකාරය පෙන්වා දිය හැකි ය.

මාර්ටින් ලූතර් කිං (Martin Luthar King) විසින් කතෝලික පල්ලියේ ආධිපත්‍යයට එරෙහි ව ගෙන ගිය ආගමික ප්‍රතිසංස්කරණ ව්‍යාපාරයත් ජෝන් කැල්වින් (John Calvin) විසින් ප්‍රොතෙස්තන්ත්‍ර නිකාය ආරම්භ කිරීමත් නිසා යුරෝපීය සමාජයෙහි ආගමික ප්‍රතිසංස්කරණ ව්‍යාපාරයක් ඇති විය. ආගමික ඉගැන්වීම් මත මානසික වශයෙන් සිරකර තිබුණු සමාජය ආගමික ප්‍රතිසංස්කරණයන් හේතුවෙන් අලුත් තත්ත්වයකට පරිවර්තනය වීම නවීකරණය කෙරෙහි බල පෑ එක් සාධකයකි.


දහසයවන හා දහත්වන සියවස්වල එංගලන්තය මුල්කරගෙන සිදු වූ නව සොයාගැනීම් හා නිපදවීම හේතුකොට ගෙන කාර්මික ක්ෂේත්‍රයේ විශාල දියුණුවක් ඇති විය. විද්‍යා පුනරුදය නිසා ඇති වූ මේ තත්ත්වය කාර්මික විප්ලවය නමින් හැඳින්වේ. පුද්ගල චින්තනයේ මෙන් ම ක්‍රියාකාරීත්වයේ ද නවීකරණයක් සිදු වීම සඳහා කාර්මික විප්ලවය හේතු විය. කාර්මික විප්ලවය හේතුවෙන් එක් අතකින් පුද්ගල ක්‍රියාකාරිත්වය තුළ යාන්ත්‍රික බවක් නිර්මාණය වූ අතර සමාජ සම්බන්ධතා හා චර්යාවන්හි වෙනසක් එමගින් ඇති වූ බව පෙනේ. අලුත් ආකාරයෙන් සිතන, ක්‍රියාකරන සමාජයක් එමගින් බිහි වූ බව පෙනේ. මේ අනුව නවීකරණය සඳහා බලපෑ දෙවන සාධකය කාර්මික විප්ලවයයි.

ක්‍රි.ව. 1789 දී ප්‍රංශයේ වැඩවසම් රාජ්‍ය පාලනය බිඳ දමා ලිබරල්වාදී ධනේශ්වර පාලන ක්‍රමයක් ඇති කරගන්නා ලදි. සාම්ප්‍රදායික වැඩවසම් දේශපාලන බැඳීම්වලින් කොටු වී සිටි ජනතාව නිදහස මුල්කරගත් අලුත් දේශපාලන සංස්කෘතියකට මාරුවීම මේ හේතුවෙන් සිදු විය. සාම්ප්‍රදායික සමාජයෙන් ඉවත් වී සමාජය නවීකරණය වීම සඳහා ප්‍රංශ ආණ්ඩු විප්ලවය

හේතු වූ බව සමහර ඉතිහාසඥයන් විසින් සඳහන් කරනු ලැබේ.

මේ කරුණු තුන ඔස්සේ සිදු වූ නවීකරණය නිසා ලෝකයේ රටවල් රැසක් විශාල පරිවර්තනයකට ලක් වූ බව පෙන්වා දිය හැකි ය. මුලින් යුරෝපීය රාජ්‍යයන් ද, පසුව අන්‍ය කලාපවල රාජ්‍යයන් බොහෝ ගණනක් ද, සංවර්ධිත රාජ්‍යයන් බවට පත්වූයේ නවීකරණයට සාර්ථක ලෙස මුහුණ දුන් බැවිණි. ඌන සංවර්ධිත රටවල් ද සිය සංවර්ධන ඉලක්ක කරා ගමන් කිරීමට උත්සාහ දරන්නේ නවීකරණයේ උදව්වෙනි. පහත රූප සටහනේ දැක්වෙන ආකාරයට විවිධ අංශ ඔස්සේ නවීකරණය සමස්ත සමාජය තුළ ම ක්‍රියාත්මක වේ.

**නවීකරණයේ අංග**




## කාර්මීකරණය


දහසයවන හා දාහත්වන සියවස්වල යුරෝපීය සමාජය තුළ සිදු වූ විද්‍යාත්මක සොයාගැනීම් නිසා ඇති වූ කාර්මික විප්ලවය මුලුමහත් නිෂ්පාදන ක්‍රියාවලිය ම නවීකරණයට ලක් කළේ ය. ජේම්ස් වොට් ගේ වාෂ්ප බල යන්ත්‍රයත්, ජෝර්ජ් ස්ටීවන්සන්ගේ දුම්රිය ඇන්ජිම සොයා ගැනීමත්

නිෂ්පාදන හා ප්‍රවාහනය සම්බන්ධයෙන් අලුත් ප්‍රවණතා රැසක් ඇති කළේ ය. රෙදි විවීමේ යන්ත්‍රය, කපු කැටීමේ යන්ත්‍රය, ජල ඉසිනය ආදි යන්ත්‍ර රැසක් බිහි වීමෙන් නිෂ්පාදන ක්‍රියාවලිය තුළ කාර්මික මෙවලම් වලට වැඩි වැදගත් කමක් ලැබිණි. සරල වශයෙන් දැක්වුවහොත් නවීකරණය යනුවෙන් හඳුන්වන්නේ එම තත්ත්වයයි.

කාර්මීකරණය නිසා හස්ත කර්මාන්ත වශයෙන් පැවති ගෘහ කර්මාන්ත, මහා පරිමාණ කර්මාන්ත බවට පත් විය. කාර්මීකරණය මගින් මහා පරිමාණ කර්මාන්ත පහළ වීමත් සමග විශාල අතිරික්ත නිෂ්පාදනයක් ලැබීම නිසා දියුණු වෙළෙඳපොළ ක්‍රමයක් බිහි විණි. ඒ සමගම සාම්ප්‍රදායික ආර්ථික දැනුම හා තාක්ෂණය වෙනුවට නව ව්‍යාපාරික ඥානයක් ආදේශ විය. තරගකාරී ලෙස වෙළෙඳපොළ ආක්‍රමණය කිරීමටත්, ලාභය මත ක්‍රියාත්මක වූ වෙළෙඳපොළ ක්‍රමයක් පැවතීමත් නිසා සාම්ප්‍රදායික සමාජ ආර්ථික ක්‍රමය බිඳ වැටුණි. ඒ වෙනුවට නවීන විද්‍යාත්මක දැනුමට මුල්තැන දෙන සමාජ ක්‍රමයක් නිර්මාණය විය. මේ නිසා මානව ශිෂ්ටාචාරය වෙනස් කිරීමට කාර්මීකරණය හේතු වූ බව පෙන්වා දිය හැකි ය.

පහත රූප සටහන අධ්‍යයනය කිරීමෙන් කාර්මීකරණයේ මූලික ලක්ෂණ පිළිබඳ අවබෝධයක් ලබා ගැනීමට හැකිවෙනු ඇත.

## කාර්මීකරණයේ මූලික ලක්ෂණ



නිෂ්පාදනය ලුහු කර්මාන්තවලට පමණක් සීමා වූ පැරණි නිෂ්පාදන රටාව කාර්මීකරණයත් සමග මහා පරිමාණ නිෂ්පාදන රටාවකට පරිවර්තනය වූ ආකාරය පෙනේ. එසේ ම ශ්‍රම සූක්‍ෂම නිෂ්පාදන ක්‍රමය ප්‍රාග්ධන සූක්‍ෂම නිෂ්පාදනයක් ලෙස වර්ධනය වූ ආකාරයක් ද දක්නට ලැබේ. කාර්මික දියුණුවත් සමග ප්‍රවාහන ක්‍රමවල දියුණුවක් ඇති විය. වෙළෙඳපොළෙන් කර්මාන්ත සඳහා ශ්‍රමය ලබාගැනීම පහසුකරලීම සඳහා ප්‍රවාහන ක්‍ෂේත්‍රයේ වර්ධනය හේතු විය. අඩු පිරිවැයකින් වැඩි නිමැවුමක් ලබාගැනීමට කාර්මීකරණය නිසා හැකි වූ බැවින් උපරිම ලාභ ලැබිය හැකි නිෂ්පාදනයන් බිහි විය. එනිසා ආර්ථිකයේ තරඟකාරීත්වය ද වර්ධනය විය. කාර්මීකරණය හේතුවෙන් වැඩ බෙදගැනීම නැතහොත් ශ්‍රම විභජනය සංකීර්ණ තත්ත්වයට පත්විය. මෙලෙස කාර්මීකරණය හේතුකොටගෙන සමාජය තුළ විශාල වෙනස්වීමක් සිදු වී ඇති බව පැහැදිලි ය.


**නාගරීකරණය**

සමාජ විද්‍යාඥයන් පෙන්වා දී ඇති පරිදි සමාජ වෙනස් වීමේ තවත් ප්‍රධාන කාරකයක් වශයෙන් නාගරීකරණය හඳුන්වා දිය හැකි ය. නව නගර බිහිවීමත්, පවතින නගර සීමා වඩාත් පුළුල් වෙමින් සංකීර්ණ නගර නිර්මාණය වීමත් නාගරීකරණය නමින් හැඳින්වේ. කාර්මීකරණයේ ප්‍රතිඵලයක් ලෙස බොහෝ කාර්යයන් පහසුවෙන් හා කෙටි කාලයක් තුළ ඉටුකර ගැනීමට යාන්ත්‍රිකරණය නිසා මග පෑදිණි. එමගින් මානව ශ්‍රමයේ අවශ්‍යතාවය අතිරික්ත විය. ග්‍රාමීය ප්‍රදේශවල කෘෂිකර්මයෙහි නියැළී සිටි විශාල පිරිසකට තම ජීවනෝපාය අහිමි වූයේ මෙකී යාන්ත්‍රිකරණය නිසා ය. මෙම තත්ත්වය මත ග්‍රාමීය ප්‍රදේශවල සිටි විශාල ශ්‍රම හමුදවක් පිටතට තල්ලුකරලීමේ ප්‍රවණතාවක් දක්නට ලැබිණි. කාර්මීකරණයේ ම ප්‍රතිඵලයක් ලෙස මහා පරිමාණ කර්මාන්ත බිහි විය. ඒවායේ විශාල ශ්‍රම වෙළෙඳපොළක් ද නිර්මාණය විය. එම ශ්‍රම වෙළෙඳපොළට නව ශ්‍රමිකයන් ඇදගැනීමේ ප්‍රවණතාවක් ද ඇති වේ. මේ ප්‍රවණතා දෙක නිසා කාර්මික ප්‍රදේශවලට විශාල ජනතාවක් ඇදී ආවේ ය. මෙලෙස විශාල ජන සංඛ්‍යාවක් කේන්ද්‍රගත වීමත්, වෙළෙඳපොළ ආර්ථිකයක් බිහිවීමත්, කර්මාන්තශාලා ඇතිවීමත්, යටිතල පහසුකම් වර්ධනයවීමත් හේතුවෙන් සංකීර්ණ නාගරික ප්‍රදේශයන් නිර්මාණය විය. නාගරීකරණය ලෙස දක්වන්නේ ඒ ආකාරයෙන් සංකීර්ණ නගර බිහිවීමේ ක්‍රියාදමයයි. අද වන විට බොහෝ නාගරික ප්‍රදේශ පුළුල්වීමේ ක්‍රියාවලිය පාලනය කිරීමේ අපහසු

තත්ත්වයකට වර්ධනය වී ඇත. ශ්‍රී ලංකාවේ නගර තුළ ඇති පැල්පත් ජනාවාස, විවිධ අපචාර ක්‍රියා, වීදි දරුවන්ගේ ප්‍රශ්න, අපරාධ ක්‍රියා ආදි තත්ත්වයන් පාලනය කිරීම අපහසු වී තිබීම එයට නිදසුන් ලෙස දැක්විය හැකි ය.

පහත රූප සටහනේ නාගරීකරණය නිසා ඇති වන වෙනස් වීම් කිහිපයක් දක්වා ඇත.

**නාගරික සමාජයේ කැපී පෙනෙන ලක්ෂණ**




නාගරික ප්‍රදේශවල ජනගහනය වැඩිවීමත් ඔවුන් විවිධ සංස්කෘතික කණ්ඩායම්වලට අයත් වීමත් නිසා නාගරික ප්‍රදේශ සංකීර්ණ ස්වභාවයක් දක්වයි. අපේකම වැනි හැඟීම් ඔවුන් තුළ නැත. සම්බන්ධතා නෛතික ඒවා වේ. නගර පුළුල් වීමත් සමඟ උප නගර බිහිවීම දක්නට ලැබේ. අඩුපාඩු සහිත මුඩුක්කු නිවාස බහුල වන අතර අපචාර ක්‍රියා ද වර්ධනය වේ.

දියුණු ශ්‍රම වෙළෙඳපොළක් තිබීම නිසා රැකියා සුලභවන අතර ආදායම් මාර්ග ද බහුල වේ. පොදු පහසුකම් වර්ධනය වී ඇති බැවින් වඩා පහසු ජීවිත

ගත කිරීමේ අවස්ථාව ද ලැබේ. අධ්‍යාපනය සෞඛ්‍ය වැනි පහසුකම් ද දියුණු මට්ටමක පවතී. නාගරික ප්‍රදේශ තුළ මෙවැනි ප්‍රබලතා මෙන් ම දුබලතා ද දක්නට ලැබේ.

### ක්‍රියාකාරකම 2.3.1

1. සමාජ පරිණාමය සඳහා බලපානු ලබන සාධක තුනක් දක්වන්න.
2. නවීකරණයේ අංග හතරක් දක්වන්න.
3. කාර්මීකරණයේ ලක්ෂණ හතරක් සඳහන් කරන්න.
4. නාගරික සමාජයේ යහපත් ලක්ෂණ හා අයහපත් ලක්ෂණ ලැයිස්තුගත කරන්න.
5. නවීකරණය භික්ෂු සමාජයට බල පා ඇති ආකාරය නිදසුන් සහිතව පැහැදිලි කරන්න.

## 2.4 සමාජ පරිණාමය කෙරෙහි බුදුදහමේ බලපෑම

පරිණාමය හෙවත් වෙනස්වීම බුදුදහමින් හඳුන්වා දෙනු ලබන්නේ අනිත්‍ය සංකල්පයෙනි. ලොව ඇති ජීව අජීව සියලු දේ අනිත්‍ය ලක්ෂණයට යටත් ය. මේ අනුව පුද්ගලයා හා ඔහුගේ සම්බන්ධතා මත නිර්මාණය වන සමාජය ද වෙනස් වන බව පැහැදිලි ය. සමාජයක වෙනස්වීම ක්‍රමික විකාශනයක් මගින් සිදුවේ. සමාජය ක්‍රමිකව වෙනස්වීම මගින් සංකීර්ණත්වයට පත්වේ.

සමාජ පරිණාමය පිළිබඳ ව කරුණු විමසීමේ දී අග්ගඤ්ඤ සූත්‍රය විශේෂයෙන් වැදගත් ය. සමාජයේ ප්‍රභවය, විකාශනය, දියුණුව, හා පිරිහීම, මෙන්ම රාජ්‍යයේ පහළවීම, සමාජයෙහි බෙදීම් හා මිනිසාගේ සමාජ තත්ත්වය පිළිබඳ ව නව්‍ය අර්ථකතනයන් යථෝක්ත සූත්‍රයේ දක්නට ලැබේ. එම සූත්‍රයට අනුව ආභස්සර බ්‍රහ්ම ලෝකයෙන් පෘථිවියට පැමිණි බඹලෝ වාසීන් විසින් පෘථිවියේ රස අනුභව කරන ලදි. එම රසයට තණ්හාව ඇති කරගැනීමෙන් ඔවුන් තුළ වූ දිව්‍යමය ලක්ෂණ ඉවත් ව ගොරෝසු ශරීර ඇති වූ බව අග්ගඤ්ඤ සූත්‍රයේ සඳහන් වේ. පෘථිවි වාසීන් තුළ තණ්හාව පහළවීම නිසා හටගත් මද, මාන, රාග ආදි කෙලෙස් නිසා කර්කශ ශරීර ඇති වූවා පමණක් නොව ස්ත්‍රී පුරුෂ බව ද ඇති වූ ආකාරය දක්වේ.

සමාජ පරිණාමය හා සම්බන්ධවන ස්ථර බෙදීම බමුණු මතයට අනුව සිදු කෙරුණි. බ්‍රාහ්මණ, ක්ෂත්‍රිය, වෛශ්‍ය, ශූද්‍ර යන වර්ණයන් හෙවත් කුල හතරකට සමාජය බෙද දක්වා ඇත. බ්‍රාහ්මණ ඉගැන්වීම් වලට අනුව බමුණන් මහා බ්‍රහ්මයාගේ මුඛයෙන් ද, ක්ෂත්‍රියන් බාහුවෙන් ද, වෛශ්‍යයන් කලවා වලින් ද, ශූද්‍රයා දෙපතුල් වලින් ද උපන්නේ ය. සමාජයේ මෙවැනි කුල ඇතිවීම සඳහා හේතු වූ කරුණු පිළිබඳව විග්‍රහයක් බුදු දහමේ අඩංගු වේ. ඒ අනුව සමාජයේ වූ පස් පව් ආදි දුශ්චරිතයන්ගෙන් ඈත් ව උතුම් පිරිසිදු ජීවිතයක් ගත කළ පිරිස බමුණන් බවට පත් වූ බව දක්වේ. පුද්ගලයා කුලය අනුව බමුණකු වන බව බමුණු මතය වුව ද බුදු දහමට අනුව බමුණා ලෙස හැඳින්විය හැක්කේ උතුම් ඇවතුම් පැවතුම් ඇති අය වන බව වසල සූත්‍රයේ සඳහන් වේ.

න ජච්චා වසලො හොති
න ජච්චා හොති බ්‍රාහමණො
කම්මනා වසලො හොති
කම්මනා හොති බ්‍රාහමණො

'' කෙනෙකු උපතින් වසලයෙකු නොවන්නේ ය. උපතින් බ්‍රාහ්මණයෙකු නොවන්නේ ය. කෙනෙක් තමා කරන පව්වු ක්‍රියාවෙන් වසලයෙක් වන්නේ ය. කෙනෙක් තමා කරන යහපත් ක්‍රියාවෙන් බ්‍රාහ්මණයෙක් වන්නේ ය. ''

සමාජය තුළ වර්ධනය වූ සොරකම්, අපරාධ, ආදි වැරදි කරන්නවුන්ට දඬුවම්

කිරීම සඳහාත් එවැනි තත්ත්වයන්ගෙන් සමාජය ආරක්ෂාකර ගැනීම සඳහාත් මහජන සම්මතයෙන් පාලකයෙකු නැතහොත් රජෙකු පත්කර ගැනිණි. පාලනය කරන්නා යන අදහසින් ඛත්තිය නැතහොත් ක්ෂත්‍රිය නමින් එම කුලය හැඳින්විය. රට පාලනය කිරීමට පාලකයෙකුගේ අවශ්‍යතාව ඇති වීම ක්ෂත්‍රීය කුලය බිහිවීමට හේතුව ලෙස දැක්විය හැකි ය. කෘෂිකර්මය, කර්මාන්ත, වෙළෙඳාම ආදි රටේ වැදගත් ආර්ථික කටයුතුවල නිරත වෙමින් කාමභෝගී ගෘහීය ජීවිතයක් ගත කළ පිරිස වෛශ්‍යය නමින් හැඳින්වේ. රටේ ආර්ථික සංවර්ධනයට ඔවුන්ගෙන් විශාල දයකත්වයක් ලැබුණි. මිනී වැළලීම, කසල ඇදීම ආදි සමාජයේ පහත් යැයි සම්මත කාර්යයන් සිදුකළ ජනතාව ශුද්‍ර නමින් හැඳින්වුණු බව බෞද්ධ සාහිත්‍යයෙහි දක්වා ඇත.

මේ සමාජ කුල හතර බ්‍රහ්ම නිර්මාණයකි. එම අදහස බුදුදහමින් ප්‍රතික්ෂේප විය. උත්පත්තියෙන් නොව පුද්ගල යහපැවැත්ම මත සමාජ පන්තිය තීරණය විය යුතු බව බුදු දහම පැහැදිලි කළේ ය. ඒ අනුව ශීලය පදනම් වූ නව සමාජ පන්ති ක්‍රමයක් යෝජනා වූ අතර භික්ෂු භික්ෂුණී, උපාසක, උපාසිකා යන සිව්වනක් පිරිස චතුර්වර්ණ වෙනුවට ආදේශ විය.

කූටදන්ත සූත්‍රයට අනුව මිනිසා පංචශීලය, අෂ්ටාංගික ශීලය, දසශීලය ආදි ශීල ප්‍රතිපත්තියේ හික්මීම උතුම් ම යාගය නැතහොත් පූජාව ලෙස දක්වා ඇත. සියලු සතුන් මරා විශාල ධනයක් විනාශ කොට යාග පවත්වනවාට වඩා සිල් රැකීම ආදි ප්‍රතිපත්ති දැරීමත් යටත් පිරිසෙයින් එක් සිල්වතෙකුටවත් දන් දීමත් මහානිසංස වන බව බුදුදහමෙහි සඳහන් ඉතා වැදගත් කරුණකි. මෙවැනි ඉගැන්වීම් තුළින් සමාජයේ පැවති හිංසාකාරී සංකල්ප ඉවත් විය. එමගින් සතුන්ට පවා කරුණාව දක්වන මෛත්‍රී සහගත වාතාවරණයක් සමාජයෙහි නිර්මාණය විය. සමාජ චින්තනයේත්, ඇවතුම් පැවතුම් වලත් බුදුදහම නිසා ඇති වූ ගුණාත්මක වෙනසක් ලෙස මෙම තත්ත්වය හැඳින්විය හැකි ය.

චක්කවත්ති සීහනාද සූත්‍රයේ ඉගැන්වීම් අතර පාලකයෙකුගේ ක්‍රියාකලාපය පිළිබඳ වැදගත් කරුණු රැසක් ඉදිරිපත් විය. පාලකයා සොරුන් මර්දනය කළ යුත්තේ ආයුධවලින් නොවන බව එහි දැක්විය. ආයුධවලින් මර්දනය කළ හැක්කේ සුළු පිරිසක් කෙටි කාලයකට පමණි. ඉතිරි සොරු නැවත සංවිධානය වී සොරකම් යළි පටන් ගනිති. මේ නිසා සොරුන්ගෙන් රට මුදවාගැනීමට නම් ගොවිතැනට කැමති අයට බීජ ආදිය ද, කර්මාන්ත

කරුවන්ට අවශ්‍ය පහසුකම් ද, වෙළෙඳාමට කැමති අයට ප්‍රාග්ධනය ද දිය යුතු බව එහි දක්වේ. මෙමගින් ඉදිරිපත් කෙරෙන පොදු අදහස වන්නේ සමාජ අවශ්‍යතා හඳුනාගෙන ඒවාට පිළියම් යෙදිය යුතු ය යන්නයි. එමගින් සමාජයෙහි ධනාත්මක වෙනසක් සිදුවන බව ද පෙන්වා දිය හැකි ය.

රජු දෙවියෙකුගේ නියෝජිතයකු නොවන බවත්,මහජන එකඟත්වය නැතහොත් මහා සම්මතයෙන් බිහිවන බවත් චක්කවත්ති සීහනාද සූත්‍රයේ දක්වා ඇත. එබැවින් පාලකයාගේ වගකීම වන්නේ ජනතාව වෙනුවෙන් සේවය කිරීමයි. ඒ අනුව රට වැසියන්ගේ ද පරිසරයේ ද ආරක්ෂාව සැලසීම, රටේ සාමය පවත්වාගැනීම, සාධාරණ ආර්ථික ක්‍රමයක් ක්‍රියාත්මක කිරීම, පූජ්‍ය - පූජක දෙපක්ෂයේ ආරක්ෂාව සැලසීම හා අවවාදනුශාසනා ලබාගැනීම පාලකයා විසින් සිදුකළ යුතු කරුණු වශයෙන් බුදුදහමේ සඳහන් වේ. දස රාජ ධර්ම, සප්ත අපරිහානිය ධර්ම, දස සක්විති වත් ආදී ධර්මතා අනුගමනය කිරීම පාලකයකු සතු උසස් ගුණාංග වේ.

ඒ තුළින් ජනතාවාදී, ජනහිතකාමී පාලකයෙකු ගොඩනැගේ. පැරණි සමාජය තුළ වූ පීඩාකාරී දේශපාලනය මේ ඉගැන්වීම් නිසා වෙනස් වීමෙන් සමාජය තුළ යහපත් පරිවර්තනයක් සිදු විය.

සමාජ පරිණාමය සමාජය දියුණුව කරා යන ගමනකි. බුදුදහමට අනුව දියුණුව දෙයාකාර වේ.

1. ලෞකික දියුණුව
2. ආධ්‍යාත්මික දියුණුව

ලෞකික දියුණුව බොහෝවිට ආර්ථික දියුණුවත් සමග බැඳී පවතී. ආධ්‍යාත්මික දියුණුවෙන් තොර ලෞකික දියුණුව හබලක් නැති ඔරුවක් මෙන් අයාලේ යයි. බුදුදහම සමාජය වෙනස්වීම තුළින් සුරක්ෂිත වන ආකාරය පිළිබඳ කරුණු දක්වයි. පැරණි සමාජය තුළ කුල හීනයන් හා කාන්තාවන් දැඩි පීඩනයකට ලක්කර තිබිණි. එසේ ම බමුණන් විසින් සමාජයෙන් කොන්කර තිබුණු කාන්තාව ඉදිරියට ගෙන ඒමට බුදුදහම සමත් විය. කාන්තාවන්ට පැවිද්ද ලබාදීම, තනතුරු ලබාදීම පමණක් නොව, පුරුෂයාට

වඩා ඇතැම් තැනක කාන්තාව බුද්ධිමත් හා බහුශ්‍රැතවන බව ද දක්වා ඇත. මෙලෙස සමාජයේ පීඩාවට ලක්වූවන්ට නිදහස ලැබීම නිසා සමාජයේ විශාල වෙනසක් සිදු වූ බව පෙන්වාදිය හැකි ය. මවු පදවිය බුදු පදවියට සමාන කිරීමෙන් කාන්තාවට සමාජයේ ලැබූ තැනත් ඒ අනුව සමාජය වෙනස් වූ ආකාරයත් පැහැදිලි වේ.

මෙලොව පරලොව ජීවිතය යහපත් කරගැනීම සඳහා හේතුවන කරුණු හතරක් ව්‍යග්ගපජ්ජ සූත්‍රයේ සඳහන් වේ.

| | | | |
|---|---|---|---|
| 1. | උට්ඨාන සම්පද | - | උත්සාහයෙන් කටයුතු කිරීම. |
| 2. | ආරක්ඛ සම්පද | - | තම ධන ධාන්‍ය ආරක්ෂා කර ගැනීම මෙන් ම තමා වැරදි චර්යා වලින් වැළකී සිටීම. |
| 3. | කල්‍යාණ මිත්තතා | - | උසස් ගුණ දහම් ඇති හොඳ මිතුරන් ඇසුරු කිරීම. |
| 4. | සමජීවිකතා | - | සරල සැහැල්ලු අවිහිංසාවාදී ජීවිතයක් ගත කිරීම. |

තම ජීවිතයට මේ කරුණු හතර සම්බන්ධ කරගැනීමෙන් අනවශ්‍ය ඇලීම්, බැඳීම් හා ගැටීම් ද නැති දෙලොව ම උසස් කරගත හැකි ජීවිතයක් ලබාගත හැකි ය. මෙවැනි ලක්ෂණ ඇති සමාජය ගුණාත්මක බවින් පිරිපුන් සමාජයක් බවට පත් වේ.

සිඟාලෝවාද සූත්‍රයේ සදිසා නමස්කාරය පිළිබඳ කරුණු ක්‍රියාත්මක කිරීම විශාල සමාජ වෙනසකට හේතු වේ. යුතුකම් ඉටුකර අයිතිවාසිකම් දිනාගන්නා සමාජයක් ඇති කිරීමට ඒ තුළින් මග පැදෙයි. මහා මංගල සූත්‍රයේ මංගල කරුණු, පරාභව සූත්‍රයේ දැක්වෙන පිරිහීමට හේතුවන කරුණු, සතර සංග්‍රහ වස්තු ආදි දේශනා මගින් ද උන්නතිකාමී සමාජ පරිණාමයක් සිදු වේ.

## ක්‍රියාකාරකම් 2.4.1

1. සමාජ පරිණාමය සම්බන්ධ ඉගැන්වීම් ඇතුළත් සූත්‍ර දෙකක් නම් කරන්න.

2. සොරුන් මර්දනය කිරීම සඳහා අනුගමනය කළ යුතු යැයි බුදුදහමේ දක්වෙන ක්‍රියාමාර්ග ඔබ උගත් කරුණු ඇසුරින් පැහැදිලි කරන්න.

3. පන්සිල් රැකීමෙන් සමාජයෙහි යහපත් වෙනසක් ඇති කරගත හැකි ආකාරය දක්වන්න.

4. සාම්ප්‍රදායික කුල භේදයට එරෙහිව දක්වා ඇති බෞද්ධ ඉගැන්වීම් පැහැදිලි කරන්න.

# 03 සංස්කෘතිය

## 3.1 සංස්කෘතිය යනු කුමක් දැ යි නිර්වචන ඇසුරින් හඳුනා ගැනීම

සංස්කෘතිය (Culture) මිනිසාගේ සමාජ උරුමය වශයෙන් හැඳින්විය හැකි ය. එය පාරම්පරිකව පවත්වාගෙන එන අඛණ්ඩ සිතුවිලි සහ ආකල්ප ඊළඟ පරම්පරාවට පැවරීමයි. සමාජයක් තවත් සමාජයකින් නුත්, ජනකොට්ඨාසයක් තවත් ජනකොට්ඨාසයකිනුත් වෙන් වෙන් ව හඳුනාගත හැකි වන්නේ සංස්කෘතිය නිසා ය. අප සමාජයට අනුවර්තනය වීමේ දී අත්පත් කරගන්නා වූ දැනුම් සම්භාරය, ආකල්ප සමුදායන් සියල්ල ම අයත්වන්නේ සංස්කෘතියටයි.

සමාජ විද්‍යාඥයෝ මිනිසා සංස්කෘතික සත්ත්වයෙකු බව හඳුන්වති. ඔහු ජීවත්වන සමාජයේ පොදු හැසිරීම් රටාව අනුව තම හැසිරීම් රටාව හැඩගස්වා ගනී. මෙසේ සමාජානුයෝජනය වීම යනු සංස්කෘතික පෞරුෂය අත්පත් කරගැනීමයි. මෙම කාර්යභාරය විවිධ සමාජ සංස්ථා මගින් සිදුකරයි. පුද්ගලයකු සමාජයට අනුකලනයවීම (Integration) සංස්කෘතිය තමා වෙත පවරාගැනීම ලෙස දැක්විය හැකි ය.

සංස්කෘතිය පිළිබඳ නිර්වචන විශාල ප්‍රමාණයක් ඇත. බ්‍රිතාන්‍ය මානව විද්‍යාවේ පියා ලෙස සැලකෙන ඊ.බී. ටයිලර් (E.B. Tylor) තමාගේ '' ප්‍රාථමික සංස්කෘතිය '' (Primitive Culture) යන කෘතියෙන් සංස්කෘතිය මෙසේ නිර්වචනය කොට ඇත.

**'' සමාජයේ සාමාජිකයෙකු වශයෙන් මිනිසා විසින් අයත් කර ගන්නා වූත්, ලබා ගන්නා වූත් දැනුම, විශ්වාස කලා, සදාචාර දහම් හා වෙනත් හැකියාවන්ගේ සමස්තය සංස්කෘතිය වේ. ''**

තවත් ප්‍රකට මානව විද්‍යාඥයකු වන රැල්ෆ් ලින්ටන් (Ralph Linton) පැවසූවේ '' **මිනිසා පරම්පරාවෙන් පරම්පරාවට දායාදයක් වශයෙන් ගෙන යන ජීවන රටා සමුදාය සංස්කෘතිය යි යන්නය** ''

බ්‍රැනිස්ලෝ මැලිනොවුස්කි (Bronislaw Malinowski) නම් සමාජ මානව විද්‍යාඥයා නිර්වචනය කළේ **''මිනිසාගේ මනෝකායික අවශ්‍යතාවයන් සපුරා ගැනීමට ඇති කරගත් දෙය සංස්කෘතිය''** යනුවෙන් ය.

රේමන්ඩ් ෆර්ත් (Raymond Firth) නම් මානව විද්‍යාඥයා දැක්වූයේ **''දෙන ලද ජීවන රටාවක් ඇතුළත පුද්ගලයන් සමූහයක් සංවිධානය වී ඇති ආකාරය සංස්කෘතිය''** වන බවයි.

සංස්කෘතිය ලෝකයේ සෑම සමාජයක ම දක්නට ලැබෙන නිසා එය විශ්වීය සංකල්පයක් බව හඳුනාගත හැකි ය. සංස්කෘතිය ගැන සාකච්ඡා කිරීමේ දී නිතර යොදා ගන්නා එළඹුම් තුනක් දක්නට ලැබේ.

- සමාජ විද්‍යාත්මක එළඹුම
- මානව විද්‍යාත්මක එළඹුම
- සෞන්දර්යාත්මක එළඹුම යනුවෙන් ය.

සමාජ විද්‍යාත්මකව බලන කල මිනිසාගේ ජීවන රටාව, චින්තන ක්‍රමය ආදියෙහි එකතුව සංස්කෘතියයි. එය භෞතික සංස්කෘතිය හා අභෞතික සංස්කෘතිය යැයි දෙයාකාරයකට බෙදා දක්වයි. මානව විද්‍යාත්මක එළඹුම අනුව පිළිගනු ලබන්නේ යම් සමාජයක ජීවත්වන මිනිසුන්ගේ චර්යා රටා පිළිබඳ හැදෑරීමෙන් ඔවුන්ගේ සංස්කෘතිය අවබෝධ කරගත හැකි බවයි. සෞන්දර්යාත්මක එළඹුමට අනුව මිනිස් සමාජයක සෞන්දර්යාත්මක හෙවත් වින්දනාත්මක පක්ෂය සලකා බැලීමෙන් ද සංස්කෘතියක් අධ්‍යයනය කළ හැකි ය. ලාංකීය ජන සමාජයේ දක්නට ලැබෙන ජන කවි, නාට්‍ය, චිත්‍ර, මූර්ති, කැටයම් ආදිය ඊට නිදසුන් ය.

සංස්කෘතියෙහි ලක්ෂණ පහසුවෙන් ම හඳුනාගැනීම සඳහා එය වර්ගීකරණය කිරීමට සමාජ මානව විද්‍යාඥයින් උත්සාහ දරා තිබේ. ඒ අනුව සංස්කෘතියේ ප්‍රධාන කොටස් දෙකක් ඇත.

1. භෞතික සංස්කෘතිය (Material Culture)
2. අභෞතික සංස්කෘතිය (Non Material Culture)

භෞතික සංස්කෘතිය යන්නෙන් අදහස් කරන්නේ ඉන්ද්‍රිය ගෝචර වන්නා වූ දෘශ්‍යමාන ස්පර්ශ කළ හැකි නිෂ්පාදිතයන් ය. මිනිසා විසින් නිර්මාණය කරන ලද්ද වූ විවිධ උපකරණ, මෙවලම්, ගොඩනැගිලි සහ වෙනත් නිෂ්පාදන ආදිය ද ඊට අයත් වෙයි. අභෞතික සංස්කෘතියට අයත් වන්නේ ඉන්ද්‍රිය ගෝචර නොවන ඇදහිලි, විශ්වාස, සිරිත් විරිත්, රුචි අරුචිකම්, ජීවන පිළිවෙත්, ධර්මතා ආකල්ප සහ අගනාකම් ආදියයි. මෙවැනි සංකල්ප හඳුනාගත හැකිවන්නේ සංස්කෘතිය තුළ දීර්ඝ කාලයක් ජීවත් වෙමින්, එකට කටයුතු කරමින්, නිරීක්ෂණයට භාජනය කිරීමෙන් ය. ඕනෑම සංස්කෘතියකට මෙම භෞතික හා අභෞතික සංස්කෘතිය යන දෙ අංශයම වැදගත් වේ.

සෑම සංස්කෘතියකට ම එයට ම ආවේණික වූ අභෞතික සංස්කෘතික වටිනාකම් අන්තර්ගතව ඇත. පහත දක්වෙන්නේ එයට අදාළ සරළ නිදසුන් කිහිපයකි.

* පරිත්‍රාන දේශනා, ධර්ම දේශනා සහ බෝධි පූජා වලට අදාළ චාරිත්‍ර.
* බලි තොවිල් සහ යාතුකර්ම කිරීමේ දී අනුගමනය කරන චාරිත්‍ර
* සරණ මංගල්‍යකට පෙර පොරොන්දම් බැලීමේ චාරිත්‍රය

සංස්කෘතිය පොදුවේ ගත් කළ ප්‍රධාන සේවා තුනක් ඉටු කරයි.

01. මිනිසාට තමා අවට පරිසරය තමාට කැමති ලෙස සකස් කර හැඩ ගස්වා ගැනීමට වෙනස් කර ගැනීමට සංස්කෘතිය උපකාරීවේ.
02. මිනිසාට සමාජයේ සෙසු සමාජිකයන් හා සහයෝගී සාමූහික ජීවන රටාවක් ගෙන යාමට සංස්කෘතිය බෙහෙවින් උපකාරී වේ.
03. මිනිසාට මෙතෙක් අවශ්‍ය වූ ගුප්තමය අධි භෞතික වස්තූන් හා සිද්ධාන්තයන් පිළිබඳ නිරතුරු අධ්‍යයනයන් කිරීම මගින් සමාජයේ නව දර්ශනයන් හා චින්තාවන් ප්‍රතිෂ්ඨාපනය කිරීමෙන් සංස්කෘතිය සමාජයට සේවාවන් සිදු කරයි.

බ්‍රිතාන්‍ය මානව විද්‍යාවේ පියා වන ඊ.බී. ටයිලර් (E.B.Tylor) 1871 දී සිය Primitive Culture නම් ග්‍රන්ථයේ දක්වෙන ආකාරයට සංස්කෘතියේ වැදගත් අංග තුනක් දක්විය හැකි ය.

* සංස්කෘතිය එකවර ම පහළවන දෙයක් නොවේ. එය කලාන්තරයක් තිස්සේ හැඩගැසෙමින් සකස්වන්නකි.

* සංස්කෘතිය යනු මිනිසා විසින් ඉගෙන ගනු ලබන්නකි. තමන්ගේ පරිසරයේ ජීවත්වන කුඩා දරුවා අවට පරිසරයට අනුව ජීවත්වීමට ඉගෙන ගන්නේ සංස්කෘතිය නිසා ය.

* සංස්කෘතිය අපගේ චර්යාවන්වලට මඟපෙන්වයි. අප කවුරුත් හැසිරෙන්නේ මේ චර්යාවන් අනුව ය.

ශ්‍රී ලාංකේය බෞද්ධ සංස්කෘතිය පෝෂණය වූයේ අවුරුදු 2600 වඩා කාලයක් තිස්සේ වර්ධනය වීමෙන් ය. මෙම සංස්කෘතිය අලුතින් සමාජයට එකතුවන සාමාජිකයාට උරුමවන්නේ උපතින් නොව සංස්කෘතිය පවරා දීමෙන් ය. ඒ සඳහා විවිධ සමාජ සංස්ථා මගින් සමාජානුයෝජන ක්‍රියාවලිය සිදු කරනු ලබයි.

සත්‍ය වශයෙන් ම සංස්කෘතිය එක්තරා අන්දමක දැනීම් හා විශ්වාස මත පදනම් වූවකි. මිනිසා පරිසරය හා ගැටෙමින් අත්දැකීම් ලබා ගනී. කෘෂිකාර්මික සමාජයේ දී නගුල නිපදවූ අතර කාර්මික සමාජයේ දී සඳ තරණය කරන රොකට් නිපදවා ඇත. මෙම දැනුම ලබා ගත්තේ අත්දැකීමෙන් ය. පරිසරයට අනුව ලබාගත් දැනුම් සම්භාරය නිසා ආදී කාලීන ලාංකිකයෝ විශාල වැව් අමුණු තැනූහ. වර්ෂාපතනය නොමැති කාලයේ වැව් ජලයෙන් කෘෂිකාර්මික කටයුතු සිදු කළහ.

සංස්කෘතියක් බිහිවීමේ දී පුද්ගල අදහස් ද පොදු මතවාදයන් ද බලපායි. ලාංකීය බෞද්ධ සංස්කෘතිය බිහිවූයේ මිහිඳු මහරහතන් වහන්සේ වැඩමවීමත් සමග ය.

ශ්‍රී ලාංකේය සංස්කෘතිය තුළ දක්නට ලැබෙන සංස්කෘතික සංකේත පවා කලා රසිකත්වය මත බිහි විය. ධාන්‍යාකාර දගැබ්, බුබ්බුලාකාර දගැබ්,

මගින් නිරූපණය වූයේ ගොවිතැනත්, දිය බිඳුවේ වටිනාකමත් ය. මේ අනුව සංස්කෘතියේ ආධ්‍යාත්මික පදනම සාමාජිකයින් තෘප්තිමත් කරන බව පැහැදිලි වෙයි.

### ක්‍රියාකාරකම් 3.1.1

1. සංස්කෘතිය යන්නට සමාජ විද්‍යාඥයින් හා සමාජ මානව විද්‍යාඥයින් ඉදිරිපත් කර ඇති නිර්වචන දෙකක් දක්වන්න.

2. මානව විද්‍යාවේ පියා ලෙස සැලකෙන බ්‍රිතාන්‍ය ජාතික ඊ.බී. ටයිලර් විසින් සංස්කෘතිය යන්නට දී ඇති අදහස කුමක් ද?

3. සංස්කෘතිය යනු කුමක් ද යි පහදන්න.

4. අභෞතික සංස්කෘතිය යනුවෙන් අදහස් කරන්නේ කුමක් ද?

## 3.2 සංස්කෘතියේ දක්නට ඇති උප සංස්කෘතීන්

සංස්කෘතිය පිළිබඳ ව අධ්‍යයනයේ දී මහා සංස්කෘතිය තුළ ඇති උප සංස්කෘතීන් (Sub Cultures) පිළිබඳ ව හැදෑරීම වැදගත් වෙයි.

මහා සංස්කෘතිය යනු යම්කිසි නිශ්චිත භූගෝලීය සීමාවන් පිළිබඳ ව කරනු ලබන සංස්කෘතික විග්‍රහයකි. ප්‍රකට සමාජ විද්‍යාඥයකු වන ඇල්බට් කොහෙන් (Albert Cohen) පවසන්නේ ඕනෑම රටක විවිධ සමාජ ස්ථර අනුව උප සංස්කෘතීන් ගණනාවක් බිහිවිය හැකි බව ය.

ඔහු පෙන්වා දෙන ආකාරයට ප්‍රධාන සංස්කෘතිය තුළ ජාතික, ආගමික,

සාමාජික, ආර්ථික වශයෙන් විවිධ සමාජ ස්ථර දක්නට ලැබෙන අතර ඔවුන්ට ම සුවිශේෂී වූ ඇඟයීම් හා චර්යාවන් ද, නව අගනාකම් සමුදයක් ද විද්‍යමාන විය හැකි බව ය. ඒ අනුව ලාංකේය සමාජය විවරණය කර බැලීමේ දී පැහැදිලි වන්නේ සිංහල, දෙමළ, මුස්ලිම් ජාතිකයින් මෙහි සිටින බව ය. එමෙන් ම බෞද්ධ, හින්දු, ඉස්ලාම් සහ ක්‍රිස්තියානි ආදී බහු ආගමික ලක්ෂණයන් ද දක්නට පුළුවන. සමාජයේ ආර්ථික ස්ථරය අනුව සුපිරි ඉහළ ධනපති සමාජ පන්තිය, මධ්‍යම සමාජ පන්තිය, පහළම දිළිඳු සමාජ පන්තිය වශයෙන් වර්ගීකරණය කිරීමට පුළුවන. එසේ ම උඩරට, පහතරට, වශයෙන් ද උප සංස්කෘතීන් දක්නට පුළුවන. ඕනෑම සමාජයක බහු ජාතික සහ බහු ආගමික පදනම මත ද, සමාජ ආර්ථික පදනම මත ද, කුල ධූරාවලිය මත ද උප සංස්කෘතීන් ගණනාවක් හඳුනාගත හැකි ය. ඔවුන් ප්‍රධාන සංස්කෘතිය සමඟ නොගැටෙන අතර, ඊට අනුගත වෙමින් උප සංස්කෘතික අංග අඛණ්ඩව, විධිමත් ලෙසින් පවත්වාගෙන යනු ලැබේ.

ලෝකයේ දක්නට ලැබෙන ප්‍රධාන සංස්කෘතීන් බිහිවීමට ආගමික සංකල්ප බලපා ඇත. හින්දු ආගම මත පදනම් වූ උප සංස්කෘතිය තුළ බහු දේවවාදී ආගමික ඉගැන්වීම් දක්නට පුළුවන. ඉස්ලාම් ආගම මෙන් ම ක්‍රිස්තියානි ආගම ද ඒක දේවවාදී ය. ඔවුන් අදහන්නේ සර්ව බලධාරී දෙවියන් වහන්සේ ය. සරල සමාජයක් වන වැදි සමාජයේ සංස්කෘතිය ස්වාභාවික වස්තූන් ඇදහීම, මළ යකුන් ඇදහීම, පුද පූජා පැවැත්වීම සිදු කරයි. සෑම ආගමක් ම පොදු ලක්ෂණ හතරක් මත පදනම් වී ඇත.

* ආගමික චාරිත්‍ර විධි
* ආගමික විශ්වාස
* ආගමික සංවිධාන
* ආගමික හැඟීම්

එමගින් කිසියම් සමාජ චර්යාවකට අනුව සමාජ ඒකාබද්ධතාව පවත්වාගෙන යයි. එමිල් ඩුර්කයිම් ප්‍රකාශ කරන්නේ සමාජ සුරක්ෂිතතාව ඉන් ඇති වන බවයි. ඒ.ආර්.රැඩ්ක්ලිෆ් බ්‍රවුන්ට (A.R.Radcliffe Brown) අනුව

1. යහපත් සෞඛ්‍ය
2. දිගු කාලීන ජීවිතය

3. දරුවන් හයමග යැවීම
4. යුද්ධ ජයග්‍රහණය
5. සරුසාර අස්වැන්න
6. යහපත් තත්ත්වයක යළි ඉපදීම

ආදී ලෞකික අපේක්ෂා ලබාදීම ආගමික කෘත්‍යයක් ලෙස හැඳින්විය හැකි ය. සෑම ආගමක ම මෙන් ම පොදුවේ දක ගත හැකි ලක්ෂණ දෙකක් තිබෙන බව ද, සමාජ විද්‍යාඥයින් පෙන්වා දී ඇත.

1. විශ්වාස සහ අදහස් (Beliefs & Ideas)
2. පුදපූජා සහ යුතුකම් (Rituals & Obligation)

**හින්දු ආගමික උප සංස්කෘතිය**

ලංකාවේ හින්දු ආගම ව්‍යාප්ත වූයේ චෝල-පාණ්ඩ්‍ය-කේරළ දේශයන්ගෙන් පැමිණි අයගෙන් හා කාලිංග මාඝ වැනි ආක්‍රමණිකයන්ගෙන් ද බව චූලවංශ කතුවරයා සඳහන් කරයි. ඉන්දියාවෙන් ලැබුණු මෙම දයාදයේ දේශීය හිමිකරුවන් වන්නේ ද්‍රවිඩ ජනතාව ය. ආගමික සංයුතිය අනුව හින්දු ආගමික ලබ්දිකයින් 12.6%කි. හින්දු ආගමේ ප්‍රධාන ග්‍රන්ථ අතර භගවත් ගීතාවට වැදගත් තැනක් හිමි වේ. හින්දු ආගමික ප්‍රභේදයන් කිහිපයකි. ලංකාවේ ශිව ආගමික සම්ප්‍රදය, විෂ්ණු ආගමික සම්ප්‍රදය ප්‍රධාන වන අතර පුල්ලෙයාර්, පාර්වතී, මුරුගන්, වෛරවර් යන දෙවිවරුන් ද ඔවුහු අදහති.

හින්දු භක්තිකයෝ ජීවිතයේ දුර්භාග්‍යය සම්පන්න අවස්ථාවල දී, යාඥ කිරීම, කන්නලව් කිරීම, පඬුරු බැඳීම, දේවදානය පූජා කිරීම සිදු කරති. ඔවුන්ගේ විශ්වාසය වන්නේ ශිව දෙවියා විවිධ වේශයෙන් පැමිණ උදව් උපකාර කරන බව ය. මීට අමතර ව කෝවිලේ රැඳී සිට සත්‍යග්‍රහ කිරීමෙන් දෙවියන්ගෙන් සහනයක් අපේක්ෂා කරයි. ඉන් සහනයක් නොලැබුණහොත් දෙවියන්ට දෙස් තබයි. නැවත බැතිමතෙක් ලෙස යාඥ කරයි.

ලාංකේය සමාජයේ හින්දු ආගම ව්‍යාප්ත වීමට සාමාජීය හා ආර්ථික සාධක බලපා ඇත. කෘෂිකාර්මික ජීවිතයේ දී නිසි කලට වැසි ලබා ගැනීම,

පළිබෝධක සතුන්ගෙන් කෘෂිබෝග ආරක්ෂා කරගැනීම සඳහා වාර්ෂිකව අස්වැන්නේ නොයිඳුල් කොටස දේව දනයක් ලෙස පූජා කිරීම, දන්දීම, දේවපූජාව ජීවිතයේ ම කොටසක් කරගෙන සිටිති.

මෙම ආගමේ ද බෞද්ධ පඤ්චශීල ප්‍රතිපත්තියට සමාන ආගමික ඉගැන්වීම් දක්නට ලැබේ. ප්‍රාණඝාතය, සොරකම් කිරීම, පරදර සේවනය, මත්ද්‍රව්‍ය භාවිතය ප්‍රතික්ෂේප කිරීම තුළින් සමාජ පාලනයක් අපේක්ෂා කරයි. සමාජ මානව විද්‍යාඥයින් සමාජ පාලන කාරකයක් වශයෙන් ආගමික ඉගැන්වීම් පිළිගනිති. මහාචාර්ය සෙනරත් පරණවිතාන මහතා ප්‍රකාශ කරන පරිදි ක්‍රි.පූ. 03වන සියවසට පෙර සිට හින්දු ආගමික ඇදහිලි ලංකාවේ පැවතුණි. හින්දු සංස්කෘතියට ආවේණික වූ ආශ්‍රම ධර්ම අනුව සෑම හින්දු භක්තිකයෙකු ම වයස අවුරුදු 50ක් ගෙවී ගිය පසුව වඩාත් දෙවියන්ට සමීප විය යුතු ය.

## ක්‍රිස්තියානි උප සංස්කෘතිය

ක්‍රි.ව.1505 දී පෘතුගීසින් ලංකාවට පැමිණීමත් සමග නිල වශයෙන්, කිතු දහම ශ්‍රී ලංකාව තුළට දායාද කෙරුණ බව අපි දනිමු. ඊට පෙර කිතුනුවන් ශ්‍රී ලංකාවට පැමිණ තිබුණ නමුත්, උප සංස්කෘතියක් බිහිවීමට එතරම් බලපෑමක් ඉන් සිදු නොවිණි.

වෙළඳාම පිණිස අග්නි දිග ආසියාතික රටවල් කරා පැමිණි පෘතුගීසීහු, අහම්බෙන් ශ්‍රී ලංකාවට පැමිණියත් දේශය තුළ තිබූ කුළුබඩු හා අනෙකුත් වාණිජමයවූ දේ දැක, එය තමන්ට ලැබුණ උපරිම වාසියක් ලෙස සළකා, තමන්ටම නතුවූ දේශයක් ලෙස ශ්‍රී ලංකාව යටත් කරගන්නට පෙළඹුණාහ. භාෂාව නොදන සිටියත් තමන්ගේ ගති පැවතුම්, ආහාරපාන, සුහද සහෝදරත්වය තුළ දේශීය සමාජයට මුහු වෙමින් ක්‍රම ක්‍රමයෙන් ඔවුන්ගේ භාෂාව ඉගෙන ගත්හ.

1960 වසර වන විට මිෂනාරි ධර්මදූතයන් නැවත ඔවුන්ගේ රටවලට

හරවා යවන තුරු දූගීන්ගේ සහ රෝගීන්ගේ සුව සහනය මිෂනාරිවරුන් විසින් කොළඹ, යාපනය, මන්නාරම වැනි ප්‍රදේශ වල රෝහල් ඇති කළේ දයා සේවා යටතේ ය. මේ නිසා කිතුනු උප සංස්කෘතිය අධ්‍යාපන ක්ෂේත්‍රයට මෙන් ම සෞඛ්‍ය ක්ෂේත්‍රයට මුසු විය.

මෙසේ පෘතුගීසි ආභාෂය හේතුවෙන්, යම් යම් කිතුනු උප සංස්කෘතික අංගයන් සිංහල ද්‍රවිඩ සංස්කෘතින්ට එක් වූ බව පහත දැක්වෙන දේ මගින් හඳුනාගත හැකි ය.

* කුල භේදයේ නුසුදුසු අංග ක්‍රමයෙන් ඉවත්වීම.
* විවාහය හා සම්බන්ධ කිතුනු සිරිත ගරු කරනු ලැබීම.
* පෘතුගීසි වචන සිංහල භාෂාවට එක්වීම.
* අපරදිග ගෘහ නිර්මාණ ශිල්පය, සිත්තම් හා මූර්ති කලාව, සංගීතය ඇඳුම් පැළඳුම් මෙරට භාවිතයට පැමිණීම.
* ආගමික නාට්‍ය, ගීතිකා, කැරොල්, සමාජයට හුරු පුරුදු වීම.
* ඉරිදා විවේක දවසක් ලෙස සලකණු ලැබීම හා ඉරිදා දහම් පාසල් ඇති වීම.
* නත්තල උත්සවාකාරයෙන් පැවැත්වීම.

පෘතුගීසින් පසුව ලන්දේසීන්ගේ පාලනය යටතේ ද කිතුනු උප සංස්කෘතියේ රෝම ලන්දේසි නීතිය ද, මුද්‍රණ ශිල්පය ද උපත් විවාහ හා මරණ ලියාපදිංචි කිරීමේ කටයුතු ද දේශීය සංස්කෘතියට එක් වූ වැදගත් අංගයක් ලෙස සැලකේ. ඉංග්‍රීසි යුගය දේශීය සංස්කෘතියට ඉමහත් වෙනස්කම් සිදුකළ අතර කිතු දහමේ තවත් නිකායක් ලෙස එය උප සංස්කෘතියක් වශයෙන් ස්ථාපිතව පවතී.

## ඉස්ලාම් උප සංස්කෘතිය

මෙම ආගමේ මූලස්ථානය, නබිනායකතුමා උපන් සෞදිඅරාබියේ මක්කම යි. ලංකාවේ ඉස්ලාම් ආගම අදහන අය මුස්ලිම් ජාතිකයින්වන අතර එය 9.7% ක් පමණ වෙයි. මෙම ආගම අරාබිකරයේ සිට මෙරටට පැමිණි

වෙළෙඳුන්ගෙන් ව්‍යාප්ත වූ බව සැලකේ. ලෝකයේ මැවුම්කරුවා අල්ලා දෙවියන් වහන්සේ ය. ඒකදේවවාදී මෙම ආගමික ඉගැන්වීම් අනුව මුහම්මද් නබිනායකතුමා අල්ලා දෙවියන්ගේ දේව දූතයා බව පිළිගැනෙයි. කුරානය එක ම ආගමික ග්‍රන්ථය වන අතර එය දෙවියන් වහන්සේ අනුමත කළ ජීවන දර්ශනය අඩංගු ආගමික ග්‍රන්ථය ලෙස සැලකේ.

ඉස්ලාම් ආගමේ අනිවාර්ය වගකීම් පහකි.

* කලීමාව
අල්ලා ගැන විශ්වාස කිරීම. අල්ලාහ් එක ම දෙවියන් වහන්සේ බව පිළිගැනීම. එමෙන් ම මුහම්මද් නබිනායකතුමා අල්ලාගේ දේවදූතයා බව පිළිගැනීම ද මෙයින් අදහස් කරයි.

* සලාතය
මුස්ලිම්වරුන්ට ආගම ඇදහීමට කාලය නියම කොට දෙන ලද වගකීමකි. එය අධික පින් සහ ප්‍රතිඵල ගෙන දෙන්නකි.

* සකාතය
පොහොසත් අය දුප්පත් අයට තමා සතු දෙයින් ප්‍රදානය කරන අනිවාර්ය දන් දීමකි. පොහොසත් අය දන් දීම අල්ලාහ් විසින් අනිවාර්ය කර ඇත. එය නොදී සිටීම දඬුවම් ලැබිය යුතු වරදකි.

* රමළාන්
අල්ලාහ්ගේ ග්‍රන්ථය වූ අල්කුර්ආනය පහළ වූයේ රමළාන් මාසයේ ය. මෙම මාසයේ සව්ම් හෙවත් උපවාස ශීලය ඉටු කිරීම අනිවාර්ය යි. ඉස්ලාමීය දින දර්ශනයට අනුව රමළාන් මාසය එහි නව වන මාසය වේ.

05. හජ් වන්දනාව ( සෞදි අරාබියේ මක්කම වන්දනාව )
ඉස්ලාමයේ අනිවාර්ය වගකීම් පහෙන් හජ් වන්දනාවට පස්වන ස්ථානය හිමි වෙයි. නිසි වයස එළඹි බුද්ධිමත්, නිදහස් ගමන්වල යෙදීමේ ශක්තිය ඇති, ප්‍රමාණවත් මුදල් හැකියාව ඇති, සෑම මුස්ලිම්වරයෙකුහටම හජ් වන්දනාව අනිවාර්ය වගකීමක්

වන්නේ ය. තම ජීවිත කාලය තුළ එක් වතාවක්වත් හජ් වන්දනාවේ යෙදීම අවශ්‍ය වේ.

මෙම ආගමික ඉගැන්වීම් අනුව ඉස්ලාම් ලබ්දිකයන් සමගි ව එකට කටයුතු කරන අතර පන්ති භේද, වර්ණ භේද නොසළකයි. මානව සමාජයේ සෞභාග්‍යය ඇති කිරීම සඳහා අවශ්‍ය භවභෝග සම්පත් උපයාගත යුතු බවත්, ආත්ම තෘප්තිය සඳහා යුක්තිගරුකව, සාමකාමීව කටයුතු කළ යුතු බවත් කුරාණයේ ඉගැන්වේ. පින් පව් විශ්වාස කෙරෙන අතර තමාගේ සිත, කය, වචනය යහපත් කර ගැනීමෙන් ස්වර්ගය හිමිවන අතර පසිඳුරන් වැරදි ලෙස පිනවීමෙන් අපාගත වන බවත් ඉස්ලාම් ධර්මයේ ඉගැන්වෙයි.

දානමාන පින්කම් කිරීම, දෙවියන් නැමදීම සහ උපවාස කිරීම කළ යුත්තේ ලාභ අපේක්ෂාවෙන් නොව අල්ලා දෙවියන් වහන්සේගේ ශ්‍රී නාමය සිතාගෙන ම බව ඉගැන්වේ.

ඉස්ලාම් ධර්මය අනුව කෙනෙකු මිය ගොස් ශරීර උෂ්ණත්වය අවසන්වීමට පෙර වළ දැමිය යුතු ය. වර්තමානයේ එය පැය විසිහතරක් ඇතුළත සිදු කළ යුතු ය.

ඉස්ලාම් උප සංස්කෘතිය තුළ අනන්‍ය ලක්ෂණයක් ලෙස අරාබි භාෂාව ආගමික භාෂාව ලෙස භාවිත වීම දක්විය හැකි ය. එමෙන් ම ආවේණික වූ ආහාර රටා , විවාහ චාරිත්‍ර, ඇඳුම් පැළඳුම්, ඇදහිලි ආදිය ද පවතී. විශේෂයෙන් ඉස්ලාම් සංස්කෘතිය රූප වන්දනාව බැහැර කරයි.

ලංකාවේ මහ සංස්කෘතිය තුළ බෙදී ගිය උප සංස්කෘතීන් දක්නට ලැබෙන අතර ආවේණික සිතුම් පැතුම්, භාෂාව, සංකේත, වචන උච්චාරණය ඔවුන්ගේ සාමාජිකයින් අතර පමණක් වලංගු වෙයි. භික්ෂු සංස්කෘතියට අනන්‍ය වූ වචන ශාසනික සම්ප්‍රදය තුළ අඛණ්ඩ ව පවත්වා ගෙන යයි. වැදි සංස්කෘතියට සීමා වූ ඥාති පද මාලාව, ඇඳුම් පැලඳුම්, ජීවන වෘත්තිය, විශේෂිත සංස්කෘතික උපකරණ ඇත. මළ යකුන් පිදීම, කිරිකොරහා වැනි යාතුකර්ම දක්නට පුළුවන.

මෙම උප සංස්කෘතීන්ට ආවේණික සංස්කෘතික ලක්ෂණ අඛණ්ඩ ව පවත්වා ගෙන යයි. සංස්කෘතික විසරණයට (Cultural Diffusion) නිරන්තරයෙන් ම ලක්වෙන නිසා උප සංස්කෘතික ලක්ෂණ ද වෙනස් වෙමින් පවතී.

**ක්‍රියාකාරකම 3.2.1**

1. මහා සංස්කෘතියක් යනුවෙන් හඳුන්වන්නේ කුමක් ද යි කෙටියෙන් පැහැදිලි කරන්න.
2. ශ්‍රී ලාංකීය බහු වාර්ගික සමාජයේ ප්‍රධාන උප සංස්කෘතීන් තුනක් නම් කරන්න.
3. හින්දු සංස්කෘතියට අදාළ මූලික ලක්ෂණ පිළිබඳ කෙටි විස්තරයක් කරන්න.
4. පැවිදි උප සංස්කෘතියට ආවේණික වචන එකතු කරන්න. ඒවායේ සරල තේරුම දක්වන්න.

## 3.3 සමාජය පවත්වා ගැනීමෙහි ලා සංස්කෘතියේ බලපෑම

මිනිසා ස්වභාවයෙන් ම සාමූහික ජීවන ශෛලියකින් සමලංකෘත ප්‍රගතිශීලි සත්ත්වයෙකි. එමනිසා සමාජ අන්තර් සම්බන්ධතා පවත්වා ගෙනයාමේ දී උපතින් ම උරුම වූ සහජ ලැදියාවන් අනුව ක්‍රියාකරයි. පුද්ගල අවශ්‍යතා ඉටුකර ගන්නේ සාමූහික පොදු සම්මුතියකට අනුරූප ව ක්‍රියා කිරීමෙන් ය.

එමෙන් ම සමාජ පැවැත්ම සඳහා සංස්කෘතිය අවශ්‍ය වෙයි. සංස්කෘතියේ පැවැත්ම සඳහා භාෂාවක් අවශ්‍ය වෙයි. භාෂාවක් පවත්වා ගෙන යාමේ හැකියාව හා කතා කිරීමේ හැකියාව මෙන් ම සංස්කෘතික චර්යාවන් අඛණ්ඩව සමාජය වෙත ගෙන යාමේ කුසලතාව ඇත්තේ මානවයා සත්ත්වයා සතුව පමණි.

මානව වර්ගයා ශිෂ්ටාචාරගත වීමේ දී විවිධ වූ විෂම වූ භූගෝලීය සාධක මෙන් ම පාරිසරික සාධක ජයගනිමින් දෛනික ජීවන චර්යාව තහවුරු කර ගත්තේ ය. සිය මූලික අවශ්‍යතාවන් සපුරා ගැනීමෙන් පසු ද්විතීයික ඕනෑ එපාකම් වන්නේ අධ්‍යාපනික, ආගමික සහ සංස්කෘතික අවශ්‍යතාවන් ය. මෙම සමාජීය අවශ්‍යතා ඉතා වැදගත් වෙයි. මෙහි දී ප්‍රධාන වන්නේ සමාජ ධර්මතා, සමාජ ඇගයීම් හා සමාජ අපේක්ෂාවන් සම්පූර්ණ කිරීම ය.

මානව සමාජය සත්ත්ව සමාජයෙන් බෙදා වෙන් කරන ප්‍රධානතම සීමා මායිම් වන්නේ සංස්කෘතියයි. නීතිගරුක බව, වැඩිහිටියන් රැක බලා ගැනීම, දරුවන්ට රැකවරණය දීම වැනි සේවාවන් සමාජ ධර්මතා ලෙස පිළිගැනේ. ඒවා සංස්කෘතික උරුමයක් ලෙස ද අඛණ්ඩව පවත්වා ගෙන යයි. මෙය පරපුරින් පරපුරට උරුමකර දෙන්නේ සමාජානුයෝජන කාර්යය ඔස්සේ ය. අලුත උපන් සාමාජිකයා විසින් අභ්‍යන්තරීකරණය කරගනු ලබන සමාජ චර්යාවන් සමාජ සම්මතයන්ට එකඟ වූ විට ඔහු සංස්කෘතික සත්ත්වයෙකු බව හඳුනා ගනියි. මිනිසා උපත ලබන්නේත්, අධ්‍යාපනය ලබන්නේත්, ජීවත්වන්නේත්, මිය යන්නේත් සංස්කෘතික පරිසරය ඇසුරුකර ගනිමින් ය. මිනිසා සිදුකරන සමාජීය ක්‍රියා පිටුපසින් ඇති බලවේගය සංස්කෘතියයි.

සතුන්ට මෙන් මිනිසාට සෘජු හැඟීම් මුදාහැරිය නොහැකි අතර තමාගේ අවශ්‍යතා සමාජ අගනාකම්වලට අනුගතව සම්පූර්ණකර ගැනීමට සිදුවෙයි. සංස්කෘතිය නිසා සමාජය ආරක්ෂා වෙයි. සමාජය පාලනය වෙයි. පුද්ගලයා සමාජයට අනුවර්තනය වීමේ කුසලතාව ලබාගැනීම සංස්කෘතිය තමා වෙත පවරා ගැනීම යනුවෙන් ද සඳහන් කළ හැකි ය. සමාජ නියමයන් තීරණය කර ඇත්තේ ද සංස්කෘතියයි.

ඊ.බී. ටයිලර් පෙන්වා දුන් ආකාරයට මිනිසා සමාජයේ සමාජිකයෙකු වශයෙන් ලබාගන්නා වූ දැනුම, විශ්වාසය, සදාචාරය, නීතිය, සිරිත් විරිත් යනාදි අගනාකම් ඔහු වෙත ළඟාකර ගන්නේ කාලාන්තරයක් තිස්සේ අඛණ්ඩව හැඩගැසීමෙන් ය. එසේ ම උපතින් ම කිසිවෙකුට සමාජ අගයන් උරුම නොවන අතර ඕනෑම කෙනෙක් සංස්කෘතිය මගින් සමාජීය අගයන් තමා වෙත පවරාගැනීම සිදුකරයි. සංස්කෘතිය විසින් සමාජ හැසිරීම්වලට මඟ පෙන්වයි. මංගල අවමංගල කටයුත්තක දී හෝ ආගමික කටයුත්තක දී එම ස්ථානයේ හැසිරිය යුතු ආකාරය පිළිබඳව මඟ පෙන්වීම කරන්නේ සංස්කෘතිය විසින් බව පැහැදිලි කරුණකි.

ඕනෑම පුද්ගලයෙකුගේ පෞරුෂත්ව ගති ලක්ෂණ ගොඩනැගී ඇත්තේ කුඩා කාලයේ සිට සමාජානුයෝජනය වූ සමාජ සංස්කෘතිය අනුව ය. සෑම සමාජයක් ම තම සමාජ පැවැත්ම සඳහා සංස්කෘතික අගනාකම් කුඩා කාලයේ දී ම ක්‍රමානුකූලව පවරා දීමක් සිදුකරන බව පෙන්නුම් කර ඇත. එසේ ම සමාජ අවශ්‍යතා මත ගොඩනැගි ඇති සංස්කෘතීන් තේරුම් ගැනීම වැදගත් ය. නව සංස්කෘතියට අනුකලනය වීමේ හැකියාව මත සංස්කෘතික කම්පනයක් පුද්ගලයාට ඇති නොවේ.

ඉන්දියාවෙන් ලැබුණු බෞද්ධ හා හින්දු බලපෑම් ද යටත් විජිතකරණයේ බලපෑම් ද ලාංකීය සමාජය වෙනස් කිරීමට හේතු වූ බව පැහැදිලි ය. වර්තමානයේ භාවිතවන ඇඳුම්-පැලඳුම්, ආහාර-පාන, බෙහෙත්-හේත් එහි ප්‍රතිඵල ලෙස පෙනේ.

සංස්කෘතික ලක්ෂණ වෙනස්වීම එකවරම සිදුවන්නේ නැත. එය අනුක්‍රමයෙන් සිදු වේ. විදේශ බලපෑම් නිසා සිදුවන වෙනස්වීම් පළමුව නාගරික ඉහළ සමාජ ස්ථරය වැළඳ ගනී. පසුව එය මධ්‍යම පන්තිය හා සමාජ පහළ පන්තිය ද අවසානයේ ගැමි සමාජය දක්වා ද ව්‍යාප්ත වෙයි.

එමෙන් ම සමාජය පවත්වාගෙන යාමට සංස්කෘතිය තුළ දණ්ඩනය මෙන් ම අනුමැතිය ද අවශ්‍ය වේ. මෙමගින් සමාජ පැවැත්මට එරෙහිවන චර්යාවන් පාලනය කරයි. අනෙක් අතට සමාජයට හිතකර සමාජ හැසිරීම් ආරක්ෂා කරයි. දණ්ඩනය හා අනුමැතිය යන දෙවර්ගය ම සමාජ ජීවිතය තුළ ප්‍රකට වෙයි. ඊ.බී. ටයිලර් පෙන්වා දෙන්නේ සමාජ අවශ්‍යතා අනුව නම්‍යශීලි වීමේ ගුණය සංස්කෘතිය සතුවන බව ය.

එමෙන් ම ආවෘත සංස්කෘතිය (Implicit Culture) ඇදහිලි හා විශ්වාසයන් මත පදනම් වෙයි. විවෘත සංස්කෘතිය (Explicit Culture) යනුවෙන් අදහස් කරන්නේ බාහිර ව දක්නට ලැබෙන තත්ත්වයන් ය. ලංකාවේ ජාතික ආගමික වශයෙන් පවතින බෙදීම් විවෘත සංස්කෘතික ලක්‍ෂණයි. ඉන්දියාවේ කුලභේදය ද එහි විවෘත ලක්‍ෂණයකි.

මෙම ආවෘත හෙවත් වැසුණු ස්වභාවය තේරුම් ගැනීමට අවශ්‍ය කාරණා කිහිපයකි. එනම්,

* අදහස්
* ඇදහිලි
* ආකල්ප
* විශ්වාස
* සාරධර්ම

යනාදිය ඒ අතර වැදගත් වේ.

ආවෘත සංස්කෘතිය සමාජයක අභ්‍යන්තරයේ ඇති සංස්කෘතික ලක්ෂණයකි. එය විවෘත සංස්කෘතික ලක්ෂණ මෙන් එක්වරම දැකගත නොහැකි ය.

මේ අනුව සමාජය හැඩ ගැස්වීමේ හා පවත්වාගෙන යාමේ දී බලවත්ම සාධකය ලෙස සංස්කෘතිය දැක්විය හැකි ය. සංස්කෘතිය වෙනස්වීම යනු පුද්ගලයා නව සමාජයකට සමාජානුයෝජනය කිරීමට හේතුවක් ලෙස දැක්විය හැකි ය.

## ක්‍රියාකාරකම් 3.3.1

1. ආවෘත සංස්කෘතිය යනු කුමක්ද?

2. සංස්කෘතිය පවත්වා ගැනීමට සමාජය තුළ ක්‍රියාත්මක යාන්ත්‍රණය පැහැදිලි කරන්න.

3. සංස්කෘතිය අනුගත නොවීමේ දී සමාජය එයට දක්වන ප්‍රතිචාරය කෙබඳුවේදැයි දක්වන්න.

## 3.4 ලාංකික සංස්කෘතිය කෙරේ ඇති වූ විදේශීය බලපෑම (ඉන්දීය හා යටත්විජිත යුගයේ බලපෑම)

සංස්කෘතිය ක්‍රියාකාරී සමාජයකට අයත් වූවක් වන බැවින් වරින්වර එම සමාජය තුළට පිවිසෙන බලපෑම් නිසා නිරන්තර වෙනස්වීම් වලට භාජනය වේ. ගඟක් පහළට ගලා යන විට එහි ජල ප්‍රවාහයට විවිධ අතු ගංගා හා දිය දහරා එකතුවීමෙන් ගඟ දිය මොහොතින් මොහොත අලුත් වන්නාක් මෙන් සමාජ සංස්කෘතිය තුළට නිරන්තරයෙන් පිවිසෙන විවිධ සංස්කෘතික ප්‍රවාහයන් නිසා සමාජ සංස්කෘතිය නිරතුරුව ම වෙනස් වේ. ඒ වටා ගොඩනැගෙන සමාජ සාම්ප්‍රදායන් ද ඊට අනුව වෙනසකට භාජනය වේ. මෙය සංස්කෘතියේ නවීකරණය ලෙස සමාජ විද්‍යාත්මකව හැඳින්වේ.

### ලාංකේය සමාජය කෙරෙහි ඉන්දීය බලපෑම

ශ්‍රී ලංකාවේ සමාජ සංස්කෘතිය පිළිබඳ තොරතුරු මගින් අතීත සමාජ සංස්කෘතික ක්‍රියාදමයන් හඳුන්වා දෙයි. පුරාවිද්‍යාත්මක සාධක හා භූ විද්‍යාත්මක පර්යේෂණයන්ට අනුව ශ්‍රී ලංකාව හා ඉන්දියාව අතර සම්බන්ධතා පැවති බව සනාථ වේ. මේ බව තවදුරටත් සනාථ කිරීම සඳහා ප්‍රමාණවත් සාක්ෂි පාහියන් සහ හියුංසියැං වැනි චීන ජාතික දේශ ගවේශකයන්ගේ වාර්තාවල ද සඳහන් වේ. එම වාර්තා වලට අනුව ලංකාව හෝ ඉන්දියාව අතර යමෙකුට පා ගමනින් යා හැකි නොගැඹුරු මුහුදු තීරයක් තිබී ඇත. වර්තමානයේ දෙරට අතර ඇති පටු ස්ථානයේ පරතරය කිලෝමීටර තිස් දෙකක් පමණ වේ.

මෙලෙස ඉන්දියාවට සමීප වීම හේතුකොට ගෙන ඈත අතීතයේ පටන් විවිධ සමාජ හා සංස්කෘතික බලපෑම් ඇති වී තිබේ. ඒ අනුව ආගම, සාහිත්‍යය, කලා ශිල්ප, ගෘහ නිර්මාණය, කෘෂි අර්ථක්‍රමය සහ කුල ක්‍රමය වැනි බොහෝ දේ ඉන්දියාවේ බලපෑමෙන් ලංකාවට උරුම වී ඇත. ඓතිහාසික වාර්තාවලට අනුව ශ්‍රී ලංකාවේ මුල් ම ජනාවාස පිහිට වූ සාමාජිකයන් මෙරටට සංක්‍රමණය වූ ආර්ය වර්ගයා බවට සාක්ෂි ලැබී ඇත. මහාවංශය සඳහන් කරන ආකාරයට බටහිර දෙසින් දදුරු ඔයේ සිට දකුණු දෙසින් වලවේ ගඟ දක්වා වූ මහාතැන්න සිසාරා දිවෙන ගංගා නිම්න ඇසුරු කරගෙන මෙම ශිෂ්ටාචාරය බිහි විය. එම ශිෂ්ටාචාරය මත බිහි වූ සංස්කෘතිය කෙරෙහි තවදුරටත් ඉන්දීය සමාජයේ බලපෑම ඇති විය.

ක්‍රි.පූ. 05 වන සියවසේ සිදු වූ විජයාගමනයත් සමඟ රාජාභිෂේකය සඳහා මධුරා පුරයෙන් ක්ෂත්‍රිය කන්‍යාවක් එවූ බව මහාවංශයේ සඳහන් වේ. ඒ සමඟ තවත් ශිල්පීය කුල දහඅටකට අයත් පිරිසක් පැමිණියහ. රට සංවර්ධනය කිරීමට හා රාජ්‍යත්වය තහවුරු කරගැනීමට සිය මව් රටින් සහයෝගය ලැබුණි. සමුද්‍රාසන්නයේ වෙළෙඳ කටයුතු සඳහා තම්මැන්නා නුවර සංවර්ධනය කළේ ය. රජුගේ ඇමතිවරුන්වන විජිත ඇමතියා විසින් විජිත නගරය ද, උරුවේල ඇමතියා විසින් උරුවෙල නගරය ද, අනුරාධ ඇමතියා විසින් අනුරාධ නගරය ද ඉදි කළ බව දීපවංශය විස්තර කරයි.

එසේ ම පඬුවස්දෙව් රජුගේ අභිෂේකය සඳහා භද්දකච්චානා සමඟ ඇයගේ සොහොයුරන් වූ අනුරාධ, උපතිස්ස, විජිත, රාම, දීඝායු, සහ රෝහණ යන අය පැමිණි අතර රෝහණ කුමරු විසින් රුහුණ නමින් හැඳින්වෙන නගරය ගොඩනඟන ලදී. පණ්ඩුකාභය රජතුමා වාපී සභ්‍යත්වයට මෙන් ම අනුරාධපුර නගර නිර්මාණයද ක්‍රමාණුකූල සැලැස්මක් අනුව සංවර්ධනය කළේ ය. මෙකල කන්න තුනක් ගොවිතැන් කළ බව **තෝණිගල සෙල්ලිපියෙහි** විස්තර වෙයි.

ඉපැරණි ලංකා සමාජයේ මීළඟ වැදගත් සිදුවීම ක්‍රි.පූ. 03වන සියවසේ දී ආරම්භ විය. එනම් අශෝක අධිරාජයාගේ අනුග්‍රහයෙන් දේවානම්පියතිස්ස රජු දවස ශ්‍රී ලංකාවට බුදු සසුන පැමිණීමයි. ස්වාධීන රාජ්‍යයක් ලෙස මෙරට ආර්ථික හා ආධ්‍යාත්මික වශයෙන් සංවර්ධනයට පත්වූයේ බුදුදහම පැමිණීමෙන් ගැනීමෙන් පසුව ය.

මහින්දගමනය නිසා ධාර්මික හා ස්ථාවර බෞද්ධ රාජ්‍යයක් බිහිවූ අතර රට සංවර්ධනය කිරීමේ කාර්මික ඥානය ශ්‍රී මහා බෝධි ආගමනයත් සමඟ දහ අටක් ශිල්ප කුල ජනයාගේ පැමිණීම සිදුවිය. එතැන් සිට ලංකා සමාජය ශ්‍රේණි දහඅටකට වර්ගීකරණය විය. සෑම කුල ශ්‍රේණියකට ම කිසියම් සමාජමය කෘත්‍යයක් පැවරිණි. ශ්‍රී ලංකා සමාජය ස්වයංපෝෂිත වූයේ අවුල් වියවුල් වලින් තොර ව නිෂ්පාදන හා සේවා කාර්යයන් ගෙන් යුතු සමාජ සංවිධාන ගොඩනැගුණ බැවිනි. කේ.විට්ෆෝගල් නම් සමාජ විද්‍යාඥයාට අනුව මහ රටක් ආසන්නයේ තිබෙන කුඩා රටක සංස්කෘතියේ ප්‍රධාන ලක්ෂණ දෙකක් දක්නට ලැබේ.

01. කුඩා සංස්කෘතිය මහා සංස්කෘතිය විසින් ග්‍රහණය කරගනු ලැබීම.

02. කුඩා සංස්කෘතියේ අතළොස්සක් දක්නට ලැබීම.

ශතවර්ෂ 15කට අධික කාලයක් සිංහල සංස්කෘතියේ ජීවන වෘත්තිය වූයේ කෘෂි කර්මාන්ත යයි. ආර්යයන් විසින් හඳුන්වා දෙනු ලැබූ කෘෂි කර්මාන්තයට වාපි තාක්ෂණය හා ජල සංරක්ෂණය පසුකාලීනව යොදා ගන්නා ලදී. අනුරාධපුරය හා පොළොන්නරුව රාජධානි කේන්ද්‍ර කරගත් මෙම වාරි ශිෂ්ටාචාරය ලොව අන් කිසිදු රටක දක්නට නොමැති බව කේ.විට්ෆෝගල් නැමැති සමාජ විද්‍යාඥයා තවදුරටත් පෙන්වා දෙයි. මහාචාර්ය ලෙස්ලි ගුණවර්ධන මහතා පවසන පරිදි මෙම වාරි සභ්‍යත්වය ඉතා විධිමත් සියුම් පරිපාලන ක්‍රම මගින් පවත්වාගෙන යන ලදී.

ක්‍රි.ව. 10 වන සියවසේ දී ලංකා සමාජයේ තවත් වෙනස්වීම් රැසක ආරම්භය සිදුවිය. ප්‍රධානතම සාධකය වූයේ දකුණු ඉන්දීය ආක්‍රමණයයි. චෝල, පාණ්ඩ්‍ය, කේරල සහ පල්ලව ආදීන්ගේ ආක්‍රමණ තුළ ප්‍රධාන අරමුණු දෙකක් තිබිණි.

එම අරමුණු නම්,

01. දේශපාලන බලය ස්ථාපිත කරගැනීම.

02. තම ආගමික සංකල්ප ලංකා සමාජයේ ස්ථාපිත කිරීම.

පොළොන්නරු යුගයේ ඇති වූ හින්දු ශිව ආගමේ බලපෑම කෝට්ටේ යුගය වන විට බෞද්ධ ආගමික මධ්‍යස්ථාන දක්වා ව්‍යාප්ත විය. බෞද්ධයා දෙවියන් යදින්නෙකු බවට පත්විය. ඒ අතර කතරගම, විෂ්ණු සහ ගණ යන දෙවිවරු කැපී පෙනෙන මට්ටමට පත්විය.

එමෙන් ම ශ්‍රී ලාංකිකයන්ගේ ජන සංස්කෘතියට දකුණු ඉන්දීය සංස්කෘතියෙන් ලද ආභාෂය පහත සඳහන් නිදසුන් වලින් පැහැදිලි වේ.

උදහරණ:

- කාන්තා ඇඳුම සාරිය ලෙස පිළිගැනීම
- විවාහයක දී ස්ත්‍රිය පුරුෂයාට වඩා උසින් අඩුවීම
- විවාහයක දී ස්ත්‍රිය පුරුෂයාට වඩා වයසින් අඩුවීම
- හස්ත ශාස්ත්‍ර කීමේ දී ස්ත්‍රියගේ වම් අත බැලීම
- විවාහයේ දී හින්දු ආගමික ස්තෝත්‍ර මෙන් බෞද්ධයින් ජයමංගල ගාථා කීම
- සිද්ධ ආයුර්වේද ක්‍රමය සහ යන්ත්‍ර, මන්ත්‍ර, බලිතොවිල්, යාග, සුර පැළඳීමට හුරුවීම
- පත්තිනි මෑණියන්ට භාර හාර වී කිරි දානය දීම

මේ අනුව සිංහල සංස්කෘතිය කෙරේ ඇති වූ ඉන්දියානු බලපෑම් පැහැදිලි ය. ක්‍රි.පූ. 03 වන සියවසේ දී සිදු වූ බෞද්ධ ආගමික බලපෑමත්, ශිල්පීය කුල දහඅටේ බලපෑමත්, ක්‍රි.ව. 10වන සියවසේ දකුණු ඉන්දීය ආක්‍රමණික බලපෑමත් ලාංකීය සංස්කෘතියේ බොහෝ වෙනස්කම් රැසකට මුල්විය.

## ලාංකික සංස්කෘතිය කෙරෙහි එල්ල වූ බටහිර යටත් විජිත යුගයේ බලපෑම්

### පෘතුගීසි යුගය

ලංකාවේ සාම්ප්‍රදයික සංස්කෘතික යුගය අවසන් වන්නේ ක්‍රි.ව. 1505 දී පෘතුගීසින් නව යටත් විජිත යුගයක් උරුමකර දීමත් සමඟ ය. එකල සිංහල රාජධානිය පැවතියේ කෝට්ටේ ය. අභ්‍යන්තර ආරවුල් නිසා කෝට්ටේ බුවනෙකබාහු රජතුමා පෘතුගීසින්ට බලකොටුවක් තනා ගැනීමට අවසර දුන්නේ ය. දේශපාලන බලය ස්ථාවර කර ගැනීමේ සිය අවශ්‍යතාව රජතුමා පෘතුගීසි පාලකයන්ට පැහැදිලිකර දුන්නේ ය. ඒ අනුව සීතාවක හා රයිගම ප්‍රාදේශීය බලය මර්දනය කිරීමෙන් පසු, කෝට්ටේ රජ වෙනුවෙන් ඉටුකරන ලද කාර්ය සඳහා උපකාරයක් වශයෙන් මුස්ලිම් ජාතිකයින් අත පැවති කුළුබඩු වෙළෙඳාම පෘතුගීසින් වෙත පවරා දෙන ලදී. ඉන් අනතුරු ව

සීතාවක හා රයිගම ප්‍රාදේශීය බලය නැවත රජුට නොදී තමන් වෙත ම තබා ගත්තේ ය. එසේ ම කෝට්ටේ රජුට එරෙහිව ද තම බලය ව්‍යාප්ත කරන ලදී. යාපනයේ ප්‍රාදේශීය බලය ද අල්ලා ගන්නා ලදුව යාපනය රාජධානිය අවුරුදු හතළිස් හතරක් ද, කෝට්ටේ රාජධානිය අවුරුදු හැටක් ද පෘතුගීසින් විසින් පාලනය කරන ලදී.

ඊළඟ අරමුණ වූයේ දේශීය ආගම් මර්දනය කිරීමයි. බෞද්ධ, හින්දු, මුස්ලිම් ආගම් ඇදහීම තහනම් කරන ලදුව, භික්ෂූන් උපැවිදි කිරීම සහ පූජකයින් පූජක බවෙන් නෙරපා හැරීම කරන ලදී. නැතිනම් මරා දමන ලදී. කතෝලික ආගම ව්‍යාප්ත කිරීම සඳහා වෙළෙඳාමෙන් හා වෙනත් ආදායම්වලින් ඉපයූ මුදල්වලින් දේවාලගම්, විහාරගම්, ගබඩාගම්, නින්දගම් මිල දී ගෙන ඒවායෙහි කතෝලික පවුල් පදිංචි කළේ ය. බෞද්ධ, හින්දු, ඉස්ලාම් ආගමික මධ්‍යස්ථාන මුළුමනින් ම විනාශ කරන ලදී. මෙසේ දැඩි ප්‍රතිපත්තියක් අනුගමනය කරමින් වෙරළබඩ ප්‍රදේශවල කතෝලික ආගම ව්‍යාප්ත කරන ලදී.

ඉඩම් හා භූමිය විධිමත්ව පවත්වාගෙන යාම සඳහා ශ්‍රී ලංකාවේ ඉඩම් ලැයිස්තු ක්‍රමය හෙවත් තෝම්බු ක්‍රමය හඳුන්වා දෙන ලදී. වර්තමානයේ ඉඩම් ලැයිස්තුගත කිරීම ඔවුන් හඳුන්වා දුන් තෝම්බු ක්‍රමය මත පදනම්ව ඇත. ඔවුන්ගේ සංස්කෘතික උරුමයන් රාශියක් හඳුන්වා දුන් අතර ඒවා වර්තමානයේ ද එලෙසින් ම පවතී.

මෙලෙස ඇඳුම් පැළඳුම්, සිරිත් විරිත්, සංගීතය, භාෂාව හා ගෘහ උපකරණ ද පෙන්වාදිය හැකි ය.

පෘතුගීසීන් ලංකාවේ සම්පත් විශාල ප්‍රමාණයක් ඔවුන්ගේ වෙළෙඳාම සඳහා පෘතුගාලයට ගෙනයන ලදී. පෘතුගීසීන්ගේ අපේක්ෂාව වූයේ ක්‍රිස්තියානි ආගම ව්‍යාප්ත කිරීම හා කුළුබඩු, ඇත් දත්, මුතුමැණික් වැනි අපනයන භාණ්ඩ රැස් කිරීම යි.

පෘතුගීසීන්ගේ පෙරදිග ලෝකයේ බලපෑම පිළිබඳව ජේ.ඇම්. බැරස්

නැමැති ඉතිහාසඥයා ප්‍රකාශ කරන්නේ '' අප්‍රිකාව, ආසියාව හා අවට දිවයින්වල පෘතුගීසි යුධ ආයුධ හා ගොඩනැගිලි කාලයාගේ ඇවෑමෙන් විනාශ වී යන බව ය. එහෙත් ඔවුන්ගේ ආගම, සිරිත්විරිත් හා භාෂාව එලෙස කාලයාට විනාශ කළ නොහැක '' යන්නයි. මෙයින් පෙනී යන්නේ යටත් විජිත සමයේ පෘතුගීසින් විසින් සංස්කෘතියට කරනා ලද බලපෑම විශාල බවයි.

## ලන්දේසි යුගය

ලන්දේසින් මෙරටට පැමිණියේ කෝට්ටේ රාජධානිය පෘතුගීසීන්ට යටත්ව තිබූ සමයේ ය. ක්‍රි.ව. 1658 දී දෙවැනි රාජසිංහ රජු සමඟ එක් වූ ලන්දේසීන් 1638 දී පෘතුගීසීන් නෙරපා දැමීම සඳහා රජු සමඟ ගිවිසුමක් ඇති කර ගත්හ. පෘතුගීසීන්ගේ වෙළෙඳ අධිකාරිය ලන්දේසීන්ට පවරා දෙන්නේ නම් පෘතුගීසි බලපෑමෙන් මුදගෙන රජුට ලබා දෙන බවට ප්‍රකාශ කළහ. මෙම දෙපාර්ශවයේ එකඟතාවය අනුව සිංහල රජු වෙළෙඳ අයිතිය ලන්දේසීන්ට ලබා දෙන ලදී. එහෙත් ගිවිසුම් ප්‍රකාරව ලන්දේසීන් විසින් මුදගත් ප්‍රදේශ රජුට ලබා නොදී දේශපාලන බලය ඔවුන් වෙතම තබාගන්නා ලදී. ක්‍රි.ව. 1796 දක්වා අඛණ්ඩව එය පැවතුණි.

ලන්දේසී ජාතිකයින්ගේ දේශපාලන බලපෑම පෘතුගීසින්ගේ බලපෑමට වඩා දරුණු විය. මුහුදුබඩ ප්‍රදේශ යටත්කරගෙන, රට අභ්‍යන්තරය දක්වා දේශපාලන බලය ව්‍යාප්ත කරන්නට සමත් විය. දෙවනුව කෝට්ටේ, යාපනය වැනි ප්‍රදේශවල තම යටත් විජිතය ව්‍යාප්ත කරන ලදී. මුහුදුබඩ ප්‍රදේශ පාලනයට ප්‍රවාහන මාර්ග ලෙස ඇළ මාර්ග ද අභ්‍යන්තර ප්‍රදේශ පාලනයට හා ප්‍රවාහන කටයුතු සඳහා මහාමාර්ග ද ඉදි කළහ.

රෝම ලන්දේසී නීතිය හඳුන්වා දෙමින් පරිපාලන කටයුතු පවත්වාගෙන යන ලදී. පෘතුගීසීන් ව්‍යාප්ත කල රෝමානු කතෝලික ආගම මර්දනය කිරීමට නීති පනවා නීති උල්ලංඝනය කරන අයට කසපහර දීම, බෞතිස්ම නොකිරීම, සිරගත කිරීම කළහ. අනතුරු ව ලන්දේසීන් විසින් රෙපරමාදු ආගමට කතෝලිකයන් හරවා ගත්හ. බෞද්ධ ආගම ඇදහීම තහනම් කළහ. බෞද්ධ

පාසල් වසා දැමූහ. පාසල් අධ්‍යාපනය අනිවාර්ය කළ ලන්දේසීන් ගමක් ගමක් පාසා පාසල් ආරම්භ කළේ ය. පාසලට යාබදව පල්ලිය ද පිහිටුවී ය. පාසල් පරිපාලන කටයුතු ක්‍රමවත්ව සිදු කළහ. යුරෝපීය ළමුන්ට ලන්දේසි පාසල් ද දේශීය ළමුන්ට ස්වභාෂා පාසල් ද විවෘත කළහ.

කෘෂිකාර්මික කටයුතු විධිමත් කළ අතර විශාල වෙළෙඳ ආදායමක් ලබාගැනීම සඳහා කුළුබඩු අපනයන කළහ.

උදා: කුරුඳු, පුවක්, කපු, කෝපි, ගම්මිරිස්, උක්, කරඳමුංගු වගා ව්‍යාප්ත කළහ. ඇත්දල, මුතු මැණික්, ස්කාගාර, යනාදී කර්මාන්ත ආරම්භ කළහ. වෙළෙඳ ප්‍රවාහනයට කළු ගඟ, ගිං ගඟ, බෙන්තර ගඟ හරහා විශාල පාලම් ඉදිකළහ. මුහුදු මාර්ගයට ආසන්නව මාතර, කොළඹ සහ මන්නාරම යන ප්‍රදේශ ආවරණය වන ලෙස මාර්ග ඉදි කළහ. ආනයන - අපනයන ආදායමට අමතරව බදුවර්ගවලින් ද විශාල ආදායම් ලැබූහ.

ඇඟ බද්ද, ඔරු බද්ද, බලු බද්ද, සෙරෙප්පු බද්ද ආදී නන්වැදෑරුම් බදු මගින් ආදායම් ශක්තිමත් කරගත් අතර වැඩවසම් කුල ක්‍රමය සම්බන්ධව රාජකාරි ක්‍රමය පවත්වාගෙන යන ලදී.

ලන්දේසීන් නිසා දේශීය සංස්කෘතියට විශාල බලපෑමක් එල්ල වූ අතර, ආලින්දය සහිත නිවාස තැනීම, ලන්දේසි වචන, නම්ගම් භාවිතයට හුරුවිය. ස්කාගාර හා රේන්ද කර්මාන්තය (රා මැදීම) නිසා බේබදුකමට ලාංකිකයන් හුරුවිය. මේ අනුව යටත් විජිත බලපෑම සමාජ, සංස්කෘතික, ආර්ථික සහ සාමාජික අංශ කරා ව්‍යාප්ත වූ බව මනාව නිරූපණය වේ.

## ඉංග්‍රීසි පාලන අවධිය

ඉංග්‍රීසි ජාතිකයින් සිය දේශපාලන ආධිපත්‍යය ආසියාව පුරා ව්‍යාප්ත කිරීම ආරම්භ කරන්නේ 18වන සියවසේ අගභාගයේ දී ය. ක්‍රි.ව. 1796 ශ්‍රී ලංකාවට ඇතුල්වන ඔවුන් ක්‍රි.ව. 1802වන විට මුහුදුබඩ ප්‍රදේශ ලන්දේසීන්ගෙන් නිදහස් කරගනී. පෘතුගීසි හා ලන්දේසීන් මෙරටට පැමිණීමේ දී මෙන් සිංහල

රජුගෙන් ඉංග්‍රීසීන්ට ආරාධනා නොලැබෙයි. ඔවුන් ලංකාවට ඇතුල්වන්නේ තම යුධ, නාවික බලය පදනම් කරගෙන ය. මුළු දිවයින ම තම ආධිපත්‍යයට යටත් කරගැනීමේ අරමුණු ඇති ව යුද්ධය හා උපක්‍රම ඉතා සාර්ථකව භාවිත කිරීමට සමත්වෙයි. එහි ප්‍රතිඵලය හැටියට ක්‍රි.ව. 1815 වන විට සිංහල රාජ්‍යයේ අවසාන රජු වූ ශ්‍රී වික්‍රම රාජසිංහ රජු සිරභාරයට ගෙන මුළු දිවයින ම තම පාලනයට යටත් කරගැනීමට ඉංග්‍රීසි ජාතිකයින්ට හැකිවිය. ක්‍රි.ව. 1818 වන විට මුළු දිවයිනට ම පොදු වූ ඒකීය පාලන ක්‍රමයක් ඇති කිරීමට ද ඉංග්‍රීසීන්ට හැකි විය. ක්‍රි.ව. 1820 දී මෙම පාලන ක්‍රමය අධීක්ෂණය කර වාර්තාවක් සැපයීම සඳහා පත්කළ කොමිසම කෝල්බෲක් හා කැමරන් නමින් හඳුන්වයි. ක්‍රි.ව. 1833 මෙම දෙදෙනා නිර්දේශ රැසක් පාලකයින් වෙත ඉදිරිපත් කරණු ලැබී ය. සමාජ විද්‍යාත්මකව වැදගත්වන නිර්දේශ 04ක් මෙහි දී දක්නට ලැබේ.

01. රාජකාරි ක්‍රමය හෙවත් අනිවාර්ය සේවා ක්‍රමය අත්හිටුවීම. මේ නිසා සිංහල රාජධානියේ පොදු අවශ්‍යතා ඉටුකර ගැනීමේ පදනම මත ශිල්පීය කුල තාක්ෂණය අහිමි විය.

02. දිවයින පුරා ආගම ව්‍යාප්ත කිරීමේ නිදහස මිෂනාරීන්ට නීත්‍යානුකූලව ලබාදිය යුතු බව මේ යෝජනාව නිසා සිංහල බෞද්ධ සංස්කෘතිය සිසාරා මිෂනාරි පාසල්, ආගමික මධ්‍යස්ථාන අස්සක් මුල්ලක් නැර පතුරුවා හැරීම සිදුවිය.

03. බ්‍රිතාන්‍ය වැසියන්ට ලංකාවේ පෞද්ගලික ඉඩම් හිමිකරගැනීමේ සීමාව ඉවත්කිරීම නිසා බ්‍රිතාන්‍ය ව්‍යාපාරිකයින් තේ, කෝපි, සිංකෝනා, රබර් වගාවන් සඳහා ඉතාම යෝග්‍ය උස්බිම් ප්‍රදේශ අත්පත් කර ගත්හ.

04. ලංකාවේ පාසල්වල අධ්‍යාපනය ඉංග්‍රීසි භාෂාවෙන් පවත්වාගෙන යාමට නිර්දේශ කිරීමයි. එම පාසල් රාජ්‍ය හා මිශනාරි සංවිධාන මගින් පාලනය කළ යුතු බවට නිර්දේශ කරන ලදී. මෙමගින් ක්‍රිස්තියානි සංස්කෘතිය ව්‍යාප්ත කිරීම අරමුණ විය. එය සාම්ප්‍රදායික බෞද්ධ අධ්‍යාපන ක්‍රමයට විශාල තර්ජනයක් විය. ඉංග්‍රීසි භාෂා ප්‍රතිපත්තිය මගින් යටත්විජිත පාලනය පවත්වාගෙන යාමට අවශ්‍ය ලිපිකරු, කම්කරු, පහළ ශ්‍රේණි

සඳහා පුහුණුවක් ලැබුණි. මේ නිසා වරප්‍රසාද ලත් සුළු පිරිසක් පාලන කටයුතු සඳහා හවුල්කරගන්නා ලදි.

මේ හැර 1813 දී හඳුන්වා දුන් දිසාපති, උප දිසාපති, කච්චේරි ක්‍රමය වර්තමානය දක්වා විධිමත් පරිපාලන ව්‍යුහයක් ලෙස පවත්වාගෙන එයි.

1820 දී ආර්ථික වාසි සඳහා තේ, කෝපි වැනි අපනයන බෝග වගාවන් සඳහා 10% ලංකා ශ්‍රමිකයන් ද, 90% ඉන්දීය ශ්‍රමිකයන් ද බඳවාගත් නිසා වැටුප් ලබන කම්කරු පන්තියක් මුල්වරට බිහිවිය. කන්ද උඩරට ප්‍රදේශවල ඉන්දීය සම්භාවය සහිත දෙමළ ජන කොටස් පදිංචි කළ අතර එය පසුකාලීනව විශාල සමාජ වෙනස්කම් වලට හේතු විය.

අධ්‍යාපනය, සෞඛ්‍ය සේවා, රාජ්‍ය පරිපාලනය, රාජ්‍ය ආරක්ෂාව ආදී ක්ෂේත්‍රවල විශාල වෙනස්කම් බ්‍රිතාන්‍ය යුගයේ දී සිදු වූ අතර ඉංග්‍රීසිය ප්‍රභූභාවයේ සංකේතයක් ලෙස සමාජය තුළ මැනවින් ස්ථාපනය විය.

## ක්‍රියාකාරකම් 3.4.1

1. දකුණු ඉන්දීය බලපෑම නිසා ශ්‍රී ලංකා සමාජයේ ඇතිවූ වෙනස්කම් මොනවාදැයි ලැයිස්තු ගත කරන්න.

2. ශ්‍රී ලාංකීය සිංහල සමාජයේ ආවාහ විවාහ චාරිත්‍ර වලට දකුණු ඉන්දියාවෙන් එකතු වූ චාරිත්‍ර මොනවා ද?

3. පෘතුගීසීන් පැමිණීම නිසා ලංකා සමාජයේ ඇතිවූ වෙනස්කම් නම් කරන්න.

4. ලන්දේසීන්ගෙන් මෙරට සමාජයට එකතුවූ නම්, ගම් භාවිත කිරීම උදාහරණ මගින් දක්වන්න.

5. ඉංග්‍රීසීන්ගේ පැමිණීම නිසා ශ්‍රී ලංකා සමාජයේ ඇතිවූ යහපත් හා අයහපත් ප්‍රතිඵල මොනවාදැයි දක්වන්න.

# 04 පුද්ගලයා හා සමාජය

## 4.1 පුද්ගල ජීවිතය හා සමාජ පසුබිම

පුද්ගලයා සමාජයේ නිර්මාණයකි. සමාජශීලී සත්ත්වයෙකු නිසා සමාජ සම්බන්ධතා ගොඩ නැගෙයි. ඒ අනුව ඔහු පවත්නා සමාජ සංස්කෘතිය අනුව සමාජානුයෝජනයට ලක්වෙයි. මානව පරිණාමයේ ආදීතම යුගයේ සිට ම පුද්ගල ජීවිතය සමාජ ජීවිතයට කේන්ද්‍රීය ලෙස ඒකාබද්ධව පවතින්නේ හුදකලාව ජීවත් වීමට නොහැකි නිසා ය. මිනිසා සාමූහික සත්ත්වයෙකු වශයෙන් සමාජයට අනුවර්තනය වීම සහජ ලැදියාව අනුව සිදුවන බැවින් අන්තර් පුද්ගල සම්බන්ධතා ගොඩනගා ගනී. සමාජ විද්‍යාව මෙන් ම සමාජ මානව විද්‍යාව ද පුද්ගලයා හා සමාජය හදාරණ අතර එමඟින් මානව සමාජ සංස්කෘතික සම්බන්ධතා ගැන විමර්ශනයට ලක්කරයි.

මිනිසා ප්‍රාථමික යුගයේ සිට සමූහ ලෙස රාශීභූත වූයේ තම මූලික අවශ්‍යතා වන ආහාර පාන සපයා ගැනීම හා ආරක්ෂාව තහවුරු කර ගැනීමට ය. මෙසේ බොහෝ කාලයක් ජීවත් වූ පුද්ගල එකතුව 'සමාජය' යනුවෙන් රැල්ෆ් ලින්ටන් නම් සමාජ මානව විද්‍යාඥයා ප්‍රකාශ කරයි.

බුදුරජාණන් වහන්සේ සංයුක්ත නිකායේ, ඉන්දක සූත්‍රයේදී පැහැදිලි කරන්නේ මව් කුසේදී දරුවා කළලයේ සිට මවගෙන් කායිකව හා මානසිකව පෝෂණය ලබන බවය.

**යඤ්චස්ස භුඤ්ජතී මාතා අන්නං පානංච**
**භොජනං , තෙනසො තත්ථයාපෙන්ති**
**'මාතු කුච්ඡිගතො නරො'**

බටහිර මනෝ විද්‍යාවේ පියා ලෙස සැළකෙන සිග්මන්ඩ් ෆ්‍රොයිඩ්ගේ මනෝ විශ්ලේෂණවාදය මඟින් පෙන්වා දෙන්නේ පෞරුෂත්වයේ වර්ධනය ජීව විද්‍යාත්මක මනෝමය හැඩගැසීමක් ලෙස ය. එසේ ම කායික අවශ්‍යතා ද මානසික අවශ්‍යතා ද බොහෝ සේ පෞරුෂ වර්ධනය කෙරෙහි බලපානු ලැබේ. මාග්‍රට් මීඩ්, රූත් බෙනඩික්ට් යන සමාජ මානව විද්‍යාඥවරියන්ගේ මතයට අනුව පුද්ගලයාගේ පෞරුෂ වර්ධනයට සමාජය හා සංස්කෘතිය බොහෝ සේ බලපාන බව පෙන්වා දෙයි. ඔහු ජීවත් වන සමාජ පසුබිම අනුව විවිධ ගති ලක්‍ෂණ පෙන්නුම් කරන බව පෙනේ. උදාහරණ ලෙස ආක්‍රමණශීලීත්වය හා සුපහන් ගති ගුණ දැක්විය හැකි ය. ඇරාපේෂ් , මුණ්ඩුගුමාර් සහ අයිරිෂ් ගෝත්‍රික සමාජවල විවිධත්වය මඟින් පෙන්නුම් කරන්නේ මව් කිරි දීමේදී අනුගමනය කරන පිළිවෙත්වල වෙනස යි.

එසේ ම ඕනෑම පුද්ගලයෙකුගේ තත්ත්වයට හිමි කාර්ය භාරයක් ද පැවරෙයි. සමාජ සම්බන්ධතා ගොඩනැගෙන්නේ අන්තර් පුද්ගල ක්‍රියා මඟිනි. විවිධ සමාජ චර්යා, සමාජ සම්බන්ධතා කාලානුරූපව සමාජ පරිණාමය සමඟ වෙනස් වෙයි. මෙහි දී සංස්කෘතිය මඟින් සමාජ චර්යාවන් නිර්වචනය කරයි. උදාහරණ ලෙස ශ්‍රී ලංකා සමාජය විජයාගමනය සමඟ ද, මහින්දාගමනය සමඟ ද, බටහිර ආක්‍රමණ සමඟ ද වෙනස් වූ බව දැක්විය හැකි ය. එක්තරා සමාජ ස්වරූපයක සිට තවත් කිසියම් ස්වරූපයක් දක්වා සමාජය ගමන් කිරීම සමාජ විපර්යාසය ලෙස හැඳින්විය හැකි ය. මෙය ප්‍රාථමික වනචාරී යුගයේ සිට නූතන කාර්මික සමාජය දක්වා විකාශනය වූ බව සඳහන් කළ හැකි ය. උදහරණ ලෙස ක්‍රි:ව: 1760 - 1830 දක්වා යුරෝපයේ සිදු වූ ඓතිහාසික සමාජ විප්ලවය දැක්විය හැකි ය. කෘෂිකාර්මික යුගයෙන් කාර්මික යුගය දක්වා ගෙන ගොස් එය නව යටත් විජිතකරණයත් සමඟ විශ්ව ගම්මාන සංකල්පය දක්වා මේ වන විට වර්ධනය වී තිබේ. ක්‍රි:ව: 1505 පෘතුගීසි ආක්‍රමණය ශ්‍රී ලාංකීය සමාජ පසු බිම වෙනස් කළේ ය. උදාහරණ ලෙස බෞද්ධ, හින්දු, ඉස්ලාම් ආගම ඇදහීම නීතියෙන් තහනම් කොට කතෝලික ආගම් පැතිරවීමත්, ක්‍රි:ව: 1656 ලන්දේසින් විසින් කෝට්ටේ රාජධානිය බිඳ දමා ක්‍රි:ව: 1796 දක්වා අඛණ්ඩව තම දේශපාලන බලය තබා ගනිමින් මිෂනාරී පාසැල් අධ්‍යාපනය ව්‍යාප්ත කිරීමත් ඔවුන්ගේ ආහාර හා නම් ගම් හඳුන්වා දීමත් දැක්විය හැකි ය.

ඉංග්‍රීසින් මෙරටට පැමිණියේ 1796 දී ය. එසේ පැමිණ 1802 දක්වා මුහුදුබඩ ප්‍රදේශත්, 1815 දී මුළු දිවයින ම සම්පූර්ණයෙන් ම අල්ලා ගත්තේ ය. ඊ.ආර්.ලීච් නම් සමාජ මානව විද්‍යාඥයා පවසන්නේ කුලය මත පදනම් වූ රාජකාරි ක්‍රමය සමාජයට සේවයක් වූ බවයි. ඉංග්‍රීසින් විසින් වැඩවසම් රජකාරි ක්‍රමය අහෝසි කරන ලදී. විධිමත් පාලනයක් ගෙන යාම සඳහා ආණ්ඩුකාරවරු, දිසාපතිවරු, උප දිසාපතිවරු සහ ආරච්චිලා පත් කරන ලදී.

වර්තමාන ශ්‍රී ලංකාවේ ගම්මාන 26,000 ක් පමණ තිබේ. ඔවුන් වැඩිපිරිසකගේ ජීවනෝපාය වශයෙන් කෘෂිකර්මාන්තය සහ ධීවර කර්මාන්තාදිය ජීවන මාර්ගය කර ගෙන යති. ලංකාවේ සමෘද්ධි ලාභීන් ලක්ෂ දහසය ක් සිටිති. දිළිඳු පවුල් වල අය මත් වතුර හා දුම්පානයට බහුල වශයෙන් ගොදුරු වී සිටිති. පිරිමින්ගේ ආයු කාලය අවුරුදු හැත්තෑ දෙකක් ද, ස්ත්‍රීන්ගේ ආයු කාලය අවුරුදු හැත්තෑ පහක් ද පෙන්නුම් කරයි. අවුරුදු දහසයකට අඩු දරුවන් ඉලක්ක කර ගත් මත්ද්‍රව්‍ය ජාවාරමක් ද ක්‍රියාත්මක වෙමින් පවතී. බාල අපචාර ක්‍රියාවල වර්ධනයක් පෙන්නුම් කරන අතර මෙය පවුලේ සමීපතම ඥාතීන්ගෙන් සිදුවීම සුලභ කරුණකි. මේ සඳහා අන්තර් ජාලය, අසභ්‍ය වීඩියෝ පටි, සංයුක්ත තැටි අලෙවිය මෙන් ම ලිංගිකත්වය ඉස්මතු කරන ඇඳුම් පැලඳුම් භාවිතය ද බලපා ඇත. ටැල්කොට් පාසන්ස් නම් සමාජ විද්‍යාඥයා පවසන්නේ "සාරධර්මවල බලපෑම තුළින් සමාජය වෙනස් වන බවය" සමාජ විසංවිධානය ද සමාජ පර්යාය වෙනස් කර ඇත. සමාජ සම්බන්ධතා බිඳ වැටීම, මව්පියන් රැකියාවන් සඳහා විදේශගත වීම නිසා දරුවන් අනාරක්ෂිත වීම ඊට හේතු වන බව පෙනේ.

1977 මෙරටට හඳුන්වා දුන් විවෘත ආර්ථිකයත්, අවුරුදු තිහක් පැවති අභ්‍යන්තර යුද ගැටුම් ද සමාජ සාරධර්ම බිඳ වැටීමට හේතු වූ බව උගතුන්ගේ මතයයි. ගෝලීය ප්‍රවණතා හමුවේ සමාජයට සාපේක්ෂව සංස්කෘතික අගයන් ද වෙනස් වීම සමාජය විශ්ලේෂණය කිරීමෙන් හඳුනාගත හැකි ය.

## ක්‍රියාකාරකම් 4.1.1

01. " පුද්ගල ජීවිතය සමාජයට අනුව සකස් වේ" කෙටියෙන් හඳුන්වන්න.

02. යහපත් සමාජ පසුබිමට හා අයහපත් සමාජ පසුබිමට අදාළ වන කරුණු තුන බැගින් ලියන්න.

03. ගැමි සමාජයේ හා නාගරික සමාජයේ වෙනස වෙන් වෙන් වශයෙන් දක්වන්න.

04. කාලානුරූපව සමාජය වෙනස් වේ. මහින්දගමනය මුල්කරගෙන පහදන්න.

05. යුද ගැටුම් හේතුවෙන් (පුද්ගල) සමාජ ජීවිතය වෙනස් වන අයුරු කෙටියෙන් හඳුන්වන්න.

## 4.2 බහුවිධ සමාජ හා සමාජ සංකීර්ණතාව

බොහෝ සමාජයන්හි විවිධ ජාතීන් ජීවත් වේ. ශ්‍රී ලංකා සමාජය තුළත් සිංහල, දෙමළ, මුස්ලිම්, බර්ගර් සහ මැලේ යන ජාතීන් දැකිය හැකි ය. මීට අමතර ව ඉතා සුළු වශයෙන් වෙනත් ජාතීහු ද සිටිති. මෙම ජාතීන් තුළ ද විවිධ බෙදීම් දක්නට ලැබේ. දෙමළ ජාතිකයන් ගත් විට ඔවුන් අතර ඉන්දියානු දෙමළ සහ ලංකා දෙමළ වශයෙන් කොටස් දෙකක් ඇත. ඔවුන් ගේ භාෂාව තුළ ද විවිධත්වයක් ඇත. සිංහල, දෙමළ ඉංග්‍රීසි යන භාෂා ත්‍රිත්වය ශ්‍රී ලංකාව තුළ භාවිත කරයි.

එමෙන් ම එක් එක් ජාතීන්ගේ ආගම් තුළත් විවිධත්වයක් ඇත. සිංහලයින්ගෙන් බහුතරයක් ථේරවාදී බුදුදහමත්, දෙමළ ජනතාවගෙන් බහුතරයක් හින්දු ආගමත්, ඔවුන් අතුරින් කොටසක් කිතු දහමත්, මුස්ලිම් ජනතාව ඉස්ලාම් ආගමත් අදහති. මේ අනුව අපට පැහැදිලි වන්නේ එකම රටක් තුළ විවිධ ජාතීන් ජීවත් වෙන අතර ඔවුන්ට ම ආවේණික භාෂාවන් හා ආගම් ක්‍රියාත්මක වන බවයි. තව ද පොදුවේ ශ්‍රී ලංකිකයන් ලෙස මොවුන් හඳුන්වන අතර ශ්‍රී ලාංකික සංස්කෘතියක් පිළිබඳව ද අප කතා කරයි. නමුත් එක රටක් තුළ එක් එක් ජනකොටස් වලට ආවේණික සංස්කෘතීන් ද ගොඩනගා ගෙන තව දුරටත් පවත්වා ගෙන යයි. ඒ අනුව ඇඳුම් පැලඳුම් සිරිත් විරිත්, ආචාර ධර්ම, ප්‍රතිමාන, ඇගයීම් සහ සාරධර්ම යනාදියේ විවිධත්වයක් දැකිය හැකි ය. මෙම විවිධත්වය නිසා සමාජය තුළ සංකීර්ණ බවක් නිර්මාණය වී ඇත. අපි මෙවැනි සමාජයක් බහුවිධ සමාජයක් ලෙස නම් කරමු.

බහුවිධ සමාජයක ඇති වැදගත් ලක්ෂණයක් නම් තම ජන කොට්ඨාසයට ආවේණික ලක්ෂණ පවත්වා ගනිමින් සමස්ත සමාජය සමඟ එකට ජීවත් වීම ය. මෙය එතරම් ම පහසු කාර්යයක් නොවේ. විවිධ ගැටලු පැන නඟින අවස්ථාවන් ඇත. එක් එක් ජන කොට්ඨාසයන් තමන්ට ආවේණික සංස්කෘතියක් තුළ තම ජීවන රටාව පවත්වා ගෙන යයි. ඒ අනුව භාෂාව ඇඳුම් පැලඳුම්, සිරිත් විරිත්, සාරධර්ම, ප්‍රතිමාන, ඇගයීම් යනාදිය කෙරෙහි උනන්දු වේ. ජන කොට්ඨාසයෙන් කොට්ඨාසයට මෙවැනි වෙනස් ලක්‍ෂණ දක්නට ලැබේ. උදාහරණ ලෙස උඩරට සමාජයේ කාන්තාවන් බෝරිච්චි හැට්ට හා ඔසරිය අඳින අතර  බොහෝ මුස්ලිම් කාන්තාවන් ශරීරය සම්පූර්ණයෙන් වැහෙන ඇඳුමක් ඇඳ මුහුණ ද ආවරණය කරයි. ඔවුන්ගේ ආගමික ඇදහීම් ද විවිධ වේ.  සිංහල බෞද්ධයෝ පෝය දවසට පන්සල් ගොස් ආගමික වතාවත්වල යෙදෙති. මුස්ලිම් ජනතාව දවසකට පස් වතාවක් අල්ලා දෙවියන් වඳියි. දෙමළ ජනතාව කෝවිල්වලට ගොස් පූජා පැවැත්වීම සිදු කරයි. ආගමික උත්සවවලදී ඇගේ කටු ගසා ගැනීම තුළින් දෙවියන්ට ඇති භක්තිය ප්‍රදර්ශනය කරයි. කතෝලිකයන් පල්ලිවල දී දෙවියන් වහන්සේ වෙනුවෙන් යාඥා කරයි. මේ ආකාරයට විවිධ ජන කොටස් තම තමන්ගේ ආගම් අදහයි. මෙයින් කිසියම් විමුක්තියක් ද බලාපොරොත්තු වේ. මේවා බහුවිධ සමාජයක දැකිය හැකි ලක්ෂණයන් වේ.

ප්‍රධාන සමාජයෙන් හුදකලාව සිටින වැදි ජනතාව හා අහිකුණ්ඨක ජනතාව ද ඔවුන්ට ආවේණික සංස්කෘතීන් පවත්වා ගෙන යයි. වැදි ජනතාවගේ පුරුෂ පක්ෂය උඩුකය නිරාවරණය කර සිටීම හා පොරෝ කෙටිය රැගෙන යාම ඔවුන්ගේ අනන්‍යතාවයි. එමෙන් ම අහිකුණ්ඨිකයින් රටපුරා තැනින් තැන සංචාරය කරමින් ඔවුන්ගේ දිවි පවත්වා ගනී. තෙලිඟු භාෂාව අහිකුණ්ඨික ජනතාවගේ භාෂාව වේ. බහුතර සිංහල ජනතාවගේ භාෂාව සිංහල වන අතර දෙමළ හා මුස්ලිම් ජනතාව දෙමළ භාෂාව භාවිත කරයි. නාගරික සමාජයේ ඇතැම් පිරිස් ඉංග්‍රීසි භාෂාව ද භාවිත කරති. එක් එක් ජාතීන් තමන්ගේ භාෂාවට අමතර ව අනෙකුත් භාෂාවන් ඉගෙන ගැනීමට ද උනන්දු වේ. උදාහරණ ලෙස දෙමළ හා මුස්ලිම් ජනතාව සිංහල භාෂාව ඉගෙන ගනී. ඔවුන්ගේ ව්‍යාපාර කටයුතුවලට හා අනෙකුත් සේවාවන්වලට සිංහල භාෂාව අවශ්‍ය වේ. සිංහල ජනතාව සමඟ හොඳින් සම්බන්ධතා ගොඩ නඟා ගැනීමට මෙය හේතු වේ.

සමාජ බහුවිධතාව ශ්‍රී ලංකාවට පමණක් නොව ලෝකයට ම පොදු තත්ත්වයකි. භූගෝලීය වශයෙන් ලෝකය තුළ විවිධත්වයක් ඇත. මෙම විවිධත්වයට ගැළපෙන ආකාරයට මිනිසුන්ගේ ස්වභාවය හා ජීවන රටාවන් ආදිය සකස් වී ඇත. තවමත් ලෝකයේ නොදියුණු ගෝත්‍රික ජන කොටස් සිටී. සමහරු වනගතව වාසය කරති. ඇමසන්, කොංගෝ වැනි වනාන්තරවල මෙවැනි ගෝත්‍රික ජන කොටස් තවමත් ජීවත් වෙති. ඔවුන්ට හුරුපුරුදු ජීවන රටාවක් ඇත. විශේෂයෙන් දඩයම ප්‍රධාන ජීවන මාර්ගය බවට පත්වී ඇත. ආසියානු රටවල ජීවත්වෙන ගෝත්‍රික ජනතාව එම ප්‍රදේශවල පරිසරය හා දේශගුණික තත්ත්වය මත කෘෂිකාර්මික ජීවන රටාවකට හුරුවී ඇත. දූපත් වාසී ජනතාව ධීවර කටයුතුවලට යොමු වී ඇත. මේ ආකාරයට ලෝකය පුරා විසිරී සිටින ජනතාව තුළ භාෂාව, ජීවන රටාව, සංස්කෘතිය යනාදී සාධකයන්හි විවිධත්වයක් දක්නට ලැබේ.

වර්තමාන ලෝකයේ රටවල් ආර්ථික හැකියාවන් අනුව වර්ග කර ඇත. ඉහළ ආදායම් ඇති රටවල් දියුණු රටවල් ලෙසත් මධ්‍යම ප්‍රමාණයේ ආදායම් ඇති රටවල් සංවර්ධනය වෙමින් පවත්නා රටවල් ලෙසත් හඳුන්වා දී ඇත. ඇතැම් රටවල් පහළ ආදායම් ලබන රටවල් ලෙසද නම් කර ඇත. මෙලෙස රටවල් වර්ග කිරීම සඳහා ආදායම් තත්ත්වයට අමතර ව සාක්ෂරතාව, ආයු අපේක්ෂාව, සෞඛ්‍ය තත්ත්වය වැනි දර්ශක ද සැලකිල්ලට ගනු ලැබේ. එය ද සමාජ විවිධත්වය පෙන්වනු ලබන සාධකයකි. සමාජයක් තුළ විවිධ ආයතන

ඇත. උදාහරණ ලෙස පවුල නැමැති ආයතනය සමාජයක ඉතාම වැදගත් ම ආයතනය වේ. ඊට අමතර ව ආගමික ආයතන, අධ්‍යාපන ආයතන ද පොලිසිය, අධිකරණය සහ බන්ධනාගාරය වැනි නීතිය ක්‍රියාත්මක කරන ආයතන ද සමාජය තුළ දක්නට ලැබේ. මෙම සෑම ආයතනයක් ම සමාජයට වැදගත් අන්තර් සම්බන්ධතාවයන් පවත්වා ගනී.

සමාජය සංකීර්ණ අන්තර් සම්බන්ධතා ජාලයකි. එක් එක් ආයතනය සිදු කරන කාර්ය කොටස් අනෙක් ආයතනය කෙරෙහි බලපායි. උදාහරණ ලෙස පවුල නැමැති ආයතනයෙන් හොඳ සමාජානුයෝජනයක් සිදු නොවුනහොත් නීතිය ක්‍රියාත්මක කරන ආයතනවලට මැදිහත් වීමට සිදුවේ. බන්ධනාගාර ගතවන බොහෝ පිරිස් පවුල නමැති ආයතනයෙන් නිසි සමාජානු යෝජනයක් සිදුනොවූ පිරිසකි. සමාජයේ පවත්නා ආයතනයන්හි ක්‍රියාකාරීත්වය මත අන්තර් සම්බන්ධතා සංකීර්ණතාවක් ගනී. ඒ අනුව සෑම සමාජ ආයතනයක් ම සංකීර්ණ වූ කාර්ය කොටසක් ඉටු කරනු ලබයි. එම සංකීර්ණත්වයෙන් මිදී හුදකලාව පැවතීමට කිසිම සමාජ ආයතනයකට හැකියාවක් නැත.

මිනිසුන් ඉහළ සිට පහළට කිසියම් අනුපිළිවෙළකට අනුව ශ්‍රේණි ගත වී ඇත. එක් එක් කුලය අනුව ඇඳුම් පැලඳුම්, ආමන්ත්‍රණ කිරීම්, ගරු කිරීම්, නම්බුනාම ලබාදීම යනාදියේ විවිධත්වයක් දැකිය හැකි ය. දකුණු ආසියාතික රටවල්වල මෙම තත්ත්වය වැඩි වශයෙන් දක්නට ලැබේ. කුල ක්‍රමය තිබෙන සමාජවල පවතින බෙදීම් හා චාරිත්‍ර වාරිත්‍ර නිසා එහි කිසියම් සංකීර්ණ ස්වභාවයක් දක්නට ලැබේ.

බටහිර සමාජවල කුල ක්‍රමය අනුව මිනිසුන් බෙදා දක්වා නැති අතර මිනිසුන්ගේ සමාජ තත්ත්වය තීරණය කරන්නේ ඔවුන්ගේ ආර්ථික ශක්තිය අනුව ය. ඒ අනුව ධනපති පන්තිය, මධ්‍යම පන්තිය, නිර්ධන පන්තිය ආදී වශයෙන් පන්තිවලට සමාජය වෙන් කර ඇත. ඉහළ පන්ති නියෝජනය කරන ධනපතියන්, දේශපාලඥයින්, ව්‍යාපාරිකයන්, වෛද්‍යවරුන් සහ ඉංජිනේරුවරුන් වැනි අය ඉහළ වැටුප් ලබන අතර සුඛෝපභෝගි ජීවිත ගත

කරති. එපමණක් නොව සමාජයේ සෙසු අයගේ ගෞරවයද ලබති. නමුත් පහළ කම්කරු පන්තියට එවැනි ගෞරවයක් නොමැත.

කුල ක්‍රමය හා පන්ති ක්‍රමය යන අංශ දෙකට ම අමතර ව ඇතැම් සමාජවල මිනිසුන්ගේ සමේ වර්ණය පදනම් කරගෙන මිනිසුන් උස් පහත් වශයෙන් බෙදා දක්වා ඇත. ඒ අනුව කළු මිනිසුන්ට වඩා සුදු මිනිසුන් උසස් ය. එබැවින් සමාජයේ වැඩි වරප්‍රසාද සුදු මිනිසුන්ට හිමි වන බව දක්වන අදහස් ද පවති. සුදු කළු භේදය හෙවත් වර්ණ භේදය යනුවෙන් එය දක්වා ඇත.

මේ ආකාරයට මිනිසුන් විවිධාකාරයෙන් ශ්‍රේණි ගත කිරීම නිසා සමාජය තුළ ද සංකීර්ණ ස්වභාවයක් ඇතිවේ. ඒ අනුව ඕනෑම සමාජයක මෙම සංකීර්ණත්වය යන්න පොදු යථාර්ථයක් බවට පත් වී ඇත.

**ක්‍රියාකාරකම් 4.2.1**

01. භාෂාව අනුව ජන වර්ග නම් කරන්න.
02. ශ්‍රී ලංකාවේ ප්‍රධාන ආගම් හතර නම් කරන්න.
03. සමාජ විවිධත්වය අවබෝධ කර ගැනීමට භාෂා කිහිපයක් දැන සිටීම ප්‍රයෝජනවත් වේ. මෙම මතය සනාථ කිරීමට කරුණු දක්වන්න.
04. පුද්ගලයා හා සමාජය පිළිබඳ හැඳින්වීමක් කරන්න.

## 4.3 ශ්‍රී ලංකා සමාජයේ විවිධත්වය

ශ්‍රී ලාංකේය සමාජය ඉහළ විවිධත්වයකින් යුත්ත වේ. මෙම විවිධත්වයට හේතු වී ඇති කරුණු අතර බහු වාර්ගික, බහු ආගමික සහ බහු සංස්කෘතික සමාජයක් වීම කැපී පෙනේ. ප්‍රධාන භාෂා වන්නේ සිංහල හා දෙමළ භාෂාවන් ය. ජාත්‍යන්තර භාෂාවක් වශයෙන් ඉංග්‍රීසි භාෂාවෙන් ද අන්තර් සමාජ සම්බන්ධතා පවත්වති. මේ හැර රැකියාව, කුලය, ධනය සහ පළාත අනුව ද වෙනස්කම් දක්නට ලැබේ. මෙම විවිධ වෙනස්කම්වලට මූලික වශයෙන් සමීපතම රටවන ඉන්දියාවේ බලපෑම් ද, බටහිර ආක්‍රමණයන් ද හේතු විය. පුරා විද්‍යාත්මක සාධක අනුව ලංකාව, චීනය සහ අරාබිය ආදී රටවල් සමඟ වෙළඳ සම්බන්ධතා ඈත අතීතයේ සිට පවත්වා තිබෙන බව තහවුරු වෙයි. භූගෝල විද්‍යාත්මක පර්යේෂණයන්ට අනුව ඉන්දියාව හා ශ්‍රී ලංකාව අතර පා ගමනින් යා හැකි නොගැඹුරු මුහුදු තීරයක් තිබුණු බව පිළිගැනේ. මහා වංශයේ සඳහන් කරන පරිදි ආර්යයන් ලංකාවට පැමිණ දුදුරු ඔයේ සිට වළවේ ගඟ දක්වා ජනාවාස බිහි කර ගෙන ඇත.

මෑත අතීතයේ දී ද සිංහල මිනිසුන් අතර උඩරට සහ පහතරට වශයෙන් සමාජ බෙදීමක් ද දැකිය හැකි ය. මේ තත්ත්වය ඇති වූයේ යටත් විජිත සමයේ ය. ඔවුන්ගේ භාෂාව තුළ මෙම වෙනස්කම් කැපී පෙනේ. වචන උච්චාරණය, ඇඳුම් පැලඳුම්, ආහාර පිසීම, සිරිත් විරිත්, යනාදියේ ද මෙම විවිධත්වය දැකිය හැකි ය. තවද නාගරික, ග්‍රාමීය, වතු, ධීවර, යනාදී වශයෙන් ද මෙම සමාජ විභේදනයන් දක්නට ලැබේ.

ආගමික උත්සව හා ඒ ආශ්‍රිත චාරිත්‍ර එකිනෙක ජන වර්ගයට අනුව වෙනස් ය. බෞද්ධයෝ ආගමික වශයෙන් ඉතා වැදගත් ලෙස සලකන වෙසක්, පොසොන් වැනි පොහොය දිනවල සිල් සමාදන් වීම, දන්සල් දීම, වෙසක් තොරණ ඉදිකිරීම, පහන් පූජා, භක්ති ගීත හා පහන් කූඩු සෑදීම වැනි වැඩ සටහන් සිදු කරති. හින්දූන් ඔවුන්ගේ ආගමික වශයෙන් වැදගත් වන දිනයන්හි කෝවිල්වල පුද පූජා පවත්වයි. ඉස්ලාම් භක්තිකයන් රාමසාන් කාලයේ දී දිවා ආහාර නොගෙන ආගමික කටයුතුවල යෙදේ. එමෙන් ම කතෝලික ආගමිකයන්

ඔවුන්ගේ ආගමික වතාවත්වල නිරත වේ. මේ සියලු ම ආගමික වතාවත් ඒකාකාරී නොවේ. එකකට එකක් වෙනස් ය. මෙය සමාජ විවිධත්වයේ ලක්ෂණයකි.

සංස්කෘතික උත්සව ගැන සලකන විට සිංහලයන්ට උරුම වූ සිංහල අලුත් අවුරුදු උත්සවය, දෙමළ ජනතාවගේ තෛයිපොන්ගල් උත්සවය, මුස්ලිම් ජනතාවගේ රාමසාන් උත්සවය හා කතෝලික/ක්‍රිස්තියානි ජනතාවගේ නත්තල් උත්සවය වැදගත් වේ. මේ නිසා උත්සව සමරන ආකාරය, උත්සවවලට සකස් කරන කැවිලි පෙවිලි යනාදිය තුළ ද විවිධත්වයක් ඇත. මෙම විවිධත්වය තුළ කිසියම් දුරකට සමීප බවක් ද දැකිය හැකි ය. උදාහරණ ලෙස බෞද්ධ ආගමික වතාවත්වලට හින්දූන් සහභාගීවීමත් හින්දු කෝවිල්වල පැවැත්වෙන ආගමික වතාවත්වලට බෞද්ධයින් සහභාගී වීමත් දක්නට ලැබේ. එමෙන් ම දන්සල් දීම බෞද්ධයින්ගේ වැඩ පිළිවෙළක් ලෙස පැවතුණ අතර මෑත කාලයේ දී එයට අනෙකුත් ජාතීන්ගේ සහයෝගය ද ලැබී ඇත. මෙයින් පැහැදිලි වන්නේ සමාජ සංකීර්ණත්වය ඕනෑ ම බහුවිධ සමාජයක දැකිය හැකි දෙයක් බවයි. නමුත් මෙම සංකීර්ණත්වය තුළ ඔවුනොවුන් එකට ජීවත් වීම වැදගත් වේ.

ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සෑම පුද්ගලයෙකුට ම තමන්ගේ ආගම, සංස්කෘතිය තමන්ගේ අනන්‍යතාව පවත්වාගෙන යාමට අවශ්‍යය නීතිමය රැකවරණ සපයා ඇත. එමෙන් ම අන්‍යයන්ගේ අයිතිවාසිකම්වලට අනන්‍යතාවන්ට ගරුකිරීම ද ආරක්ෂා කිරීම ද සහතික කර ඇත. එක් එක් ජන කොටස් ඔවුන්ට ආවේණික වූ සමාජ සංස්කෘතික ලක්ෂණ පවත්වාගෙන යන ගමන් අනෙක් අයගේ සමාජ සංස්කෘතික ලක්ෂණවලට ගරුකිරීම තුළින් සමාජයේ ගැටුම් අවම කරගැනීමට පුළුවන. වර්තමානයේ ශ්‍රී ලංකා සමාජයට අවශ්‍ය වී ඇත්තේ සමාජ විවිධත්වය තුළ අන්‍යෝන්‍ය ඒකාග්‍රතාවයෙන් කටයුතු කිරීම ය.

ප්‍රාදේශීය වශයෙන් භාෂාවේ විවිධත්වයක් දක්නට ලැබේ. උදාහරණ ලෙස උඩරට, පහතරට, රුහුණු, රජරට ආදී වශයෙන් එම භාෂාවේ විවිධත්වය කැපී පෙනේ. එමෙන් ම එක් එක් වෘත්තීන්ට අදාළව භාෂා විෂමතාවන් ද හඳුනාගත හැකි ය. උදාහරණ ලෙස කමත් භාෂාව දැක්විය හැකි ය.

මංගල අවස්ථාවල කතෝලික හා හින්දු ජනතාව පල්ලියේ ද කෝවිලේ ද උත්සව පවත්වති. බෞද්ධයින්ගෙන් අතලොස්සක් නූතනයේ විහාරස්ථානවල දී ද විවාහ චාරිත්‍ර පවත්වති. උඩරට විවාහ චාරිත්‍රවල දී මුල් ඇඳුම ද, පහතරට විවාහ චාරිත්‍රවල දී බටහිර ඇඳුම් ද භාවිත කරති. අවමංගල අවස්ථාවල බෞද්ධයන් සුදු ඇඳුමින් ද කතෝලිකයන් කළු ඇඳුමින්ද සැරසෙති.

එකම ආගමක් තුළ ද නිකාය වශයෙන්, පාර්ශව වශයෙන්, කුල වශයෙන් වෙනස්කම් දක්නට පුළුවන. සියම් මහා නිකායේ පාර්ශව අටක් ඇත. අමරපුර නිකායේ කොටස් විසිදෙකක් පමණ ඇත. ශ්‍රී ලංකා රාමඤ්ඤ මහා නිකායේ පාර්ශ්ව නොමැති අතර වන වාසී, ග්‍රාමවාසී භික්ෂූහු වැඩ වෙසෙති.

හින්දු ආගමිකයන් බහුදේව වන්දනයේ යෙදේ. ඔවුන් වන්දනා කරන දෙවියන්ගෙන් කිහිප දෙනෙකු වන්නේ විෂ්ණු, මුරුගන්, ශිව, ගනේෂ්, කාලි යන දෙවියන් ය. ක්‍රිස්තියානි ආගමේ ද විවිධ කොටස් ඇත. ඇන්ග්ලිකන් නිකාය, රෝමානු කතෝලික නිකාය ආදියද ඒ අතර වෙයි. ඉස්ලාම් ආගමේ සුන්නි මුස්ලිම්, ෂියා මුස්ලිම්වරුන් ලෙස බෙදීමක් ඇත. මෙම ප්‍රධාන ආගම් හතරට අයත් ආගමික උත්සව තිබේ. සියලු ජනවර්ග ආගමික උත්සව සාමූහිකව පවත්වති. උදාහරණ ලෙස සිංහල සහ දෙමළ අවුරුදු උත්සවය, වෙසක් සහ පොසොන් උත්සවය, ඇසළ උත්සවය, හින්දුන්ගේ වේල් හෝලි උත්සවය, නත්තල් උත්සවය දැක්විය හැකි ය. සියලු ම ජනවර්ග ලංකාව පුරාම මිශ්‍රව ජීවත් වෙති.

කිසිම ජනවර්ගයක් මානව කේන්ද්‍රණවාදය (Ethnocentrism) අනුව බැලීම භින්න රුචික සමාජයේ අපූර්වත්වය ගැන නොදැනුමක් බව කිව හැකි ය. සංස්කෘතික කම්පනයක් ඇති වුවත් කාලානුරූපව එය වටහා ගත යුතු වේ. මෙම විවිධතාවයේ චමත්කාරය ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරුන්ගේ නියෝජනය හා විශ්ව විද්‍යාලවල රාජ්‍ය අංශයේ හා පෞද්ගලික අංශයේ විවිධ ක්‍රීඩා ඉසව්වල නියෝජනය තුළින් පෙන්නුම් කරයි.

මෙය ජාතික සංහිඳියාව හා ආගමික සංහිඳියාව ඇති කිරීමට ද ඉමහත් රුකුලක් බව වාර්තමාන මාධ්‍ය භාවිතය මඟින් සනාථ කරයි.

වර්තමාන ශ්‍රී ලංකා සමාජයේ ජනවාර්ගික සංයුතිය හා ආගමික සංයුතිය 2012 ජන හා සංඛ්‍යා ලේඛන සංගණන වාර්තා අනුව මෙසේ ය.

**ජාතීන් අනුව**

| | |
|---|---|
| සිංහල | 74.9% |
| ශ්‍රී ලංකා දෙමළ | 11.2% |
| ඉන්දියානු දෙමළ | 4.2% |
| ශ්‍රී ලංකා යෝනක | 9.2% |
| බර්ගර් | 0.2% |
| මැලේ | 0.2% |
| වෙනත් | 0.1% |

**ආගම් අනුව ප්‍රතිශතය**

| | |
|---|---|
| බෞද්ධ | 70.2% |
| ඉස්ලාම් | 9.7% |
| හින්දු | 12.6% |
| රෝමානු කතෝලික | 6.1 % |
| වෙනත් ක්‍රිස්තියානි | 1.3% |
| වෙනත් | 0.1% |

මූලාශ්‍රය - ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව - 2012

මේ හැර සිංහල බෞද්ධ ප්‍රජාව සිංහල කතෝලික, ද්‍රවිඩ හින්දු, ද්‍රවිඩ කතෝලික, ද්‍රවිඩ බෞද්ධ ආගමික අනුගාමිකයෝ වෙති. වැදි ප්‍රජාව ද, අභිකුණ්ඨික ප්‍රජාව ද ශ්‍රී ලාංකික පුරවැසියෝ වෙති. ඔවුන්ගේ සංස්කෘතික ලැදියාවන් අනුව විවිධ උප සංස්කෘතීන් දක්නට පුළුවන. මෙහි සංකීර්ණ ස්වභාවයක් දක්නට ලැබේ. මෙම විවිධත්වය ලාංකීය සමාජය අගය කරයි.

මෙය බොහෝ දුරට නිරූපණය වන්නේ සිංහල, දෙමළ, මුස්ලිම් ජනතාවගේ ඇඳුම් පැළඳුම් හා ආගමික උත්සවවලදී ය. ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් ද ජාතීන් අතර අනන්‍යතාව සුරක්ෂිත කර ඇත.

**ක්‍රියාකාරකම් 4.3.1**

01. ශ්‍රී ලංකාවේ භාවිත වන ප්‍රධාන භාෂා තුන ලියන්න.

03. එකිනෙකා කරන රැකියාවන් අනුව සමාජය විවිධත්වයට බෙදී වෙන්කර ඇත. එයැනි විවිධ රැකියා පහක් ලියන්න.

04. ඒ ඒ ජාතීන්ට ආවේනික සංස්කෘතික උත්සව නම් කරන්න.

05. ශ්‍රී ලංකාවේ ථේරවාදී බුදු දහම නිකාය වශයෙන් බෙදී ඇති ප්‍රධාන නිකාය තුන ලියන්න.

## 4.4 බුදුදහම හා සමාජ ජීවිතය

කිසියම් ජන සමාජයක සංස්කෘතියක් ගොඩනැගෙන්නේ එම සමාජය සතු ව පවත්නා සමාජ සිරිත් විරිත්, කලාව, භාෂාව ආදී සියල්ල මුල්කොට සම්මත කර ගත් ජීවන රටාව අනුව ය. පාරම්පරිකව අත්පත් කොට ගෙන ඇති එම සමාජය සතු සියලු චර්යාවන්හි එකතුව ද එම සමාජයේ

සංස්කෘතිය වශයෙන් සලකනු ලැබේ. සංස්කෘතිය වනාහි කිසියම් ජන සමාජයක අනන්‍යතාව ප්‍රකට කෙරෙන මූලික සාධකය ලෙස දැක්විය හැකි ය.

ශ්‍රී ලංකා ජන සමාජය පෝෂණය වූයේ මිහිඳු මාහිමියන්ගෙන් ලැබුණු ථේරවාදී බුදුදහමේ ආභාසයෙනි. එම සමාජ දහම ලාංකේය සමාජය වැළඳ ගැනීමෙන් බෞද්ධ රාජ්‍යයක් ලෙස නැගී සිටියේ ය. අවිහිංසාව, සමගිය, පරහිතකාමීත්වය, කෘතවේදීත්වය සහ මිත්‍රත්වය ආදිය සහ සීලය මුල් කර ගත් සංවරය තුළින් ආදී ලක්වැසියෝ බුදු දහම වැළඳ ගැනීමත් සමඟ ආචාරශීලි ගෞරවාන්විත ජන කොටසක් බවට පත්වූහ. ඒ වන විට බුදු සමයෙන් ප්‍රභාවිත වූ සාහිත්‍ය කලාව, ගෘහ නිර්මාණ ශිල්පය, මූර්ති හා කැටයම් ශිල්පය සමඟ පෙරදිග ප්‍රචලිතව පැවති විශිෂ්ට වාරි කර්මාන්ත ශිල්පීය ක්‍රමයන් ද බුදු සමයත් සමඟ අපට ලැබුණු දායාදයන් ය.

සරුසාර පොළොවකින් යුත් ශ්‍රී ලංකාවේ කෘෂිකර්මාන්තය දියුණු කර ගැනීම උදෙසා ජලය ඒකරාශි කිරීමට වැව් තැනීම ආරම්භ කරන ලද්දේ බුදු සමයෙන් ශ්‍රී ලාංකිකයන් ප්‍රබුද්ධතාවට පත්වූ නිසා ය. දේවානම් පියතිස්ස රජතුමා බෞද්ධයකු බවට පත්වීමත් සමඟ බෞද්ධ රාජ්‍යය පාලනය ඇරඹිණ. බුදුදහම රාජ්‍ය ආගම බවට පත්විය. පසු කලෙක රජ බෝසත් ගති ගුණ ඇත්තෙකු විය. රට ආර්ථික වශයෙන් සමෘද්ධියට පත් කිරීමත්, ජනතාවගේ ආචාර ධර්ම සකස් කිරීමත් අරමුණු කර ගෙන වෙහෙර විහාර ඇරඹිණ. භික්ෂූන් වහන්සේගේ අනුශාසනා පරිදි ආගමික උත්සව පවත්වනු ලැබී ය. විහාරස්ථාන සෑම ගමකම පුරෝගාමී ස්ථානය වූ අතර ප්‍රධාන අනුශාසකයා වූයේ භික්ෂූන් වහන්සේ ය. ගමේ දරුවන්ට ශිල්ප ශාස්ත්‍ර මෙන් ම හොඳ - නරක කියා දෙන ලද්දේ උන්වහන්සේ විසිනි. ගම් වැසියෝ සවසට විහාරයට ගොස් වන්දනාමාන කොට දහම් කරුණු දැන කියා ගත්හ.

වැඩිහිටියන්ට ගරු කිරීම, ආගන්තුක සත්කාරය, කාරුණික බව, සමගි සම්පන්න බව නිරන්තරයෙන්ම දක්නට ලැබුණි. අස්වනු නෙළාගත් වැසියෝ දන්දීම ආදී පිංකම් නොකඩවා සිදු කළහ. නොඉඳුල් ශෂ්‍යයේ අග්‍ර කොටස **"අගහස්දානය"** හෙවත් අලුත් සහල් මංගල්‍ය නමින් බුදුනට පිදූහ. කඨින පිංකම්, ඇසළ උත්සව, පොසොන් උත්සව වර්ෂයේ නියමිත කාලවලදී සිදු කළහ. තෙරුවන් මුල් කර ගෙන වන්දනා මාන කිරීම නිසා මුළු මහත් ජීවන පරිසරය පුරාම බුදුදහම පැතිර ගියේ ය. රජතුමා බෝසත් චරිතය අනුගමනය කරන්නෙකු විය.

දසරාජ ධර්මය, සතර සංග්‍රහ වස්තු, සප්ත අපරිහානිය ධර්මය රාජ්‍ය පාලනයේ මූල ධර්ම ලෙස පිළිගැනීමට පාත්‍රවිය. සෑම රජ කෙනෙක් විසින් ම දළදා වහන්සේ සේසතින් පුදනු ලැබීය. බෞද්ධ රාජ්‍ය උරුමය බුදුරදුන්ට පුදනු ලැබී ය.

වැව ජීවනාලිය කර ගත් ගම්මාන රටපුරා බිහිවිය. වැව් තිස්දහසක් පමණ ද, ඇළ දොළ හැටදහසක් පමණ ද ඉදි වූ අතර බොහෝ විට ගම හඳුන්වන ලද්දේ වැවේ නමින් ය. ඒ අනුව කලා වැව, තිසා වැව, මහිලා වැව, අලුත් වැව, නික වැව ආදී වශයෙන් බොහෝ ගම්මාන හඳුන්වා ඇත. වියළි පරිසරයක් ඇති රජරටට සිසිලස ගෙන දුන්නේ මේ වාරි ශිෂ්ටාචාරය නිසා ය. සමතුලිත පරිසරය, ජීවහිතකාමී සහ පරිසර හිතකාමී විය. වැවේ දියවර ඇළ වේලි ඔස්සේ ගොස් කෙත්වතු සරුසාර කළේ ය. සතා සිව්පාවුන් පවා "කුරුලු පාළුව" නමින් හැඳින්වෙන ලියද්දේ නිදහසේ ආහාර ගත්තේ ය.

අටලෝ දහමින් අකම්පිතවීම, සුචරිතය-දුෂ්චරිතය පිළිබඳ සංකල්ප ශ්‍රී ලාංකීය ජන විඥ්ඤාණය තුළ ස්ථාපිත විය. මේ සඳහා බෞද්ධ සාර ධර්ම විදහා දක්වෙන තේමාවක් ඔස්සේ නිර්මාණය වූ සාහිත්‍ය කෘතිවල විශිෂ්ටත්වය ද හේතු විය. ලෝ වැඩ සඟරාව, කාව්‍යශේඛරය, සුභාෂිතය, පන්සිය පනස් ජාතකය, බුත් සරණ, අමාවතුර ඉන් කිහිපයකි. ත්‍රිපිටක සාහිත්‍යයේ එන මංගල, පරාභව, වසල, සිඟාලෝවාද, ව්‍යග්ගපජ්ජ සූත්‍ර මෙන් ම විමාන වත්ථු, පේත වත්ථු, ධම්ම පදය වැනි පොත් පත් මගින් මානසික සංවර්ධනයට අවශ්‍ය සාරධර්ම පැහැදිලි කර ඇත.

ප්‍රධාන සමාජ පාලනය දේවධර්ම හෙවත් හිරි ඔත්තප්ප මඟින් සිදුවිය. බෞද්ධ සමාජානුයෝජනය සාරධර්ම මත සිදුවිය. කුඩා කාලයේ සිටම සමාජයට අනුවර්තනය වූයේ බෞද්ධ පුරුෂාර්ථයන්ට අනුව ය. කරුණාව, සාමය, සතුට, කාර්යක්‍ෂමතාව,සහයෝගය, ධෛර්ය, නිරවද්‍යතාව, මිත්‍රත්වය මානව චර්යාධර්ම අර්ථවත් කිරීමට හේතු විය. ගමේ සියලු දෙනාම සහයෝගයෙන් ඇළ, දොළ, ඒදඬු, ගෙවල් දොරවල් ඉදි කළහ. මෙම සුහදතාව, සන්තෘෂ්ටිය තහවුරු වූයේ බුදුදහම හා භික්ෂූන් වහන්සේ නිසා ය. ශ්‍රී ලංකාවට ආවේණික සරල අල්පේච්ඡ ජීවන රටාව හා මිත්‍රශීලි බව ඉහත සුසංයෝගයෙන් දායාද කළ විශිෂ්ට ප්‍රතිඵල වෙයි.

තෘෂ්ණාව මුල් කොට ගත් ඇලීම හා ගැටීම නිසා ලෞකික ආශාවන් හී ඇලෙන මිනිසා කොතෙක් සම්පත් ලැබුණත් එයින් තෘප්තිමත් නොවේ. ඔහු තව තවත් සම්පත් බොහෝ ප්‍රාර්ථනා කරයි. පරලොව යන විට රැගෙන යන්නේ කුසල් අකුසල් දෙක පමණක් බව කර්ම සංකල්පය තුළින් පැහැදිලි කරයි. ඒ ඔස්සේ නිර්ලෝභිව පුණ්‍ය කටයුතු සඳහා දයක වීමට බුදුදහම විසින් මිනිසා පොළඹවයි.

මීළඟට අපගේ අවධානය යොමු කළ යුතුව ඇත්තේ බෞද්ධ සාහිත්‍යය මූලාශ්‍රයන් වෙතය. එය පුද්ගලයෙකුට බලපාන අයුරු මෙහිදී විමසා බැලිය යුතුව ඇත. එමගින් ඒවායේ ඇති සමාජ විද්‍යාත්මක අගය ද වටහා ගැනීම වැදගත් වේ. බෞද්ධයන්ගේ ප්‍රියතම බෞද්ධ සාහිත්‍යය මූලාශ්‍රයක් වන ජාතක පොත වනාහි මිනිස් චරිත පිළිබඳ සැබෑ ජීවිත විවරණයන් ඇතුලත් ග්‍රන්ථයකි. බුද්ධිමත් පුද්ගලයෙක් තම රාජ්‍ය හා වැසියන් බේරා ගන්නා ආකාරය උම්මග්ග ජාතකයෙන් ද, දාන පාරමිතාව පිළිබඳව වෙස්සන්තර ජාතකයෙන් ද, ප්‍රේමය පිළිබඳ කුස ජාතකයෙන් ද පතිභක්තිය සම්බුලා ජාතකයෙන් ද විස්තර කරයි. ඉහත ජාතක කතාවලින් හමුවන සමාජ නියෝජිතයන් සජීවි චරිතයන් ලෙස ඉදිරිපත් වේ. එම සිතුම් පැතුම් හා චරිත ලක්ෂණ පොදු ජනතාවට බෙහෙවින් සමීප වන බැවින් ලක්දිව ජන හදවත් හි එම චරිත රැඳී සිටීම නිසා සමාජ සාරධර්ම පෝෂණය කිරීමෙහි ලා ජාතක පොතින් එදා මෙදා තුර ලැබී ඇති පිටුබලය ඉමහත් ය. සිත පිළිබඳ මනෝ විශ්ලේෂණයක් ජාතක පොතින් හෙළිවෙයි. බෞද්ධ සමාජනුයෝජනය පිළිබඳව හා මානව පවුලේ කාර්යභාරය, තත්ත්වය හා භූමිකා නිරූපණය පිළිබඳව සිඟාලෝවාද සූත්‍රයේ දක්වෙයි. පවුල වැනි සමාජ සංස්ථාවල මූලික කාර්යභාරය වන්නේ පිරිපුන් පෞරුෂ ගති ලක්ෂණ ඇති පුද්ගලයකු හැඩගැස්වීම ය. සිඟාලෝවාද සූත්‍රයේ එම කාර්යන් වෙන් කොට දක්වා තිබේ. දරුවන්ගේ දෙමව්පියන්ගේ කාර්ය භාරය, ස්වාමියාගේ හා බිරිඳගේ කාර්ය භාරය, ගුරු-ශිෂ්‍ය කාර්ය භාරය, දසි දස් කම්කරු ස්වාමි සේවක කාර්ය භාරය, ගිහි පැවිදි කාර්ය භාරය කෙබඳු විය යුතු දැ යි දක්වයි. අතීතයේ වඩාත් තෘප්තිමත් ජන සමාජයක් පවත්වා ගෙන යාමට මෙම සමාජ දර්ශනය හේතුවිය. දික්කසාදවීම්, මහලුවියේ ගැටලු, අධ්‍යාපන ගැටලු, වැඩ වර්ජන, සමාජ ප්‍රශ්න නොවූයේ බෞද්ධ සමාජානුයෝජන කාර්යය සමාජ සංස්ථාවලින් නිසි පරිදි සිදුවීම නිසා ය.

බෞද්ධයෝ ඇසුරු කළ යුතු මිත්‍රයන් හා මිත්‍ර ප්‍රතිරූපකයන් පිළිබඳ ව, සද්ගුණ හා අවගුණ ගැන අවබෝධය ආගමික ඉගැන්වීම තුළින් ලබා ගත්හ. පරාභව සූත්‍රයෙහි මිනිසුන් පිරිහෙන ආකාරය අලස බව, සූරා සොඬ බව, සූදුව, ස්ත්‍රී ලෝලිත්වය පිළිබඳ ව මනාව විස්තර කරයි. මංගල සූත්‍රයේ කරුණු තිස් අටක් සාරධර්ම පද්ධතියක් ලෙස දක්වා ඇත. එහි මව්පිය උපස්ථානය, අඹුදරුවන්ට සංග්‍රහ කිරීම, නිවැරදි කර්මාන්ත කිරීම, වැඩිහිටියන්ට ගරු කිරීම, ලද දෙයින් සතුටු වීම, ඉවසීම සහ අනතිමානී බව යහපත් පුද්ගල චර්යා ධර්ම බව විස්තර කර තිබේ.

මේ හැර මානව පවුලේ සමාජ සම්බන්ධතා කරුණු පහක් වටා සකස් විණි. පවුලේ අය එකට ආහාර ගැනීම, එකම වේලාවක සාමූහිකව ආගම සිහි කිරීම, ජාතක පොත වැනි සමාජ ධර්ම පිරි ග්‍රන්ථයක් සාකච්ඡා කිරීම, මව්පිය දූ දරුවන් සාමූහිකව කටයුතුවල යෙදීම, චිරාගත චාරිත්‍ර වාරිත්‍ර ඉටු කිරීම යනාදියයි. කාම තෘෂ්ණාව පාලනය කිරීම සඳහාත්, ඒඩ්ස් වැනි සමාජ රෝග පාලනය කිරීම සඳහාත්, සමාජ විසංවිධාන අවස්ථා වළක්වාලීම සඳහාත් ඒක ස්ත්‍රී , ඒක පුරුෂ විවාහය අගය කළහ.

බිරිඳ හා සැමියා එකිනෙකා සරණ ගියහ. බෞද්ධ සරණ බන්ධනය මෙලොවට පමණක් නොව සංසාරය පුරාවට ම සම්බන්ධ වූවකි. දෙදෙනා කෙරෙහි ප්‍රසාදය, හික්මීම, සවන්දීම, පරිත්‍යාගශීලී වීම, සාමූහිකව සාකච්ඡා කිරීමෙන් තීරණ ගැනීම බෞද්ධ සමාජයේ දක්නට ලැබේ. එකට ආහාර අනුභව කිරීම තරම් වැදගත් අවස්ථාවක් තවත් නැත. වෙහෙස වී උපයා සපයාගත් ආහාර බෙදා හදා ගැනීම මින් අපේක්ෂිත ය. එය ලාංකීය බෞද්ධයින්ගේ චාරිත්‍රයකි. උදේ සවස මව්පියන්ට වැඳීම, රැකියාවට යන ස්වාමියාට වැඳීම, දරුවන්ට ආශිර්වාද කිරීම ආදී සිරිත් තුළ ගැබ් වූයේ අන්‍යෝන්‍ය ගෞරවයයි. මෙසේ බුදුදහම හා හැඩ ගැසුණු පැරණි සමාජ ජීවිතය නිසා සමාජීය පරමාර්ථ ඉෂ්ඨකර ගැනීමට හැකි විය. දානය, ප්‍රිය වචනය, අර්ථචර්යාව, සමානාත්මතාව, සමාජයක වැදගත් ගුණාංග වෙයි. ජීවිතයේ සෑම අවස්ථාවක ම සදාචාර ධර්ම ප්‍රමුඛ විය යුතු බව බුදුසමය සලකන්නේ ඒවායෙහි ඇති සමාජීය වැදගත්කම නිසා ය.

## ක්‍රියාකාරකම් 4.4.1

01. බුදු දහමින් ලාංකික ජීවිත පෝෂණය වූ ආකාරය විස්තර කරන්න.

02. කෘෂි කර්මාන්තය කෙරෙහි බුදු දහම බලපෑ ආකාරය පහදන්න.

03. මහින්දාගමනය රාජ්‍යය පාලනය කෙරෙහි බලපෑ ආකාරය විස්තර කරන්න.

04. භික්ෂුණී වහන්සේ බෞද්ධ ජනතාවගේ මුරදේවතාව බවට පත් වූ ආකාරය පැහැදිලි කරන්න.

05. බෞද්ධ පොත පත තුළින් අල්පේච්ඡ ජීවිතය බෞද්ධයා සකසා ගත් අයුරු පහදන්න.

# 05 සමාජ පාලනය

## 5.1 සමාජ පාලනයක අවශ්‍යතාව ග්‍රාමීය හා නාගරික සමාජ ඇසුරින්

සමාජයක් යනු චේතනාත්මක භාවයෙන් යුක්ත විවිධ තරාතිරමේ පුද්ගල එකතුවකි. එහෙත් ඒ පුද්ගල එකතුව අන්‍යෝන්‍ය පුද්ගල ඒකාබද්ධතාවකින් සකස් විය යුතු වෙයි. ඒ අනුව පොදු අරමුණක් මත සකස් වූ ඒකකය සමාජය ලෙස අපි හඳුන්වමු.

ඒ සමාජය තුළ ආදරය, කරුණාව, දයාව, මෛත්‍රිය, අනුකම්පාව සහ පරාර්ථකාමීත්වය වැනි යහපත් චිත්තවේගයන් ගෙන් මෙන් ම ද්වේෂය, ඊර්ෂ්‍යාව, ආත්මාර්ථකාමීත්වය, වෛරය, පළිගැනීම ආදී අයහපත් චිත්තවේගයන් ගෙන් ද යුක්ත වූ පුද්ගලයන්ගෙන් සමාජය ගහණ ය.

ඉහත දැක්වූ යහපත් චිත්ත වේගයන්ගෙන් පමණක් සමන්විත වූ සමාජයකට නම් සමාජ පාලනයක් අත්‍යවශ්‍ය නොවේ. නමුත් අයහපත් චිත්ත වේග නිසා සමාජය තුළ අරගල, කලකෝලාහල, සාමය කඩවීම් හා සමාජ සහජීවනයට බාධා එල්ලවීම් නිරන්තරයෙන් සිදුවේ. වර්තමාන සමාජය තුළ මෙම ප්‍රවණතාව වැඩි වශයෙන් දක්නට ලැබේ.

මානවයාගේ ආරම්භයේ සිට සමාජ පාලනයක් පිළිබඳ තොරතුරු ත්‍රිපිටක ග්‍රන්ථ ආශ්‍රයෙන් ලබාගත හැකිවෙයි. දීඝ නිකායේ අග්ගඤ්ඤ සූත්‍රයේ මේ පිළිබඳ තොරතුරු දක්නට ලැබෙයි. මානව වර්ගයාගේ ආරම්භයෙන් පසු ක්‍රමයෙන් තෘෂ්ණාව, ආහාර පිළිබද ඇති කරගත් ලෝභය, කාම සේවනය, හොරකම සහ මුසාවාදය (බොරුකීම) ගැටම් සහ ප්‍රජා ඝාතනය ඇතිවූ බවත් එම අර්බුද නිරාකරණයට මානව වර්ගයා අතුරෙන් කෙනෙක් පත්කර ගත්බවත් දක්වා ඇත. ඔහු "මහා සම්මත" නමින්

හඳුන්වා තිබේ. මෙය සමාජ පාලනයේ ආරම්භක අවධිය ලෙස දැක්විය හැකි ය.

පුද්ගල නිදහස භුක්තිවිඳීමට යාමේදී අන්‍ය පුද්ගලයන්ගේ නිදහසට බාධා එල්ලවීමෙන් ගැටලු පැන නගී. මෙම පසුබිම හමුවේ සැමට පොදුවේ භුක්තිවිඳිය හැකි අයිතිවාසිකම් හා ඉටුවිය යුතු යුතුකම් සමුදායක් ක්‍රියාත්මක වීම තහවුරු කිරීම සමාජ පාලනය මගින් සිදු වේ. සමාජය පාලනය කිරීම සඳහා අතීතයේ සිට නොයෙක් ක්‍රම ක්‍රියාත්මක වී තිබේ. නායකයාගේ අභිමතයට පාලනය වූ ගෝත්‍රික සමාජ ව්‍යුහයේ සිට නූතන ප්‍රජාතන්ත්‍රවාදී පාලන ව්‍යුහය දක්වා සමාජ පාලනය ක්‍රමික විකාශනයකට ලක් විය. එමෙන් ම එය සරල තත්ත්වයේ සිට සංකීර්ණත්වයට පත්වූ අතර සමාජ පාලනය සඳහා ව්‍යුහාත්මක වෙනස්කම් ද සමාජය තුළ ස්ථාපිත ය. අධිකරණය, බන්ධනාගාරය ආදිය එවැනි සමාජ පාලන ආයතන ලෙස කැපී පෙනෙයි.

## ග්‍රාමීය සමාජය හා එහි පාලනය

ක්ලිෆර්ඩ් ගියට්ස්ගේ ( Clifford Geertz ) පැහැදිලි කිරීමට අනුව ලෝකයේ ප්‍රථම ගම්මානය ක්‍රිස්තු පූර්ව 6750 දී පමණ ඉරාකයේ බිහිවූ බව දැක් වේ. ඉන්පසු ක්‍රිස්තු පූර්ව 5000 දී අත්ලන්තික් යුරෝපයේ ද නැවත ක්‍රිස්තු පූර්ව 1500 දී පමණ බටහිර අප්‍රිකාවේ ද බිහිවූ බව ක්ලිෆර්ඩ් ගියට්ස්ගේ අදහස වේ.

"ගම" යන්න බිඳී තිබෙන්නේ සංස්කෘත භාෂාවෙන් "ග්‍රාම" සහ පාලි භාෂාවෙන් "ගාම" යන ශබ්දයෙනි. එහි වචනාර්ථය සමූහය හෝ එකතුව යන්න ය. රාජ්‍යයක ජනාවාස අතර කුඩා ම ඒකකය වූයේ ගම ය.

වර්තමාන ලංකාවේ ගම් 26,000කට අධික ප්‍රමාණයක් ඇති අතර ලාංකීය ජනගහනය 80% ක් පමණ තවමත් ගම්වල ජීවත්වන බව දක්නට ලැබේ.

ශ්‍රී ලංකාවේ පුරාණ ගම්මාන පිළිබඳ ව සපයාගත හැකි තොරතුරු අල්ප

වුවත් විටින් විට ලංකාවට පැමිණි සංචාරකයන්ගේ වාර්තාවල මේ පිළිබඳ තොරතුරු සඳහන් වේ.

ශ්‍රී ලංකාවේ උඩරට රාජධානියේ වසර 20ක් පමණ සිරකරුවෙකුව සිටි රොබට් නොක්ස් ගේ "එදා හෙළ දිව" පොතෙහි ගම් පිළිබඳ පුළුල් විස්තරයක් අඩංගු වේ. පහත දැක්වෙන්නේ එම කෘතියෙන් උපුටා ගත් කොටසකි.

"මෙම දීපයෙහි යම් යහපත් ගමක් ඇතොත් එහි විහාරයක් හෝ දේවාලයක් හෝ ඇත. එම විහාර දේවාල ගම්වලට අයත් ය. එම ගම්වල වීදි බෙදී යන පරිද්දෙන් ගෙවල් එකිනෙක යා කොට පෙළට නිර්මාණය කොට ඇත්තේ ය. භවබෝගවලට හදි කිරීමට පැමිණෙන ගවයින් සහ වනසතුන්ගේ ගමන වැළැක්වීම සඳහා ඉදිකරන ලද බඩවැටියකින් හා අගලකින් පරික්ෂිප්ත වූ ගොවිපළවල ගොවියෝ වෙන් වෙන් ව වාසය කරති. සියලු ම ගම්; සිරිතක් වශයෙන් මහා මාර්ගයට නුදුරෙන් පිහිටා ඇත්තේ ය. මේ මාර්ගය හැර යමෙකු ගම් මැද්දෙන් ගමන් කරතොත් එය අත්‍යවශ්‍ය ම කරුණක් නිසා ය. නිකරුනේ ගම්මැද්දෙන් ඇවිද යාම ගම්වැසියෝ නුරුස්නාහ. විශාලත්වයෙන් එතරම් දිග පළල නැති ගමක සමහර විට ගෙවල් 40ක් හෝ 50ක් පමණ ද ඉදින් නියම් ගමක් නම් ගෙවල් 100ක් හෝ වැඩි ගණනක් ද ඇත්තේය. ජනහීන වූ ඇතැම් ගම්වල ගෙවල් 8කට 10කට වඩා නැත්තේ ය."

මෙම අදහසට අනුව "ගමක් යනු කෘෂිකාර්මික ජීවන රටාව තුළින් තම ජීවනෝපාය මාර්ගය සකස් කර ගන්නා එම ආර්ථික ක්‍රියාදාමය නිසා හෝ වෙනත් සාමාජීය බැඳීම් පදනම් කරගෙන අන්‍යෝන්‍ය සහජීවනයෙන් කටයුතු කරන ජන සමූහයක් ජීවත් වන ප්‍රදේශයකි" යනුවෙන් දැක්විය හැකි ය. ඔවුන්ගේ ආර්ථික ක්‍රියාදාමයේ ප්‍රධානම සම්පත භූමිය වන අතර සත්ත්ව පාලනයටද මුල් තැනක් ලබාදෙන බව කිව යුතු ය. ගවයන් ඇති කිරීම තුළින් තම ජීවන ක්‍රියාදාමය ස්වංපෝෂිත කරගත හැකි බව ඔවුන්ගේ විශ්වාස යයි. ඒ අනුව ගවයින් වැඩි ගණනක් සිටින ගම් වැසියා ඉහළ ආර්ථික ශක්තියක් ඇත්තෙකු වේ.

අතීතයේ සිට ගමක පාලනය සිදුවූයේ රජු විසින් පත් කරන ලද "ගමික" යනුවෙන් හඳුන්වන ලද පුද්ගලයෙකුගෙනි. ගමිකගේ ප්‍රධාන කාර්යය වූයේ ගමේ එදිනෙදා සිදුවන ආර්ථික ක්‍රියාදාමයන්ට සම්බන්ධ වී රජු වෙනුවෙන් ගමෙන් බදු එකතු කිරීමයි. කලට වේලාවට කෘෂිකාර්මික කටයුතුවලට ග්‍රාමීය ජනතාව යොමු කිරීමත් නිසි කලට වැවෙන් ජලය නිකුත් කිරීම ආදිය මොහුගෙන් සිදුවූ බවට ඉතිහාසගත තොරතුරු වලින් පැහැදිලි වේ. 'ගාමිණී' නමින් හැඳින්වූ මොහු පසු කලෙක රජ කමටද පත්වී ඇත.

මුල් කාලීන ග්‍රාමීය සමාජවල පාලනය ඉහත ආකාරයට කිසියම් පෙළ ගැස්මක් යටතේ ක්‍රියාත්මක වෙද්දී ඉංග්‍රීසීන් විසින් මේ රට යටත්කර ගැනීමත් සමඟ නව පාලන ක්‍රමයක් ග්‍රාමීය සමාජ පාලනයට සම්බන්ධ කළේ ය. ඔවුන් විසින් ගම් පාලනය සඳහා පත්කළ පුද්ගලයා හැඳින්වූයේ "Village Headman" (ගම් ප්‍රධානියා) යන නමිනි. ඉංග්‍රීසි පාලනය යටතේ විලේජ් හෙඩ්මන් පත්කර තිබුණේ විශේෂයෙන් ඉංග්‍රීසි ආණ්ඩුවේ අවශ්‍යතා ඉටුකරගැනීමේ පදනම මතයි. එසේ හෙයින් ශ්‍රී ලාංකික ග්‍රාමීය ජන සමාජය ඔහුට වඩා ගමේ පන්සලේ හාමුදුරුවෝ, පාසලේ ගුරුවරයා, ගමේ වෙද මහතා පිළිබඳ ව කිසියම් අවනත බවක් දක්වා තිබුණි. අද ද එම තත්ත්වය ඇතැම් ග්‍රාමීය සමාජ ඒකක තුළ දක්නට ලැබේ.

ඉංග්‍රීසි ආණ්ඩුව විසින් "Village Headman" (ගම් ප්‍රධානියා) නමින් හඳුන්වා දුන් තනතුර නිදහස ලබා ගැනීමෙන් පසු "ගම්මුලාදෑනි තනතුර" (ගමේ ආරච්චිරාළ) ලෙස පරිවර්තනය විය. මෙම නිලය කාලයාගේ ඇවෑමෙන් ග්‍රාම සේවක, ග්‍රාම නිලධාරි තනතුර තෙක් පරිවර්තනය විය.

මේ අනුව ගැමි සමාජය පාලනය කරන ප්‍රධාන ඒකකය ග්‍රාම නිලධාරිවරයා වේ. මහා සම්මත රජුගේ කාලයේ සිට විවිධාකාර ග්‍රාමීය සමාජ පාලන ඒකක බිහිවී තිබුණේ සමාජ පාලනයක අවශ්‍යතාව ග්‍රාමීය සමාජයට දැඩි ව අවශ්‍ය වී තිබූ බැවිණි.

### නාගරික සමාජය සහ එහි පාලනය

මුල් ම ගම්මාන බිහිවීම ඉරාකයේ සිදුවූවාක් මෙන් මුල් ම නගර බිහිවී

ඇත්තේ ග්‍රීසියේ බවට තොරතුරු දක්නට ලැබේ. ඒවා හැඳින්වූයේ පෞර රාජ්‍ය වශයෙනි. එසේ වූවත් නගර බිහිවීම පිළිබඳ ඉතිහාසය තව දුරටත් අතීතයට ගමන් කරයි. ඒ අනුව ක්‍රිස්තු පූර්ව 3000දී ගංගා නිම්න ආශ්‍රිත ව බිහිවූ ශිෂ්ටාචාරවල නගර දක්නට ලැබේ. යුප්‍රටීස් ටයිග්‍රීස් නමින් වූ දෙගම්මැදි ශිෂ්ටාචාරයේ සුමේරි (බැබිලන්) යන නගර පැවති බවත් ඉන්දු නිම්න ශිෂ්ටාචාරයේ "හරප්පා, මොහෙන්දොජාරෝ" යනුවෙන් නගර සහ නයිල් නිම්න ශිෂ්ටාචාරයේ "මෙම්පීස්" නගර පැවති බවටත් සාධක ඇත. නගර පිළිබඳ ඉතිහාසය මේ ආකාරයට දක්නට ලැබුණත් ග්‍රීසියේ පැවති නගර පිළිබඳ වඩාත් පැහැදිලි තොරතුරු දක්නට තිබේ. ඍජු ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රම පැවතියේ මෙම නගර ආශ්‍රිත ව යි. ඒවා පෞර රාජ්‍ය ලෙස හඳුන්වයි. ඇතැන්ස්, ස්පාටා ආදී නගර ඊට උදාහරණ වේ. පාලි හා සංස්කෘත භාෂාවලින් "නගර" ලෙස හැඳින්වෙන පදය සිංහල භාෂාවට යොදාගෙන තිබුණේ "නුවර" යනුවෙනි. එහෙත් වර්තමානයේ උච්චාරණ පහසුව සඳහා නගර යන වචනය ම තත්සම ලෙස යොදා තිබේ.

ග්‍රාමීය ජන සමාජයකට වඩා සංකීර්ණ වූ ජන සමූහයක් වෙසෙන වාණිජ ආර්ථිකයට මුල්තැන දෙමින් ක්‍රියාත්මක වන සමාජ ඒකකය නාගරික ජන සමාජය ලෙස අපි හඳුන්වමු. මෙම නාගරික ජන සමාජ පිළිබඳ විවිධ වූ නිර්වචන ඉදිරිපත් වී තිබේ. බ්‍රිතාන්‍ය විශ්ව කෝෂය නාගරීකරණය පැහැදිලි කරන්නේ මෙසේ ය. නාගරීකරණය (Urbanization) යනුවෙන් හඳුන්වන්නේ ''ජනගහන පුරවර හෝ නාගරික ප්‍රදේශවල ජන ඒකරාශිවීමේ ක්‍රියාවලියයි''.

නගරය තුළ ජීවත්වන ජන සංඛ්‍යාව සලකා නගර වර්ග කිරීමක් සිදු කර ඇත. ඒ අනුව නගර වර්ග පහක් දක්නට පුළුවන.

* කුඩා නගර
* මධ්‍යම නගර
* මහ නගර(ජනගහනය ලක්ෂයේ සිට මිලියනය දක්වා)
* මිලියන නගර (ජනගහනය මිලියනයේ සිට මිලියන දහය දක්වා)
* අති විශාල මිලියන නගර (ජනගහනය මිලියන සියයට වැඩි නගර)

පුද්ගලයා ගමින් නගරයට සංක්‍රමණය වී නාගරික ප්‍රදේශවල ජන සංඛ්‍යාව වර්ධනය වී නගර පුළුල්වීම නාගරීකරණය වශයෙන් ඉතා සරලව

දැක්විය හැකි ය. නාගරීකරණය මගින් ලෝක ජන සංඛ්‍යා ව්‍යාප්තිය කෙරෙහි ප්‍රබල බලපෑමක් ඇති කරනු ලබයි. ග්‍රාමීය ප්‍රදේශවල සිට නාගරික ප්‍රදේශවල ඒකරාශී වෙමින් ඔවුන් චර්යා රටා ගොඩනගා ගැනීම නාගරීකරණය" වශයෙන් දැක්විය හැකි ය. විශේෂයෙන් නාගරික ප්‍රදේශවලට ආවේණික චර්යා රටාවන් සමුදායක් දක්නට ලැබේ. ඒවා හුදෙක් ග්‍රාමීය ජන සමාජයෙන් බොහෝ සෙයින් වෙනස් වන චර්යාවන් ලෙස දැක්විය හැකි ය. එක් එක් නගරවලට ආවේණික වූ චර්යා රටාවන් ද දක්නට පුළුවන.

නගරයේ ඇති ආකර්ෂණීය සාධක (යටිතල පහසුකම්) හේතුවෙන් නාගරීකරණය වේගවත් වී ඇත.

එම යටිතල පහසුකම් කිහිපයක් පහත දැක්වේ.

01. පරිපාලන කේන්ද්‍රස්ථාන
02. කර්මාන්ත පුරවර
03. රැකියා පහසුකම්
04. අධ්‍යාපන පහසුකම්
05. සෞඛ්‍ය පහසුකම්
06. ප්‍රවාහන පහසුකම් / සන්නිවේදන පහසුකම්
07. ඉහළ වෙළඳපොළ පහසුකම්
08. වෙනත් යටිතල පහසුකම්

යථෝක්ත සාධක රැසකගේ බලපෑම් සමඟ ග්‍රාමීය ජන කොටස් නගර කරා ඇදී එයි. විශේෂයෙන් කෘෂිකාර්මික කටයුතුවලදී සිදු වන විවිධ බාධා නිසා කෘෂිකාර්මික ආර්ථික ක්‍රියාවලියෙන් ඉවත්වී නාගරික ජන සමාජයේ කම්හලක වැටුප් මත සේවය කරන කම්කරුවෙකු ලෙස සම්බන්ධවීම එහිදී සිදුවේ. තව ද තම දරුවන්ට ඉහළ අධ්‍යාපනයක් ලබා දීමේ අරමුණින් ද ග්‍රාමීය ප්‍රජාව නගර කරා සංක්‍රමණය වෙයි. විශේෂයෙන් යටත් විජිත ව පැවති තුන්වන ලෝකයේ රටවල අධිරාජ්‍යවාදීන් මුලින් සංවර්ධනය කරගත් ප්‍රදේශ අද නගර බවට පත්වී තිබේ. ශ්‍රී ලංකාවේ කොළඹ, ගාල්ල, මහනුවර, යාපනය, ත්‍රිකුණාමලය ආදී නගර බිහිවූයේ ඉහත සාධක ය පදනම් කරගෙන ය.

සංවර්ධනය වෙමින් පවතින රටවල නාගරික ජනාවාසවල ජනගහනය

ශීඝ්‍රයෙන්  වර්ධනය වේ. මෙසේ වර්ධනය වීමට පහත සඳහන් සාධක බලපා ඇත.

* නාගරික ප්‍රදේශ කරා සිදුවන ජනගහන සංක්‍රමණ
* නාගරික ප්‍රදේශවල සිදුවන ස්වාභාවික වර්ධනය
* නාගරික සීමා සංශෝධනය කිරීම මගින් අවට ප්‍රදේශ ඇතුළත් කර ගැනීම
* ග්‍රාමීය ජනාවාස නාගරික තත්ත්වයට පරිණාමය වීම
* නගර නිර්මාණයේදී භාවිත කරන නිර්ණායක වෙනස් කිරීම
* අවතැන් වූවන්ගේ පැමිණීම

අවුරුදු දහස් ගණනක ඇවෑමෙන් මුහුණ දුන් ප්‍රධාන සමාජ සිද්ධියක් වූයේ කාර්මික විප්ලවයයි. කාර්මික විප්ලවය බොහෝ වෙනස්කම් ඇති කළ සමාජ සාධකයක් විය. එමගින් ඇති වූ සමාජ වෙනස්වීමේ සංසිද්ධිය නාගරීකරණය ලෙස හඳුනාගත හැකි ය. කාර්මික නිෂ්පාදනයන්ට දියුණු ශිල්පීය ක්‍රම යොදා ගැනීමත් සමඟ නාගරික ප්‍රදේශවල ශ්‍රම ඉල්ලුමක් ඇතිවිය. එහි ප්‍රතිඵලය ජනයා නගර කරා සංක්‍රමණය වීමයි.

මෙම සිදුවීම් සියල්ලන්ගෙන් ම අවසන් වශයෙන් සිදු වන්නේ නාගරික ජනගහනයේ ශීඝ්‍ර වර්ධනයයි. මෙම වර්ධනයත් සමඟ නගර ආශ්‍රිත ව ගැටලු රාශියක් නිර්මාණය වීමට පහත සඳහන් සාධක බලපානු ලබයි.

01. භූමිය ප්‍රමාණවත් නොවීම
02. නගරවල ජන ආර්ථික පදනම වෙනස්වීම
03. නාගරික යටිතල ව්‍යුහය ප්‍රමාණවත් ලෙස වර්ධනය වී නොතිබීම

ඉහත සාධක පදනම් කරගෙන ඇතිවන පහත දැක්වෙන සමාජ ගැටලු නිරන්තරයෙන් ම සමාජය තුළ දක්නට ලැබේ.

* අපිරිසිදු වාතාශ්‍රයක් පැවතීම.
* පෝෂ්‍යදායි ආහාර නොලැබීම.
* දරුවන්ටත් කාන්තාවන්ටත් සුරක්ෂිත බව අහිමිවීම.
* මත් උවදුර ව්‍යාප්තවීම.
* අපරාධ හා අපචාර වැඩිවීම.

* ලිංගික හා සමාජ රෝග වැඩිවීම.
* පැල්පත් හා මුඩුක්කු නිවාස බිහිවීම.
* සෞඛ්‍ය හා සනීපාරක්ෂාව පිළිබඳ ගැටලු පැවතීම.

සමස්ත නාගරික සමාජ පද්ධතිය පුරාම ව්‍යාප්ත වූ ගැටලු සමුදයක් දක්නට ලැබෙන බැවින් නාගරික ජන සමාජයේ පාලනයක් අත්‍යවශ්‍ය වී තිබේ.

නගර පාලනය පිළිබඳ ශ්‍රී ලංකාවේ ඓතිහාසික සාධක පරීක්ෂා කර බැලීමේ දී වැදගත් තොරතුරු කිහිපයක් එයි. පණ්ඩුකාභය රජතුමා අනුරාධගාම නමින් තිබූ ස්ථානය අනුරාධපුරය බවට පත් කළ බව මහා වංශයේ සඳහන් වේ. නගරයකට අවශ්‍ය මූලික පහසුකම් මෙම රජු විසින් ගොඩනැගූ බව තවදුරටත් එහි සඳහන් ය. එමෙන් ම නගර පාලනය සඳහා "නගර ගුත්තික" නමින් තනතුරක් ඇති කළේ ද මෙම රජතුමා විසිනි.

රාජධානි පැවති යුගවලදී නගරය පාලනය කිරීමට පහසුව සඳහාත්, ආරක්ෂාව සඳහාත් නගරය වටා පවුරක් ඉදි කිරීමත්, දිය අගල් ඉදිකිරීමත් සිදුවිය. එසේ ම ඇතුළු නුවර හා පිටි නුවර ලෙස නගරය කොටස් දෙකකට බෙදී තිබුණි. විශේෂයෙන් ම ඇතුළු නුවර රජ මාළිගාව, රාජ සභාව, ප්‍රභූ නිවාස හා අන්තඃපුරය ආදී අංගවලින් යුක්ත වූ අතර පසු කාලයේ ආගමික සිද්ධස්ථාන ද ඇතුළු නුවර ඉදිකර තිබුණි.

පිටි නුවර ආරක්ෂක බල සේනාව සහ නගර සේවකයන්ගේ නිවාස ද සුසාන භූමි ද දක්නට ලැබුණි. මෙසේ බිහිවූ නගරවල නටබුන් අද ද අනුරාධපුර පොළොන්නරු රාජධානිවල දක්නට ලැබේ.

නගර පාලනය මේ ආකාරයෙන් අතීතයේ සිට සෑම රාජධානියකම ක්‍රියාත්මක වූවත් වර්තමාන නගර පාලනය හා සම්බන්ධ පරිපාලන ව්‍යුහය ආරම්භ වූයේ ඉංග්‍රීසි පාලන කාලයේ සිට ය.

ඔවුන් විශාල නාගරික ප්‍රදේශ සඳහා නගර සභා ද කුඩා නාගරික ප්‍රදේශ

සඳහා සුළු නගර සභා ද ඇති කළේය. නගර සභා සහ සුළු නගර සභා සඳහා නගරාධිපතිවරයෙකු පත්කර තිබුණි. මේ ආකාරයට ආරම්භ වූ නාගරික පාලනය වර්තමානයේ සුළු වෙනස්කම්වලට ලක්වී ක්‍රියාත්මක වේ. නාගරික ප්‍රදේශ පාලනය සඳහා නගරාධිපතිවරයෙකු ප්‍රධාන නගර සභිකවරුන් මහජන ඡන්දයෙන් තෝරාපත් කර ගනී. මොවුන්ගේ ප්‍රධාන කාර්යය වන්නේ නගරයේ සංවර්ධනයට අදාළ වන සුභසාධක සේවා සිදුකරන අර්ධ ස්වාධීන ආයතනයක් ලෙස කටයුතු කිරීමයි.

පරිපාලන කටයුතුවල දී ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මගින් ද නීතිය හා සාමය ආරක්ෂා කිරීමේ දී පොලිසිය මගින් ද රජය නගර පාලනය සඳහා සම්බන්ධ වේ.

## 5.2 ආගමික සංස්ථාව සමාජ පාලනයෙහිලා ඇති කරන බලපෑම ලාංකික සමාජය ඇසුරින්

ශ්‍රී ලංකා සමාජය බහුවාර්ගික ජන කොටස් වලින් යුත් ඒකකයක් වෙයි. මෙම ජන කොටස් සිංහල, දෙමළ, මුස්ලිම්, බර්ගර් සහ මැලේ ආදී වශයෙන් කොටස් කිහිපයකට බෙදිය හැකි ය. එවැනි බහු වාර්ගික සමාජයක් පවතින නිසා බහු ආගමික හා සංස්කෘතික ලක්ෂණවලින් ද ශ්‍රී ලංකා සමාජය සමන්විත වේ. ආගමික වශයෙන් ලාංකික ජන සමාජය බෞද්ධ, හින්දු, ඉස්ලාම් සහ ක්‍රිස්තියානි වශයෙන් වර්ග කළ හැකි ය. විශේෂයෙන් සිංහල භාෂාව කතා කරන ශ්‍රී ලාංකික ප්‍රජාව බෞද්ධ හා කතෝලික (ක්‍රිස්තියානි) වශයෙන් ආගම් දෙකකට බෙදී පවතී.

### 5.2.1 බෞද්ධ ආගමික සංස්ථාව සමාජ පාලනයට ඇති කරන බලපෑම

ක්‍රිස්තු පූර්ව 236දී මිහිඳු හිමියන් මෙම දිවයිනට වැඩම කරන විට අගය කළ හැකි කිසිදු ආගමික චින්තන ක්‍රමයක් මෙහි පැවති බවක් දක්නට නොලැබේ. එකල මෙහි විසුවෝ මළවුන් යක්ෂ යෝනියෙහි ඉපිද තමන්ට ඇප උපකාර කරන්නේ යැයි සලකා යක්ෂ වන්දනාවේ යෙදුණාහ.

දඩයම ජීවිකා වෘත්තියේ එක් ප්‍රධාන අංශයක් වූ හෙයින් දඩයමේ දී තමන් ආරක්ෂා කරන්නේ යැයි සලකා, තමන්ට ආයුධ සාදා දෙන කම්මල්කරුවන් රැක දෙන්නේ යැයි සලකා, අනුරාධපුර නගරයට අරක්ගත්තේ යැයි සලකා ඔවුහු දේව වන්දනාවේ යෙදුණාහ. එසේ ම තමන්ට විවිධ වූ ලාභ ප්‍රයෝජන ලබා දෙන බව සලකා තල් ගස, නුග ගස ආදී වෘක්ෂයන්ට ද වන්දනා කළහ.

සැබෑ ආගමික මූලධර්මයක් මත මෙම කිසිදු පුද පූජාවක් නොපැවැත් වූ අතර සියල්ලම මිනිස් මනසේ ඇති වූ විශ්වාසයන් මත පදනම් විය. එක් එක් අවස්ථාවන්ට ගැළපෙන පරිදි ඔවුහු යක්ෂ පූජාවෙත්, දේව පූජාවෙත් යෙදුණු අයුරු දක්නට ලැබුණි. එබැවින් මෙම ක්‍රියාදාමයන්හි සැබෑ ආගමික මුහුණුවරක් දක්නට නොලැබුණි.

එවන් අවධියක අනුබුදු මිහිඳු හිමියන් ගෙන ආ බුදු දහම ලක්වැසි ජනතාවට අතිශය ප්‍රභාවිත තත්ත්වයක් ඇති කළායැයි සිතිය හැකි ය. නිසි මග පෙන්වීමක් නොලත් ලාංකික ජන සමාජය සහනශීලි මාර්ගෝපදේශකයාණන්ගෙන් ලැබුණු දහම අතිශයින්ම ප්‍රිය කළෝ ය.

අනුබුදු මිහිඳු හිමියන් ලක්දිවට වඩින විට පළමුව දක්නට ලැබුණේ දුණු ඊතල රැගත් රජ කෙනෙකි. මේ පිළිබඳ ව විමසීමේ දී මිහිඳු හිමියන්ට පැහැදිලි වූයේ රජු මුව දඩයමේ යමින් සිටි බවකි. දේවානම්පියතිස්ස රජු සමඟ ප්‍රිය සංවාදයක යෙදුණු අනුබුදු මිහිඳු හිමියෝ පළමුව රජු ඇතුළු පිරිස බුදුසසුනේ උපාසකයන් බවට පත්කොට පංචශීලයේ පිහිටුවාලූහ.

ප්‍රාණඝාතයෙන් වැළකීම, සොරකමෙන් වැළකීම, කාමයෙහි වරදවා හැසිරීමෙන් වැළකීම, බොරුකීමෙන් වැළකීම, රහමෙර පානයෙන් වැළකීම බෞද්ධයෙකු විසින් නිතිපතා කළ යුතු බව පෙන්වා දී යහපත් සමාජ පාලනයකට අවශ්‍ය මූලික අඩිතාලම ගොඩනංවනු ලැබුණි.

ඒ වන තෙක් ශ්‍රී ලංකාවේ නිසි ආගමක් නොතිබූ අවදියක මිහිඳු මහ

රහතන් විසින් ගෙන ආ ථෙරවාදී බුදු දහම ඉතා ඉක්මනින් දිවයින පුරා ව්‍යාප්ත විය. දේවානම්පියතිස්ස රජුගේ දායකත්වය සහ ධර්මදූතයන් වහන්සේලාගේ මහත් කැපවීම නිසා මෙසේ නව සමාජයක් මෙ රට තුළ බිහිකිරීමට පදනම වැටුණු බව කිව හැකි ය. එසේ නව සංස්කෘතික ප්‍රවණතාවක් සමග සමාජය සාරධර්ම පිරිපුන් සමාජයක් බවට පත්විය. රටේ රාජ්‍ය පාලනය පහසු වී ය. කෘෂිකර්මාන්තයට අවශ්‍ය පහසුකම් සලස්වා දීමත් ආගමික සංවර්ධන කටයුතු සිදු කිරීමත් මෙකල රජවරුන්ගේ ප්‍රධාන කාර්යය බවට පත්විය.

ප්‍රජාතන්ත්‍රවාදයේ මූලධර්මයන් ලංකාවේ රෝපණය වූයේත් බුදු දහම නිසා යැයි කීම යුක්ති සහගත වන්නේ ය. ලාංකිකයා අවිහිංසාවාදී ජීවන මාවතකට පිවිසියේ ද බුදු දහමේ මග පෙන්වීමෙනි. මහින්දාගමනයට පෙර මෙරට සත්ත්ව ඝාතනය ඉහළ මට්ටමක පැවති බව ඉතිහාසයෙන් කියවේ. එහෙත් බුදු දහම ගෙන ඒමෙන් පසු සිංහල රජුන් උත්සවයන් මුල්කොට ගෙන " මාඝාත ආඥාව " පනවා තිබීමෙන් බුදු දහම නිසා ලක්වැස්සන් අවිහිංසාවාදී වූ ආකාරය සිතාගත හැකි ය. මෙසේ මහින්දාගමනයෙන් ලක්වැසියන්ට ලැබුණු විශිෂ්ට ආගමික චින්තනය සමාජයේ බලවත් විපර්යාසයක් ඇති කිරීමට සමත් විය.

නිති පන්සිල් සුරකීමත්, පොහොය දා අටසිල් සමාදන් වීමත්, විශේෂ අවස්ථාවක දී දසසිල් සමාදන් වීමත් තුළින් ශ්‍රී ලාංකික සිංහලයා සැබෑ බෞද්ධ උපාසකයෙකු බවට පත් විය. ඔහු තම නිවසේ බුදුරජාණන් වහන්සේ වෙනුවෙන් මල් පූජා කර පහන් දල්වා වන්දනා කිරීමට පුරුදු විය. විහාරස්ථානය ඔහුගේ විවේක කාලය ගත කරන ස්ථානය වූ අතර එය ලෝකෝත්තර ජීවිතයට පුද්ගලයා හුරු කරන ස්ථානය ද විය. එසේ සකස් වන සමාජය සද්භාවයෙන් පිරිපුන් සමාජයකි. එම සමාජයේ පාලනය කළ යුතු දෙයක් නැත. ඒ ආගමික පසුබිම තුළ යහපත් සමාජ පාලනයක් නිරායාසයෙන් ම ගොඩ නැගෙනු ඇත.

ශ්‍රී ලාංකිකයන්ගේ පාලන තන්ත්‍රය කෙරෙහිද සෑහෙන පමණ බලපෑමක් කිරීමටද මහින්දාගමනයට හැකි වී තිබේ. ආර්යාගමනයෙන් පසු මෙරට

පුරෝහිතගේ අනුශාසකත්වය යටතේ ඇති වූ රාජ්‍ය පාලනය භික්ෂූන් වහන්සේගේ අනුශාසකත්වය යටතට පත් විය. බුද්ධාගම ආරක්ෂා කිරීම රජුගේ මූලික යුතුකමක් වූ අතර ඒ වෙනුවෙන් ම විශේෂ නිලධාරී පිරිසක් ද රාජ්‍ය පාලනය හා සම්බන්ධ කරගැනීම සිදු විය.

ඉන්පසු ශ්‍රී මහා බෝධියේ ආරක්ෂාවට ද දළදා වහන්සේගේ ආරක්ෂාව සඳහා ද තනතුරු ලබා දී තිබේ. එපමණක් නොව විහාරාරාම පාලනය සඳහා රාජ්‍ය නිලධාරීන් පත්කර තිබූ අයුරු මිහින්තලා සෙල් ලිපියෙන් අනාවරණය වේ.

මිත්‍යා ලබ්ධික රජවරුන් ද ලංකාව පාලනය කරන කාලවලදී බුදු දහමට අනුග්‍රහ දක්වා තිබුණ බවට සාධක ඇත. එළාර රජු චේතියගිරි භික්ෂූන්ට දානයකට ඇරයුම් කළ අතර රජුගේ රිය වැදී බිඳීගිය ස්ථූපයක් ප්‍රතිසංස්කරණය කළ බවට ද ඓතිහාසික සාධක තිබේ.

බොහෝ රජවරුන් දසරාජ ධර්මයට අනුව රාජ්‍ය පාලනය කළ ආකාරය දක්නට ලැබීමෙන් පැහැදිලි වන්නේ සාමාන්‍ය ජනතාවට හානි නොවන ආකාරයේ යහපත් පාලනයක් පවත්වාගෙන යාමට පාලකයන් උනන්දු වූ ආකාරයයි.

බෝධිසත්ව ගුණයන්ට අනුව රට පාලනය කිරීමේ දී සමාජ පාලනයට වෙනත් උත්සාහයක් අවශ්‍ය නොවේ. මෙවන් රජවරු කිහිපදෙනෙක් ද අනුරාධපුර යුගයේ දක්නට ලැබුණි.

බුදුරජාණන් වහන්සේ ද අගය කළ ලිච්ඡවී රජදරුවන් අනුගමනය කළ සප්ත අපරිහානිය ධර්ම අපේ රජවරුන් ද අනුගමනය කර තිබේ. රජු, යුව රජ, ඇමතිවරුන් සහ පුරෝහිතයන් ඇතුළු පිරිස නිතිපතා සාකච්ඡා කරමින් රාජ්‍ය පාලනය මනාව කළ බවට සාධක ඇත. අනුරාධපුර, පොළොන්නරු යුගවල දී රාජ්‍ය පාලකයන්ට බුදු දහමේ ආභාසයත් සමග සමාජ පාලනය පහසු වූ ආකාරය ඉහත තොරතුරුවලින් පැහැදිලි වේ.

බුදු දහමේ මූලික අරමුණ ස්වයං පාලනයක් සහ ස්වයං විනයක් ඇති කිරීමයි. **"තුම්හෙහි කිච්චං ආතප්පං අක්ඛාතාරෝ තථාගතා"** තොප විසින් කටයුතු කළ යුතුය. බුදුවරු මඟ පෙන්වති යන උතුම් බුදු වදනට අනුව ස්වයං විනයක් සමාජයේ ඔවුනොවුන් විසින් ම ඇති කර ගැනීමේ මඟ බුදුරජාණන් වහන්සේ දේශනා කර තිබේ.

බුදුරජාණන් වහන්සේ විසින් දේශිත පහත දැක්වෙන ඉගැන්වීම් හතර ස්වයං විනයක් ඇති කර ගැනීමට හේතු වේ.

01. අප්පිච්ඡතා - අල්පේච්ඡ බව
02. සන්තුට්ඨිතා - ලද දෙයින් සතුටු වීම
03. සල්ලේකතා - සැහැල්ලු පැවතුම් ඇතිබව
04. සුභරතා - පෝෂණය පහසු වීම

මෙම චතුර් ගුණයන් ඇති කරගත යුත්තේ තමන් විසින් ම ය.සමස්ත සමාජයම එවැනි ගුණවලින් පෝෂිත වේ නම් වෙනත් සමාජ පාලනයක අවශ්‍යතාවක් ඇති නොවන තරම් ය.

## 5.2.2 හින්දු ආගමික සංස්ථාව ද්‍රවිඩ ජන සමාජය පාලනය කරන අන්දම

ශ්‍රී ලංකාවේ භූගෝලීය පිහිටීම සලකා බලන විට එය දකුණු ඉන්දියාවට ආසන්න ව පිහිටි රටක් බැවින් දකුණු ඉන්දියානු ද්‍රවිඩ ජනතාවගේ බලපෑම ශ්‍රී ලංකාවට නොඅඩුව ලැබුණි. එම ද්‍රවිඩ ජන කොටස් තම සංස්කෘතික ලක්ෂණ සහ හින්දු ආගම මෙරට තුළ ශත වර්ෂ ගණනාවක් පුරා ව්‍යාප්ත කරවූහ. ලාංකික ජන ව්‍යාප්ති රටාවට අනුව දෙවැනි තැන ගන්නා ජන වර්ගය හින්දු ආගමික ද්‍රවිඩ ජන වර්ගය වේ.

උතුරු නැගෙනහිර හා මධ්‍යම පළාත්වල විශේෂයෙන් මෙම ජන කොටස් ඒකරාශී වී සිටිති. හින්දු සංස්කෘතිය බොහෝ සෙයින් බෞද්ධ සංස්කෘතියට

සමීප සම්බන්ධතාවක් පෙන්නුම් කරයි.

මෙරට වාසය කරන ද්‍රවිඩ ජනතාවගෙන් බහුතරයක් හින්දු සංස්කෘතියට අනුව ශිව භක්තිකයෝ වෙති. හින්දු ආගමික සම්ප්‍රදය තුළ මැවීම, රැකීම සහ නැසීම යන ත්‍රිවිධ කාර්යය බ්‍රහ්ම, විෂ්ණු සහ ශිව යන දෙවිවරුන්ට පවරා ඇත.

එසේ වුවත් වර්තමානයේ හින්දු ලබ්ධිකයන්ගේ ඉහත ත්‍රිවිධ කාර්යයන් ම ශිව දෙවිඳුන්ට පවරා තිබේ. ශිව ලබ්ධිය මධ්‍ය කාලීන යුගයේදී දකුණු ඉන්දියාවේ තමිල්නාඩු ප්‍රදේශයේ වර්ධනය වූවකි. සත්වන හා අටවන සියවස්වලදී දකුණු ඉන්දියාවේ ඇතිවූ ශිව පුනර්ජීවන ව්‍යාපාරයේ පුරෝගාමීන් සිවු දෙනා වන තිරු ඥානසම්පර්දර්,අප්පර්,සුන්දරාර් සහ මානික්ක වාසගර් විසින් සම්පාදිත ගීතිකා ද මෛකන්ඩ දේව විසින් සම්පාදිත සාංගීතික දාර්ශනික කෘති ද තිරමුරෛ නම්වූ රචනා සම්භාරය ද ශිව භක්තිකයන්ගේ සිරිත් විරිත් හෙලි කරන ආගමික ධර්ම සාහිත්‍ය වේ.

මෙරට හින්දු ජනයා තුළ දැඩි ව ශිව භක්තිය (දේව භක්තිය) පවතී. ඔවුන් වන්දනා ගමන් යෑම සහ භක්තියෙන් යුතුව එම දෙවියන් නැමදීමේ සිරිත අඛණ්ඩ ව පවත්වා ගනියි. විශේෂයෙන් නල්ලූර් හි කන්දස්වාමි කෝවිල, තිරුකේස්වරම්හි ශිව දේවාලය, ත්‍රිකුණාමලයේ කොනේස්වරම් දේවාලය හා දකුණේ කතරගම දේවාලය යන සිද්ධස්ථාන හින්දු බැතිමතුන්ගේ නිරන්තර වන්දනාවට ලක් වේ.

මෙම දේවස්ථානවල පවතින ආගමික පුද සිරිත් පිළිබඳ ව දැඩි විශ්වාසයක් දක්වන ඔවුහු ඒවා වෙනසකට ලක්කිරීමට කැමැත්තක් නොදක්වති. ආගමික සිරිත් විරිත් පමණක් නොව වෙනත් සමාජ සාම්ප්‍රදායන් කෙරෙහිද දැඩි පක්ෂපාතී බවක් දක්වන ඔවුහු ඒවා ආරක්ෂා කර ගැනීමට ද විශාල වෙහෙසක් ගනිති. තෛපොංගල්, දීපවාලී උත්සවය, හින්දු අලුත් අවුරුද්ද ආදිය හින්දු ජන ජීවිතයේ ආගමික හා සමාජමය වැදගත්කමක් ඇති උත්සව වේ.

කෝවිල් භූමියේ පෙරලි පෙරලී යාම, කාවඩි නටමින් ශරීරයට තියුණු කටු ඇණ ගැනීම, ගිනි පෑගීම සහ යාපනය වැනි ඈත ප්‍රදේශවල සිට කතරගම වැනි දුර බැහැර ප්‍රදේශවලට පා ගමනින් යාම ආදිය හින්දු ආගමිකයන්ගේ දැඩි ආගමික භක්තිය පෙන්වන ආගමික චාරිත්‍ර විධිය. දෙවියන්ට බාරහාර වීම, විවිධ වූ ව්‍රත සමාදන් වීම ආදිය සිදුකරන්නේ එදිනෙදා ගෘහ ජීවිතයේ මුහුණ දීමට සිදුවන විවිධ ගැටලුවලට විසඳුම් වශයෙනි. තම දියණියට සුදුසු ස්වාමි පුරුෂයකු පතා, තම රැකියාව උසස් කර ගැනීම පිණිස සහ ගොවිපළේ අස්වැන්න වැඩිකර ගැනීම ආදී වශයෙන් නොයෙක් අරමුණු මත දෙවියන්ට යාඥා කිරීම ඔවුන්ගේ සිරිතකි.

උපවාස කිරීම ශිව සම්ප්‍රදායට ඇතුළත් වී ඇත. අශුභ ග්‍රහ බලපෑමක් වැලැක්වීම, විවාහ වීමේ බලාපොරොත්තුව ඉටුකර ගැනීම ආදිය උපවාස කිරීමට පාදක වශයෙන්  යොදාගනී. වර්තමානයේ විවාහ අපේක්ෂිත තරුණ කාන්තාවෝ අභිමත සැමියෙකු ලබා ගැනීම සඳහා උපවාසයේ යෙදෙති.

ශිව සම්ප්‍රදායට නව ජීවයක් ලබා දීමට 19 වන සියවසේ අගභාගයේ යාපනයේ ජීවත් වූ ආරුමුග නාවලර් තුමාට හැකි විය. හින්දු ආගමික සාම්ප්‍රදායේ පුරෝගාමී නායකයෙකු වශයෙන් මෙතුමාගේ සේවය සමස්ත හින්දු ලබ්ධිකයන්ට ම බලපා තිබේ. එතුමා විසින් අනුමත කරන ලද එක් පිළිවෙතක් නම් "දීක්ෂාකරණයයි". එනම්, ශුද්ධ වූ අළු ස්ථාන දහයක ආලේප කර ගැනීමයි. ඉරි තුනකින් යුතුව එම අළු ආලේප කරනු ලැබේ. "කෝවිලක් නැති ගමක ජීවත් නොවවු" යනුවෙන් සාම්ප්‍රදායගත කියමනක් හින්දු භක්තිකයන් තුළ පවතී. මෙයින් පැහැදිලි වන්නේ මෙරට ද්‍රවිඩ ජනතාව කිසිසේත් ම ශිව ආගමෙන් ඈත්ව නොයන බවයි. ඔවුන්ගේ ලෞකික හා අධ්‍යාත්මික කටයුතු ශිව භක්තියෙන් වෙන්කළ නොහැකි වෙයි. සියලු කාර්යයන් තුළ ආගමික ස්වරූපයක් පවතී. හින්දු කෝවිල ඔවුන්ගේ පාරම්පරික සංස්කෘතියේ සංකේතය ලෙස සලකයි.

ශ්‍රී ලාංකික ජන සමාජයේ මුළු ජනගහනයෙන් 15.4% ක් ( ශ්‍රී ලංකා දෙමළ, ඉන්දියානු දෙමළ ) පමණ වන ද්‍රවිඩ ජන කොටස්වල සියලු ක්‍රියා

පාලනය කරන ඔවුන්ගේ ශිව දෙවිඳුන් මුල්කරගත් හින්දු ආගම මූලිකත්වය ගෙන ඇති බව පැහැදිලිය. කෝවිල ඔවුන් පාලනය කරන ප්‍රධාන ඒකකය වන අතර ශිව දෙවිඳුන් ඔවුන් පාලනය කරන ප්‍රධාන අධ්‍යාත්මික බලවේගය වේ.

## 5.2.3 ඉස්ලාම් ආගම මුස්ලිම් ජන සමාජය පාලනය කරන අයුරු

මුස්ලිම් ජන කොටස් ශ්‍රී ලංකා යෝනක නමින් හඳුන්වා ඇති අතර මොවුන් ශ්‍රී ලංකාවට මුලින් ම සම්බන්ධ වන්නේ වෙළෙන්දන් වශයෙනි. වර්තමානයේ දිවයිනේ නැගෙනහිර පළාතේ වැඩි වශයෙන් මුස්ලිම් ජන කොටස් ඒකරාශි වී ඇති අතර සංකේන්ද්‍ර වීමකට වඩා දිවයින පුරාම විසිරි ජන කොටසක් වශයෙන් ඔවුන්ගේ ව්‍යාප්තිය දක්නට පුළුවන. අරාබියේ සිට පැමිණ පදිංචි වූවන්ගෙන් ද සහ ඉන්දියාවෙන් පැමිණි විවිධ මුස්ලිම්වරුන්ගෙන් ද සමන්විත මෙම සමාජය නා නා ප්‍රකාරයෙන් පරිණාමනය වූ කාණ්ඩවල එකතුවකි.

ආගමික වශයෙන් මොවුහු ඉස්ලාම් දහම අදහති. ඉස්ලාම් සහ මුස්ලිම් යන්න එකිනෙකින් වෙන්කළ නොහැකි ය. ඒ අනුව ඔවුන්ගේ ජාතියත් ආගමත් එකක්ම වේ. මුස්ලිම්වරුන්ගේ ආගමික ග්‍රන්ථ සහ ආගමික කාර්යයන් සඳහා භාවිත කරන්නේ අරාබි භාෂාවයි. එහෙත් ලංකාවේ ඔවුන්ගේ එදිනෙදා ව්‍යවහාර භාෂාව වන්නේ දෙමළ භාෂාව යි.

ඉස්ලාම් භක්තිකයන්ගේ ආගමෙහි කතුවරයා වන්නේ මුහම්මද් නබිනායකතුමා ය. එසේ ම අල්ලාහ් දෙවියන් ඔවුන්ගේ විමුක්ති දායකයාණෝ වෙති. නබිනායකතුමාගේ අභාවයෙන් පසු ආගමික හා දේශපාලන හේතු මත මුස්ලිම් සමාජය හෙවත් ඉස්ලාම් සමාජය "සුන්නි" සහ "ෂියා" යනුවෙන් කොටස් දෙකකට බෙදුණි. ලෝකයේ මුස්ලිම්වරුන්ගෙන් වැඩි කොටසක් සුන්නි නිකායට ඇතුළත් ය. ශ්‍රී ලංකාවේ ද මුස්ලිම් ජනයා ද සුන්නි නිකායට අයත් වේ.

ඉස්ලාම් යනු අවනත වීම, කීකරු වීම, බැඳීම සහ සාමය යන අර්ථ ඇති අරාබි වචනයකි. ඉස්ලාම් ධර්මය විශ්වයේ මැවුම්කරුවාණන් හා ස්වාමියා වන අල්ලාහ් දෙවියන් වහන්සේ විසින් මනුෂ්‍ය වර්ගයාට මඟ පෙන්වීම සඳහා හෙළිදරව් කරන ලද ජීවන චර්යා සංග්‍රහයකැයි මුස්ලිම්වරු විශ්වාස කරති.

ඔවුන්ගේ ප්‍රධාන ආගමික ග්‍රන්ථය "කුරාණය" වන අතර "ෂරියාත්" නැමැති ආගමික නීති සංග්‍රහය මඟින් ලෞකික ජීවිතය සහ අධ්‍යාත්මික ජීවිතය පාලනය කරනු ලබයි.

මුස්ලිම් ජනතාවගේ සියලු ජීවිත ක්‍රියාකාරීත්වයන් ඔවුන්ගේ ආගමික නීති ග්‍රන්ථවල සඳහන් ආකාරයට සිදු වේ.සිරිත් විරිත්, පිළිවෙත් සහ පාලනය ද එම නීති ග්‍රන්ථවල සඳහන් ආකාරයට ම සිදුකරයි. විවාහ හා දික්කසාද නීති ද, දේපල උරුමය පිළිබඳ නීති ද ඔවුන්ට ම විශේෂිත වූ ආගමික නීති ග්‍රන්ථවලට අනුව සිදු වෙයි.

මුස්ලිම්වරුන්ගේ ලෞකික ජීවිතයත් ලෝකෝත්තර ජීවිතයත් ඉස්ලාම් දහම මත සකස් වී ඇත. ඉස්ලාම් භක්තිකයෙකු නොවී මුස්ලිම් ජාතිකයෙකු විය නොහැකි වේ. ඉස්ලාම් භක්තිකයෙකු ගේ ජීවිතය හා සම්බන්ධ වූ සිරිත් විරිත් ගොඩනැගීම ආගමික ධර්ම හතරක් පාදක කොටගෙන සකස් වී ඇත.

- සලාතය (නිරතුරුව ම ප්‍රණාමයේ යෙදීම)
- සකාතය (පොහොසත් අය දුප්පත් අයට තමා සතු දෙයින් ප්‍රදානය කරන අනිවාර්ය දන් දීම)
- උපවාසය (රාමලාන් මාසය තුල දිවා කාලයේ ආහාරයෙන් වැළකී සිටීම)
- හජ්ජිය ( සෞදි අරාබියේ මක්කම වන්දනාවේ යෙදීම)

දිනකට පස් වරක් ප්‍රණාමයේ යෙදීම මුස්ලිම් ආගමික සිරිතකි. පල්ලිය තුළ සිදු කරන නමැදීමට පුරුෂ පක්ෂයේ සියලුදෙනා සහභාගී වීම දක්නට ලැබේ. සිරුර පවිත්‍ර කර ගැනීමෙන් පසු පල්ලිය තුළ පූජකවරයාගේ (ඉමාම්)

ප්‍රධානත්වයෙන් නැමැදීම සිදු කෙරේ. පල්ලිය ඔවුන්ගේ ප්‍රධාන සමාජානුයෝජන ආයතනය වන අතර සමාජ අනුකලනයට මුල්වන ස්ථානයක් ද වේ. ඔවුන්ගේ ලෞකික හා ආධ්‍යාත්මික සුභ සිද්ධිය සඳහා අවශ්‍ය අංග සම්පූර්ණ පුහුණුවක් පල්ලිය තුළින් ලබා දේ.

සකාත් නමැති ධන බද්ද ගෙවීම මුස්ලිම්වරුන්ගේ ආගමික නීතියයි. වත්කම් ඇති සෑම මුස්ලිම් භක්තිකයෙකු ම මෙම ධන බද්දට යටත් විය යුතු ය. ඔවුන්ගේ සමාජයේ මූලික අවශ්‍යතාවන් සපුරා ගැනීමටත්, දුප්පතුන්ගේ සුභ සාධනයටත් පල්ලියට බදු මුදල ගෙවිය යුතු අතර වාර්ෂිකව හෝ ගිවිස ගත් යම් කාලසීමාවකට හෝ මෙම බදු මුදල ගෙවිය හැකි වේ.

රාමලාන් මාසය තුළ දිවා කාලයේ ආහාරයෙන් වැළකී සිටීම උපවාසය ලෙස හඳුන්වයි. දින 30ක් සඳහා මෙම උපවාසය ක්‍රියාත්මක වේ. උපවාසය හා බැඳුණු සිරිත් විරිත් රාශියක් ඇති අතර එම නීතිරීති මැනවින් පිළිපැදීමට සෑම ඉස්ලාම් භක්තිකයෙකු ම දැඩි උත්සහයක් දරයි.

නබිනායකතුමාගේ උපන් බිම ලෙස සැලකෙන මක්කම වන්දනා කිරීමට සෑම ඉස්ලාම් භක්තිකයෙකු ම පෙළඹේ. මක්කම වන්දනා කිරීම ඉස්ලාම් බැතිමතුන්ගේ ජීවිතය සම්පූර්ණ වීමක් ලෙස සලකන අතර මක්කම යනු අරාබියේ පැවති ප්‍රධාන ආගමික පූජ්‍ය ස්ථානයයි. මක්කම වන්දනාවේ යෙදුනු අයෙකු පූජනීය පුද්ගලයෙකු බවට පත්වෙයි. වන්දනා සමය අතිශයින්ම පූජනීය වේ. මෙම පූජනීය කටයුත්තේ දී රෙදිපිළි භාවිතය පවා ආගමික සම්ප්‍රදායන්ට අනුව සිදු වේ.

ශ්‍රී ලංකාවේ සෑම දිස්ත්‍රික්කයක ම පාහේ විසිරි සිටින ජනගහනයක් ලෙස මුස්ලිම්වරුන් හැඳින්විය හැකි ය. ආගමික සංස්ථාව මගින් ඔවුන්ගේ ජීවිතය සෑම අවස්ථාවක් ම පාලනය කරන බවත් ඒ අනුව සමාජ පාලනය මුස්ලිම් සමාජය තුළ මනා සංයමකින් සිදුවන බවත් දැක්විය හැකි ය.

## 5.2.4 කතෝලික ආගමික සංස්ථාව සමාජ පාලනයට ඇති කරන බලපෑම

ක්‍රි.ව.1505 දී පෘතුගීසින් ශ්‍රී ලංකාවට පැමිණීමත් සමග කතෝලික ආගමේ ද සම්ප්‍රාප්තිය සිදු විය. ඔවුන් පෙරදිගට පැමිණියේ පරමාර්ථ 02ක් මුල් කරගෙනය. එනම්,

01. පෙරදිග වෙළඳ ඒකාධිකාරය හිමිකර ගැනීම.
02. ලෝකය පුරා කතෝලික ආගම ව්‍යාප්ත කිරීම.

යන පරමාර්ථයන් ය.

පරමාර්ථයන් දෙක ඉටුකර ගැනීම සඳහා ඔවුන් යටත් කරගත් ප්‍රදේශවල ඔවුන්ගේ ම පාලන ක්‍රමයක් ආරම්භ කළේ ය. ඒ සඳහා ඔවුන් උපයෝගී කොට ගෙන ඇත්තේ කතෝලික ආගමේ ඉගැන්වීම් සහ පෘතුගාලයේ තිබූ පාලන රටාවන් ය.

කතෝලික ආගම ජේසුස් ක්‍රිස්තුස් වහන්සේ විසින් ආරම්භ කරන ලද්දකි. උන්වහන්සේගේ ජීවිත කාලය පිළිබඳ තොරතුරු බයිබලයේ සඳහන් වේ. වයස අවුරුදු 30 දී පමණ උන්වහන්සේ මිනිසුන්ට සාමය, දයාව, කරුණාව සහ නිර්මල බව ආදිය පිළිබඳ දේශනා පැවැත් වූහ.

නූතන කතෝලික ආගමික සංස්ථාව හෙවත් ශුද්ධ වූ සභාව ක්‍රියාත්මක කරන්නේ තම ස්වාමියාණන් වූ ජේසුස් වහන්සේ පෙන්වා දුන් උගන්වා වදාළ හා කරන්න යැයි පැවරූ කාර්යය භාරයයි.

වර්තමානය සමාජ යථාර්ථය තුළ දෙවි ස්වාමීන් වහන්සේ, සෑම කිතුනුවෙකුටම ආරාධනා කරන්නේ දේශපාලනික, ආර්ථික, අධ්‍යාපනික, සංස්කෘතික හා සාමාජීය පසුතලයන්හි, තම අයිතිවාසිකම්, මානව ගරුත්වය සඳහා වන මූලික මිනිස් අවැසිතා අහිමි වූ සහෝදර ජනතාවගේ ජීවිත නගා සිටුවන්නට ය. ඔවුන් වෙනුවෙන් කථා කරන්නට, ක්‍රියා කරන්නට, සෑම කිතුනුවකුම වගකීමෙන් බැඳී සිටියි. එමගින් සමාජ පාලනය අවදි කරන්නට යුතුකමක් ඇත.

අද ශ්‍රී ලංකාව පුරා විහිදී තිබෙන රදගුරු පදවි තුළ සමාජ සංවර්ධනය ආයතන හරහා ක්‍රියාත්මක වන ශ්‍රී ලංකා රදගුරු මණ්ඩලයේ නියාමිකත්වයෙන් යුත් යුක්තිය හා සාමය පිළිබඳ කොමිසම, මානව උදරත්වය හා අයිතිවාසිකම් වෙනුවෙන් ද, සමාජය තුළ සිදුවන අයුක්තිය හා අසාධාරණය පිටුදැකීමට නැගී සිටින්නේ ද ක්‍රිස්තුන් වහන්සේ අනුගාමී වෙමින්, උන්වහන්සේ කලාක් මෙන් පරිත්‍යාගය, සේවය පෙරදැරි කරගත් ප්‍රේමයේ දයාවේ ජීවිත ප්‍රතිපදාවක් තුළ සමාජ පාලනයට බලපෑමක් කරමින් ය.

කතෝලික ආගම විසින් සමාජ පාලනය සඳහා පදනම ලෙස ගෙන ඇත්තේ යොහොවඃ නම් සර්ව බලධාරී දෙවියන් වහන්සේ විසින් මෝසෙස්ට (ඊශ්‍රායල ජාතීන්ගේ පැරණිම නායකයා) දෙන ලදැයි සම්මත දස පනත්ය.

01. තමා හමුවෙහි අන්‍යතර දෙවියෙකුට නමස්කර නොකළ යුතුය.
02. තෝ තා උදෙසා අන්‍යතර ස්මරණ රූපයක් හෝ කිසිවක හැඩ හුරුකම් ඇති ප්‍රතිබිම්භයක් නොකළ යුතුය හෙවත් රූප වන්දනා නොකළ යුතුය.
03. තෝ තාගේ සර්ව බලධාරී දෙවියන් වහන්සේගේ නාමයෙන් නිකරුණේ නොදිවුරනු.
04. තා සදිනක් වැඩ කරව. එහෙත් සත්වන දිනය (ඉරිදා) තාගේ දෙවියන් වහන්සේගේ "සබත්"දිනයයි.එදින තා කිසිවැඩක් නොකළ යුතුය.
05. තාගේ මවුපියන්ට ගෞරව පූජා කරව.
06. ප්‍රාණඝාතය නොකරව.
07. කාමයෙහි වරදවා නොහැසිරෙව.
08. අදත්තාදානය නොකරව.
09. තාගේ අසල්වාසීන්ට විරුද්ධව බොරු සාක්කි කියන්නෙක් නොවේව.
10. තාගේ අසල්වැසියාගේ ගෙදරට, අසල්වැසියාගේ භාර්යාවට, අසල්වැසියාගේ දාසයකුට හෝ දාසියකට, කොටළුවකුවකට හෝ අන් කිසිවකුට ආශා නොකරව.

මෙම දස පනතෙහි ආර්ථික සංවර්ධනය පිළිබඳ අවධානය යොමු කිරීමක් සහ පුද්ගලයාට ආගමික යහපත් බැඳීමක් ඇති කිරීම පිළිබඳ ව ප්‍රකාශ වේ. ඒ තුළින් යහපත් සමාජ පාලනයකට මඟ පෙන්වීමක් සිදුවේ.

## 5.3 සමාජ පාලනය කෙරෙහි අධ්‍යාපනයේ වැදගත්කම

අධ්‍යාපනය යන්නට භාවිත කරන ඉංග්‍රීසි වචනය 'Education' යන්නයි. මෙය ලතින් භාෂාවේ Ex + duco යන ශබ්දයන් එකතු වීමෙන් නිෂ්පන්න වී ඇති අතර Ex යන ශබ්දයෙන් පිටතට ගෙන ඒම යන අදහසද duco යන ශබ්දයෙන් මඟ පෙන්වීම යන අදහස ඇතුලත් වේ. ඒ අනුව අධ්‍යාපනය (Education) යනු නොදැනුමෙන් දැනුම කරා ගෙනයාම යන අදහස අන්තර්ගත වේ.

සරල ව විග්‍රහ කරන්නේ නම් අධ්‍යාපනය යනු "අවිද්‍යාවෙන් විද්‍යාව කරා ගෙනයාම" ලෙස හැඳින්විය හැකි ය. ඒ අනුව යම් කෙනෙකු තුළ ඇති හැකියාවන්, කුසලතාවන් මතුකර ගැනීම හෙවත් පිටතට ගෙන ඒමට මඟ පෙන්වීම අධ්‍යාපනයෙන් ඉටුවිය යුතු වැදගත් ම කාර්යයයි. ශ්‍රේෂ්ඨ ඉතිහාසඥයකු වන ගිබන් ප්‍රකාශ කරන්නේ පුද්ගලයෙකුට ක්‍රම දෙකකින් අධ්‍යාපනය ලබාගත හැකි බවයි.

01. අනුන්ගෙන් ලබන අධ්‍යාපනය. (ගුරුවරුන්ගෙන්, දෙමාපියන්ගෙන්, පොතපතෙන්,මාධ්‍යයෙන්, වැඩිහිටියන්ගෙන්)
02. තමාට තමාගෙන් ලැබෙන අධ්‍යාපනය.

මෙයින් වඩාත් වැදගත් වන්නේ තමාට තමාගෙන් ලැබෙන අධ්‍යාපනයයි.

මහත්මා ගාන්ධි තුමා අධ්‍යාපනය පිළිබඳ ප්‍රකාශ කරන්නේ "යමෙකු තුළ ශරීරයෙහි, සිතෙහි සහ ආධ්‍යාත්මයෙහි ඇති හොඳම දෙය පිටතට ඇද ගැනීම" අධ්‍යාපනය ලෙසයි. දරුවෙකුට අධ්‍යාපනය ලබාදිය යුත්තේ ඔහුට අනාගතයේ යමක් තම අතින් නිපදවීමට ඇති පුහුණුවක් ද සමඟින් බවත් එතුමා ප්‍රකාශ කරයි.

අධ්‍යාපනය යන්න සඳහා විවිධ අධ්‍යාපනඥයින් විවිධ නිර්වචන දී තිබේ. ඒවායෙන් තෝරාගත් කිහිපයක් පහත දැක්වේ.

01. අධ්‍යාපනය වූ කලී කිසියම් පුද්ගලයෙකු තුළ සිතුම් පැතුම් සාරධර්ම හා ආකල්ප සම්බන්ධයෙන් යහපත් හැඩගැසීමක් ඇතිවන ආකාරයේ බලපෑමක්, සංයමයක් සිදුකරන ක්‍රියාවලියකි.
02. අධ්‍යාපනය යනු චින්තනය, ආකල්ප හා චර්යා වෙනස් කිරීම සම්බන්ධ ශික්ෂණයකි.
03. ස්වීයත්වය හා පෞරුෂ වර්ධනය කිරීම අධ්‍යාපනයයි.
04. පුද්ගල ප්‍රතිචාරයන්හි වෙනස්කම් ඇති කිරීමක අධ්‍යාපනය වේ.
05. ඇතිකරගත් පුරුදු හැසිරීම සඳහා යෙදවීම අධ්‍යාපනයයි.

ඉහත දැක්වෙන සියලු මතයන් ද කැටිකරගත් විට "අධ්‍යාපනය වනාහි මිනිසෙකු ස්වකීය සංස්කෘතියේ අනන්‍යතාව තුළ ගුණ නුවණින් හෙබි සමාජයට ප්‍රයෝජනවත් සමබර පුද්ගලයෙකු බවට පත්කිරීමේ අභ්‍යාසය කැ යි" සඳහන් කළ හැකි ය. ඉතා කෙටියෙන් සඳහන් කරන්නේ නම් අධ්‍යාපනය තුළින් සිදු කරන්නේ "පූර්ණ පෞරුෂයකින් හෙබි" මිනිසෙකු බිහිකිරීමයි.

අධ්‍යාපනය හිස පමණක් දියුණු කිරීමේ කාර්යයට සීමා නොවිය යුතුය. එනම් හිසෙහි දියුණුවට සමානව හදවත ද දියුණු කළ යුතු ය. හදවත හිස අතර මනා සබඳතාවක් පැවතිය යුතු වේ. චින්තන ශක්තිය ද සමබර ව දියුණුවීම අත්‍යවශ්‍යය.

සෞන්දර්ය විෂයයන් ප්‍රගුණ කිරීමට ඇතැම් කෙනෙකුට නොහැකි වන්නට පුළුවන. නමුත් ඕනෑම කෙනෙකුට නාට්‍යයක, සංගීතයක රසය විඳීමට හැකි චිත්ත ස්වභාවයක් ඇතිකර ගත හැකිවේ. එසේ රස විඳිය හැකි පුද්ගලයාගේ හදවත මෘදුය, තෙත්ය. සිතේ අනුකම්පාව ජනිත වේ. සමාජයට අහිතකර දේ කිරීමට හිත නොදේ. මෙයින් මානව දයාව නිතැතින්ම ජනිත වේ. ඒ තුළින් ද යහපත් සමාජ පාලනයක් නිරායාසයෙන් ඇතිවේ. එබැවින් අධ්‍යාපනයේ එක් අංශයක් වන සෞන්දර්ය කෙරෙහි ද සිසු මනස යොමුකිරීම ඉතා වැදගත් වේ.

ශ්‍රී ලංකාවේ පැරණි අධ්‍යාපන ක්‍රමය විභාග, උපාධි සහ රැකියා ඉලක්ක කොට නොපැවතිණි. අධ්‍යාපනයේ අරමුණ වූයේ අදාළ විෂයයන් පිළිබඳ ව ගැඹුරු දැනුමක් ලබාදෙන අතර ම තර්කන ශක්තිය හා නිර්මාණාත්මක හැකියාවන් වර්ධනය කිරීමයි. ඊට අමතර ව ශිෂ්‍යයා තුළ මනා හික්මීමක් සහ විනයක් ඇති කිරීම ද අධ්‍යාපනය තුළින් සිදුවිය. චරිත සංවර්ධනය සහ සාරධර්ම සංවර්ධනය යන අංශ දෙක එකිනෙකින් වෙන්කළ නොහැකි අන්‍යෝන්‍ය වශයෙන් සම්බන්ධ ඒවා විය. චරිත සංවර්ධනය සහ සාරධර්ම සංවර්ධනය යන අංශවලින් පරිපූර්ණ අධ්‍යාපනයක් තුළින් බිහි කරන පුරවැසියන් තුළ පහත සඳහන් ගුණාංග තිබිය යුතුය.

* හැදෑරූ විෂයයන් පිළිබඳ මනා නිපුණත්වය තිබීම.
* අගතියෙන් තොරව යමක් විග්‍රහ කිරීමේ හැකියාව තිබීම.
* මනුෂ්‍යත්වය පිළිබඳ දැනුමක් සහ සාරධර්ම පිළිබඳ ප්‍රමාණවත් අවබෝධයක් තිබීම.
* මනා සංයමයක් හා විනයගරුක බවක් තිබීම.
* දේශීය සංස්කෘතික හරයන් සහ ජාතිකත්වය පිළිබඳ මනා අවබෝධයක් හා ඒවා අගය කිරීමේ හැකියාවක් තිබීම.

මෙම ගුණාංගවලින් පිරිපුන් දරුවා සමාජයට වැඩදායක ය. එමෙන් ම හොඳ සමාජ සේවකයෙකි. අන් අයට හොඳ මඟ පෙන්වන්නෙකි. එවන් දරුවන් සිටින සමාජයකට නීතිරීති මගින් පාලනයක් කිරීමේ අවශ්‍යතාවක් ඇති නොවේ.

දරුවාගේ අධ්‍යාපනය ආරම්භ වන්නේ පවුල තුළිනි. බුදුරජාණන් වහන්සේ "පුබ්බාචරිය" ලෙස දෙමාපියන් නම්කර තිබෙන්නේ මේ නිසා ය. පවුලෙන් ලබාගන්නා අධ්‍යාපනයත් සමඟ පූර්ව ළමාවිය සංවර්ධන මාවතට සෑම දරුවෙක් ම යොමුවෙයි. එහිදී ඔහු තරමක් නුහුරු පරිසරයකට සම්බන්ධ වෙයි. ක්‍රමයෙන් සමාජානුයෝජනද වේ.

දරුවන් සමාජානුයෝජනය වීමේ දී ඔහුට මඟ පෙන්වීම සිදුකළ යුතු ආකාරය මෙසේ පෙළගැස්විය හැකි ය.

* සැබෑ දැනුම ඇසුරෙහි වැඩෙන දරුවා උගත්කම ලබයි.
* දිරිගැන්වීම ඇසුරෙහි වැඩෙන දරුවා ආත්මවිශ්වාසය ලබයි.
* ප්‍රශංසාව ඇසුරෙහි වැඩෙන දරුවා අනුන්ව අගය කරන්නට උගනී.
* සැලකීම ඇසුරෙහි වැඩෙන දරුවා අනුන්ට සැලකීමට උගනී.
* දයාව ඇසුරෙහි වැඩෙන දරුවා ආදරය කිරීමට උගනී.

පූර්ව ළමාවිය අධ්‍යාපනයෙන් පසු දරුවා විධිමත් අධ්‍යාපනයට යොමු කරන්නේ ඔහුට වයස අවුරුදු පහක් සම්පූර්ණ වූ විටයි. එතැන් සිට විශ්ව විද්‍යාල අධ්‍යාපනයට සුදුස්සෙක් වන තුරු අවුරුදු දහතුනක් පාසලේ අධ්‍යාපනය හදාරයි. පාසලේ දී ඔහුට විවිධ වූ නිපුණතා හුරු වේ. චින්තන ශක්තිය වර්ධනය වීමට අමතර ව කායික ශක්තිය වර්ධනය වන ක්‍රියාකාරකම් අත්විඳීමට පාසල් ජීවිතය ඉඩකඩ සලසයි.

පාසලෙන් සමු ගන්නා දරුවා සමාජගත වීමේ දී ඔවුන්ගේ වැඩිහිටියන් ඒ පිළිබඳ ව වඩාත් සැලකිලිමත් විය යුතුව ඇත. එයට හේතුව වර්තමාන ජන සමාජයේ බහුල ව අවිධිමත් ව ක්‍රියාත්මක වන විවධ බලවේගවලට හසුවී සමාජ විරෝධි ක්‍රියාවන්ට දරුවා පෙළඹීමට ඉඩකඩ පවතින බැවිනි. ඒ තුළින් විශාල සමාජ ව්‍යසනයක් දක්නට ලැබේ. එවැනි සමාජයක් පාලනයට පොලිසිය, උසාවිය සහ බන්ධනාගාරය වැනි ආයතන සකස් කළ යුතුවේ.

පිරිවෙන් අධ්‍යාපන ක්ෂේත්‍රය තුළින් ද පැවිදි ගිහි පිරිස් මනා පෞරුෂයකින් හෙබි පුද්ගලයන් ලෙස සමාජගත කිරීමට මග සලසා ඇත. මිහිඳු මාහිමිගේ ලංකා ගමනයත් සමඟ මෙම ක්‍රියාදමය ආරම්භ විය.

වර්තමාන ලංකාවේ උගතුන්ගෙන් විශාල පිරිසක් පිරිවෙන් ක්ෂේත්‍රයේ අධ්‍යාපනය හැදෑරූ පිරිස වේ. ඔවුන් අතර ග්‍රන්ථ කතෘවරු, ප්‍රසිද්ධ දේශපාලනඥයින්, විශ්ව විද්‍යාල කථිකාචාර්යවරුන්, සමාජ සේවකයන් සහ දේශකවරුන් දක්නට ලැබේ. සමාජ පාලනය සඳහා එම පිරිසගෙන් වන සේවය මිල කළ නොහැක. මේ අනුව පිරිවෙන් අධ්‍යාපනය සමාජ පාලනයට සෘජුවම දයකත්වය ලබා දී තිබෙන බව ප්‍රකාශ කළ හැකිය.

දහම් පාසල් අධ්‍යාපනය ද සමාජ පාලනයට සෘජු දයකත්වයක් ලබා දේ. බෞද්ධ දහම් පාසල, ක්‍රිස්තියානි සහ කතෝලික දහම් පාසල, හින්දු දහම් පාසල, ඉස්ලාම් දහම් පාසල යන සමස්ත දහම් පාසලේ පද්ධතිය ම මීට දයකත්වය දෙයි.

පානදුරාවාදය පිළිබඳ තොරතුරු දැනගැනීමෙන් පසුව බෞද්ධ දර්ශනය පිළිබඳ ඇතිවූ පැහැදීම නිසා 1880දී ලංකාවට පැමිණි ඇමරිකන් ජාතික කර්නල් හෙන්රි ස්ටීල් ඕල්කට් තුමා බෞද්ධ ආගම හදාරා ලක්දිව බොදු දරුවන්ට දහම් අධ්‍යාපනය ලබා දීමට දහම් පාසල් ආරම්භ කිරීමට පුරෝගාමී විය. මෙසේ ආරම්භ වූ පළමු දහම් පාසල වූයේ ගාල්ලේ විජයානන්ද දහම් පාසලයි. වර්තමාන දහම් පාසල් අධ්‍යාපනය සඳහා ද නොමිලේ පෙළපොත් ලබා දෙන අතර ගමේ විහාරස්ථානය කේන්ද්‍රකොටගෙන දහම් අධ්‍යාපනය ලබාදීමත් භික්ෂූන් වහන්සේගේ ඇසුර ලබාදීමත් ඒ තුළින් සාරධර්ම පිරිපුන් සමාජයක් ගොඩනැගීමටත් බලාපොරොත්තු වේ.

හොඳ පුරවැසියෙක් බිහි කිරීමට මේ තුළින් උපරිම දයකත්වයක් ලබාදෙන අතර සමාජ විරෝධි චර්යාවලට සම්බන්ධ වූ පිරිස අතර වැඩි පිරිසක් දහම් පාසල් අධ්‍යාපනය ලබා නොමැති බව සමීක්ෂණ තුළින් සොයාගෙන තිබේ. අවිහිංසාවාදී සමාජයක් ලෙස විනයගරුක සමාජයක් ගොඩනැගීම දහම් පාසල් අධ්‍යාපනය තුළින් සිදුවන බව ඉහත සිදුවීම තුළින් පැහැදිලි වේ. එසේ හෙයින් සමාජ පාලනයට දහම් පාසල් අධ්‍යාපනය ද ඉතාම වැදගත් මෙහෙවරක් සිදු කරන බව පෙන්වා දිය හැකිය.

## 5.4 බුදු දහම හා භික්ෂු දායකත්වය සමාජ පාලනයට ඇති කරන බලපෑම

බුදුරජාණන් වහන්සේ අවබෝධ කරගත් දහම බරණැස් නුවර ඉසිපතනාරාමයේ දී පස්වග තවුසන් උදෙසා දේශනා කළ අතර එම පස්වග තවුසන්නු තමන් වහන්සේගේ පළමු ශ්‍රාවක පස්දෙනා වහන්සේ වූහ. මේ පිරිස "භික්ෂු" නමින් හඳුන්වයි. මේ අතර ම යසකුල පුත්‍රයා ප්‍රමුඛ තරුණයින් පනස් පස් දෙනෙක් ද බුදුරජාණන් වහන්සේගේ ශ්‍රාවක ගණයාට ඇතුළත් විය. මෙසේ ශ්‍රාවක භික්ෂු පිරිස හැට නමක් වූ පසු ක්‍රම ක්‍රමයෙන් මුළු දඹදිව පුරාවට ම සීඝ්‍රයෙන් බුදු දහමේ පණිවුඩය බෙදා දෙන ලදී. එම ශ්‍රාවක සමූහයාට බුදුරජාණන් වහන්සේ දේශනා කරන ලද පළමු අවවාදය වූයේ සමාජ සේවකයෙක් ලෙස චාරිකාවේ හැසිරෙමින් අර්ථයෙන් ධර්මයෙන් ලෝකවාසී සත්ත්වයාට දහම් දෙසමින් ඔවුන් යහමගට ගෙන ඒම සඳහා අවශ්‍ය මඟ පාදන ලෙසයි. මෙහි ප්‍රතිඵලය වූයේ භික්ෂු සමූහයා සිය දහස් ගණනින් වර්ධනය වීමයි. එසේ වූ එම පිරිස සියලු කෙලෙසුන් නැසූ රහතන් වහන්සේලා වීම ද විශේෂත්වයක් විය.

අතීතයේ භික්ෂූන් වහන්සේලාගේ මූලික කාර්යය වූයේ පුද්ගලයාගේ ලෝකෝත්තර ජීවිතය සාර්ථක කර දීමට අවශ්‍ය මඟ පෙන්වීම යි.

එහෙත් බුදුරජාණන් වහන්සේ ගිහි සමාජයේ උන්නතිය උදෙසා වැදගත් වන කරුණු රාශියක් ස්වකීය දේශනාවන්හි ඇතුළත් කළ සේක. විශේෂයෙන් කාලාම, සිඟාලෝවාද, පරාභව වැනි සූත්‍ර ගිහි විනය පිළිබඳ මනා මග පෙන්වීමක් සිදු කරයි. එමෙන් ම රාජ්‍ය පාලනයට අදාළ ධර්ම කරුණු රාශියක් චක්කවත්ති සීහනාද සූත්‍රයේ අඩංගු වේ. බුද්ධ ප්‍රමුඛ මහ සඟරුවන රාජ්‍ය නායකයාගේ ප්‍රධාන අනුශාසක තනතුරට නිරායාසයෙන් පත්විය. විශේෂයෙන් රාජ්‍ය විචාරන අතරතුර ඇතිවන ගැටලු බුදුපාමොක් මහ සඟන වෙත ගොස් විසඳා ගත් අයුරු කොසොල් රාජ චරිතයෙහි දක්වේ. අශෝක අධිරාජයාද දිග්විජයෙන් අනතුරු ව තම අනුශාසක ධුරය මහතෙරුන් වහන්සේලාට පිරිනමා තිබිණි.

ශ්‍රී ලංකාවේ ද දෙවන පෑතිස් රජු දා පටන් බුද්ධ පුත්‍රයන් වහන්සේලා රාජ්‍ය පාලනය යහමඟ ගැන්වීමට නිරතුරු ව කටයුතු කළ බව මහා වංශය දක්වා ඇත. යටත් විජිත සමය වනතෙක් මෙම තත්ත්වය අඛණ්ඩ ව පැවතිය ද ඉන් පසුව ශ්‍රී ලාංකේය යතිවරයන් වහන්සේලාට සිදු වූ ගැහැට හේතුවෙන් වනගත වී දිවි බේරා ගැනීමට සිදුවිය. කෙසේ වෙතත් නූතන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ පවා බුදු දහමට විශේෂ සැළකිල්ලක් දක්වා තිබීමෙන් ලාංකික සමාජ ව්‍යුහය කෙරෙහි බුදු දහමේ බලපෑම පැහැදිළි වේ.

භික්ෂු දයකත්වය සමාජ පාලනයට දයක වන ආකාරය මෙම කරුණු එකිනෙක විමසා බැලීමෙන් පැහැදිලි වේ. උන්වහන්සේ ගමේ නායකයාණෝ ය. එසේ ම පක්ෂග්‍රාහී නොවී පොදුජන සේවය සලකා කටයුතු කරන හොඳ මග පෙන්වන්නෙකි. ඒ මග ඔස්සේ ගමන් කිරීම තුළින් යහපත් සමාජ වාතාවරණයක් ගොඩනගා ගත හැකි වේ.

භික්ෂුව අල්පේච්ඡතා ගුණයෙන් පරිපෝෂිත ය. උන්වහන්සේ කිසිම දෙයකට ඇල්මක් නැති අයෙකි. කිසිම දෙයක් පිළිබඳ ව බැඳීමක් නැති අයෙකි.

01. පුද්ගලයන් ගැන ඇලීමක් නැත.
02. වස්තුව හා දේපල ගැන ඇලීමක් නැත.
03. සංකල්ප කෙරෙහි ඇලීමක් නැත.

මෙම ධර්මයන්හි පිහිටා භික්ෂූන් වහන්සේ සමාජ සේවයේ යෙදෙති. හුදෙක්ම එම සේවය පරාර්ථචර්යාව සඳහාම ය. භික්‍ෂූන් වහන්සේලා ඒ සඳහා අප්‍රතිහත ධෛර්යයෙන් යුක්තව කැපවෙති. සමාජය යහමගට ගැනීම මෙම කාර්යයයේ මුඛ්‍ය අරමුණ බව ප්‍රකාශ කළ යුතුවේ.

බෞද්ධ භික්ෂුව සමාජය තුළින් ම බිහිවූ පුද්ගලයෙක් වුවද සාමාන්‍ය මිනිසුන්ගේ හැඟීම් දැනීම් හා අවශ්‍යතා ඉක්මවා හැසිරේ. ලෞකික ලෝකය හා ගැටුණ ද එහි ස්වභාවයන් හා දැඩිලෙස සම්බන්ධ නොවී කටයුතු කිරීමට

අවශ්‍ය මානසික සංවරයෙන් යුක්ත ය. භික්ෂුව සියලු හැඟීම්, දැනීම්, සංවේදන, සංජානන ක්‍රියාවන් මෙන් ම ප්‍රතික්‍රියාවන් විෂයෙහි බුද්ධිමත්ව සිතා බුද්ධිමත් නිගමනවලට එළඹීමේ කුසලතාව ප්‍රගුණ කරයි. එසේ හෙයින් දුර්දාන්ත අවිනීත හැඟීම් මර්දනය කරගෙන සිටී. රෝගී සමාජයක නීරෝගී පුද්ගලයෙකු ලෙසින් ද වෛරී සමාජයක අවෛරී අයෙකු ලෙසින් ද පෙනී සිටිමින් ස්වාර්ථයට වඩා පරාර්ථය උදෙසා වෙහෙසේ. එමෙන් ම භික්ෂුව සිංහයෙකු මෙන් නිර්භීත ය. සිවුපසය අපේක්ෂාවෙන් හෝ ජීවිත ආශාවෙන් හෝ සිය යහපත් ප්‍රතිපත්ති වෙනස් නොකරන අයෙකි.

එවන් පුද්ගලයෙකුට පෞද්ගලිකත්වයක් නොමැත. අන් අයගේ සැපත තමාගේ යහපතයැයි සිතීමට තරම් පරාර්ථකාමීය. බෞද්ධ ඉගැන්වීම්වලට අනුව එම පුද්ගලයාට සමාජ සංවර්ධනයට අවශ්‍ය නායකත්වය සැපයීමට උපරිම සුදුසුකම් ඇත.

මහින්දාගමනයත් සමග ම ඇරඹුණු ලාංකික භික්ෂු ජීවිතයේ මූලික ම ලක්ෂණය වූයේ අල්පේච්ඡතාවයි. ආත්ම විමුක්තිය කේන්ද්‍රකොටගත් ආදීම භික්ෂූන් වහන්සේ ගල්ලෙනක වාසය කරමින් භාවනානුයෝගී ව කල් ගෙවූහ. භික්ෂු සංඛ්‍යාව දිනෙන් දින අධිකවත් ම තවදුරටත් වාසය සඳහා සුදුසු ලෙන් සෙවීම ගැටලුවක් වූවාට සැක නැත.

ලාංකේය භික්ෂූන් වහන්සේ ආරාමික ජීවිතයට සම්බන්ධ වූයේ දේවානම්පියතිස්ස රජු විසින් මහමෙවුනා උයනෙහි මහා විහාරය සාදා භික්ෂූන් වහන්සේට පූජා කිරීමත් සමගයි. සුනහාත පිරිවෙන, ථේරඑස්ස පිරිවෙන, දීඝසන්ධ සේනාපති පිරිවෙන ආදී නම්වලින් හැඳින්වුණු මෙවැනි භික්ෂු ආරාම කිහිපයක් ම මහමෙවුනාවෙහි පිහිට වූ බව සඳහන් වේ. මේ ආරාම රාත්‍රී ස්ථාන, දිවා ස්ථාන, පොකුණු හා සක්මන් මළුවලින් සමන්විත වූ බවද කියවේ.

කාලයත් සමඟ ම භික්ෂූන් වහන්සේ රජුගේ අනුශාසකයා බවට පත්වෙමින් රාජ අනුග්‍රහය හිමිකරගත් අතර ජන සමාජයේ ගුරුවරයා බවට

පත්වෙමින් ජනතා අනුග්‍රහය දිනා ගත්හ. අනුරාධපුර යුගයේ මුල් අවධියේ සමාජයේ පාලක පාලිත දෙපක්ෂය ම මෙහෙයවීමේ පුරෝගාමී නායකයන් බවට පත්වී තිබුණේ භික්ෂූන් වහන්සේ ය. උන්වහන්සේලාගේ අවවාද දෙපක්ෂය ම ඉතා ඉහළින්ම පිළිගනු ලැබිණි. එබැවින් සමාජ පාලනයේ පුරෝගාමී නියමුවන් වශයෙන් භික්ෂූන් වහන්සේලාගෙන් වැදගත් මෙහෙයක් සිදු වී තිබේ.

භික්ෂූන් වහන්සේ අතීතයේ සිට ම ශ්‍රී ලංකාද්වීපයට නායකත්වය සපයා දුන් බවට කදිම සාධකයක් ලෙස වාරියපොළ සුමංගල හිමියන් ඉංග්‍රීසි කතිර කොඩිය බිම දමා පාගා සිංහ කොඩිය මහනුවර මඟුල් මඩුවේ එසවීම දැක්විය හැකි ය.

භික්ෂූන් වහන්සේලාගෙන් ශාසනික, ජාතික සේවා පමණක් නොව සමාජ පාලනය සඳහා අධ්‍යාපනික වශයෙන් ද විශාල මෙහෙවරක් අතීතයේ සිට සිදුවනු දක්නට ලැබේ. කෝට්ටේ යුගයේ දී තොටගමුවේ රාහුල හිමි, වෑත්තෑවේ හිමි, වීදගම මෛත්‍රිය හිමි සහ කැරගල වනරතන හිමි ආදි භික්ෂූන් වහන්සේ පිරිවෙන් විහාරස්ථාන ආරම්භ කර භික්ෂූන්ට පමණක් නොව අවට සිටි ගිහි පිරිසට ද ඉගෙනීම සඳහා අවශ්‍ය මඟ පෙන්වා දී තිබේ.

භික්ෂූන් වහන්සේ පුරෝගාමී නායකත්වය ගෙන මෙරට ශාසන සම්ප්‍රදයත් ථේරවාදී බුදු දහමත් ආරක්ෂා කරගත් එක්තරා අවස්ථාවක් ලෙස පංචමහා වාදය හැඳින්විය හැකි ය. එකල පංචමහා වාදයට මොහොට්ටිවත්තේ ගුණානන්ද හිමියෝ නායකත්වය දුන් අතර ඊට සහය වූ අනිත් භික්ෂූන් වහන්සේලා වූයේ, බුලත්ගම ධම්මාලංකාර හිමි, හික්කඩුවේ ශ්‍රී සුමංගල හිමි වස්කඩුවේ ශ්‍රී සුභූති හිමි හා මොහොට්ටිවත්තේ ජනානන්ද හිමියන් ය.

පංචමහා වාදය සිංහල බෞද්ධයා අවදි කළේය. ලාංකික බොහෝ පිරිස් භික්ෂූන් වහන්සේගේ ඇසුර ලබා ගැනීමට පෙළඹීම පංචමහා වාදයෙන් පසුව දක්නට ලැබුණි. ඒ තුළින් සමාජයේ විශාල පරාසයක් පුරා භික්ෂූන් වහන්සේගේ නායකත්වය ව්‍යාප්ත විය. සමාජ පාලනය සඳහා සාර්ථක මග

පෙන්වන්නෙක් ලෙස භික්ෂූන් වහන්සේ ඉතා ඉහළ සමාජ තලයක වැජඹෙනු දක්නට ලැබුණි.

සමාජ පාලනයට භික්ෂූණීන් වහන්සේලාගෙන් ද නොමඳ සේවයක් වන බව ප්‍රකාශ කළ යුතුය.

ශ්‍රී ලංකාවේ භික්ෂූණී ශාසනය ආරම්භ වූයේ සංඝමිත්තා රහත් භික්ෂූණී වහන්සේගේ මූලිකත්වයෙනි. දේවානම්පියතිස්ස රජුගේ සහෝදරයා වූ මහානාග යුවරජුගේ බිසව අනුලා දේවිය පැවිදි වීමට අවශ්‍ය බව ප්‍රකාශ කළෙන් මිහිඳු හිමි එය තමාගේ මූලිකත්වයෙන් කළ නොහැකි බව පවසා අශෝක අධිරාජයා මගින් සංඝමිත්තා රහත් භික්ෂුණීන් වහන්සේ ලක්දිවට වැඩමවා ගනු ලැබුණි. සංඝමිත්තාවන්ගේ මැදිහත්වීම මත අනුලා දේවිය ප්‍රමුඛ 500ක් කුල කාන්තාවන් පැවිදි කළේ ය.

වර්තමාන දසසිල් මාතාවන් හා භික්ෂුණීන් වහන්සේලා පිරිවෙන් අධ්‍යාපනයට සම්බන්ධ වෙමින් මූලික පිරිවෙන් අවසාන විභාගය, ප්‍රාචීන විභාග, සාමාන්‍ය පෙළ  විභාග සහ උසස් පෙළ විභාග සමත්වී විශ්ව විද්‍යාල වලට ඇතුළත් වන අතර උපාධිධාරී දසසිල් මාතාවන්  හා භික්ෂුණීන් වහන්සේලා ලෙස විශාල සමාජ මෙහෙවරක් සිදු කරයි.

ගෙදරක ගෘහණිය සමග සමීප සබඳතා පැවැත්වීමට භික්ෂුණීන්  හා දසසිල් මාතා වහන්සේ ට හැකියාව ඇත. ඒ නිසා පවුල තුළ ඇතිවන ප්‍රශ්නයක් නිරාකරණය කිරීමට ගෘහණියට කාරුණිකත්වයෙන් අවවාද, උපදෙස් දීමට හැකියාව තිබේ. පවුල තුළ ඇතිවන ගැටලු මේ තුළින් අවම කරගත හැකිය.

ආගමික ශ්‍රද්ධාවෙන් යුතු දැහැමි සමාජයක් ගොඩනැගීම පිණිස සමාජය පාලනය කිරීමේ ලා භික්ෂුන් වහන්සේගෙන් සිදුවන මෙහෙය අතිමහත් බව නොඅනුමානව පැවසිය හැකි ය.

## ක්‍රියාකාරකම් 5

### I කොටස

කෙටි පිළිතුරු සපයන්න.

I. මානවයාගේ ආරම්භය පිළිබඳ තොරතුරු ලබාගත හැකි ත්‍රිපිටකාගත මූලාශ්‍රය කුමක්ද?

II. සමාජ විද්‍යාවේ දී ගම නිර්වචනය කරන්නේ කෙසේද?

III. පෞර රාජ්‍යයක් යනු කුමක්ද?

IV. ග්‍රාමීය හා නාගරික ජනාවාස අතර වෙනස්කම් මොනවාද?

V. නගරගුත්තික යනු කවරෙක්ද ?

VI. මාඝාත ආඥාව යනු කුමක්ද?

V.II ශ්‍රී ලංකාවේ ගම් සහ නගර පාලනය සඳහා විධිමත් වැඩපිළිවෙලක් සකස් කළ රජතුමා කවරෙක්ද?

VIII. ශිව භක්තිය වර්ධනය කරලීමේ පුරෝගාමී වූවන් තිදෙනෙක් නම් කරන්න.

IX. සුන්නි සහ ෂියා යනු මොනවාද?

XI. සදාචාරඅධ්‍යාපනය ලබා දෙන බෞද්ධ සූත්‍ර ධර්ම තුනක් නම් කරන්න.

XII. ස්වයං විනයක් ඇතිකරලීම සඳහා අනුගමනය කලයුතු ප්‍රධාන කරුණු මොනවාද?

XIII. අධ්‍යාපනය යනු කුමක්ද?

XIV. අපේ සාම්ප්‍රදායික අධ්‍යාපන ක්‍රමයේ මූලික පරමාර්ථය වූයේ කුමක්ද?

XVII. ශ්‍රී ලංකාවේ ගම් සහ නගර පාලනය සඳහා විධිමත් වැඩපිළිවෙලක් සකස් කළ රජතුමා කවරෙක්ද?

XVIII. භික්ෂුවක් සතු අල්පේච්ඡතා ගුණය යනු කුමක්ද?

XIX. අකර්මණ්‍ය සමාජයට නායකත්වය ලබාදී සමාජය මෙහෙයවූ භික්ෂූන් වහන්සේලා දෙනමක් නම් කරන්න.

## II කොටස

I. ගම හා නගරය අතර වෙනස පැහැදිලි කර එම ඒකක පාලනය සඳහා වර්තමානයේ අනුගමනය කරන ක්‍රියා මාර්ග විස්තර කරන්න.

II. ශ්‍රී ලාංකික ජන සමාජය බහු වාර්ගික සමාජයක් වේ. පක්ෂව හෝ විපක්ෂව කරුණු දක්වන්න.

III සමාජ පාලනයෙහි ලා ආගමික සංවිධාන වලින් ලබාගත හැකි සහය අති විශාලය. ශ්‍රී ලාංකික සමාජය ඇසුරෙන් පැහැදිලි කරන්න.

V. ශ්‍රී ලාංකික ජන සමාජය සදාචාර සම්පන්න ශිෂ්ට සමාජයක් ලෙසට මූලික පදනම සැකසුනේ මහින්දාගමනයෙන් ඇරඹුණු බෞද්ධ අධ්‍යාපන ක්‍රමය තුළිනි විමසන්න.

VI. සමාජයේ යහපාලනය ඇති කරලීම සඳහා නායකත්වය ගැනීමට සුදුසු ම පුද්ගලයා භික්ෂුවය. උදාහරණ දෙමින් පැහැදිලි කරන්න.

# 06 සමාජ ප්‍රශ්න

## 6.1 සමාජ ප්‍රශ්න හඳුනා ගනිමු.

සමාජයේ ජීවත් වන පුද්ගලයන් පවතින සමාජ ධර්මතා හා අගනාකම්වලට ප්‍රතිවිරුද්ධ ව ක්‍රියා කිරීමේ ප්‍රතිඵලයක් ලෙස ප්‍රශ්න ඇතිවේ. ඒ අනුව සමාජය තුළ පැන නගින යම් තත්ත්වයන් සඳහා සමාජමය මැදිහත්වීමක් සහිත පිළිතුරක් බලාපොරොත්තු වේ ද, එය සමාජ ප්‍රශ්නයක් වශයෙන් ඉතා සරල ව විග්‍රහ කළ හැකි ය.

අප ජීවත් වන සමාජයේ මිනිසාට මුහුණ දීමට සිදු වන ප්‍රශ්න රාශියකි. එම ප්‍රශ්නවලින් සමහරක් මිනිසාගේ ජීවිතයට තදබල ලෙස බලපානු ලබයි. එසේ ම ජන ජීවිතයට එතරම් ගැටලුවක් නොවන ප්‍රශ්න ද රාශියක් පවතින අතර එම ප්‍රශ්න ගැන එතරම් සැළකිල්ලක් නො දක්වයි. මානව සමාජය ආරම්භයේ සිට නූතනය දක්වා ජන සමාජයට මුහුණ පෑමට සිදු වූ ප්‍රශ්න නොතිබුණා ද නොවේ. එයට විවිධ අර්ථකථන දෙමින් නොයෙක් දර්ශනික මතවාද ද ඉදිරිපත් වී ඇත.

එම ගැටලුවලට විසඳුම් සෙවීමේදී සමාජයේ පවතින ප්‍රශ්න මොනවා ද ඒවා මතුවීමට හේතූන් මොනවා ද එම ගැටලුවලට විසඳුම් මොනවා ද, යන්න පිළිබඳ ඒ ඒ සමාජ විද්‍යාඥයින් තමන්ගේ දෘෂ්ටිකෝණයන්ට අනුකූල ව නිර්වචන කිරීමට උත්සාහ ගෙන ඇත. ඒ අනුව සමාජ විසංවිධානය වීමේ ප්‍රතිඵලයක් ලෙස සමාජ ප්‍රශ්න මතු වන බව පැහැදිලි ය.

සමාජයේ සියලු දෙනාම එක හා සමාන විය යුතු ය, යන සමානාත්මතා ධර්මය සෑම දෙනාම පිළිගනු ලබති. එහෙත් සමාජ හැසිරීමේ දී සියලු දෙනාම එක ම අයුරින් සිතන්නේ ද යන්න සැක සහිත ය. ජාතීන් වශයෙන් දුප්පත් පොහොසත් වශයෙන්, ආගම් වශයෙන්, පළාත් වශයෙන් විවිධත්වයක් ඇති

අයුරු මැනවින් හඳුනාගත හැකි ය. මේ නිසා ම ජනතාව සිතන ආකාරයෙන් ම සෑම විටම ක්‍රියා කරන්නේ යැයි නිශ්චිතව ම කිව නොහැකි ය. මේ හේතුසාධක නිසා ඇතිවන ගැටීම සමාජ ප්‍රශ්නවලට තුඩු දෙන කරුණකි මේ හේතුවෙන් සමාජ ගැටලු, සමාජ අගනාකම් හා ධර්මතා එකක් හෝ ඊට වැඩි ගණනක් සමග යම් ආකාර වූ සම්බන්ධතාවක් පවතින බව පැහැදිලි ය.

මේ අනුව සමාජ ප්‍රශ්න පිළිබඳ ව විමසීමේ දී එක් පුද්ගලයෙකුට පෞද්ගලික ව ඇති වන තත්ත්වයක් සමාජ ප්‍රශ්නයක් ලෙස නිර්වචනය කිරීම තර්කානුකූල නොවේ. එම ප්‍රශ්නය පොදුවේ සමාජයේ වැඩි පිරිසකට බලපානු ලබන්නේ නම් ඒවා සමාජ ප්‍රශ්නයක් වශයෙන් නිර්වචනය වී තිබේ. නිදසුනක් වශයෙන් යම් තරුණ භික්ෂූන් වහන්සේ නමක් උපැවිදි ව ගියේ නම් එය පොදුවේ සමාජයට බලපාන්නේ නැත. එහෙත් බොහෝ තරුණ භික්ෂූන් වහන්සේලා දිගින් දිගටම උපැවිදි ව යන්නේ නම් එය සමාජ ප්‍රශ්නයක් වශයෙන් හැඳින්විය හැකි ය. එයට හේතුව සමාජයේ බොහෝ දෙනෙකුට එය බලපෑම් සිදු කරන බැවිණි. මේ අනුව සමාජයක වැඩි පිරිසකට එම ගැටලුව බලපාන්නේ නම් වැඩි දෙනෙකුගේ කතාබහට ලක්වන්නේ නම්, විසඳුම් සෙවීමට උත්සාහ කරන්නේ නම් ඒවා සමාජ ප්‍රශ්නවල ලක්ෂණ වශයෙන් හඳුනා ගත හැකි යැ යි සමාජ විද්‍යාඥයෝ පෙන්වා දෙයි. සමාජ ප්‍රශ්නයක් වුව ද කෙනෙකු ගේ සිතට කා වදින්නේ එයට තමන් ද කොටස් කරුවෙකු වූ විට යි.

සමාජ ප්‍රශ්න ගණනාවක් සමාජ හා මානව විද්‍යාඥයින් විසින් හඳුනාගෙන ඇත. ඒ අතරින් ජනගහන වර්ධනය, ගණිකා වෘත්තිය, වයස්ගත භාවය, ජනවාර්ගික අර්බුදය, දුගීභාවය, ආත්මඝාතනය, ලිංගික අපරාධ, ඒඩ්ස් රෝගය, මත් ද්‍රව්‍ය භාවිතය, තරුණ අසහනය, විරැකියාව, ළමා අපචාර වැනි සමාජ ගැටලු ප්‍රධාන වේ.

මෙවැනි සමාජ ප්‍රශ්න ඇතිවන්නේ සමාජය තුළ අනෝමීය තත්ත්වයක් නැතහොත් ධර්මතා රහිත තත්ත්වයක් ඇති වීමේ ප්‍රතිඵලයක් වශයෙන් බව ප්‍රකට සමාජ විද්‍යාඥයෙකු වූ එමිල් ඩුර්කයිම් සඳහන් කර ඇත. මේ අයුරින් නූතන සමාජ ධර්මතා බිඳ වැටී ඇත්තේ සමාජ වෙනස් වීම් නිසයි. සමාජය නිරන්තරයෙන් වෙනස් වන බව වටහා ගත යුතු වේ. සෑම සමාජයක් ම වෙනස් වීම ස්වාභාවික වූ ධර්මතාවකි. එ බැවින් සමාජ ප්‍රශ්න ද එසේ වෙනස් වන බව සැලකිය යුතු ය. සමහර විට එම ප්‍රශ්නයේ මුහුණුවර හෝ වර්ධන

වේගය හා එහි බලපෑම වෙනස් විය හැකිය. ප්‍රාථමික සමාජයේ හටගැනෙන සමාජ ප්‍රශ්ණයක් වර්තමානයේ හටගෙන ඇති සමාජ ප්‍රශ්නයකට වඩා වෙනස් විය හැකි ය. අනාගතයේ දී එම ප්‍රශ්නයේ ස්වභාවය හා බලපෑම ඊටත් වඩා වෙනස් විය හැකි ය. එක් හේතුවක් නිසා ඇතිවන සමාජ ප්‍රශ්නයක් පසුව විවිධ හේතුවල එකතුවක් බවට පත්විය හැකිය. උදහරණයක් වශයෙන් විරැකියාව නිසා හටගන්නා මානසික රෝගී තත්ත්වය සියදිවි නසා ගැනීමේ ප්‍රශ්නය දක්වා උග්‍ර වීමට එය ප්‍රබල සාධකයක් විය හැකි ය.

සමාජ ප්‍රශ්න හමුවේ සමාජ විද්‍යාඥයාගේ කාර්ය භාර්ය වන්නේ යම්කිසි සමාජ තත්ත්වයක් විග්‍රහ කිරිම, එහි මතු වී ඇති හෝ මතුවන ගැටලු එහි ස්වභාවය හා වෙනස්කම් ආදි වශයෙන් එම සමාජ ක්ෂේත්‍රය පිළිබඳ දැනුම වර්ධනය කිරීම හා ඒ පිළිබඳ දැනුමක් ලබාදීම යි. එම කාර්යභාරය ඉටු කිරීමෙහිලා සමාජ විද්‍යාඥයාට කළ හැකි මෙහෙය සුවිශාල ය.

## ක්‍රියාකාරකම් 6.1.1

කෙටි පිළිතුරු සපයන්න

01. සමාජ ප්‍රශ්නයක් යනු කුමක් ද යි සරලව විග්‍රහ කරන්න.

02. ඔබ දන්නා සමාජ ප්‍රශ්න තුනක් සඳහන් කරන්න.

03. ''අනෝමිය තත්ත්වයක්'' යනු කුමක් ද යි සැකෙවින් පැහැදිලි කරන්න.

04. ''විද්‍යා දදාති විනයං'' යන පාඨයෙහි සරල අදහස ශිෂ්‍ය ජීවිතයට වැදගත් වන අයුරු පහදන්න.

## 6.2 සියදිවි නසා ගැනීම සමාජ ප්‍රශ්නයක් ලෙස

සියදිවි නසා ගැනීමක් යනුවෙන් විස්තර කර ඇත්තේ යම්කිසි පුද්ගලයකු, තමන්ගේ ප්‍රාණය තමා විසින් ම විනාශ කර ගැනීමකි. එය ආත්ම ඝාතනය (Suicide) වශයෙන් ද විස්තර කර තිබේ. සමාජ විද්‍යාඥයින් අධ්‍යයනය කරන සමාජ ප්‍රශ්න අතරින් සියදිවි නසා ගැනීම පිළිබඳ වැඩි අවධානයක් යොමු කර ඇත. වර්තමානය වන විටත් සියදිවි හානිකර ගැනීම ශීඝ්‍රයෙන් වැඩි වී ඇත. එබැවින් ඒ පිළිබඳව විද්‍යාත්මක ව පර්යේෂණ කිරීමට සමාජ මානව විද්‍යාඥයින් වැඩි උනන්දුවක් දක්වයි. ඒ සඳහා නිවාරණ වැඩ සටහන් කෙරෙහි ද වැඩි අවධානයක් යොමු වී ඇත. මෙම ගැටලුවෙහි ඇති වර්ධනය නිසා ම එක් සමාජයක් අධ්‍යයනය කිරීමෙන් පමණක් විශ්වීය නිර්වචනයක් ලබා දීමට ද නො හැකි වී ඇත.

සියදිවි නසා ගැනීම අතීතයේ ද පැවැති බවට සාධක හමු වී තිබේ. සමහර ඉපැරණි මානව සමාජවල දිවිනසා ගැනීම උසස් චාරිත්‍රයක් වශයෙන් පිළිගෙන තිබුණි. විවිධ පර්යේෂණ මගින් ද ඒ බව සනාථ කර ගෙන තිබේ. බොර්නියෝවල ජීවත් වන "ඩයක් "නම් ගෝත්‍රික ජනතාව විශ්වාස කරන ආකාරයට සිය දිවි නසාගැනීම තුළින් තමන්ට විශේෂ ස්ථානයකට යා හැකි බව ඔවුහු විශ්වාස කරති.

මධ්‍යම අප්‍රිකාවේ ජීවත් වන නොදියුණු ගෝත්‍රිකයන් සේ සැලකෙන නන්දීස්වරු අතර දනුදු දිවි නසා ගැනීම ශ්‍රේෂ්ඨ වීර ක්‍රියාවක් ලෙස සැලකෙන බව ඒ පිළිබඳ අධ්‍යයනය කළමානව විද්‍යාඥයින් විසින් සඳහන් කරනු ලැබ ඇත. මේ අනුව විවිධ සමාජයන් ආශ්‍රය කරගෙන ලෝකය පුරා සිටින විවිධ සමාජ හා මානව විද්‍යාඥයන් පර්යේෂණ (Research) මගින් තම මත ඉදිරිපත් කර ඇත. සියදිවි නසා ගැනීම යනු ප්‍රතිඵලය නියත වශයෙන් ම මරණය බව දනගෙන මරණයට පත්වන පුද්ගලයාට යොදගත් ප්‍රතිජානාත්මක හෝ නිශේධනාත්මක ක්‍රියාවක් බව එමිල් ඩුර්කයිම් (Emile Durkheim) (Durkheim : 1951) සඳහන් කරයි.

ඔහු විසින් රචිත සියදිවි නසා ගැනීම : සමාජ විද්‍යාත්මක අධ්‍යයනයක් (Suicide) නම් කෘතියේ පෙන්වා දීමට උත්සාහ කර ඇත්තේ විවිධ සමාජ සාධක මුල් කරගෙන පුද්ගලයා සියදිවි නසා ගන්නා බවයි. යාන්ත්‍රික

ඒකාබද්ධතාවෙන් යුත් සමාජ ඓන්ද්‍රීය ඒකාබද්ධතාවෙන් යුත් සමාජය දක්වා ගමන් කිරීමේ දී ධර්මතා හීන වීමෙන් අනෝමීය තත්ත්වයක් ඇති වේ. සියදිවි නසා ගැනීමට වඩාත් ම බලපාන්නේ මානසික හේතූන් යැයි කෙනෙකුට තර්ක කළ හැකි ය. එහෙත් ඩුර්කයිම් පෙන්වා දෙන්නේ පුද්ගලයකු සිය දිවි හානි කර ගැනීමට පෙළඹෙන්නේ හුදෙක් මානසික හේතූන් නිසා පමණක් නොව සමාජ සාධක ද ඊට හේතු වීමෙන් බවයි. පුද්ගලයා නිසි ලෙස සමාජයට අනුකලනය නොවීම නිසා ද සියදිවි නසා ගැනීමට පෙලඹේ. සමාජයෙන් ඔහුට ආරක්ෂාවක් නොමැති විට ආත්ම විශ්වාසය ක්‍රමයෙන් හීන වේ. ඒ හේතුව නිසා තම ප්‍රශ්නවලට වෙනත් විකල්පයක් නොමැති විට පුද්ගලයා සියදිවි නසා ගැනීම සඳහා වැඩි පෙලඹීමක් ඇති බව ඩුර්කයිම් අවධාරණය කරයි.

වර්තමානයේ සිය දිවි නසා ගැනීම පිළිබඳ ප්‍රවෘත්ති නිතර අසන්නට ලැබේ. අතීතයේ මෙය සමාජ ගැටලුවක් ලෙස ප්‍රබල ව නොපිළිගැනුණ ද දැන් එය ප්‍රබල සමාජ ප්‍රශ්නයක් බවට පත් වී තිබේ. සමහර තරුණ පිරිස් තම අභිමතාර්ථයන් මුදුන් පමුණුවා ගත නොහැකි වූ විට සියදිවි නසා ගැනීමට පෙලඹේ. එපමණක් නොව වයස් සීමාවකින් තොරව මානසික රෝග හේතුකොට ගෙන දිවිනසා ගන්නා පිරිස් ද සමාජයේ බහුල ව දක්නට ලැබේ.

ශ්‍රී ලංකාව ආශ්‍රිත ව සියදිවි නසා ගැනීම පිළිබඳ ප්‍රශ්නය සාකච්ඡා කිරීමේ දී දක්නට ලැබුණේ ද දැඩි සංවාදශීලී උනන්දුවකි. පසුගිය කාලයේ දී සිදු කරන ලද පර්යේෂණවලට අනුව ශ්‍රී ලංකාවේ වසරකට සියදිවි නසා ගැනීම් ඉහළ අගයක් ගෙන තිබේ. එසේම සියදිවි නසා ගැනීමට උත්සාහ කරන සංඛ්‍යාව ද ඉහළ ගොස් ඇති බව පර්යේෂණ මගින් සොයාගෙන ඇත.

ශ්‍රී ලංකාව තුළ සිය දිවි නසා ගැනීමට තුඩුදෙන හේතූන් පහත දැක්වෙන පරිදි වර්ග කර දක්වා ඇත.

* දුගී බව ආශ්‍රිතව ගොඩනැගුණු ඉච්ඡාභංගත්වය
* අනාගත අපේක්ෂාවන් බිඳ වැටීම.
* ආදරය පිළිබඳ බලාපොරොත්තු සුන් වීම.
* විභාගවලින් අසමත් වීම.
* දෙමව්පියන්ගේ හා ගුරුවරුන්ගේ දැඩි අවවාද දරා ගැනීමට නොහැකි වීම.
* විරැකියාව.

* තරුණ අසහනය.
* මානසික රෝග.
* ලබා ගත් ණය ගෙවීමට නොහැකි වීම.

මේ කරුණු විශ්ලේෂණය කරන විට සිය දිවි හානිකර ගැනීම් බොහෝමයකට කිසියම් අසහනකාරී ස්වභාවයක් හේතු වී ඇති බව පැහැදිලි ය. සියදිවි හානිකර ගැනීම සඳහා යොදා ගෙන ඇති උපක්‍රම ගණනාවක් ද සමාජ විද්‍යාඥයන් හඳුනා ගෙන ඇත.

කුමන ක්‍රමයකින් හෝ සියදිවි නසා ගැනීම සිදු වුවද බරපතල සමාජ අර්බුදයක් ය යන අදහස නූතනයෙහි අවිවාදාත්මක ව පිළිගෙන ඇත. යම් රටක දිවි නසා ගැනීම ලක්ෂයකට දහය ඉක්මවයි ද එය අසාමාන්‍ය ස්වරූපයකි **ආර්.ජේ. හැව්ගාර්ට්** නම් මනෝ විද්‍යාඥයා පෙන්වා දී ඇති පරිදි සිය දිවි නසා ගැනීමේ අනුපාතය ජනගහනය ලක්ෂයකට පහළොව ඉක්මවයි නම් එය ඉහළ අනුපාතයක් බවයි.

එමිල් ඩුර්කයිම් ප්‍රකාශ කර ඇති පරිදි කිසියම් රටක තිබෙන සමාජ විෂමතාව වැඩි වූ තරමට සිය දිවි හානි කර ගන්නා පුද්ගලයන්ගේ සංඛ්‍යාව ද වැඩි වේ.

මේ ආකාරයෙන් සිය දිවි නසා ගැනීම සමාජ ප්‍රශ්නයක් ලෙස විග්‍රහ කිරීමේදී එය පොදුවේ මුළු මහත් සමාජයට ම අහිතකර ලෙස බලපානු ලබයි. සිය දිවි නසා ගැනීමෙන් සමාජයට පුද්ගලයකු අහිමි වීම පමණක් නොව තම පවුලේ සාමාජිකයින්ට මෙන් ම සමාජ කණ්ඩායම්වලට ද බලපෑම් කරයි. මේ අයුරින් සිය දිවි අහිමි කර ගැනීම තුළින් එම තැනැත්තාගෙන් සමාජ සංවර්ධනයට ලබා දිය හැකි දායකත්වය අහිමි වීම, ඔහු හෝ ඇය අයත් පවුල් සංස්ථාව බිඳ වැටීම, බිරිඳ හා දරුවන් සමාජ ආර්ථික ගැටලුවලට පත් වීම, සැමියා අපචාරවලට යොමු වීම සහ දරුවන්ගේ අධ්‍යාපන කටයුතු අඩාල වීම වැනි අහිතකර බලපෑම් සමාජයට අත් විය හැකි ය.

කුමන සිය දිවි නසා ගැනීමකදී වුව ද ආත්මීය හුදකලාභාවයකට පුද්ගලයා ලක් වන බව සත්‍යයකි. එබැවින් එයට අදාළ සමාජ ආර්ථික පසුබිම සමග සම්බන්ධ කර බැලීම අවශ්‍ය වේ. මානසික රෝග ලක්ෂණයක් ලෙස සිය දිවි නසා ගැනීම විග්‍රහ කිරීමක දී වුව ද එබඳු ව්‍යාකූලතාවන් ඇති කරන

සාධක ගැඹුරින් විමසීම වඩාත් යෝග්‍ය වන බව සඳහන් කළ හැකිය. දිවි නසා ගැනීම සමස්ත සමාජයට ම ප්‍රශ්නයක් වී ඇති බව සමාජ විද්‍යාඥයින්ගේ මතය වී තිබේ.

සමාජයක යහපැවැත්ම උදෙසා එම සමාජය උරුම කර ගෙන ඇති විශ්වාස, ආකල්ප සහ සිරිත් විරිත් වැදගත් වේ.

එබැවින් කිසිම සමාජයක සියදිවි නසා ගැනීමක් යහපත් යැයි පිළි ගැනෙන්නේ නැත. එය සමාජ බිඳ වැටීමක් ලෙස සැලකේ. එබැවින් යම් සමාජ ක්‍රමයක සාමාජිකයකු වී සිටින පුද්ගලයකු සියදිවි හානිකර ගැනීම මගින් එම සමාජයේ සාරධර්ම බිඳ වැටීමකට ලක් වී ඇති බව පැහැදිලි වේ.

## ශ්‍රී ලංකාවේ සිය දිවි නසා ගැනීම සම්බන්ධව සංඛ්‍යා ලේඛන

| වර්ෂය | පිරිමි | කාන්තා | මුළු ගණන |
|---|---|---|---|
| 2010 | 2914 | 950 | 3864 |
| 2011 | 2939 | 831 | 3770 |
| 2012 ජූනි දක්වා | 1381 | 397 | 1778 |

(පොලිස් වාර්තා. 2012)

ඉහත සංඛ්‍යා ලේඛනවලට අදාල වසර තුනේදී ම වැඩිම පිරිසක් දිවිනසා ගැනීම් වාර්තා වී ඇත්තේ රත්නපුරය හා අනුරාධපුර දිස්ත්‍රික්කවලින් ය.

2011 වර්ෂයේ වයස් සීමා පරීක්ෂා කිරීමේදී වැඩි ප්‍රතිශතයක් වශයෙන් අවුරුදු හතළිහත් පනස් පහත් අතර වැඩිහිටියන් දිවි නසා ගැනීමට පෙලඹී ඇති බව පොලිස් මූලස්ථානය පෙන්වා දෙයි.

(පොලිස් වාර්තා. 2013)

## ක්‍රියාකාරකම් 6.2.1

කෙටි පිළිතුරු ලියන්න

01. දිවි නසා ගැනීමට බලපාන ප්‍රධාන සාධක 3ක් දක්වන්න.

02. දිවි නසා ගැනීම් පිළිබඳ පර්යේෂණ පැවැත්වූ සමාජ විද්‍යාඥයන් දෙදෙනෙකුගේ නම් ලියන්න.

03. පුද්ගල දිවිනසා ගැනීමක් නිසා සමාජයට ඇතිවන බලපෑම් තුනක් ලියන්න.

04. දිවි නසා ගැනීමක් වළක්වා ගැනීමට ලබාදිය හැකි උපදේශ කිහිපයක් සඳහන් කරන්න.

## 6.3 HIV/ ඒඩ්ස් රෝගය සමාජ ප්‍රශ්නයක් ලෙස

සමාජ විද්‍යාඥයින්ගේ විග්‍රහයට අනුව පොදුවේ සමාජයේ බහුතරයට බලපෑමක් කරන ගැටලු සමාජ ප්‍රශ්න වශයෙන් නිර්වචන කර ඇත. ශ්‍රී ලංකාව තුළ ඇති වී තිබෙන සමාජ ගැටලු අතරට එකතු වී ඇති බරපතල ම සමාජ ප්‍රශ්නයක් නම් ඒඩ්ස් රෝගයයි.

ඒ තුළින් සමාජය අනුමත නොකළ ක්‍රියාකාරකම් පද්ධතියක් පැන නඟී. සමාජ ප්‍රශ්න (Social Problems) යනු මෙසේ ව්‍යාකූල වූ සමාජයක දැකිය හැකි සමාජ විරෝධී හැසිරීම් රටාවක එක් පැත්තකි. සමාජයට අනුගත නො වූ හැසිරීමක් නිසා පෙරලා සමාජ ක්‍රියාකාරිත්වයට හානි කර බලපෑමක් ඇති අර්බුදකාරි තත්ත්වයක් ඉන් නිරූපණය වේ.

අප ශරීරයට රෝග ඇති කරන ක්ෂුද්‍රජීවීන් බොහෝ ය. වෛද්‍ය විද්‍යාවේ මේවා රෝග කාරක ලෙස හඳුන්වයි. බැක්ටීරියා, වයිරස්, දිලීර පරපෝෂිතයන් මින් ප්‍රධාන වේ. ඒඩ්ස් රෝග කාරකය වයිරසයකි. මෙම වයිරසය මානව ප්‍රතිශක්ති ඌනතා වයිරසය (HIV) නොහොත් (HUMAN IMMUNE DEFICIENCY VIRUS) ලෙස නම් කර ඇත. රෝග කාරක වයිරසයේ නමින් ම එම රෝගයේදී මිනිස් ශරීරයට සිදුවන දේ පැහැදිලි කරයි. ලෙඩ රෝගවලට ඔරොත්තු දීමේ හැකියාව ප්‍රතිශක්තිකරණය ලෙස හඳුන්වන අතර එම ප්‍රතිශක්තිය ඌනතාවකට පත් කිරීම නොහොත් ලෙඩ රෝගවලට ඔරොත්තු දීමේ හැකියාව අඩු කිරීම හෝ නැති කිරීම මෙම වයිරසය නිසා සිදු වේ.

විෂබීජයක් ශරීරය තුළට ඇතුළු වූ පසු මුලින් ම හමුවනුයේ ශරීරයේ ඇති ප්‍රතිශක්තිකරණ පද්ධතියයි. ප්‍රතිශක්තිකරණ පද්ධතියට විෂබීජය සමග සටන් කොට ජය ලබාගත හැකි නම් එම රෝගය හට නොගනී. පරාජය වුවහොත් එම රෝගය හටගනී. ප්‍රතිශක්තියට හේතුවන T 4 සෛල ක්‍රම ක්‍රමයෙන් විනාශ කිරීම තුළින් මුළු ප්‍රතිශක්තිකරණ පද්ධතිය ම අඩපණ කර විනාශ කරනු ලබයි. එමගින් ඒඩ්ස් නමැති මාරාන්තික රෝගය මිනිසා තුළ ඇති කරයි.

මෙම වෛරසය මගින් විනාශ කරනුයේ සුදු රුධිරාණු සෛල කොට්ඨාසයයි. ශරීරයේ ප්‍රතිශක්තිය සඳහා අත්‍යවශ්‍ය වන මෙම සුදු රුධිරාණු සෛලයන් විනාශ වීම නිසා එච්. අයි. වී. ආසාදිතයකුට වෙනත් රෝග වැළඳීම ද පහසු කරවයි. එලෙස ම විශේෂ වර්ගයේ වූ පිළිකා ද ඇතිවිය හැකි ය.

1981 වර්ෂයේ ඇමරිකාවේ ලොස් ඇන්ජලිස් නගරයේ විරල ගණයේ නිව්මෝනියා රෝගීන් පස් දෙනෙකු සොයා ගැනීමත් එම නගරයේ ම සමේ ඇති වන විරල ගණයේ කැපොයිසාකෝමාව නම් පිළිකා තත්ත්වයෙන් පෙලෙන රෝගීන් විසිහය දෙනෙකු සොයා ගැනීමත්, එම රෝගීන් බොහෝ දුරට සමලිංගික කටයුතුවල නිරතවූවන් බව සොයා ගැනීමත් සමඟම මෙම රෝගය පිළිබඳව විද්‍යාඥයින්ගේ පරීක්ෂණ දියත් කිරීමට හේතු වූ බව පෙනේ. එහි දී කරන ලද පරීක්ෂණවලට අනුව HIV වයිරසය නම් රෝග කාරකය සොයා ගැනුණි.

ශ්‍රී ලංකාවේ ප්‍රථම වතාවට HIV වයිරසය ශරීරගත වූ ආසාදිතයා සොයා ගනු ලැබුයේ 1986 දී ය. ඔහු විදේශ සංචාරයෙකි. ප්‍රථම ශ්‍රී ලංකිකයා 1987 දී

රත්නපුර දිස්ත්‍රික්කයෙන් සොයා ගනු ලැබූ බව වාර්තා වී ඇත. මේ අනුව 1993 සැප්තැම්බර් වනවිට HIV වයිරසය ශරීර ගත වූවන් එකසිය හතක් පමණ සොයා ගෙන ඇති අතර එයින් ඒඩ්ස් රෝගීන් විසි පහක් සොයා ගත් අතර ඉන් විසි හතරක් ම ඒ වන විටත් මරණයට පත් වී තිබුණි. මෙම රෝගී තත්ත්වය ව්‍යාප්ත වීම ශ්‍රී ලංකා සමාජය ඇසුරෙන් විග්‍රහ කර බලන විට දී බරපතල සමාජ තත්ත්වයක් බව පැහැදිලි ය. ශ්‍රී ලංකාව සංවර්ධනය මාවතට පිවිසෙමින් සිටින රටකි. එබැවින් මෙම භයානක ව්‍යවසනයට ලංකාව ද ගොදුරු වී ඇති බැවින් එය දැන් බරපතල සමාජ ප්‍රශ්නයක් බවට පත් වී තිබේ. වසර 2002 වන විට ශ්‍රී ලංකාව තුළ HIV ආසාදිත රෝගීන්ගේ සංඛ්‍යාව 8500 ක් දක්වා වැඩි වී ඇති බව සනාථ කර ගෙන ඇත.

ඒඩ්ස් රෝගයට වඩාත් ගොදුරු වන්නේ තරුණ තරුණියන් ය. එයට හේතු වන්නේ යෞවනත්වය සහ තාරුණ්‍යය අත්හදා බැලීම් සහ විවිධ සොයා ගැනීම් මත බැඳී පවතින කාලවකවානුවක් ලෙසට හඳුනාගත හැකි වීමයි. ඔවුන් තුළ උපදින නව හැඟුම් ඔස්සේ ඔවුනොවුන් චර්යා රටාවන් සහ සම්බන්ධතාවන් ගොඩනඟා ගනී. එහෙත් එය අවදානම් සහගත වීමට ඇති ඉඩකඩ වැඩි ය. ශ්‍රී ලංකාව තුළ පාරම්පරික සමාජය සකස් වී තිබුණේ ඉතාමත් ක්‍රමවත් ආකාරයකට යි. ඒ අනුව මීට දශක කිහිපයකට පෙර යෞවන, යෞවනියන් සමඟ අද සමාජයේ යෞවන, යෞවනියන් සැසඳූ විට ඔවුන් අතර පැහැදිලි වෙනසක් දක්නට ලැබේ. මෙයට හේතු වූ ප්‍රධාන කරුණු අතර

* ශ්‍රී ලංකාව තුළ සිදුවන නාගරීකරණය
* විවෘත ආර්ථිකය
* පවුල් සංස්ථාව තුළ ඇති වී තිබෙන සාරධර්ම සහ පෞරාණික හර පද්ධතියේ අගයන් පිරිහීම
* ජනමාධ්‍ය මඟින් ශ්‍රී ලාංකික සංස්කෘතියට අහිතකර ආකාරයෙන් යෞවන, යෞවනියන් තුළ ඇති කර වන අනිසි පෙලඹවීම්

ආදී සාධක දැක්විය හැකි ය.

ඒඩ්ස් රෝගය නිසා අති විශාල මානව හා ආර්ථික බරක් සමාජයට දැරීමට සිදුවන බැවින් පුද්ගලයින් දැනුවත් කර ඒඩ්ස් රෝගීන්ගේ සංඛ්‍යාව අවම මට්ටමක පවත්වා ගැනීමට වැඩසටහන් සංවිධානය කළ යුතුව පවතී.

HIV වෛරසය ආසාධිත පුද්ගලයකු ඒඩ්ස් රෝගියෙකු බවට පත්වීමට ගත වන කාලය වසර එකේ සිට වසර විස්සක් දක්වා විය හැකි බව වෛද්‍යවරුන්ගේ මතය යි. එය තීරණය වන්නේ සිරුරට ඇතුළු වන වෛරස ප්‍රමාණය සහ පුද්ගලයාගේ ශරීර සෞඛ්‍ය ආදී කරුණු මතයි. එබැවින් ඒඩ්ස් ආසාදිත පුද්ගලයකු ඔහු හෝ ඇය තමන්ට ඒඩ්ස් ආසාදිත ව ඇතැයි යන්න නොදන තවත් කෙනෙක් හා ලිංගිකව සම්බන්ධතා පැවැත්වීම මඟින් නිරෝගී තැනැත්තෙකුට රෝග කාරක විෂබීජ ශරීරගත විය හැකි ය. එමෙන් ම සමාජයෙන් පලිගැනීමේ චේතනාව අතැ'තිව තමන් දනගත් පසුව තවත් අයෙක් ලිංගික ක්‍රියාවලියකට පොලඹවාලීම තුළින් ඒඩ්ස් රෝග කාරක විෂබීජය පතුරුවා හැරිය හැකි ය. එය ශ්‍රී ලංකාවට ම බලපාන ප්‍රබල සමාජ ප්‍රශ්නයක් ලෙසට දැක්විය හැකි ය.

ඒඩ්ස් රෝගියෙකු සඳහා දැඩි ආර්ථික බරක් දැරීමට සිදුවන්නේ ය. එය ශ්‍රී ලංකාව වැනි දියුණු වෙමින් පවතින රටකට ඔරොත්තු නොදෙන අතර පවුලක සිටින සාමාජිකයෙකුහට ඒඩ්ස් රෝගය වැළඳුන විට ඔහු හෝ ඇය රැකබලා ගැනීමේ කටයුතු හා ඖෂධ කටයුතු සඳහා වෙනම ම මුදල් ප්‍රමාණයක් වැය කිරීමට සිදු වන්නේ ය. මේ නිසා ආර්ථික පරිහානියකට ද පවුල් සංස්ථාව පත්වන්නේ ය.

ඒඩ්ස් රෝගයට ගොදුරු වූ තැනැත්තාගේ සමාජ තත්ත්වය සහ ඔහුගෙන් ඉටුවිය යුතු කාර්ය භාරය ඔහුගෙන් ගිලිහි යන අතර ඒ හේතුවෙන් මුළු පවුල් සංස්ථාව ම දැඩි අපහසුතා රැසකට පත්වන්නේ ය. ඒ හේතුවෙන් ම ඔහු හෝ ඇය මත යැපෙන්නන්ගේ ඉරණම ඉතාමත්ම දුක්ඛදායක බවට වන්නේ ය.

රටක් සංවර්ධනය කරා ගමන් කරනු ලබන්නේ රටේ ජීවනාලිය බඳු වූ තරුණ පිරිස නිරෝගී ව හා ක්‍රියාශීලී ව සිටින්නේ නම් පමණකි. එහෙත් ඒඩ්ස් වැනි රෝගයකට සමාජයේ ජීවත් වන්නාවූ තරුණ පරපුර ලක් වූ කළ රටේ සමාජ සංවර්ධනය සහ මානව සංවර්ධනය දුර්වල වන්නේ ය. ඒ හේතුවෙන් රෝගී වූ තරුණ පරපුරක් සමාජයට දායාද වන අතර ක්‍රියාශීලී සමාජයක් හෝ ඵලදායිතාව වැඩි දියුණු වූ ගුණාත්මක සමාජයක් වර්ධනය නොවන්නේ ය. ඒ හේතුවෙන් සමාජ සංවර්ධනය අඩපණ වන අතර සමාජ පරිහානියක් ද සිදුවන්නේ ය.

**ක්‍රියාකාරකම් 6.3.1**

කෙටි පිළිතුරු ලියන්න

01. H.I.V. හෙවත් ඒඩ්ස් රෝගය මුලින් ම වාර්තා වූයේ කුමන රටේ ද?

02. ඒඩ්ස් රෝගයේදී ශරීරය තුළ සිදුවන වෙනස් කම් සැකෙවින් දක්වන්න.

03. ඒඩ්ස් රෝගය ශ්‍රී ලංකාවේ පැතිරීමට බලපා ඇති කරුණු දෙකක් නම් කරන්න.

04. පන්සිල් සුරකින සමාජයට ඒඩ්ස් අවධානමක් නැත. ශිෂ්‍ය සමිතියේ දී ඉදිරිපත් කිරීමට ලිපියක් සකසන්න.

## 6.4 ඉහත සමාජ ප්‍රශ්න ලාංකීය සමාජය කෙරෙහි ඇති කරන බලපෑම හා ඒවා නිවාරණය සඳහා ඇති බෞද්ධ මාර්ගෝපදේශ

ශ්‍රී ලංකාව සංවර්ධනය වෙමින් පවතින රටක් වශයෙන් මුහුණ දෙන සමාජ ගැටලු රාශියකි. ඒ අතරින් සිය දිවි නසා ගැනීම හා ඒඩ්ස් රෝගය යන ගැටලු දෙක වර්තමානය වනවිට ඉතා ශීඝ්‍රයෙන් වර්ධනය වෙමින් පවතින ගැටලු දෙකකි. පොදුවේ සැලකීමේ දී මෙය ශ්‍රී ලංකාව වැනි සංවර්ධනයේ ගමන් මඟට පිවිසි රටකට ප්‍රබල ලෙස බලපෑම් කළ හැකි ගැටලු සහගත අවස්ථාවකි.

සමාජ මානව විද්‍යාඥයින්ගේ විග්‍රහයන් සමග මෙවැනි ගැටලු සංසන්දනාත්මක ව විමසිමේදී ඒවා සමාජයකට කුමන ආකාරයට බලපෑම් කෙරේ ද යන්න පැහැදිලි කරගත හැකි වේ. මෙම ගැටලු දෙකින් සියදිවි නසා ගැනීමේ සමාජ ගැටලුව අතීතයේ ද පැවැති බව අතීත තොරතුරුවලින් සනාථ වේ. එහෙත් වර්තමානයේ තරම් දිවිනසා ගැනීම් වර්ධනය වූ වකවානුවක් වෙන නැති තරම් ය. තමා තමාට ම එරෙහිවීමත් තමා සමාජයට එරෙහි වීමත් නිසා පුද්ගලයන් සියදිවි තොර කර ගන්නා බව ඩූර්කයිම්ගේ මතය යි. පරාර්ථකාමීත්වය නිසා ද පුද්ගලයින් සියදිවි තොර කර ගන්නා අවස්ථා ද ඩූර්කයිම් තව දුරටත් විස්තර කරයි. එනම් රට ජාතිය, ආගම හා භාෂාව වෙනුවෙන් සිය දිවි තොර කර ගැනීමයි. මෙයින් ශ්‍රී ලංකියන් බහුතරයක් දිවි නසාගෙන ඇත්තේ පරාර්ථකාමිත්වය නිසා නොවන බව සංඛ්‍යා ලේඛන මඟින් අනාවරණය කර ගෙන තිබේ.

ශ්‍රී ලංකාවේ සියදිවි නසා ගැනීමේ විශේෂ ලක්ෂණයක් වනුයේ එයට වැඩිපුර ම පෙලඹෙනුයේ තරුණයන් විමයි. මෑත භාගය දක්වා කරන ලද සමීක්ෂණවලින් හෙළි වන්නේ දිවි නසා ගැනීම් වලින් හරි අඩක් ම වාගේ අවුරුදු පහළොවත් විසි නමයත් අතර වූවන් බව ය. වයස්ගත පුද්ගලයන් සිය දිවි නසා ගැනීමට පෙලඹී ඇත්තේ ඉච්ඡාභංගත්වය හෙවත් බලාපොරොත්තු බිඳවැටීම නිසා යැයි ද පිළිගත හැකි ය.

සියදිවි නසා ගැනීම් පිළිබඳ ව ශ්‍රී ලංකාව තුළ දැකිය හැකි තවත් විශේෂ ලක්ෂණයක් වන්නේ අභ්‍යන්තරික සංක්‍රමණ සිදු වූ පොළොන්නරුව අනුරාධපුරය සහ ත්‍රිකුණාමලය වැනි දිස්ත්‍රික්කවල දිවි නසා ගැනීමේ අනුපාතය අධික ජනගහනයක් සිටින දකුණ, බස්නාහිර, වයඹ වැනි පළාත්වලට අයත් දිස්ත්‍රික්කවල අනුපාතයට වඩා බෙහෙවින් ම වැඩි වීම යි. මෙම ප්‍රදේශ කෘෂි ආර්ථික රටාවක් පවතින ප්‍රදේශ වීම හා දිවිනසා ගැනීමේ උපක්‍රම පහසුවෙන් හඳුනාගත හැකි වීම ද මීට හේතුවක් විය හැකි ය.මේ අනුව ශ්‍රී ලංකාවේ සියදිවි නසා ගැනීම් ඉතා ශීඝ්‍රයෙන් වර්ධනය වී පවතින බව පැහැදිලි කරුණකි.

ශ්‍රී ලංකාව තුළ වර්ධනය වෙමින් පවතින ඒඩ්ස් රෝගය නිසා ලාංකික සමාජය පත් වී ඇති තත්ත්වය පිළිබඳව විමසා බැලිය යුතු වේ. ශ්‍රී ලංකාවට පමණක් නො ව සමස්ත ලෝකයාට ම අහිතකර ලෙස බලපා ඇති ප්‍රබල සමාජ ප්‍රශ්නයක් වශයෙන් ඒඩ්ස් රෝගය ඉහතින් හඳුනා ගන්නා ලදි. අද වන විට ද ලිංගික සම්ප්‍රේෂණ රෝග පාලනය සම්බන්ධයෙන් රෝග මර්දන

ව්‍යාපාරය විවිධ උපක්‍රම භාවිත කරනු ලැබේ. ශ්‍රී ලංකාවේ පූර්ණ කාලීන වශයෙන් ක්‍රියාත්මක වන ලිංගික සම්ප්‍රේෂණ රෝග සායන විස්සක් ක්‍රියාත්මක වන අතර ශාඛා සායන ද ක්‍රියාත්මක වේ. ඒවා ජාතික සහ මූලික රෝහල් ආශ්‍රිත ව ක්‍රියාත්මක කෙරේ, මීට අමතරව ශ්‍රී ලංකාව පුරා ම පිහිටා ඇති ආරෝග්‍ය ශාලාවල ද මෙම සායන පිහිටා තිබේ.

ලිංගාශ්‍රිතව සම්ප්‍රේෂණය වන රෝග නිවාරණය සඳහා මග පෙන්වන උතුම් දර්ශනයක් ලෙස බෞද්ධ දර්ශන හඳුන්වා දිය හැකිය. එය " කාමමිත්‍යාචාරය" ගෘහස්ථ සීලයක් ලෙසට නිර්දේශ කර ඇති අතර එමගින් පති / පතිනි දම් රැක්මට සමාජය පොලඹවාලයි. ගිහි කාම සම්පත් විඳීමේ දී පවත්වාගත යුතු ආචාරධර්ම බුද්ධ දේශනාව පැහැදිලි ව දක්වා ඇත. පරදර සේවනය පිරිහීමට කරුණක් බව පරභව සූත්‍රයෙහි දැක්වේ. සිඟාලෝවාද සූත්‍රයේ අඹු දරුවන් අරභයා පවත්වා ගත යුතු ආචාර ධර්ම මෙහි දී ඉතා වැදගත් ය. කාලාම සූත්‍ර දේශනාවේ ද ගිහි ශීලයට අදාළව ඉදිරිපත් කර ඇති කරුණු ද යහපත් සමාජ සංවිධානයකට මග පෙන්වයි.

පවුල තුළ යහපත් හා විශ්වාසවන්ත ස්වාමි භාර්යා සබඳතාවන් පවත්වා ගැනීම ඒඩ්ස් රෝගය වළක්වා ගැනීමේ ඒකායන විසඳුම වේ.එබැවින් භික්ෂූන් වහන්සේ පන්සල වෙත පැමිණෙන දායක ප්‍රජාව අරභයා නිරන්තරයෙන් අවවාද අනුශාසනා කිරීමත් එහිදී ස්වකීය අඹුසැමියන් කෙරෙහි සැමවිට ආදර ගෞරව සම්ප්‍රයුක්ත ව හා විශ්වාසවන්ත ව ජීවත් වීමේ අගය පහදා දීමත් සිදුකළ යුතු ය.

මෙම කරුණු අනුව සඳහන් කළ හැක්කේ 20 වන සියවසේ ලොව බිලි ගත් මහා ව්‍යවසනය වන ඒඩ්ස් රෝගය පැතිරීම වළක්වා ගැනීම සඳහා චර්යාත්මක විපර්යාසයකට සමාජය භාජනය කළ යුතු බවයි. ශ්‍රී ලාංකීය සමාජය තුළ පවත්නා වූ අගයන් සංස්කෘතික පසුබිම හැදියාව ආදී දේ උපරිම ලෙසට ප්‍රයෝජනයට ගනිමින් ද දියුණු වන ලෝකය තුළ සිදු වන සමාජ විපර්යාසයන්ට ඔරොත්තු දෙන සේ ඊළඟ පරපුර ශක්තිමත් කිරීම මගින් ද ව්‍යසනයක් ලෙසට පවතින ඒඩ්ස් රෝගයෙන් ආරක්ෂා වීමට හැකිවන්නේ ය. ඒ අනුව ඉහත සඳහන් ක්‍රියාකාරකම් ශ්‍රී ලංකා සමාජය අනුගමනය කරලීම මගින් ඒඩ්ස් රෝගයෙන් ශ්‍රී ලංකා සමාජය ආරක්ෂා කරගැනීමට හැකිවනු ඇතැයි අපේක්ෂා කළ හැකි වන්නේ ය. විසිඑක්වන සියවසේ දී ශ්‍රී ලාංකික ප්‍රජාව ඒඩ්ස් රෝගයෙන් තොර සමාජයක සාමාජිකයින් බිහි කිරීම සඳහා

ඉහත ක්‍රියාමාර්ග නිසි ලෙස ප්‍රයෝජනයට ගත හැකි ය. එකී ක්‍රියාමාර්ග තුළින් අනාගතයේදී බිහිවන අපේ දූ දරුවන් සඳහා කළ හැකි උතුම්ම ආයෝජනය එය වනු ඇත.

## සමාජ ගැටලු නිරාකරණයට බෞද්ධ ඉගැන්වීම්

බුදු දහම බුද්ධිය හා සදාචාරය පදනම් කර ගත් දර්ශනයක් මත ගොඩනැගී ඇති දහමකි. එහිදී අනුන් සෙවීමට වඩා තමා සෙවීම මුල් විය යුතු යැ යි සඳහන් කරයි. පුද්ගලයාට බලපාන සමාජ ප්‍රශ්න අතර සිය දිවි නසා ගැනිම ප්‍රධාන තැනක් ගනී. සමහර තරුණ පිරිස් තම අභිමතාර්ථයක් මුදුන් පමුණුවා ගත නොහැකි වූ විට සිය දිවි නසා ගැනිම විසඳුමක් ලෙස භාවිත කරති. මීට අමතර ව වයස් සීමාවකින් තොරව මානසික රෝග හේතු කොටගෙන දිවි නසා ගන්නා අය ද සමාජයේ දක්නට ඇත. කෙසේ වුව ද දිවි හානි කර ගැනිම් බොහෝමයකට කිසියම් අසහනකාරී ස්වභාවයක් හේතු වී ඇති බව පැහැදිලි කරුණකි.

තමා හමුවේ ඇති අභියෝගාත්මක ප්‍රශ්නවලට මුහුණ දීමේ හැකියාවක් ස්වභාවයෙන් ම මිනිසාට තිබේ. එහෙත් එය පුද්ගලයාගෙන් පුද්ගලයාට වෙනස් වේ. දරා ගැනිමේ ශක්තිය ඇති කෙනෙකු වෙත ගැටලුවක් ඇති වූ අවස්ථාවකදී එම ගැටලුවෙන් මිදී අලුත් තත්ත්වයකට හැඩ ගැසීමට ඔහුට හැකියාව තිබේ. ඒ නිසා ගැටලුව සඳහා හේතුසාධක වූ දේ අවබෝධ කර ගැනීමේ මානසික අපහසු තත්ත්වයෙන් ගොඩ ඒමට හැකියාව ලැබේ. එහෙත් සමහරුන්ගේ මෙම දරා ගැනීමේ ශක්තිය දුර්වල ය. එවන්නෝ හැම විටම ප්‍රශ්නවලට ලෙහෙසි හා ක්ෂණික විසඳුම් සොයති. ඇතැම් විටෙක ඔවුහු ප්‍රශ්නයක් ඇති වූවිට ලබාගත හැකි ක්ෂණික විසඳුමක් ලෙසට මරණය දකිති. මනෝ විද්‍යාඥයන් මොවුන් දුර්වල පෞරුෂයන් (Weak Personality) ඇති අය වශයෙන් හඳුන්වති.

කිසියම් ප්‍රශ්නයකට විසඳුමක් ලෙස සියදිවි හානි කර ගැනීම ප්‍රඥාගෝචර නොවන බව බුදු දහම උගන්වයි. බුදු දහමේ ඉගැන්වෙන කර්මය හා පුනර්භවය වැනි සංකල්පයන්ට අනුව සිය දිවි හානි කර ගැනිමෙන් සංසාරය දික් වන බව පෙන්වා දී තිබේ. ගැටලුවක් ඇති වූ විට ඒ ඇති වීමට හේතු වූයේ කුමක් ද යන්න විමසා බැලීම ය. ඊට පිළියම් යෙදීම ද, ඒවාට කම්පා නොවීම ද අවශ්‍ය බව එහි සඳහන් කරයි.

මේ පිළිබඳ තවදුරටත් විස්තර කර ඇති බුදු දහම පුද්ගලයා කේන්ද්‍ර කොට ගනිමින් ඔහු වටා ගොඩනැගී ඇති සමාජ යුතුකම් ඉටුවිය යුතු ය යි නිර්දේශ කොට ඇත. මක් නිසාද යත් ඔවුනොවුන්ගෙන් ඔවුනොවුන්ට ඉටුවිය යුතු යුතුකම් හරිහැටි ඉටු නොවීමෙන් ද අසහනයට පත්වන විට සිය දිවි හානිකර ගැනීමට පෙළඹෙන අවස්ථා ද ඇත. මෙයින් පැහැදිලි කරන්නේ එකිනෙකා වෙත ඉටුවිය යුතු යුතුකම් ඉටුවේ නම් සමාජයේ සාරධර්ම ආරක්ෂා වීමක් ද ඒ තුළින් පුද්ගල අසහනය දුරුවීමක් ද ජීවිත ආරක්ෂා වීම ද සිදු වන බවයි.

හිත සන්සුන් කර ගැනීමෙන් ප්‍රශ්න දෙස නිදහස් ව බැලීමටත් වඩාත් සුදුසු ක්‍රියා මාර්ග ගැනීමටත් පුද්ගලයා පෙලඹේ. අසහනකාරී හෝ පසුතැවීමේ අවස්ථාවන්ට ගොදුරු නොවන අතර අපේක්ෂා සහගත ව ප්‍රශ්නවලට මුහුණ දීමේ හැකියාව ලැබේ. ඒ සඳහා සීලයත් භාවනාවත් ප්‍රගුණ කළ යුතුය.

සියදිවි නසා ගැනීම සිදු කර ගන්නා පුද්ගලයන් අතුරින් එක් කොටසක් ඉච්ඡා භංගත්වය හේතුවෙන් එම තත්ත්වයට පත්වන බව වාර්තා වේ. බුදු දහම අනුව පුද්ගලයා පමණ ඉක්මවා බලාපොරොත්තු තබා නොගත යුතු ය. අසීමිත ආශාවන් පාලනය කරගෙන ලද දෙයින් සතුටු වීමට පුරුදු විය යුතු ය. සැහැල්ලු ගති පැවැතුම්වලින් යුක්ත නිසාත් පෝෂණය කිරිම පහසු නිසාත් නිතර ගැටලු මතු නොවේ. එ නිසා මිනිසා අසහනයට පත් කොට සියදිවි නසා ගැනිම සඳහා පෙලඹෙන මුල් හේතූන් සොයා ඒවාට පිළියම් යෙදීම මගින් එය වළක්වා ගත හැකි බව පෙන්නුම් කෙරේ. ඉවසීම, කරුණාව මෛත්‍රිය, අනුකම්පාව වැනි ගුණ ධර්ම ආරක්ෂා වූ තරමට සහනශීලි ජීවිතයක් මිනිසාට ගත කළ හැකි බවත් බුදු දහම අවධාරණය කර ඇත. බෞද්ධ සාරධර්ම මගින් ජීවිතයක වටිනාකම අවබෝධ කර වීම තුළින් සියදිවි නසා ගැනීමට පෙලඹෙන ජීවිත ආරක්ෂා කර ගැනීමට හැකි වන්නේ ය.

සමාජ ගැටලු විසඳීමේදී ආගමික පසුබිම ඉතා ම වැදගත් කාර්ය භාරයක් ඉටු කරයි. ඒ ඒ ගැටලුවල ස්වභාවය අනුව ක්‍රියා මාර්ග ගනු ලබන අතර එයින් බොහෝ දුරට ගැටලු නිරාකරණයට ඉඩ කඩ ලැබී ඇත. සමාජ ගැටලු අතර ඒඩ්ස් රෝගය නූතනයේ ප්‍රධාන තැනක් ගනී. පුද්ගලයාගේ චර්යාව පාලනය කිරීමට නිසි ලෙස නොහැකි වීමේ ප්‍රතිඵලයක් වශයෙන් ඇති වන ඒඩ්ස් රෝගය වැනි ගැටලුවලින් මිදීමට බුදු දහමෙන් නිසි උපදෙස් ලබා ගත හැකි ය.

නිත්‍ය ගිහි සීලය වන පංච ශීලය ගැන උනන්දුවක් දක්වන්නේ නම් එය ම බොහෝ සමාජ ගැටලු විසඳීමට උපකාර කර ගත හැකිය. පංචශීලයේ එන කාමයෙහි වරදවා හැසිරීමෙන් වැළකීම යන ශික්ෂාපදයට අනුව දෛනික ජීවිතය ගොඩනංවා ගැනීමට හැකිනම් ඉන් බොහෝ පවුල් ප්‍රශ්න හා ඒ සම්බන්ධිත අනිකුත් ප්‍රශ්න මග හරවා ගත හැකි ය. ගණිකා වෘත්තිය නිසා ඒඩ්ස් වැනි රෝග ද ඇති වීමට ඉඩ ඇත. වර්තමානයේදී ප්‍රබල සමාජ ගැටලුවක් වන මාරාන්තික ඒඩ්ස් රෝගයෙන් සමාජය මුදවා ගැනීමට  පුද්ගල චරිත පාරිශුද්ධිය පවත්වා ගැනීම අවශ්‍ය වේ. ඒ සඳහා නිවැරදි මාර්ගය වන්නේ හැකිතාක් දුරට කාම වැරදිවලින් වැළකි ජීවත් වීමය. පරදාර සේවනය බුදු දහම ප්‍රතික්ෂේප කරයි. එවැනි ක්‍රියා නිසා සමාජය තුළ ව්‍යසනකාරී තත්ත්වයක් ඇති වන අතර කාමයෙහි වරදවා නොහැසිරීමෙන් මෙම රෝග බෝවීම ඉඳුරා ම වළක්වා ගත හැකි ය.

ඒඩ්ස් රෝගය සමාජය විසින් ම පහ කළ යුතු බරපතල ම මානව ගැටලුවක් වෙයි. මේ තත්ත්වයෙන් මඟ හැරීම සඳහා ත්‍රිපිටකය තුළින් ගත හැකි දේශනා පාඨ බොහෝ වෙයි. බෞද්ධ සමාජය බොහෝ සෙයින් භාවිතා කරන සිඟාලෝවාද සූත්‍රයේ පංචකාම සම්පත්තිය පිළිබඳ දේශනා කිරීමේ දී බුදුරජාණන් වහන්සේ පරදාර සේවනය ප්‍රතික්ෂේප කිරීම පිළිබඳ අවධාරණය කරයි. තවද කුමර- කුමරි බ්‍රහ්මචාරි බව පිළිබඳ දේශනා කිරීමේදී කායික ස්පර්ශය පමණක් නොව මානසික ස්පර්ශය ද බුදුරජාණන් වහන්සේ ප්‍රතික්ෂේප කරයි.

පරාභව සූත්‍රයේ දහසයවන ගාථාව ආරම්භ වන්නේ ''ඉත්ථි ධූත්තෝ...'' ආදී වශයෙනි. පරස්ත්‍රීන් කෙරෙහි ලොල් වීම පිරිහීමට කරුණක් බව මෙහි සරල අදහස වෙයි. පරස්ත්‍රීන් කෙරෙහි ලොල් වීම නිසා සමාජ ගැටලු ඇති වීමටත් නීරෝගී සෞඛ්‍ය තත්ත්වයක් පවත්වාගෙන යාමටත් බාධාවක් වන බව එම දේශනා වල දක්වේ. එමෙන් ම එහි දහඅටවන ගාථාව කායික, මානසික සහ ආර්ථික අර්බුද ඇති වීමට හේතු වන කරුණක් මෙසේ දක්වා ඇත.

''සෙහිදාරෙහ්‍යසනතුට්ඨො - වේසියාසු'පදිස්සති,
දිස්සති පරදාරෙසු - තං පරාභවතො මුඛං''.

''තමාගේ භර්යාව හේතුකොට ගෙන නොසතුටු වූ යමෙක් වෛශ්‍යාවන් කෙරෙහි දක්නා ලැබේ ද, පර ස්ත්‍රීන් කෙරේ දක්නා ලැබේ ද එය ද පිරිහීමට කරුණක් වෙයි'' යනුවෙන් කර ඇති දේශනාවෙන් දක්නට ලැබෙන්නේ වෛශ්‍යාවන් කෙරෙහි ඇදී යාම කායික මානසික පිරිහීමක් සිදු වන ක්‍රියාදාමයක් බවයි.

පුද්ගලයකු වසලයෙකු වන ආකාරය වසල සූත්‍රයේ දක්වා ඇත. එහි අටවන ගාථාවෙහි දක්වෙන්නේ යමෙක් පරස්ත්‍රීන් වෙත ගොස් අනාචාරයේ හැසිරෙන්නේ නම් ඔහු වසලයකු වන බවයි. වසලයා යනු සමාජය විසින් පිළිකුල් කරන්නෙකි. ඔහු කායික මානසික පිරිහිම පමණක් නො ව සමාජගත පරිහානියකට ද ලක්විය හැකි ය. ඒ නිසා තම විශ්වාසවන්ත පවුල් සහකරුගෙන් / සහකාරියගෙන් බැහැරව කම් සැප සොයා යාම ඒඩ්ස් වැනි සමාජ රෝගවලට හේතු විය හැකි බව පැහැදිලි ව ප්‍රකාශ කළ හැකි ය.

බෞද්ධ සාහිත්‍යයේ එන ඇතැම් කතන්දර තුළින් ද අඹුසැමි බැඳීම පිළිබඳ තොරතුරු දැක ගත හැකිය. ''නකුල මාතා-නකුල පිතා'' පිළිබඳ කතා පුවත විමසීමේදී පැහැදිලි වන්නේ ඔවුන් ආත්ම ගණනාවක් එක ම අඹුසැමියන් ලෙස ජීවත් වූ බවයි. ඔවුන් දෙදෙනා අතර ඇති වූ පුංචි සිද්ධියකදී නකුල මාතා ප්‍රකාශ කරන්නේ සිහිනෙන් වත් වෙනත් පුරුෂයෙකු නොපැතූ බවයි. නකුල පිතා ද සිහිනෙන් වත් වෙනත් ස්ත්‍රියක් නොපැතූ බව ප්‍රකාශ කරයි. බුදුරජාණන් වහන්සේ එය අනුමත කරයි. මේ තුළින් ඔවුන්ගේ ආත්මගත බැඳීම තහවුරු වෙයි. එහි සඳහන්වන කරුණු වලට අනුව සමාජ ප්‍රශ්න ඔවුන්ට නැත. කායික මානසික ගැටලු ඔවුන්ට ඇති නො වූ බව මෙයින් තහවුරු වෙයි.

'' එක සැමියෙක් එක බිරිඳක්/ ඒකපති -ඒකපතිනි '' සංකල්පය සමාජයේ බොහෝ ප්‍රශ්නවලට විසඳුම් ලබා දෙන සංකල්පයක් බව අවධාරණය කරයි. මෙසේ බෞද්ධ ඉගැන්වීම් අපමණ සංඛ්‍යාවකින් පවුල් සංස්ථාවේ යථා පැවැත්ම අගය කරන අතර සමීප හා උණුසුම් බැඳීම් සහිත පවුල් ඒකකයක් ස්ථාපනය වීමෙන් සමාජ ගැටලු ස්ථිර වශයෙන් ම සමාජයෙන් නිවාරණය කළ හැකි ය.

**ක්‍රියාකාරකම් 6.4.1**

01. ශ්‍රී ලංකාවේ පවතින ප්‍රධාන සමාජ ප්‍රශ්නයක් තෝරාගෙන එයින් සමාජයට ඇතිවන බලපෑම් කෙටියෙන් ලියන්න.

02. සියදිවි නසා ගැනීම හා එඩ්ස් රෝගය වැනි සමාජ ප්‍රශ්න වලට බුදු දහමෙන් ලබා දිය හැකි උපදේශයන් කෙටියෙන් ලියන්න.

03. සමාජ ප්‍රශ්නවලට මුහුණදීමට හැකි උපදේශ අඩංගු ධර්ම කරුණු පිළිබඳ වාර්තාවක් සකස් කරන්න.

# 07 සමාජ සංවිධානය අධ්‍යයනය පිළිබඳ සමාජ විද්‍යාත්මක ප්‍රවේශය

## 7.1 සමාජ විද්‍යා පර්යේෂණවල අවශ්‍යතාව

පර්යේෂණයක් යනු ඥාන ගවේෂණයකි. තෝරාගත් මාතෘකාවක් යටතේ ක්‍රමානුකූලව සහ විද්‍යාත්මකව තොරතුරු ගවේෂණය කිරීම පර්යේෂණ ලෙස වැඩිදුරටත් පැහැදිලි කළ හැකි ය. ඉහළ අධ්‍යයන කටයුතු කරන්නන්ගේ ශබ්ද කෝෂයෙහි (Advanced Learner's Dictionary) සඳහන් වන අන්දමට '' ප්‍රවේශම් සහගත පර්යේෂණයක් හෝ සොයා බැලීමක් තුළින් නව දැනුම හා එයට බලපාන හේතු සාධක සොයා බැලීම '' පර්යේෂණ වේ. නිශ්චිත ක්‍රමයකට අනුව තොරතුරු ගවේෂණය කිරීම විද්‍යාත්මක කලාවක් ලෙසට හැඳින්වීමට ''කොතාරි'' (Kothari, 2003;1) යත්න දරා ඇත. ඉතා සරල ව සඳහන් කළහොත් දන්නා දෙයින් නොදන්නා දේ දක්වා ගමන් කිරීම නැතහොත් ගවේෂණය කිරීම පර්යේෂණ ලෙසට අර්ථ දක්විය හැකිය.

ක්ලිෆඩ් වුඩි (Clifford Woody) දක්වන ආකාරයට ගැටලු හඳුනා ගැනීම සහ අර්ථ දැක්වීම, කල්පිත සැකසීම හෝ විසඳුම් යෝජනා කිරීම; දත්ත ඒකරාශී කිරීම; සංවිධානය කිරීම සහ ඇගයීමට ලක් කිරීම, සමාලෝචනය කිරීම සහ නිගමනවලට එළඹීම මෙන් ම කල්පිතවලට එළඹුණු නිගමන ප්‍රායෝගිකව කොතෙක් දුරට අදාළ වන්නේ ද යනාදිය පර්යේෂණවලට අයත් වේ.

විශේෂයෙන් පර්යේෂණ කිරීමේ අවශ්‍යතාව රටක පාලකයින්ට බෙහෙවින් ම වැදගත් වේ. ඒ අනුව ප්‍රතිපත්ති සම්පාදකයින්ට, නව ව්‍යවසායකයින්ට, කෘෂි කාර්මික ක්ෂේත්‍රයට, නව ව්‍යවස්ථා සැලසුම් කිරීමට, ව්‍යාපෘතියක බලපෑම පරීක්ෂා කිරීමට, රටක අනාගත අය වැය සකස් කිරීමට ආදි වශයෙන් බෙහෙවින් ඉවහල් වේ.

## සමාජ විද්‍යා පර්යේෂණ යනු මොනවාද ?

සමාජ විද්‍යාත්මක පර්යේෂණ මොනවා ද යන්න විග්‍රහ කිරීමට විද්වතුන් බොහොමයක් යත්න දරා ඇත. පී.වී.යන්ග් (P.V.Young) විසින් රචිත විද්‍යාත්මක සමාජ සමීක්‍ෂණ සහ පර්යේෂණ ( Scientific Social Surveys and Research ) නැමැති ග්‍රන්ථයේ සඳහන්වන අන්දමට සමාජ විද්‍යාත්මක පර්යේෂණ යනු ''නව අදහස් ඉදිරිපත් කිරීම, ඉදිරිපත් කර ඇති මත වාදවල වලංගුභාවය සොයාබැලීම හෝ කිසියම් ක්‍රියාවලියක් සඳහා බලපාන සාධක අනුගත කිරීම, විග්‍රහ කිරීම, ඒවා අතර සබඳතාව සොයා බැලීම සහ ඒවාට බලපාන නෛසර්ගික සාධක සොයා බැලීමේ ක්‍රමානුකූල ප්‍රවේශයකි.'' මෙම නිර්වචනයට අනුව සමාජ විද්‍යාත්මක පර්යේෂණවල අඩංගු මූලික කරුණු කිහිපයක් පවතින බව අනාවරණය වේ.

i . සමාජ සන්දර්භය තුළ සමාජ විද්‍යා පර්යේෂණ කිරීම.

ii . නව අදහස් ඉදිරිපත් කිරීම හෝ ඉදිරිපත් කර ඇති මතවාදවල වලංගුභාවය සොයා බැලීම.

iii. මානව ක්‍රියාකාරකම් අතර සබඳතාව විග්‍රහ කිරීම.

## සමාජ විද්‍යා පර්යේෂණවල අරමුණු :-

සමාජ විද්‍යා විෂය ක්ෂෙත්‍රයන් යටතේ සිදු කෙරෙන පර්යේෂණවල අරමුණු එකිනෙකට වෙනස් වේ. එකී අරමුණු සියල්ල කැටිකොට ගත් විට සමාජ විද්‍යා පර්යේෂණවල අරමුණු මූලික වශයෙන් කොටස් දෙකකට කාණ්ඩ ගත කළ හැකිය.

(i) ශාස්ත්‍රීය අරමුණු (Academic Objectives)
(ii) උපයෝගීතා අරමුණු (Utilitarian Objectives)

(i) ශාස්ත්‍රීය අරමුණු - කිසියම් විෂය ක්ෂේත්‍රයක ප්‍රවීණතාව ලබාගැනීම හෝ ලබා ඇති බව තහවුරු කිරීම පාඨමාලාවක අවශ්‍යතාව වූ විට සිදුකරන පර්යේෂණ

මේ අරමුණ යටතේ ගත හැකි ය. එසේ ම පවතින දැනුම යළි පිරික්සීම තහවුරු කිරීම හෝ නව දැනුමක් අත්කර ගැනීම උදෙසා සිදුකරන පර්යේෂණ මෙම අරමුණ ඔස්සේ සිදු වේ.

(ii) උපයෝගීතා අරමුණු - කිසියම් ක්‍රියාන්විතයක සාඵල්‍යතාව, බලපෑම,කාර්යක්ෂමතාව, උපයෝගීතාව වැනි කරුණු පිළිබඳ ව විමසා බැලීමට සිදුකරන පර්යේෂණ මේ අරමුණු කාණ්ඩයට ඇතුළත් වේ. උදාහරණ ලෙස යම් ගුවන් විදුලි නාලිකාවක ජනප්‍රියතාව පිළිබඳ ව කරන ශ්‍රාවක පර්යේෂණයක් මේ යටතට ගත හැකි ය.

### ක්‍රියාකාරකම් 7.1.1

මෙම පරිච්ඡේදය හැදෑරීමෙන් ලබා ගත් දැනුම තහවුරු කර ගැනීම සඳහා පහත සඳහන් ක්‍රියාකාරකම්වල නිරත වීම ප්‍රයෝජනවත් වනු ඇත.

01. සමාජ විද්‍යා පර්යේෂණ පිළිබඳ ව අර්ථ දක්වන්න.

02. සමාජ විද්‍යා පර්යේෂණයන්හි ප්‍රධාන අරමුණු දෙක පිළිබඳ කෙටි විස්තරයක් කරන්න.

## 7.2 සමාජ විද්‍යාත්මක පර්යේෂණ ක්‍රමවේදය

සමාජ විද්‍යා පර්යේෂණයක් සැළසුම් කිරීමේදී ද ශුද්ධ විද්‍යාවන්හි භාවිත වන විද්‍යාත්මක ක්‍රමවේදය යම් තාක් දුරට, යොදා ගනු ලැබේ. සමාජය පිළිබඳ විද්‍යාත්මකව අධ්‍යයනය කිරීම මගින් "සමාජ විද්‍යාව" විද්‍යාවක් ලෙස ගොඩ නැගෙන්නේ මෙම ආනුභාවික පර්යේෂණ මූලධර්මවල භාවිතය නිසා ය.

### පර්යේෂණ ගැටලු හඳුනා ගැනීම

සමාජයේ පවතින තත්ත්වය අධ්‍යයනය කිරීම, වෙනස් වීම අධ්‍යයනය කිරීම, එමෙන් ම අනාගතයේ ඇතිවිය හැකි වෙනස්වීමකට තුඩු දෙන ප්‍රවණතා අධ්‍යයනය කිරීම ආදී වූ විවිධ ඉලක්ක ඔස්සේ පර්යේෂණයකට පිවිසිය හැකි වේ.

අධ්‍යයනයකට වඩාත් නැඹුරු වූ සමාජ වටපිටාව හඳුනා ගැනීමට පර්යේෂකයා සමත් විය යුතු වේ. ඒ අනුව සංකීර්ණ සමාජ වටපිටාවක අධ්‍යනයට සුදුසු හා හැකිවන පරිදි තෝරාගත් විෂය පථයක් පර්යේෂකයා විසින් වෙන් කර හඳුනාගත යුතු වේ. උදාහරණ ලෙස දහම් පාසලට සිසුන්ගේ පැමිණීම අඩුවී ඇති අවස්ථාවක ඊට පාදක වන හේතූන් පිළිබඳ දහම් පාසල් ප්‍රධානාචාර්යවරයා අවධානයක් යොමුකළ යුතු ය. ඒ පිළිබද වඩා හොඳින් අවබෝධකර ගැනීමට පර්යේෂණයක නියැළීමට පහසු ඉඩකඩක් පවතී.

කීර්තිමත් සමාජ විද්‍යාඥයකු වන මර්ටන් (Merton) '' පර්යේෂණ ගැටලුවකට විසඳුමක් සෙවීමට වඩා පර්යේෂණ ගැටලුව හඳුනාගැනීම සහ එම පර්යේෂණ ගැටලු අර්ථ දැක්වීම අසීරු කාර්යයක් වන බව '' ප්‍රකාශකර ඇත.

ඕනෑම පර්යේෂණ ගැටලුවක් හඳුනා ගැනීමට ප්‍රථමයෙන් එම ගැටලුව පිළිබඳ ව ඍජු ව හෝ වක්‍ර ව ලියවී ඇති ලිපි ලේඛන පරිශීලනය කිරීම එම පර්යේෂණ ගැටලුව හඳුනාගැනීමට පූර්ව සුදුසුකම් වනවා නොඅනුමාන ය.

සෑම පර්යේෂණ ගැටලුවක් ම වෙනත් පර්යේෂණ ගැටලුවලින් වෙනස්වන බව පැහැදිලි කරුණකි. එහෙත් පර්යේෂණ ගැටලුව හඳුනාගැනීමේ දී ප්‍රකාශිත තොරතුරු මහඟු මාර්ගෝපදේශකත්වයක් ඉටුකරයි. ඇතැම් අවස්ථාවලදී පර්යේෂණ ගැටලුව හඳුනාගැනීමට ඉවහල්වන දත්ත සහ තොරතුරු සොයාගැනීම දුෂ්කර විය හැකි ය. එසේ ම ඇතැම් කරුණු සම්බන්ධව තොරතුරු සොයාගත නොහැකි ය. ව්‍යවහාරික පර්යේෂණ සම්බන්ධ තොරතුරු සොයාගැනීම තරමක් දුරට පහසු කාර්යයක්වුව ද, න්‍යායාත්මක ප්‍රවේශයකින් යුක්ත පර්යේෂණ සඳහා තොරතුරු සොයා ගැනීම ඇතැම් විට බෙහෙවින් දුෂ්කර කාර්යයක් විය හැකි ය.

ගැටලුව හඳුනාගත් පසු එම තත්ත්වයට හේතු විය හැකි යැයි හැඟෙන කරුණු පිළිබඳ අවධානය යොමුකළ යුතු වේ. ඒ සඳහා මාතෘකාවට අදාළ පර්යේෂණ සාහිත්‍ය කියවීම ඉතා වැදගත් වේ. ඒ අනුව ක්ෂේත්‍රයට අදාළ පෙර දැනුම මෙන් ම පූර්වගාමී පර්යේෂණ, ඇත්නම් ඒවායේ නිගමන ආදිය පිළිබඳ මනා වැටහීමක් පර්යේෂකයාට ලබා ගත හැකි වේ.

ඉන් අනතුරු ව සිදුවිය යුත්තේ තෝරාගත් ගැටලුවට හේතු වේ යැයි හැඟෙන කරුණු හඳුනා ගැනීමයි. මෙය "උපන්‍යාස" හෝ අභ්‍යුපගමන ගොඩ නැංවීම ලෙස පර්යේෂණ ක්ෂේත්‍රයේදී හැඳින් වේ. මෙම උපන්‍යාසය හොඳින් විමසා බලා ඒ අතරින් තෝරා ගත් උපන්‍යාසයක සත්‍ය අසත්‍යතාව සොයා බැලීමට පර්යේෂණ ක්‍රමවේදයක් සැලසුම් කිරීම මීළඟ පියවරයි.

ඒවා පහත දැක්වෙන අයුරින් මෙහි දී පෙළ ගැස්විය හැකි ය.

1. දත්ත රැස්කර ගැනීමට අදළ ආකෘති, මෙවලම්, ප්‍රශ්නාවලි සකස් කර ගැනීම.
2. පර්යේෂණයට අදළ නියැදිය තෝරා ගැනීම.
3. තමන් අධ්‍යයනය කරන ක්ෂේත්‍රයට අනුව දත්ත රැස් කිරීම.

මෙසේ රැස්කරගත් දත්ත සුදුසු පරිදි යළි සැකසීමෙන් අර්ථකථනය කළහැකි තොරතුරු බවට ඒවා පත්කර ගත යුතු ය. මීළඟ පියවර වනුයේ එම තොරතුරු පදනම් කරගෙන මුලින් ඇතිකරගත් උපන්‍යාසයේ වලංගුතාව අර්ථකථනය කිරීමයි. ඒ අනුව උපන්‍යාසය තහවුරු කිරීම, බැහැර කිරීම හෝ සංශෝධනය කිරීමට අවශ්‍ය දැනුම පර්යේෂණය අනුසාරයෙන් ගොඩනගා ගත හැකි ය.

පර්යේෂණයට අදාළ සමස්ත ක්‍රියාවලිය වාර්තාව තුළ අඩංගු විය යුතු ය. පර්යේෂණ අරමුණු ඉටුවීම පිළිබඳ ඇගයීම සිදු කිරීම සඳහා මෙම පර්යේෂණ වාර්තාව ඉතා වැදගත් වේ.

### ක්‍රියාකාරකම් 7.2.1

මෙම පරිච්ඡේදය අධ්‍යයනය කිරීමෙන් ලබාගත් දැනුම තහවුරු කරගැනීම සඳහා පහත සඳහන් ක්‍රියාකාරකම්වල නිරත වීම ප්‍රයෝජනවත් වනු ඇත.

01. පර්යේෂණයක් සඳහා ගැටලුවක් හඳුනාගන්නා අයුරු පහදන්න.

02. උපන්‍යාසයක සත්‍ය අසත්‍යතාවය සොයා බැලීමට පර්යේෂණ ක්‍රමවේදයක් සැළසුම් කිරීමේ දී අනුගමනය කරන පියවර කෙටියෙන් දක්වන්න.

## 7.3 නිරීක්ෂණය තොරතුරු රැස් කිරීමේ ක්‍රමවේදයක් ලෙස

කිසියම් සිද්ධියක් පිළිබඳ ව හෝ අවස්ථාවක් පිළිබඳ ව විමසිලිමත් ව, සියුම් ව බැලීම නිරීක්ෂණය ලෙස සඳහන් කළ හැකි ය. යමක් සිදුවන ආකාරය යම් අරමුණක් සහිතව බලා අවශ්‍ය කොටස් හෝ කරුණු වාර්තා කර ගැනීම ද නිරීක්ෂණය ලෙස දැක්විය හැකි ය. ගැටලුවක් නිරීක්ෂණය කිරීමේ දී එම ගැටලු දෙස සියුම් ව බැලීම, වාර්තා කිරීම සහ විශ්ලේෂණය කිරීම අත්‍යවශ්‍ය කරුණු ලෙස දැක්විය හැකි ය.

"නිරීක්ෂණය යනු පර්යේෂකයා සහභාගී වන ක්ෂේත්‍රය තුළ සජීවීව තොරතුරු ලබා ගැනීම වේ." (Blaxter:2002:176)

යම් සිද්ධියක් සිදු වන අවස්ථාවේ දී එහි සජීවීව අවශ්‍ය තොරතුරු ලබා ගැනීම නිරීක්‍ෂණයේ දී වැදගත් වේ. වෙනත් ආකාරයකට දක්වතොත් කිසියම් සිදුවීමක් ඒ ඇති සැටියෙන්ම සිදුවන ආකාරය දැකීම නිරීක්ෂණයයි. උදාහරණ ලෙස යම්කිසි ගුරුවරයෙක් පාඩමක් උගන්වන ආකාරය පිළිබඳව ඔහු උගන්වන මොහොතේ ම සජීවීව බලා තොරතුරු ලබාගැනීම දැක්විය හැකි ය. විශේෂයෙන් සමාජ විද්‍යාත්මක හා අධ්‍යාපනික පර්යේෂණවලදී නිරීක්ෂණ ක්‍රමය දත්ත රැස්කිරීම සඳහා වැඩි වශයෙන් භාවිත කෙරේ.


### නිරීක්ෂණ ක්‍රියාවලියේ ස්වභාවය

පර්යේෂණ ක්‍රියාවලියේදී පර්යේෂණ අරමුණට අදාළ ව නිරීක්ෂණය සැළසුම් කර ගත යුතු ය. නිරීක්ෂණය සඳහා පූර්ව සූදානමක් අවශ්‍ය වේ.

පර්යේෂණ සඳහා තොරතුරු එකතු කිරීමේ දී නිරීක්ෂණය ආධාර කරගනී නම් එවැනි නිරීක්ෂණ සඳහා මූලික අරමුණු පිහිටුවීම වැදගත් වේ. අරමුණු සහිත නිරීක්ෂණය පර්යේෂණ කාර්යයට හොඳ අත්තිවාරමකි. පර්යේෂණ ගැටලුවක් සඳහා අවශ්‍ය තොරතුරු ලබාගැනීමේ දී පළමුවෙන් ම උපයෝගී කරගනුයේ නිරීක්ෂණ තොරතුරු ය. ආයතනයක කාර්යක්ෂමතාව අධ්‍යයනයට

ලක්කිරීමට බලාපොරොත්තුවන්නේ නම් පළමුවෙන් ම එම ආයතනයේ ක්‍රියාකාරීත්වය පිළිබඳ ව නිරීක්ෂණය කර එවැනි ගැටලුවක් තිබේ දැයි හඳුනාගත යුතුවේ.


පර්යේෂණ ක්‍රියාවලියේදී නිරීක්ෂණය දත්ත රැස්කිරීමේ උපකරණයක් ලෙස භාවිත කෙරේ. ඒ තුළ දැකිය හැකි වැදගත් ලක්ෂණ කිහිපයක් පහත සඳහන් වගුවෙන් දැක්වේ.




## නිරීක්ෂණයේ දී සැලකිය යුතු වැදගත් කරුණු

නිරීක්ෂණයේ දී අවධානය යොමුකළ යුතු විශේෂ කරුණු කිහිපයක් පහත රූපයේ දක්වා ඇත. ඒ පිළිබඳ අවධානයෙන් කටයුතු කිරීමෙන් නිරීක්ෂණය වඩා ඵලදායී බවට පත්කරගත හැකි ය.

## නිරීක්ෂණයේ දී සැලකිය යුතු කරුණු




නිරීක්ෂණය සඳහා දත්ත වාර්තා කර ගැනීමට නිරීක්ෂණ සැලසුමක් වගුවක් ලෙස සකස් කරගැනීම වැදගත් වේ.

නිරීක්ෂණයෙන් දුටු දේ වාර්තාවක් ලෙස ප්‍රගණන ලකුණු, රූප සටහන් හෝ වෙනත් සංඥා ක්‍රමයක් මාර්ගයෙන් සටහන් කර ගත හැකි ය.


නිරීක්ෂණයේ දී ස්වභාවික හැසිරීමක් අපේක්ෂා කරන්නේ නම් එහිදී නිරීක්ෂණයට භාජනය වන පුද්ගලයන්ට නොදැනෙන සේ සිදු කිරීම වඩා වැදගත් වේ. නිරීක්ෂණය කරන බව දැනගත් විට ඇතැම් අය ආරෝපිත චර්යාවන් ප්‍රදර්ශනය කිරීමට ඉඩ තිබේ.

නිරීක්ෂණයේ දී විශ්වාසනීයතාව හා වලංගුතාව ආරක්ෂාකර ගැනීම ද අවශ්‍ය වේ. නිරීක්ෂණය පුද්ගල ඉන්ද්‍රියන් මගින් සිදුකරන ක්‍රියාවලියක් බැවින් වැරදි සිදුවීමට ඉඩ ඇත. ඒ නිසා පුද්ගලයින් දෙදෙනෙක් හෝ කිහිප දෙනෙක් එකතුව නිරීක්ෂණය කිරීම තුළින් වලංගුතාව ආරක්ෂා කරගත හැකි ය. එසේ ම වීඩියෝගත කිරීම, පටිගත කිරීම වැනි තාක්ෂණික ක්‍රම භාවිතය මගින් ද විශ්වසනීයතාව හා වලංගුතාව සහිත නිරීක්ෂණ දත්ත ලබාගත හැකි වේ.

නිරීක්ෂණයේ දී ලබාගන්නා තොරතුරු පර්යේෂණ කාර්යයෙන් බැහැර ව භාවිත නොකිරීම ද වැදගත් පර්යේෂණ ආචාර ධර්මයකි. උදහරණ ලෙස පුද්ගලයින් පෞද්ගලික විවේචනයට, අපහසුතාවන්ට ලක්කිරීමට නිරීක්ෂණ දත්ත යොද නොගත යුතු වේ.

## නිරීක්ෂණ ප්‍රභේද

නිරීක්ෂණය පුළුල් ක්‍රියාවකි. ඒ අනුව නිරීක්ෂණය විවිධ ක්‍රම අනුව සිදුකළ හැකි ය. පර්යේෂණ කටයුතුවල දී දත්ත රැස්කිරීමේ ක්‍රමයක් ලෙස නිරීක්ෂණය සිදු කරන ප්‍රධාන ක්‍රම තුනක් හඳුනාගත හැකි ය. එකී නිරීක්ෂණ වර්ග පහත සඳහන් රූප සටහනෙන් දක්වේ.




## 1. ඍජු නිරීකෂණය :-

නිරීක්ෂණයට භාජනය වන පුද්ගලයින් දැනුවත් ව, ඔවුන්ගේ යම් යම් ක්‍රියාකාරකම් ඔවුන්ට දැනෙන සේ නිරීක්ෂණය කිරීම ඍජු නිරීක්ෂණය නම් වේ. උදහරණ ලෙස ගුරුවරයෙක් උගන්වන ආකාරය පන්තියේ පිටුපසින් වාඩිවී නිරීක්ෂණය කිරීම සහ යාචකයෙක් සිඟමන් යදින ආකාරය ඔහු අසලින් වාඩිවී නිරීක්ෂණය කිරීම ආදිය දක්විය හැකි ය.

## 2. වක්‍ර නිරීක්ෂණය :-

වක්‍ර නිරීක්ෂණයේ දී නිරීක්ෂණයට භාජනය වන පුද්ගලයින් තමන් නිරීක්ෂණය කරන බව නොදනී. ඔවුන්ට නොදැනෙන සේ, නොපෙනෙන සේ අවශ්‍ය චර්යාවන් නිරීක්ෂණයට ලක්කිරීම වක්‍ර නිරීක්ෂණයයි.

උදහරණ ලෙස පාරිභෝගිකයින්ගේ හැසිරීම වාහනයක ඇතුළත සිට නිරීක්ෂණය කිරීම, සිසුන් ක්‍රීඩා පිටියේ දී හැසිරෙන ආකාරය පන්ති කාමරයක් තුළ සිට නිරීක්ෂණය කිරීම ආදිය දැක්විය හැකි ය.


## 3. සහභාගිත්ව නිරීක්ෂණය :-

නිරීක්ෂකයා ද නිරීක්ෂණයට ලක්වන කණ්ඩායමේ ම සාමාජිකයෙකු බවට පත්වී ඔවුනට නොදැනෙන සේ අවශ්‍ය චර්යාවන් නිරීක්ෂණය කිරීම සහභාගිත්ව නිරීක්ෂණය නම් වේ. එහිදී කණ්ඩායමක් සමග කුලුපග වී ඔවුන්ගේ චර්යාවන් තමා ම අනුගමනය කරමින් දීර්ඝ කාලයක් පර්යේෂණ භූමියේ ජීවත්වීමට නිරීක්ෂකයාට සිදුවේ. මහාචාර්ය නන්දසේන රත්නපාල මැතිතුමා මෙවැනි සහභාගිත්ව නිරීක්ෂණ ඔස්සේ දත්ත ලබාගෙන යාචකයන් පිළිබඳ පර්යේෂණයක් සිදුකර තිබේ.

## නිරීක්ෂණ ක්‍රමයේ වාසි

පර්යේෂණ සඳහා මනා සැලසුමක් යටතේ නිරීක්ෂණ මගින් ලබාගන්නා දත්ත ගැටලුව හඳුනාගෙන අර්ථකථනය කිරීමටත්, ගැටලුවට හෝ කල්පිතයට අදාළ නිගමනවලට එළඹීමටත් හැකි වේ. නිරීක්ෂණ ක්‍රමයේ දක්නට ලැබෙන වාසි කිහිපයක් මහාචාර්ය නන්දසේන රත්නපාල මහතා පෙන්වා දී ඇත. ඒවා පහත රූප සටහනේ දැක්වේ.

### නිරීක්‍ෂණ ක්‍රමයේ වාසි





(සමාජ විද්‍යා පර්යේෂණ මූලධර්ම, රත්නපාල, 1995:141-143 ඇසුරෙනි.)

නිරීක්ෂණය තාක්ෂණික උපක්‍රම භාවිත කොට පටිගත කරගැනීම තුළින් ඉතාම නිවැරදි ආකාරයට අවශ්‍ය චර්යාවන් කිහිපවරක් නිරීක්ෂණය කිරීමට හැකි වේ. එසේම ප්‍රශ්නාවලි, සම්මුඛ සාකච්ඡා වැනි උපක්‍රම භාවිත කළ නොහැකි අවස්ථාවල දී අවශ්‍ය දත්ත රැස්කර ගැනීම සඳහා නිරීක්ෂණය ඉතා වැදගත් වේ. විශේෂයෙන් කුඩා ළමුන් ආශ්‍රිතව සිදු කරන පර්යේෂණ සඳහා නිරීක්ෂණ ක්‍රමය බොහෝ සෙයින් ඵලදායක වේ. ළමා සංවර්ධනය පිළිබඳ ජීන් පියාජේ විසින් තම න්‍යායයන් ඉදිරිපත් කළේ කුඩා දරුවන්ගේ ක්‍රියාකාරකම් දිගු කලක් නිරීක්ෂණය කිරීමෙනි. එමගින් නිරීක්ෂණ ක්‍රමයේ ඇති වැදගත්කම පැහැදිලි වේ.

## නිරීක්ෂණ ක්‍රමයේ අවාසි

නිරීක්ෂණය දත්ත රැස්කිරීමට යොදගැනීමේ දී යම් යම් බාධාවන්ට ද මුහුණ දීමට සිදු වේ. එවැනි බාධක කිහිපයක් පහත සඳහන් රූප සටහනෙන් දැක්වේ.

## නිරීක්ෂණයේ දී මතුවන බාධා




නිරීක්ෂණ ක්‍රියාවලියේ දී සිදුවන බාධාවන් වලක්වා ගැනීමට පූර්වෝපායන් යෙදීම අවශ්‍ය වේ. ඒ පිළිබඳ වඩාත් සංවිධානාත්මකව පිරික්සුම් ලැයිස්තු පිළියෙළ කරගැනීමෙන් නිරීක්ෂණ වඩාත් ප්‍රමාණාත්මක ව සිදුකළ හැකිය. නිරීක්ෂණ ක්‍රියාවලිය අතරතුර ගුණාත්මක වශයෙන් වැදගත් තොරතුරු ද වාර්තා කිරීම ඉතා වැදගත් වේ.

**ක්‍රියාකාරකම් 7.3.1**

මෙම පරිච්ඡේදය අධ්‍යයනය කිරීමෙන් ලබාගත් දැනුම තහවුරු කරගැනීම සඳහා පහත ක්‍රියාකාරකම්වල නිරත වීම ප්‍රයෝජනවත් වනු ඇත.

01. "නිරීක්ෂණය" යනු කුමක්දැයි අර්ථකථනය කර දක්වන්න.

02. නිරීක්ෂණයේ දී සැලකිල්ලට ගත යුතු කරුණු පැහැදිලි කරන්න.

03. නිරීක්ෂණ වර්ග හඳුන්වා උදාහරණ ඇසුරින් විග්‍රහ කරන්න.

04. නිරීක්ෂණය දත්ත රැස්කිරීමේ ක්‍රමයක් ලෙස භාවිත කිරීමේ දී සිදුවන වාසි හා අවාසි දක්වන්න.

05. තෝරාගත් ගැටලුවක් නිරීක්ෂණය සඳහා නිරීක්ෂණ පත්‍රිකාවක් පිළියෙල කරන්න.

## 7.4 සම්මුඛ සාකච්ඡාව තොරතුරු රැස්කිරීමේ ක්‍රමවේදයක් ලෙස

පර්යේෂණ ක්‍රියාවලියේ දී නිරීක්ෂණයට මෙන් ම සම්මුඛ සාකච්ඡාවට විශේෂ ස්ථානයක් හිමි වේ.

පර්යේෂණ ක්‍රියාවලියේ දී අධ්‍යයනයට අදාළව තොරතුරු ලබාගැනීම සඳහා ගැටලුව පිළිබඳ දැනුමක් සහිත පුද්ගලයන් සමග සාකච්ඡා කිරීම සම්මුඛ සාකච්ඡා ලෙස අර්ථ දැක්විය හැකි ය. සම්මුඛ සාකච්ඡා පිළිබඳව බ්ලැක්ස්ටර් (Blaxter) දක්වන අදහස මෙසේ ය.

"පුද්ගලයන් සමඟ සාකච්ඡා හෝ ප්‍රශ්න කිරීම් සම්මුඛ සාකච්ඡා නම් වේ.''

"එක් පුද්ගලයෙකු තවත් පුද්ගලයෙකු සමඟ මුහුණට මුහුණලා කෙරෙන වාචික අන්තර් පුද්ගල සබඳතාව සම්මුඛ සාකච්ඡා ලෙසින්'' ඩෙන්සින් (Denzin) නැමැති සමාජ විද්‍යාඥයා ද විග්‍රහ කර ඇත.

කිසියම් සිද්ධියක්, අවස්ථාවක් හෝ ගැටලුවක් පිළිබඳ ව තවත් පුද්ගලයෙකු සමඟ වාචිකව අදහස් හුවමාරු කරගැනීම සම්මුඛ සාකච්ඡා බව පූර්වෝක්ත ප්‍රකාශවලින් පැහැදිලි වේ.

**සම්මුඛ සාකච්ඡාවක් සැලසුම් කරන ප්‍රධාන පියවර :**

පුද්ගලයන් අතර සිදුවන අදහස් හුවමාරු කර ගැනීමේ දී බොහෝ ප්‍රයෝජනවත් දත්ත ලබාගත හැකි වේ. පර්යේෂණ ගැටලුවට විසඳුම් ඉදිරිපත් කිරීමට අවශ්‍ය යෝජනා පවා සම්මුඛ සාකච්ඡා මඟින් ලබාගත හැකි ය. සම්මුඛ සාකච්ඡා මගින් පුද්ගලයන් අතර පවත්නා අත්දැකීම් හුවමාරු කරගත හැකිබව **කොහෙන් හා මැනියන්** (Cohen and Manion) දක්වා ඇත. සම්මුඛ සාකච්ඡාවට භාජනය වන පුද්ගලයන්ට සීමා කිරීමකින් තොරව ස්වකීය අදහස් ප්‍රකාශ කිරීමට ඉඩ ලබාදීම වැදගත් වේ. තවදුරටත් මේ පිළිබඳව විමසා බැලීමේදී සම්මුඛ සාකච්ඡාවල ඇති වැදගත්කම **බෙස්ට් හා කාන්ගේ** (Best & khan) අදහස් වලින් ද පැහැදිලි වේ. ඔවුන් දක්වා ඇති පරිදි

"කුසලතා පූර්ණ පර්යේෂකයෙකුට, ක්‍රමවත් ව සංවිධානය කරනු ලබන සම්මුඛ සාකච්ඡාවකින් අනෙකුත් ක්‍රමවලට වඩා හොඳින් තොරතුරු රැස්කර ගත හැකි වේ."

සම්මුඛ සාකච්ඡාවක් ඵලදායි වීමට නම් එය මනාව සංවිධානය කළයුතු බව පැහැදිලි වේ.

සම්මුඛ සාකච්ඡාවකදී වැදගත් ම කරුණ වන්නේ සුදුසු පුද්ගලයන් තෝරා ගැනීමයි.විශාල නියැදියක් සම්මුඛ සාකච්ඡාවලට යොදවා ගැනීම දුෂ්කර මෙන් ම වැඩිකලක් ගතවන ක්‍රියාවලියක් වන බැවින් නියැදිය විශාල වීම යෝග්‍ය නොවේ.

සම්මුඛ සාකච්ඡාවක් පැවැත්වීමේ දී විශේෂ අවධානයක් යොමුකළ යුතු පියවර රාශියක් පවතී. ඒ අතුරින් ප්‍රමුඛ පියවර කිහිපයක් පහත දැක්වේ.

## සම්මුඛ සාකච්ඡාවක පියවර

| පියවර | ක්‍රියාත්මක වන ආකාරය |
|---|---|
| 1. සැලසුම් කිරීම හා පිළියෙල කිරීම. | සම්මුඛ සාකච්ඡාව සඳහා පුද්ගලයන් තෝරා ගැනීම, තෝරාගත් පුද්ගලයින්ගෙන් සාකච්ඡාව සඳහා ස්ථානයක්, වේලාවක්, දිනයක් ලබා ගැනීම කළ යුතු ය. එසේ ම සම්මුඛ සාකච්ඡාවේ දී අසනු ලබන ප්‍රශ්න ඇතුළත් සැලැස්මක් පිළියෙල කිරීම ද අවශ්‍ය වේ. |
| 2. සම්බන්ධතා ගොඩනගා ගැනීම. | සම්මුඛ සාකච්ඡාව පිළිබඳ පූර්ව අවබෝධයක් හා සූදානම ක් තිබීම අවශ්‍යය වේ. සැලසුම තෝරාගත් නියැදියට ගැළපිය යුතු ය. නියමිත වේලාවට පුද්ගල හමුවීම, නව අධ්‍යයනයේ අරමුණු පැහැදිලි කරදීම හා තමාව හඳුන්වාදීම තුළින් සුහද බව ගොඩනගා ගැනීම. |
| 3. සම්මුඛ සාකච්ඡාව ආරම්භ කිරීම. | නිදහස් අදහස් හුවමාරු කරගැනීමෙන් අනතුරුව සම්මුඛ සාකච්ඡාව ආරම්භ කළ හැකි ය. වාර්තා කරගැනීමට සූදානම්වීම ද අවශ්‍ය ය. |
| 4. ප්‍රශ්න ඇසීම. | කලින් පිළියෙල කරගත් සැලැස්මට අනුව ප්‍රශ්න ඇසිය යුතු ය. ඒ ඒ ප්‍රශ්න සඳහා අදහස් ප්‍රකාශනයට අවස්ථා ලබාදීම ද වැදගත් වේ. |
| 5. වගකීමෙන් සවන් දීම. | බාධා කිරීමකින් තොරව අවධානයෙන් සවන්දීම අවශ්‍ය ය. අවශ්‍ය ස්ථානයක දී හිස සෙලවීම, හෝ වාචික ව දිරිමත් කිරීම කළ යුතු ය. තමා අඛණ්ඩව සවන්දෙන බව ප්‍රතිචාරකයාට හැඟී යන පරිදි හැසිරීම ද අවශ්‍ය ය. |
| 6. අතුරු ප්‍රශ්න අසා සම්පූර්ණ ප්‍රතිචාරය. | ප්‍රතිචාරකයාගේ යම් කරුණක් පිළිබඳව තොරතුරු ප්‍රකාශ කිරීම අවම වන විටෙක අතුරු ප්‍රශ්න අසමින් සියලු ම තොරතුරු ප්‍රකාශකරවා ගැනීමට කටයුතු කළ යුතු ය. නොපැහැදිලි ස්ථාන නැවත පැහැදිලි කරන ලෙස ද ඉල්ලා සිටීමට පුළුවන. |

| | |
|---|---|
| 7. වාර්තා කර ගැනීම. | ප්‍රතිචාරකයාගේ ප්‍රකාශ ලියා ගැනීමට ද පුළුවන. මෙහි දී කෙටි සංඥා ක්‍රම භාවිත කළ හැකි ය. එසේ ම ප්‍රතිචාරකයාගේ අනුමැතිය ලබාගෙන පටිගත කරගැනීම ද කළ හැකි ය. අවශ්‍ය නම් ලඝු ලේඛකයෙකුගේ සහාය වුව ද ලබා ගැනීම වරදක් නොවේ. |
| 8. සම්මුඛ සාකච්ඡාව අවසන් කිරීම. | කාලය හා අවස්ථාව ලබාදීම පිළිබඳ ව තම කෘතඥතාව පළකිරීම ඉතා වැදගත් වේ. අවස්ථාව පරිදි එම පුද්ගලයන්ට සුළු සංග්‍රහයක් කිරීමට වුවද පුළුවන. නැවත ස්තුතිකර ලිපියක් යැවීම ද වැදගත් වේ. |

සම්මුඛ සාකච්ඡාවක් පැවැත්වීමේ දී විශේෂ අවධානයක් යොමුකළ යුතු කරුණු රාශියක් පවතී. ඒ අතුරින් ප්‍රමුඛ කරුණු කිහිපයක් පහත දැක්වේ.

**සම්මුඛ සාකච්ඡාවේ දී සැළකිය යුතු කරුණු**
**මෙසේ වගු ගත කළ හැකි ය.**

**සම්මුඛ සාකච්ඡාවේ දී සැළකිය යුතු කරුණු**

- එකවර එක ප්‍රශ්නයක් පමණක් ඇසිය යුතු ය.
- අවශ්‍ය නම් එම ප්‍රශ්නය ම නැවත ඇසිය යුතු ය.
- ප්‍රශ්නයේ අරමුණු පිළිබඳ ව පැහැදිලි කර දිය යුතු ය.
- ප්‍රවේශමෙන් හා අවධානයෙන් ප්‍රතිචාරවලට සවන්දිය යුතු ය.
- ප්‍රතිචාර දක්වන අයගේ මුහුණේ හැඟීම්, අනුමාන කිරීම්, උච්චාරණය හොඳින් නිරීක්ෂණය කළ යුතු ය.
- පිළිතුරු දීමට අවශ්‍ය තරම් කාලය දිය යුතු ය.
- පුදුමය, කම්පනය, තරහ වැනි චිත්තවේග ප්‍රදර්ශනය නොකළ යුතු ය.
- ස්වාභාවික ආකල්ප පවත්වාගෙන යාමට උත්සාහ කළ යුතු ය.
- නොපැහැදිලි ද්විත්ව අර්ථ සහිත වංක පිළිතුරු වාර්තා කරගත යුතු ය.
- පරීක්ෂිතයා අදාළ ප්‍රස්තුතයට ප්‍රවිෂ්ට කර රඳවා ගැනීමට උපාය මාර්ග භාවිත කළ යුතු ය.

## සම්මුඛ සාකච්ඡාවල වාසි හා අවාසි :-

සම්මුඛ සාකච්ඡා මගින් දත්ත රැස් කිරීමේදී ඒ තුළ දක්නට ලැබෙන නම්‍යශීලි බව ඉතා වැදගත් වේ. පර්යේෂකයාට අවශ්‍ය පරිදි වෙනස් කරගනිමින් සම්මුඛ සාකච්ඡාව ක්‍රියාත්මක කළ හැකිවීම මෙම ක්‍රමය තුළ දක්නට ලැබෙන විශේෂ ලක්ෂණයකි.

සම්මුඛ සාකච්ඡා තුළින් ලැබිය හැකි වාසි සහ අවාසි පහත සඳහන් ලෙස පෙළ ගැස්විය හැකි ය.

වාසි :-

* රහස්‍ය තොරතුරු පවා අනාවරණය කරගත හැකි වීම.
* අදාළ යැයි හැඟෙන අමතර තොරතුරු රැස්කරගත හැකි වීම.
* පර්යේෂණය සඳහා මෙතෙක් අවධානය යොමු නොවූ කරුණු, මූලාශ්‍ර අනාවරණය කරගත හැකි වීම.

අවාසි :-

* විශාල නියැදියක් යොදගත නොහැකි වීම.
* දත්ත වාර්තා කර ගැනීමේ දී ඇති වන දුෂ්කරතා
* වැඩි කාලයක් ගත යුතු වීම.
* විශේෂ පුහුණුවක් අවශ්‍ය වීම.

මීට අමතරව සම්මුඛ සාකච්ඡා ක්‍රමයේ දක්නට ලැබෙන වාසි හා අවාසි සම්මුඛ සාකච්ඡා වර්ග අනුව වෙනස්වන ආකාරය පහත සඳහන් වගුවෙන් විස්තර කෙරේ.

### සම්මුඛ සාකච්ඡාවල ප්‍රබලතා හා දුර්වලතා

| වර්ගය | ප්‍රබලතා | දුබලතා |
|---|---|---|
| අවිධිමත් සම්මුඛ සාකච්ඡා. | * අදළ ප්‍රශ්නයට පිළිතුරු ලැබීමට වැඩි ඉඩක් ලැබීම.<br>* පුද්ගලයා කේන්ද්‍රකර ගෙන සාකච්ඡා කළ හැකිවිම.<br>* පරීක්ෂකයාට නිරීක්ෂණය කිරීම ද කළ හැකි ය. | * විවිධ පුද්ගලයන්ගෙන් විවිධ තොරතුරු ලැබීම.<br>* දත්තවල ක්‍රමවත් බව අඩු වීම හා විස්තීර්ණ වීම.<br>* දත්ත සංවිධානය හා විශ්ලේෂණය දුෂ්කර වීම. |

| | | |
|---|---|---|
| විධිමත් සම්මුඛ සාකච්ඡා | *දත්ත රැස් කිරිම ක්‍රමවත් කළ හැකි ය.<br>*සමීප ව පවතින තත්ත්වය අනුව සාකච්ඡා කළ හැකි ය.<br>*තාර්කික සාධක බලාපොරොත්තු විය හැකි ය. | * වැදගත් මාතෘකා අත්හැරීමට ඉඩ තිබේ.<br>* නම්‍යශීලිව ක්‍රියා කළ නොහැකි ය.<br>* විවිධ ප්‍රතිචාර ලැබිය හැකි ය.<br>* ප්‍රතිචාර සැසඳීම අපහසු ය. |
| ප්‍රවීන, විවෘත අවසානයක් සහිත සම්මුඛ සාකච්ඡා | * එකම ප්‍රශ්නවලට ප්‍රතිචාර දක්වීම නිසා සැසඳීම පහසු ය.<br>* පරීක්ෂකයන් කිහිප දෙනෙකු යෙදවීමෙන් පුද්ගල අගතිය අඩු කරගත හැකි ය.<br>* දත්ත සංවිධානය හා විශ්ලේෂණය පහසු ය. | * පුද්ගල ස්වභාවය අනුව නම්‍යශීලි විය නොහැක.<br>* ලැබෙන ප්‍රතිචාර ප්‍රමිත ඒවා නොවීම.<br>* තමන්ට අවශ්‍ය දේ ඇතුළත් කිරීම දුෂ්කරය. |
| සංවෘත ස්ථිර ප්‍රතිචාර සම්මුඛ සාකච්ඡා | * දත්ත විශ්ලේෂණය පහසු ය.<br>* කෙටි කාලයක දී වැඩි ප්‍රශ්න සංඛ්‍යාවක් ඇසිය හැකි ය.<br>* පර්යේෂකයාගේ පුද්ගල බද්ධතාව අඩු වේ. | * පරීක්ෂකයාගේ අත් දැකීම් හා හැඟීම්වලට ඉඩ නොලැබීම.<br>* අදාළ නොවන ප්‍රශ්න හා ප්‍රතිචාර තිබිය හැකිවීම.<br>* අපේක්ෂිත ප්‍රතිචාරය නොමැති විට පිළිතුරු නොදී සිටීම. |

( දත්ත රැස්කිරීමේ ක්‍රම ශිල්ප - ශාමින්ද වනසිංහ )

මේ අනුව බලන විට සම්මුඛ සාකච්ඡාව පර්යේෂණ ක්‍රියාවලියක දී තොරතුරු රැස්කර ගැනීමේ ප්‍රබල ක්‍රමවේදයක් ලෙස සැලකිය හැකි ය. එමෙන් ම ඉතා වැදගත් හා ඉහළ විශ්වාසයකින් යුතු තොරතුරු මෙම ක්‍රමවේදය තුළින් රැස්කර ගත හැකි වේ. එමෙන් ම අවශ්‍ය ම තොරතුරු නිරවද්‍ය ලෙස වාර්තා කර ගැනීමට ද එමගින් හැකි ය. පර්යේෂණ ක්‍රියාවලියක දී සම්මුඛ සාකච්ඡා යොදා ගැනීම එහි විශ්වසනීයතාව හා වලංගුතාව පිළිබඳ යම් තහවුරුවක් ලබා දෙන බවද මේ අනුව පැහැදිලි වේ.

## ක්‍රියාකාරකම් 7.4.1

මෙම පරිච්ඡේදය අධ්‍යයනයෙන් ඔබ ලබාගත් දැනුම තහවුරු කර ගැනීම සඳහා පහත සඳහන් ක්‍රියාකාරකම්වල නිරත වීම ප්‍රයෝජනවත් වනු ඇත.

01. සම්මුඛ සාකච්ඡාවක පියවර පැහැදිලි කරන්න.

02. " සම්මුඛ සාකච්ඡාවක් පැවැත්වීමේ දී විශේෂ අවධානයක් යොමුකළ යුතු කරුණු රාශියක් ඇත " මෙම ප්‍රකාශය විග්‍රහ කරන්න.

03. සම්මුඛ සාකච්ඡා ක්‍රමයෙහි වාසි හා අවාසි සංසන්දනය කරන්න.